

විස්තර වර්ණනා සහිත

# භක්ති ශතකය

හෙවත්

# බෞද්ධ ශතකය



විස්තර වර්ණනා සහිත

# භක්ති ශතකය

හෙවත්

# බෞද්ධ ශතකය

---

විද්‍යෝදය පිරිවෙණේ ආචාර්ය,
කොළඹ බෞද්ධ මධ්‍යස්ථානයේ ප්‍රධාන අධ්‍යක්ෂ,
රාජකීය පූජ්‍ය පණ්ඩිත
හැගොඩ ධම්මින්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
විසින් සම්පාදිත සි.

---

විද්‍යෝදය පරිවෙණාධිපති, ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය, මහෝපාධ්‍යාය,
සාහිත්‍ය වාචස්පති (=D. Litt)
බද්දේගම ශ්‍රී ප්‍රියරතනාභිධාන
දක්ෂිණ ලංකාවේ ප්‍රධාන නායක මාහිමියන් වහන්සේ
විසින් ප්‍රතිශෝධිත සි.

---

පී. ගුණදාස රාජපක්ෂ මහත්මයා විසින්
මරදානේ අතුල මුද්‍රණාලයයෙහි
මුද්‍රාපිත සි.

2498
1954

මිල රු. 2·00 සි.

# භක්ති ශතකය

### හෙවත්

## බෞද්ධ ශතකය

ලක්දිව පැරණි අධ්‍යාපනයෙහි උසස් තැනක් ගත් ශතක පොත් පෙළෙහි වූ මේ **භක්ති ශතකය** වනාහි චමත්කාරජනක බුද්ධස්තෝත්‍රයෙකි. ශ්‍රී ජයවර්ධනපුර (=කෝට්ටේ) රාජධානි සමයෙහි දඹදිව ගෞඩදේශයෙන් මෙහි පැමිණ තොටගමුවේ ශ්‍රී සඞ්ඝබෝධි විජයබාහු පරිවෙණාධිපති ෂඩ්භාෂා පරමේශ්වර ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය **ශ්‍රී රාහුල සඞ්ඝරාජ** මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙත පාලි භාෂාව සහිත ත්‍රිපිටක ධර්මය හැදෑරීමෙන් පරම බෞද්ධෝපාසක භාවයට පැමිණි **ශ්‍රී රාමචන්ද්‍ර කවිභාරතී** නම් බ්‍රාහ්මණ පඬිවරයා විසින් රත්නත්‍රය විෂයෙහි වූ ස්වකීය දෘඪ භක්තිය පවසනු වස් මෙය රචිත බව ප්‍රසිද්ධ ය. මොහුගේ නම කොටින් කියන්නෝ **චන්ද්‍රභාරතී** ය යි කියති. එකල ලක්දිව රජ කළ සවන **ශ්‍රී පරාක්‍රමබාහු** මහ රජතුමා මේ පොත කියවීමෙන් ප්‍රීතියට පත් ව **බෞද්ධාගම චක්‍රවර්තීන්** යන ගෞරවෝපාධිය තමාහට ප්‍රදානය කළ බව ග්‍රන්ථ කර්තෘහු විසින් ම ග්‍රන්ථාවසානයෙහි ප්‍රකාශිත සි.

ව්‍යක්ත සුකෝමල පද ලාලිත්‍යයෙන් යුත් අනුප්‍රාස බහුල සුමධුර නිබන්ධයක් වූ මේ ග්‍රන්ථයට රචයිතෘ විසින් තබන ලද නම **භක්ති ශතක** යනු යි. එහෙත් නියම බෞද්ධයෙකුගේ ස්වභාවය මෙයින් ප්‍රකට වන හෙයින් මෙය **බෞද්ධ ශතක** ය යි කියා ද සාමාන්‍ය මහාජනයා අතර ව්‍යවහාර ප්‍රාප්ත විය. **ශතක** නම් සියය යි. එහෙත් ඊට ටිකක් අඩු වැඩි වුව ද ප්‍රධාන සඞ්ඛ්‍යාව සලකා අභෙදෝපචාරයෙන් "ශතක" ය යි කියනු ලැබේ. එපරිද්දෙන් මේ ග්‍රන්ථය ද **ශතක** නම් විය. මෙහි පද්‍ය 107 කි. රත්නත්‍රය කෙරෙහි වූ භක්තිය පැවසෙන ශතකය **භක්ති ශතකය** යි. බෞද්ධයන්ගේ ස්වභාවය දැක්වෙන ශතකය **බෞද්ධ ශතකය** යි.

තොටගමුවේ ශ්‍රී රාහුල සඞ්ඝරාජ මාහිමියන් වහන්සේගේ ම ශිෂ්‍යයකු වූ ද, රාමචන්ද්‍ර කවිභාරතීන් හා සමකාලික පඬිවරයකු වූ ද **සුමඞ්ගල** නම් තෙර කෙනෙකුන් විසින් භක්ති ශතකයට කරණ ලද ව්‍යාඛ්‍යානයෙක් ද වෙයි. පදගතාර්ථ සන්නයක් වූ එහි ඇතැම් තැන්හි පදගතාර්ථ නො ව පදයන්ගේ අදහස් දැක්වෙන සේ ලියා තිබේ. අපට එකඟ විය නො හැකි තැන් ද වෙයි. තවත් කිව යුතු විස්තර ප්‍රස්තාවනායෙහි දැක්වෙන බැවින් මෙහි මීට වඩා යමක් කීම අනවශ්‍ය ය.

ශ්‍රී දේවරක්ෂිත බටුවන්තුඩාවේ පඬිතුමාගේ සංශෝධනයෙන් මුද්‍රාපිත යථෝක්ත සන්න සහිත භක්ති ශතකය වනාහි මෑතක දී ඔවුනොවුන් විසින් අනවධානතාවයෙන් මුද්‍රණය කරවීමෙන් අනේක දෝෂ දූෂිත ව ඇත්තේ ය. විශේෂයෙන් 61 වන පද්‍යයේ අදහස තේරුම් ගැනීමට පවා දුෂ්කර තත්ත්වයට පමුණුවා තිබේ. එහෙයින් මෙය බොහෝ උත්සාහයෙන් සංශෝධනය කොට අප විසින් ලියන ලද භාවයකින් හා ප්‍රමාණවත් විස්තරයකින් ද සරසා ආධුනිකයන් අතට පමුණුවන්නට කල්පනා කෙළෙමු. සෙසු ශතක පොත් ද මෙසේ මුද්‍රණය කරවීමට මගේ අදහස ය.

මේ භක්ති ශතකය 1955 – 57 වර්ෂවල ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ ප්‍රාරම්භ විභාගට නියම කිරීමෙන් කලකට පසු ව හෝ අපේ පැරණි අධ්‍යාපන ග්‍රන්ථ පඞ්ක්තියට ඇතුළත් ශතක පොත් කෙරෙහි සැලකිල්ලක් දක්වීම ගැන යථෝක්ත සමාගමේ කාරක මණ්ඩලයට පැසසිය යුතු ය. මතු වාරවල දී වෙනත් වැදගත් ශතක පොත් ද මෙසේ නියම කෙරෙතැයි අපි බලාපොරොත්තු වෙමු.

මුල් පොත ද ශුද්ධ කොට මෙය පිළිගෙණ වදාළ මාගේ ගුරුදේව වූ විද්‍යෝදය පරිවෙණාධිපති ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය මහෝපාධ්‍යාය බද්දේගම ශ්‍රී ප්‍රියරතනාභිධාන දක්ෂිණ ලඞ්කාවේ ප්‍රධාන නායක මාහිමියන් වහන්සේ ගේ ශ්‍රී චරණ චුම්බනය කෙරෙමින් මීට ප්‍රමාණවත් ප්‍රස්තාවනාවනාවක් සැපයූ විද්‍යෝදය පිරිවෙණේ ආචාර්ය පර්යේෂණ විශාරද පණ්ඩිත මඩිතියවෙල සුමඞ්ගල ස්ථවිරයන් වහන්සේට හා මේ සඳහා මා උනන්දු කරවූ විද්‍යෝදය පිරිවෙණේ ආචාර්ය පණ්ඩිත තෙල්ලඹුරේ පවරකිත්ති ස්ථවිරයන් වහන්සේට ද කෘතඥ වෙමු.

අසර්වඥ සියල්ලෝ ම වරදින සුල්ලෝ ය. එබැවින් මෙහි ද සදෝෂස්ථාන වෙතොත් සුධීහු කරුණාවෙන් අප වෙත දන්වත්වා.

හැගොඩ ධම්මින්ද නායක ස්ථවිර.

2498 / 1954 ජුනි 1 දින විද්‍යෝදය පිරිවෙණේ දී ය.

# ප්‍රස්තාවනා

**සාහිත්‍යය.**

හොඳට කියන ලද්ද හෙවත් පිළිවෙළට සකස් කරණ ලද්ද **සාහිත** නම්. එය ම **සාහිත්‍යය යි** ද කියනු ලැබේ. භාෂාවකට අයත් ව්‍යාකරණ, ඡන්දෝලඞ්කාර, උපමා, උපමෙය හා ශ්ලේෂාදි යෙන් යුක්ත කොට ලියා තැබූ දෙය සාහිත්‍යයට අඩංගු වන බව මෙයින් පැහැදිලි වෙයි. එබඳු සාහිත්‍ය ග්‍රන්ථයන්හි ඇතුළත් වනුයේ මිනිසුන්ගේ සිත් තුළ උපන් අදහස් ය. ඒවා සකස් වී ඇත්තේ ගද්‍ය පද්‍ය දෙකෙනි. එමගින් මිනිසාගේ පරිණත බුද්ධිප්‍රභාවය ලොවට ප්‍රදර්ශනය වෙයි. මිනිසුන් උසස් වූ තරමට ඔවුන්ගේ සිතුම් පැතුම් ද උසස් වෙයි. එමගින් ඔප්පු වන්නේ ලොව ඇති තාක් දෙය ක්‍රමයෙන් පරිණත වන බවෙකි.

එසේ ම ජාතියක් ද උසස් වනුයේ ක්‍රමයෙනි. ඒ අනු ව ම ඔවුන් ගේ ගති ගුණ හා සිතුම් පැතුම් ද දියුණු වෙයි. සාහිත්‍යය පිරී ඇත්තේ එවැනි මිනිසුන්ගේ අදහස්වලිනි. එසේ හෙයින් ජාති යක පරිණාම ක්‍රමය අවබොධ කර ගැණීමට එම ජාතියට අයත් සාහිත්‍යය බෙහෙවින් ම උපකාරී වෙයි.

**පැරණි සාහිත්‍යය**

ලොව පැරණිතම සාහිත්‍යය ලෙස සැලකෙන්නේ හින්දු ධර්මයෙහි එන ඍග් වේදය යි. ආර්‍ය වර්ගයාගේ ශ්‍රේෂ්ඨ අදහස් රැසක් එයින් ලොවට හෙළි වෙයි.

ක්‍රිස්තු වර්ෂයට පෙර පස් වෙනි සියවසේ දී පමණ ආර්‍ය වර්ගයා ගෙන් සිංහල භාෂාව ඇති වී ය යි විද්‍යාඥයෝ සලකති. භාරත වර්ෂිය ආර්‍ය ජනයා ලක්දිවට ගෙණ එන ලද්දේ වෛදික සංස්කෘතයට හුරු භාෂා විශෙෂයක් බව සිතිය හැකි යි සංස්කෘතය පුරාතන, මධ්‍යතන හා නූතන ය යි කොටස් කිරීමේ දී එහි මධ්‍යතන යුගයට අයත් සංස්කෘතය මෙහි ගෙණෙන ලද භාෂා වට බෙහෙවින් ම හුරු බැව් පඬුවන්ගේ නිගමනය වේ.

**පණ්ඩුකාභය** කුමරු **පණ්ඩුල** බමුණාගෙන් වෙදය උගත් බවක් ඉතිහාසය පෙන්වයි. "එහෙත් සංස්කෘත භාෂාව ගැණ එහි කිසිත් සඳහන් නො වෙයි. වෙදය ලියැවී ඇත්තේ සංස්කෘත යෙන් නිසා ඒ ගැණ එහි විශෙෂ සඳහන් කිරීමක් අනවශ්‍ය ය'' යනු ඇතැමෙකුගේ මතය විය හැකි යි එහෙත් ක්‍රිස්තුවර්ෂයට

පෙර තුන් වැනි සියවසේ දී ලියැවුනු සෙල්ලිපි දෙස බලන විට එහි බස සංස්කෘතයට වඩා පාලි භාෂාවට ගුරු කමක් දක්වන සිංහල භාෂාවක් බව නිසැක ව ම ප්‍රත්‍යක්ෂ වෙයි. එමෙන් ම ක්‍රිස්තු වර්ෂ පස් වැනි සියවසට අයත් "ලබුඇටගල" සෙල්ලිපියේ භාෂාව සංස්කෘතයට කිසි සේත් සමාන කමක් නොමැති නමුත් පාලියට සම කමක් දක්වන සිංහලයෙන් ලියැවී තිබේ.

සාහිත්‍යික භාෂාවක් ලෙස සංස්කෘතය ලක්දිවට පැමිණියේ වෛතුල්‍ය ධර්මයන් සමග ය කීවොත් එය තරමක් නිවරද ය. අනුරාධපුර **වොහාරතිස්ස** රජු දවස **අභයගිරි වාසීහු වෛතුල්‍ය වාදය** නමින් යුත් මහායාන ධර්මය පිළිගත් බවක් ඉතිහාසය අපට හෙළි කරයි. නිකාය සංග්‍රහය ද එය එසේ ම ය යි සවිර කරයි. මේ මහායාන ධර්මය ලියා ඇත්තේ සංස්කෘත භාෂාවෙනි. ඒ නිසා ඒ ධර්මය ඉගෙණ ගැණීමට සංස්කෘතය අවශ්‍යයෙන් ම ඉගෙණ ගත යුතු විය. හීනයාන ධර්ම නම් වූ ථෙරවාදය ඉගෙණීමට පාලිභාෂාව ඉගෙණ ගැණීම අවශ්‍ය වූවාක් මෙන් මේ ධර්මය පුරුදු පුහුණු කිරීමට සංස්කෘතය අවශ්‍ය හෙයින් බොහෝ දෙන එය ඉගෙණ ගත්තෝ ය. ඉන් පසු සංස්කෘතයේ වටිනාකම දත් සිංහලයා සංස්කෘත භාෂාව කෙරෙහි ඇල්මක් දක්වී ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් භාරත වර්ෂයෙන් සංස්කෘත ග්‍රන්ථ මෙහි ගලා එන්ට වූහ. **කාලිදාස - කුමාරදාස** සම්බන්ධය ද මේ නිසා ඇති වූයේ ය යි සිතිය හැකි යි. **බුද්ධදාස** රජතුමන් ලියූ **සාරාර්ථ සංග්‍රහය** සිංහල මිශ්‍ර සංස්කෘත වචන මාලාවකින් යුක්ත විය. එකල ලියූ සිංහල ශාස්ත්‍රීය ග්‍රන්ථ පවා වැඩියක් සංස්කෘත වචන වලින් පිරී තිබේ.

දශ වන ශත වර්ෂයේ ආරම්භයේ පටන් සංස්කෘත බහුල සිංහල රචනා ක්‍රමයෙන් වැඩි වී 12 වන ශත වර්ෂය වන විට හොඳට ම දියුණු විය. i **විජයබාහු** රාජ්‍ය කාලයේ දී සිංහල ගද්‍ය රචනා සංස්කෘත ශෛලිය ගුරු තන්හි ලා කිරීමට සිංහල ලේඛකයෝ අමතක නො කළහ.

සංස්කෘත ශෛලිය ගුරු තන්හි ලා කළ ග්‍රන්ථයන් වූ **බුත් සරණ, දහම් සරණ** හා **සඟ සරණ**යන්හි කතුවරයා වූයේ **විද්‍යාචක්‍රවර්තිහු ය**. මේ ග්‍රන්ථයන් හි භාෂාව ලලිතාන්විත පදමාලා හා කමනීය යෙදුම්වලින් යුත් දීර්ඝ වාක්‍ය සහ සමාස බහුල ශබ්ද මාලාවන්ගෙන් සරසා ඇති බව දක්ක හැකි ය. මෙයින් ඔප්පු වන්නේ මේවා **කාදම්බරිය** හා **හර්ෂචරිතය** අනුගමනය කළ බව ය.

**කාව්‍යශෙඛරය** හා **කාව්සිළු** ණ ද මාතර යුගයට අයත් ය යි සැලකෙන **කාව්මුතුහර** සහ **කාව්මිණ්මල්දම ද, සසදාවත** හා **ගුත්තිලය ද** දීර්ඝ වණ්නයන්ගෙන් සරසා තිබීමෙන් පැහැදිලි වන්නේ ඒවා ද සංස්කෘත ශෛලිය අනුගමනය කළ බව ය

කාලිදාසයන්ගේ **මෙඝදූතය** ගුරු තන්හි තබා රචිත දූත කාව්‍යයන් ද සංස්කෘත ශෛලියේ ආභාසය ලබා තිබේ. එහෙත් **අමාවතුර** සංස්කෘත ශෛලිය පල පදියන් වීමට පෙර කළ නිසා ඒ නීති රීතිවලට අසු නො වී සිංහල උරුවට මුල් තැන දී කළ කෘතියෙකි. එමෙන් ම භාවගීත සාහිත්‍යයට ද සංස්කෘත ශෛලියෙන් වැඩක් වි නැත.

ක්‍රිස්තු වර්ෂයෙන් සට 1 වැනි ශත වර්ෂයේ සංස්කෘත විරිතට අනු ව සිංහල කවි බැඳීම සිදු වී තිබේ. එහෙත් **සියබස් ලකරට** එබන්දක් වි නැත. එය සිංහල රීතිය අනු ව සකස් වී ඇති නමුත් **එළුසඳැස් ලකුණ** සංස්කෘත ඡන්දස් අනුගමනය කර තිබේ.

මාතර යුගයේ ප්‍රචලිතවූ "සිලෝ" නමින් දක්නා වෘත්තය සංස්කෘත ඡන්දස් ශාස්ත්‍රයෙහි එන්නෙකි. මිට සමාන වෘත්ත කිපයෙ කින් බඳනා ලද "ගංගාරොහණ ශතක" යෙහි මාලිනී, ශාර්දූල වික්‍රීඩිත, වසන්ත තිලකා, වංසස්ථ, ඉන්ද්‍රවංශා හා තොටක ආදි සංස්කෘත වෘත්ත ඇත්තේ ද එසේ හෙයිනි. කෙසේ හෝ මෙයින් සිංහල සාහිත්‍යයට සිදු වූයේ ශබ්දාලඞ්කාරයෙන් යුත් පදමාලා වන්ගෙන් හා උපමා රූපක බහුල ව යෙදුන වාක්‍යයන්ගෙන් යුත් පොහොසත් සාහිත්‍යයක් වීම ය.

**ශතක ග්‍රන්ථ.**

නාමාෂ්ට ශතකය, ප්‍රත්‍යය ශතකය, අනුරුද්ධ ශතකය, භක්ති ශතකය, සූර්‍ය ශතකය, දෘෂ්ටාන්ත ශතකය, නීති ශතකය, ශෘඞ්ගාර ශතකය, වෛරාග්‍ය ශතකය, චණ්ඩි ශතකය, අමරු ශතකය, භාව ශතකය, අන්‍යොක්ති ශතකය, අරිෂ්ට ශතකය, හා යොග ශතකය යන මොහු සංස්කෘත භාෂාවෙන් රචිත වූවෝ ය. මෙයින් අවසනට දැක්වුන ශතක අයය විශෙෂයෙන් ආයුර්වේදීය ක්‍රමයන් විස්තර කරමින් රචනා කර තිබේ. එළු සිලෝ ශතකය, බුද්ධස්තොත්‍ර ශතකය, ප්‍රාතිහාර්‍ය ශතකය, ගංගා රොහණ ශතකය ආදිය සිංහල භාෂාවෙන් ලියැවී ඇත. ශතක නාමයෙන් ලියැවුනු එක ම පාලි පොත නාම වෘත්ත මාලාව යි,

**ශතකයන්ගේ පහළ වීම.**

ශතක ග්‍රන්ථ පහළ වූයේ භාරත වර්ෂයේ ය. ආදිම ශතක කතෘ ලෙස පිළිගැණෙන්නේ **භර්තෘහරි ය.** මෙහෙමේ ලොවට ශතක කාව්‍යයන් පළමුවෙන් ම බිහි කළ හැනැත්තා ය. ශතක පහළ වූයේ මෙසේ සි:-

"භාරත වර්ෂයේ චතුර්වේදයෙහි හසළ බුද්ධියක් ඇති බ්‍රාහමණ යෙකුට මිහිරි පළතුරු ගෙඩියක් ලැබුනේ ය. බමුණෝ කවදත් පලතුරුවලට බොහෝ ආශා කරති. එහෙත් මොහු ඒ මිහිරි එලය එරට රජුට තෑගි කළහ. 'තෑග්ගෙන් තෑග්ග උතුම් තෑග්ග' ය යි කියා ඒ රජු එය තම අග මෙහෙසියට පරිත්‍යාග කෙළේ ය. සත්‍රින් බෙහෙවින් මිතුරන්ට ප්‍රිය කරණ හෙයින් ඕ තොමෝ එම ඵලය ඇගේ යහලු සොර සැමියෙකුට දුන්නා ය. ඒ සොර සැමියා එය ඔහුගේ තවත් පෙම්වතියකට තෑගි කෙළේ ය. කෙසේ හෝ රජුට මේ පලතුරු ගෙඩිය අතිනතට යෑමේ සිද්ධිය ආරංචි විය. එය ඔහුගේ සිත් වේදනාවට හේතු විය. එහෙයින් රජු රජ සැපත ද අත් හැර දමා වන වාසයට ගියේ ය. මෙසේ වනවාසී වූ **භර්තෘහරි** නම් ඒ රජ තමහට ප්‍රත්‍යක්ෂ වූ මෙවැනි සිද්ධීන් අලලා, ඒ මගින් ම ලොවට උපදෙස් රාශියක් දීමේ බලාපොරොත්තුවෙන් ශතක කාව්‍යයක් ලියුවේ ය. එය **නීති ශතක** නමින් ප්‍රසිද්ධ විය." ශතක ග්‍රන්ථයන්ගේ ආරම්භය වූයේ මෙසේ සි.

සංස්කෘත ග්‍රන්ථ කතෘවරු කිපදෙනෙක් මේ '**භර්තෘහරි**' නමින් පෙණී සිටිත්. භට්ටි **කාව්‍යයේ** කතෘ භූත ප්‍රසිද්ධ **භර්තෘහරි** පඬිවරයා ද මින් කෙනෙකි. එහෙත් මේ භට්ටි කාව්‍ය ශතක ග්‍රන්ථයක් නො වේ. එහි විස්තර වනුයේ රාම පිළිබඳ කථාවෙකි. එය සර්ග 22 කින් පරිමිත තරමක් විශාල සංස්කෘත කාව්‍ය ග්‍රන්ථයෙකි.

මේ නිසා ශතක කාව්‍යයන්හි ආදි කතෘ මේ ඉහත කී **භර්තෘහරි** රජු ය. හේ හින්දු ආගමිකයෙකි. ඔහුගේ ආදිම ශතක කාව්‍යය නීති ශතක ය සි. පසු ව ශෘඞ්ගාර ශතකය හා වෛරාග්‍ය ශතකයත් ඔහු විසින් ම රචිත ය.

සංස්කෘත සාහිත්‍යයේ තන්හි තන්හි විසිරී ගිය ඉතා උසස් හිතොපදෙශ බහුල කිම් පද්‍යාත්මක ව ශතක ග්‍රන්ථයන්හි දක්නට ලැබේ. උපමා කථා වශයෙන් මේවා වැඩියක් සිංහ - කොටි - ව්‍යාඝ්‍ර - හිවල් - බළල් සහ එවැනි තිරිසන් ගත සතුන් සම්බන්ධ ව ම ප්‍රකාශ ව ඇත.

ශ්‍රිතොපදෙශය හා පඤ්චතන්ත්‍රය සදාචාර පිළිබඳ සූත්‍ර ක්‍රමයන්ගෙන් ගහණ ආචාර හා දර්ශන පිළිබඳ වූත් මූලික "අත් පොත්" ය යි කිවට හැකි යි. ලෝකව්‍යාප්ත මෙබඳු කියමන් සංස්කෘත සාහිත්‍යයේ ගැබ් වී පවත්නේ පද්‍යමය සාහිත්‍යයෙහි ය. එයින් සමහර විට ස්වාභාවික සෞන්දර්යය මෙන් ම ගිහි ජීවිතය ද ජීවිතයේ උසස් පරමාර්ථය වූ වෛරාග්‍යය හා සන්‍යාසි ජීවිතය ද පිළිබිඹු කර දක්වයි. ලෝක හා සමාජ තත්ත්වයන් ද මැනවින් විදහා පෙන්වන අවස්ථා ද එමට ය. භර්තෘහරිගේ **නීති ශතකය** හා **වෛරාග්‍ය ශතකය** ද මේ අතින් ඉතා උසස් තැනක් ගන්නා බව කිව යුතු යි.

**ශතක ග්‍රන්ථයන්ගේ ප්‍රයෝජන.**

ශතක ග්‍රන්ථයන් ඉගෙණීමෙන් සංස්කෘත භාෂාවේ පටුත්වය ද, වචනයන්ගේ විසිතුරු බව ද, නීති ශාස්ත්‍රයෙහි විශාරද බව ද, නුවණ දියුණු වීම ද, සමාජ චාරිත්‍ර පොෂණය ද ලැබෙන විශෙෂ ප්‍රයෝජන වශයෙන් දැක්විය හැකි ය.

පෙර ලක්දිව මේ ශතක ග්‍රන්ථ අධ්‍යාපනික ග්‍රන්ථ ලෙස සලකා සියලු ශිෂ්‍යයන්ට ම මේවා ඉගැන්වූ බව අපි දනිමු. සිංහල හෝඩියෙන් පටන් ගත් ප්‍රථම අධ්‍යාපනාංශය සකස් කඩයෙන් අවසන් වෙයි. එකල ප්‍රචලිත වූ "සකස් කඩ නො කී කට උගේ කට හුඹස් කට" ය යි උචිත කියමණක් ද ඇත්තේ මේ නිසා ය.

නාමාෂ්ට ශතකයෙන් ආරම්භ වන ද්විතීය අධ්‍යාපනාංශය සූර්ය ශතකයෙන් අවසන් වෙයි. භක්ති ශතකාදිය මේ අතරට වැටෙයි.

**භක්ති ශතකය හෙවත් බෞද්ධ ශතකය.**

මේ භක්ති ශතකය බුදුරජාණන් වහන්සේගේ බුද්ධ ගුණයන් විස්තර කරමින් උන් වහන්සේ ශරණ යෑම සඳහා විශෙෂයෙන් රචනා කරණ ලදී. උන් වහන්සේ සම්‍යක් සම්බුද්ධත්වය ලබා ගැණීමෙන් පසු වැඩ විසූ සෑම තැනක් ම චෛත්‍යයන් සේ සලකා වන්දනමානනාදිය කළ යුතු බව හා එසේ කළ යුතු ආකාරය ද පැහැදිලි වශයෙන් පෙන්වා ඇත. බුදුන් ශරණ යෑම සමග ම ධර්මය හා සඞ්ඝයාත් ශරණ යෑම ගැණ ද විස්තර සඳහන් වෙයි.

**කර්තෘ.**

**ඉති ශ්‍රී ශාක්‍යමුනෙර්භගවතස් සර්වඥස්‍ය පරමොපාසකෙන ගෞඩදෙශිය ශ්‍රී බෞද්ධාගම චක්‍රවර්තිනා භූසුරෙණා චාර්යෙණ මහාපණ්ඩිතෙන** විරචිතං භක්ති ශතකං **සමාප්තම්** යනුවෙන් ග්‍රන්ථාවසානයෙහි දැක්වෙන හෙයින් මහාපුරුෂ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ උපාසකවරයකු වූ ගෞඩ දෙශීය රාඪ මණ්ඩලය බද වරෙන්ද්‍ර ජනපදයෙහි විරවටකී නම් අග්‍රහාරයෙහි උපන් ත්‍රිපිටක, තර්ක, ව්‍යාකරණ, තිසණ්ඩු, ඡන්දෙලඞ්කාර, කාව්‍ය, නාටක, ස්මෘති, පුරාණ, ඉතිහාසාදි වූ සකල ශාස්ත්‍රඥ භාවයෙන් ප්‍රසිද්ධ මහා පණ්ඩිත **බෞද්ධාගම චක්‍රවර්ති ශ්‍රී රාමචන්ද්‍ර කවිභාරති** නම් බ්‍රාහ්මණ පඬිවරයා මෙහි කර්තෘවරයා යි

මේ **බෞද්ධාගම චක්‍රවර්ති** යන නම මොහුට ලැබුනේ ලක්දිව හවන **ශ්‍රී පරාක්‍රමබාහු** මහරජුගෙනි. ඒ බව මෙන්න:-

"නෘපඃ පරාක්‍රාන්තා භුජො මහිභුජාං
ශිරොමණිඃ පණ්ඩිතමණ්ඩලී සභඃ,
ස රාමචන්ද්‍රං කවිභාරති ද්විජම්
චකාර බෞද්ධාගම චක්‍රවර්තිතම්."

ග්‍රන්ථවසානයෙහි වූ මේ පද්‍යයේ අර්ථ එහි දැක්වෙන බැවින් මෙහි නො ලියමු.

**කාලය.**

ක්‍රි: ව: 1412 සිට වර්ෂ 55 ක් හවන පැරකුම් රජු කෝට්ටේ රජ කළ බව ඉතිහාසයෙන් පෙණේ. ඒ කාලය අතරතුර දී මෙය රචනා කරණ ලද්දේ ය යි සිතිය හැකි ය.

**ප්‍රමාණය**

මෙය නොයෙක් දුෂ්කර වෘත්ත අනුව බඳනා ලද පාද සතරකින් යුත් කෙටි හා දිග ශ්ලොක 107 කින් යුක්ත ය. මඞ්ගල නම් මහා ස්ථවිරපාදයන් වහන්සේ නමක් විසින් මීට සිංහල ව්‍යාඛ්‍යා නයක් රචනා කරණ ලද බැව් ද සිහි පත් කළ යුත්තෙකි.

**මඩිතියවෙල සුමඞ්ගල ස්ථවිර.**

විද්‍යොදය පිරිවෙණේ දී ය.

# භක්ති ශතකය

### හෙවත්

# බෞද්ධ ශතකය

**නමස්තස්මෛ භගවතෙ'ර්හතෙ සම්‍යක් සම්බුද්ධාය.**

**1. ඥානං යස්‍ය සමස්තවස්තුවිෂයං යස්‍යානවද්‍යං වචො**
**යස්මින් රාගලවො'පි නෛව න පුනර් ද්වෙෂො**
**න මොහස්තථා,**
**යස්‍යාහෙතු රනන්තසත්ත්වසුඛදනල්පා කෘපාමාධුරී**
**බුද්ධො වා ගිරිශො'ථ වා ස භගවාංස් තස්මෛ**
**නමස්කුර්මහෙ.**

**පදාර්ථ:-** **යස්‍ය**= යමක්හුගේ; **ඥානං** = ප්‍රඥාව; **සමස්තවස්තුවිෂයං** = සියලු පදාර්ථයන් විෂය කොට පවත්නී ද; **යස්‍ය වචඃ** = යමක් හුගේ වචනය; **අනවද්‍යං** = නිර්දෝෂ ද; **යස්මින්** = යමක්හු කෙරෙහි; **රාග ලවො'පි** = තෘෂ්ණා ලේශයකුත්; **නෛව** = නැත්තේ ම ද; **පුනඃ** = නැවත; **ද්වෙෂො'පි** = ද්වේෂයකුත්; **න** = නැද්ද; **තථා** = එසේ ම; **මොහො'පි** = අවිද්‍යාවත්; **න** = නැද්ද; **යස්‍ය** = යමක්හුගේ; **අහෙතුකඃ** = ලාභාදි කාරණ නිරපේක්ෂක වූ; **අනල්පා** = අල්ප නො වන්නා වූ; **කෘපාමාධුරී**= කරුණාවෙන් වූ මධුරතා තොමෝ; **අනන්තසත්ත්වසුඛදා** = අපරිමිත සත්ත්වයන්ට සැප දෙන්නී ද; **සඃ භගවාන්**= ඒ භගවත්හු; **බුද්ධො වා** = සම්බුද්ධ හෝ වේ වයි; **අථ වා** = නොහොත්; **ගිරිශඃ**= ඊශ්වර හෝ වේ වයි; **තස්මෛ**= යථොක්ත සර්වඥත්වාදි ගුණයෙන් යුක්ත වූ ඒ උත්තමයානට; **නමස්කුර්මහෙ** = නමස්කාර කරමු.

**භාවය:-** යමෙක් සියල්ල දනී ද, යමෙකුගේ වචන නිර්දෝෂ ද, යමකු තුළ රාග, ද්වේෂ, මෝහයන් සවල්ප මාත්‍රයකුත් නැද්ද, ලාභාදි අපේක්ෂාවක් නැති යමකුගේ කාරුණාව අපමණ සත්ත්වට සැප ගෙණ දේ ද, හෙතෙමේ බුද්ධ නම් වූයේ හෝ වේවා, ඊශ්වර නම් වූයේ හෝ වේවා, ඒ උත්තමයාට අපි නමස්කාර කරමු.

**විස්තර:-** කවර නමකින් පෙණී සිටියත් අපගේ නමස්කාරය ඉහත සඳහන් ගුණ ඇති උත්තමයාට ය යි කි නියා යි. මෙයින් බුදුරජාණන් වහන්සේට නමස්කාර කෙරෙයි.

**අනවද්‍යං වචඃ** = නිදොස් වචන: බොරු, කේලාම් පරුෂ වචන සම්ඵප්‍රලාප (=හිස් වදන්) යන මෙයින් තොර වූ වචන යි.

**ලවඃ** = ලෙශමාත්‍රයක්, ඉතාම ස්වල්පයක්: "ලව" ශබ්දය අල්පාර්ථයෙහි ය.

**අහේතුඃ** = හෙතු රහිත: බුදුරදුන්ගේ මහා කරුණාව කිසිම ලාභාදි අපෙක්ෂාවක් නැති ව හුදු මහා නම්භාවයෙන් ම සිද්ධ බව මෙයින් දක්වේ.

**කෘපා මාධුරී** = කරුණාවෙන් වූ මධුරත්වය: උන්වහන්සේ කෙරෙහි පවත්නා ලෝවැස්සාගේ සිත් ගන්නා සුලු මිහිරි බව හුදු කරුණාවෙන් ම ඇති වූවෙකි.

**බුද්ධඃ** = සර්වඥයන් වහන්සේ: පරොපදෙශ රහිත ව තෙමේ ම චතුස්සත්‍යාවබොධය කළ උත්තමයන් වහන්සේ යි.

**ගිරිශඃ** = මහදෙවියා හෙවත් ඊශ්වරයා: "ගිරෞ ශෙත ඉති ගිරිශඃ" = පර්වතයෙහි හොවී නු යි 'ගිරිශ' නම්. ඊශ්වරයාගේ වාසස්ථානය කෛලාස පර්වතය බව ප්‍රසිද්ධ ය.

**කුර්මහෙ** = "ඩු කෘඤ් කරණෙ" ධාතු ලට් විභක්ති ආත්ම නෙපද උත්තම පුරුෂ බහු වචන යි. **වයම්** යනු අධ්‍යාහෘත උක්ත කර්තෘ යි.

**වෘත්තය:-** අභිධෘති ඡන්දසට අයත් ශාර්දූල වික්‍රීඩිත යි. **සූර්යාශ්වෛර්මසජස්තතාඃ සගුරවඃ ශාර්දූල වික්‍රීඩිතම්** = මගණ, සගණ, ජගණ, සගණ, තගණ, තගණ, ගුරු යන මෙයින් ද, දොළසින් හා සතින් කරණ ලද යතියෙන් ද යුක්ත වූයේ **ශාර්දූල වික්‍රීඩිත** නම්.

2\. **දෙවඃ ශම්භුර් න වෛරී හරිරපි න රිපුඃ**
**කෙවලී නො සපත්නො**
**නොදාසීනඃ ස්වයම්භූර් න ච පුනරපරෙ**
**තෙ පරෙ වාසවාද්‍යාඃ,**
**ශාස්තා බුද්ධො න බන්ධුර්ජගති න ජනකො**
**නෛකගොත්‍රෛකජාතිඃ**
**කින්ත්වෙතෙෂාං වීතරාගො භවති සකලවිද්**
**යඃ සුධීභිඃ ස සෙව්‍යඃ.**

**පදාර්ථ:-** ශම්භුදේවඃ = ඊශ්වර දෙවි ද; **න මෛවරී** = නුවණැත්තන්ට සතුරු නො වන්නේ ය; **හරිරපි** = විෂ්ණු ද; **රිපුඃ න** = ප්‍රතිපක්‍ෂ නො වන්නේ ය; **කෙවලි** = ක්‍ෂපණක දේව ද; **නො සපත්නඃ** = විරුද්ධ නො වන්නේ ය; **සචයම්භූඃ** = බ්‍රහ්ම ද; **උදාසිනඃ න** = මධ්‍යස්ථ නො වන්නේ ය; **පුනඃ** = නැවත; **අපරෙ** = මෙයින් අන්‍ය වූ; **තෙ වාසවාද්‍යාශව = ඒ** ප්‍රසිද්ධ වූ ඉන්ද්‍රාදි දෙවියෝ ද; **පරෙ න** = අන්‍යයෝ නො වෙති; **ජගති** = ලොකයෙහි; **ශාස්තා** = (සාන්දෘෂ්ටික සාම්පරායික පරමාර්ථ ධර්මයෙන් අනුශාසනා කරණ හෙයින්) ශාස්තෘ නම් වූ; **බුද්ධඃ, සර්වඥ ද; න බන්ධුඃ** = නෑ නො වන්නේ ය; **ජනකො න**= පිය ද නො වන්නේ ය; **නෛකගොත්‍රෛකජාතිඃ** = සම න ගොත්‍ර, සමාන ජාති ඇත්තේ ද නො වන්නේ ය; **කින්තු** = වැලි එකෙක් ඇති; **එෂාං** = මේ ඊශ්වරාදි දෙවියන් අතුරෙන්; **යඃ** = යමෙක්; **විතරාගො භවති** =(සමස්ත වස්තු විෂයෙහි අත්‍යන්ත) ප්‍රහීණ වූ රාග ඇත්තේ ද; **සකලවිත්** = (සංස්කාර, විකාර, ලක්‍ෂණ, නිර්වාණ, ප්‍රඥප්ති යන පඤ්චවිධ ඥෙයමණ්ඩලය කරතලාමලක ක්‍රමයෙන් නිඃශෙෂ කොට අවබොධ කළ හෙයින්) සර්වඥ ද; **සඃ** = හේ තෙමේ; **සුධීභිඃ** = ප්‍රාඥයන් විසින්; **සෙව්‍යඃ** = භජනය කට යුත්තේ යි.

**භාවය** – ඊශ්වර, විෂ්ණු, ක්‍ෂපණක, බ්‍රහ්ම, ශක්‍ර යනාදි දෙවියෝ නුවණැත්තන්ට සතුරු නො වෙති. එසේ ම ශාස්තෘ වූ බුදුරජ තෙමේ පියෙක් හෝ නෑයෙක් හෝ සමාන ජාති සමාන ගොත්‍ර ඇත්තෙක් හෝ නො වේ. එහෙත් මෙකී උතුමන් අතුරෙන් යමෙක් වීතරාග නම්, සියල්ල දත වදාළ සේක් නම් හෙතෙමේ ම නුවණැත්තන් විසින් සෙවනය කළ යුත්තේ ය.

**විස්තර:-** ආශ්‍රය නො කළ යුත්තේ සතුරු බව නිසා වත්, ආශ්‍රය කළ යුත්තේ නෑ සබඳකම් ඇති බව නිසා වත් නො වේ. ගුණවත්කම ම ආශ්‍රය කළ යුතු බවට හේතුව යි. බ්‍රහ්මාදි දෙවතාවෝ සතුරෝ නො වෙති ඔහු ද නුවණැත්තන්ට හිතවත්හ එහෙත් ඔව්හු රාග සහිතයෝ ය, සියල්ල නො දත්තෝ ය. එබැවින් ප්‍රාඥයන් විසින් සෙවනය නො කළ යුත්තෝ ය. බුදුරජ තෙමේ විශෙෂ නෑ සබඳකම් ආදියක් ඇත්තෙක් නො වේ එහෙත් උන්වහන්සේ වීතරාගු ය. සියල්ල දත් උත්තමයාණෝ ය. එබැවින් උන්වහන්සේ ම සේවනය කළ යුත්තාහ.

**කෙවලි** = "කෙවලින්" ශබ්ද ප්‍රථමෛක වචන යි. සන්න්‍යාසි විශෙෂයෙකි.

**වාසවාද්‍යාඃ** = ශක්‍රාදි දෙවතාවෝ යි. "වාසව ආදි යේෂාං තෙ = වාසවාද්‍යාඃ" ෂෂ්ඨී බහුව්‍රීහි යි.

**එකගොත්‍රෛකජාතිඃ** = එක ම ජාතියෙහි, එක ම පරම්පරාවෙහි වූයේ යි. "එකං ගොත්‍රං යස්‍ය ස එකගොත්‍රඃ, එකා ජාතිර්‍යස්‍ය ස එකජාතිඃ, එක ගොත්‍රශ්ච ස එකජාතිශ්චෙති= එකගොත්‍රෛකජාතිඃ." බහුව්‍රීහි ගර්භ කර්මධාරය යි.

**විතරාගඃ** = රාගය දුරු කළ උත්තමයා යි. "වීතො රාගො යස්‍ය ස = වීතරාගඃ" ෂෂ්ඨී බහුව්‍රීහි යි.

**සකලවිද්** = සර්වඥ: "සකලං වෙත්තීති සකලවිද්" = සියල්ල දනී තු යි "සකලවිද්" නම්. 'සකල' ශබ්දොපපද 'විද් ඥානෙ' ධාතුවෙන් නිපන් ක්විබන්ත නාමයෙකි.

**සෙව්‍යඃ** = සෙවනය, භජනය, පර්‍යුපාසනය කට යුතු: "සෙවෘ සෙවනෙ" ධාතු කර්මකාරක කෘදන්ත යි

**වෘත්තය**:- මෙයත්, මීලඟ පද්‍යයත් ප්‍රකෘති ඡන්දසට අයත් ස්‍රග්ධරා යි. **ම්‍රභ්නෛර්‍යානාං ත්‍රයෙණ ත්‍රිමුනියතියුතා ස්‍රග්ධරා කීර්තිතෙයම්**= මගණ, රගණ, භගණ, නගණයන් ගෙන් හා යගණ තුනෙකින් ද යුත් සතකින්, සතකින් හා සතකින් කරණ ලද යති තුනක් ඇති වෘත්තය **ස්‍රග්ධරා** නම්.

3. **බ්‍රහ්මා විද්‍යාභිභූතො දුරධිගමමහා මායයා ලිඞ්ගිතො 'ශෙෂ
විෂ්ණූ රාගාතිරෙකාන් නිජ වපුෂි ධෘතා පාර්වතී ශඞ්කරෙණ,
විතාවිද්‍යො විමායො ජගති ස භගවාන් වීතරාගො මුනීන්ද්‍රඃ
කඃ සෙව්‍යො බුද්ධිමද්භිර්‍යදි වදත මෙ භ්‍රාතරස්
තෙෂු මුඛ්‍යොන්‍යඃ.**

**පදාර්ථ**:- **බ්‍රහ්මා** = (වෙදාන්තවාදීන් විසින් අපරිමිත වූ ඥානසුඛ ස්වරූපය යි කියන ලද) බ්‍රහ්මපදාර්ථය තෙමේ; **අවිද්‍යාභිභූතඃ** = (මූලාවිද්‍යා තූලාවිද්‍යා යන) අඥාන දෙකකින් මඩනා ලද්දේ ය; **අශෙෂ විෂ්ණුඃ** = (වෛෂ්ණවයන් විසින් ජගදන්තරාත්මය යි කියනලද) මේ විෂ්ණු තෙමේ; **දුරධිගම** = දුර්විඥෙය වූ; **මහා මායයා** = (සකල ලොක ව්‍යාමොහකාරිත්වයෙන්) මහත් වූ මායාව විසින්; **ආලිංගිතඃ** = වැළඳනා ලද්දේ ය. **ශඞ්කරෙණ** = (ශෛවයන් විසින් අණිමාදි ගුණයෙන් යුක්ත ය යි වර්ණිතා

කරණලද) ඊශ්වරයා විසින්; **නිජ වපුෂි** = ස්වකීය ශරීරයෙහි; **පාර්වතී** = උමා දේවී තොමෝ; **රාගාතිරෙකාත්** = රාගාධික්‍යය හෙතු කොට ගෙණ; **ධෘතා** = දරණ ලද්දී ය; **ජගති** = ලොක යෙහි; **භගවාන්** = (භග්න රාගත්වාදි ගුණයෙන්) භගවත් නම් වූ; **සඃ මුනීන්ද්‍රඃ** = මුනි ශ්‍රෙෂ්ඨ වූ ඒ සර්වඥ තෙමේ; **විතාවිද්‍යඃ** = විධ්වස්ත වූ අවිද්‍යා ඇත්තේ ය; **විමායඃ** = විගත වූ මායා ඇත්තේ ය; **වීතරාගඃ** = පහ වූ රාග ඇත්තේ ය; **තෙෂු** = ඒ බ්‍රහ්මාදීන් අතුරෙහි; **බුද්ධිමද්භිඃ** = නුවණැත්තවුන් විසින්; **මොක්ෂාය** = නිවන් පිණිස; **කඃ** = කවරෙක්; **සෙව්‍යඃ** = භජනය කට යුතු ද? **මෙ භ්‍රාතරඃ** = (පරසමය වාදී) මාගේ මල්බෑයෙනි; **වදත වදත** = (ඒ සෙව්‍යාසෙව්‍ය විෂය විභාගය යහපත් කොට) කියව්, කියව්.

**භාවය**:- බ්‍රහ්මයා අවිද්‍යාවෙන් මූළා වූවෙකි. විෂ්ණු රූවට්ලි කාර යෙකි. ඊශ්වරයා රාගාධික බැවින් උමාව ස්වකීය ශරීරයෙහි දරණ ලද්දී ය. මුනීන්ද්‍ර වූ සර්වඥ තෙමේ එකී අවිද්‍යා, මායා, රාග යන සියල්ලෙන් විනිර්මුක්ත ය. අන්‍යලබ්ධික සහෝදරවරුණි, එබැවින් ඉහත සඳහන් සිවු වැදෑරුම් පුද්ගලයන් අතුරෙන් කවරෙක් නිවන් පිණිස සේවනය කට යුතු දැයි වහවහා කියව්.

**විස්තර**:- බ්‍රහ්ම, විෂ්ණු, මහෙශ්වර යන ත්‍රිමූර්තිය ඇදහීම නිෂ්ඵල බවත්, බුදුරජාණන් වහන්සේ ඇදහීමෙන් ම නිර්වාණය අවබොධ කළ හැකි බවත් මෙයින් දැක්වේ. මෙහි 'බ්‍රහ්මා' යන්නෙන් තුන්ලොව මැවී ය යි වෛදිකයන් විසින් සැලකෙන මහාබ්‍රහ්මයා ගැණේ. සන්නයෙහි බ්‍රහ්මපදාර්ථය යි අර්ථ දැක්වූ නමුත් බ්‍රහ්මපදාර්ථ වාචී 'බ්‍රහ්මන්' ශබ්දය නපුංසක ලිඞ්ගික ය.

**දුරධිගමමහාමායයා** = "දුඃඛෙන අධිගන්තව්‍යා = දුරධිගමා, මහතී ච සා මායා චෙති = මහාමායා, දුරධිගමා ච සා මහාමායා චෙති = දුරධිගමමහාමායා, තයා." තත්පුරුෂ, කර්මධාරය ගර්භ කර්මධාරය යි. විෂ්ණු තෙමේ අතිශයින් නො දත හැකි මහා මායාවකින් ලොකයා මූළා කෙරෙයි.

**පාර්වතී** = උමාව: "පර්වතෙ භවා පාර්වතී" = හිමාලය පර්වත යෙහි හටගත් හෙයින් එනම් වූවා ය. එබැවින් උමාවගේ පියා හිමාලය පර්වතය යි.

**ශඞ්කර** = ඊශ්වරයා: "ශං කරොතීති = ශඞ්කරඃ" = යහපත කෙරේ නුයි "ශඞ්කර" නම්. මොහුට ඇස් තුණකැයි ද,

වාහනය ගොණෙකැයි ද, ආයුධය ත්‍රිශූලයැයි ද, කඳකුමරු හා ගණදෙවි දෙදෙන පුත්තුය යි ද කියති. භාර්‍යාව වූ උමාව නිතර ම දකුණත ඔහුගේ බෙල්ල වට දමා ගෙණ වම්පස ශරීරය වැලඳගෙණ සිටී ල. එහෙත් වාගර්ථාවිව සම්පෘක්තෞ ......................., පාර්වතී පරමේශ්වරෞ යනුවෙන් උමා-මෙහෙසුරු දෙදෙන දෙබෑ රූපයක් මෙන් වෙන් නො කළ හැකි සේ එකට බැඳී සිටිතැයි මහාකවි කාලිදාසයෝ කීහ.

**විතාවිද්‍යඃ** = "විතා අවිද්‍යා යස්‍ය සඃ = විතාවිද්‍යඃ" ෂෂ්ඨි බහුව්‍රීහි යි.

**විමායඃ** = 'විගතා මායා යස්මාත් සඃ = විමායඃ'' පඤ්චමී බහුව්‍රීහි යි.

**මුනීන්ද්‍රඃ** = 'මුනීනාම් ඉන්ද්‍රඃ = මුනීන්ද්‍රඃ'' ෂෂ්ඨි තත්පුරුෂ යි. සෙඛමුනි, අසෙඛමුනි, පච්චෙකමුනි යන සියලු මුනිවරයන්ට ශ්‍රෙෂ්ඨ බැවින් බුදුරජ තෙමේ 'මුනීන්ද්‍ර'' නම්.

**වදත වදත** = "වද වාක්‍යෙ" ලෝට් මධ්‍යම පුරුෂ බහු වචන යි. ආම්‍රෙඩිතයෙහි ද්විත්වය යි. භය, ක්‍රොධ, ප්‍රශංසා, ත්වරිත, කෞතූහල, හාස්‍ය, ශොක, ප්‍රසාද යන මොවුන් ඇති කල්හි එක් පදය දෙවරක් උසුරුවීම ආම්‍රෙඩිතය යි. මෙහි ත්වරිතාර්ථයෙහි ආම්‍රෙඩිත යි.

4. **බ්‍රාහ්මං වෛෂ්ණවමෛශ්වරඤ්ච බහුධා ලබ්ධ්වා පදං හෙතුතස්**
**සංසාරෙ වත සංසරන්ති පුනරප්‍යෙකාන්තදුඃඛාස්පදෙ,**
**කිමෛතෛර්දෙහභෘතා මපායබහුලෛ රාද්‍යන්තවද්භිඃ පදෛස්**
**තස්මාත් නිත්‍යමනාදිමධ්‍යනිධනං බෞද්ධං පදං ප්‍රාර්ථ්‍යතාම්.**

**පදාර්ථ:-** **බ්‍රාහ්මං පදං** = බ්‍රහ්මයාගේ පදවිය ද; **වෛෂ්ණවං පදං** = විෂ්ණුහුගේ පදවිය ද; **ඓශ්වරං පදං** = ඊශ්වරයාගේ පදවිය ද; **බහුධා** = නොයෙක් වර; **ලබ්ධ්වා** = ලැබ; **හෙතුතඃ** = හෙතු වශයෙන් හෙවත් තෘෂ්ණාමූලය අවිනෂ්ට බැවින්; **පුනරපි**= නැවතත්; **එකාන්ත දුඃඛ** = (ජාති ජරාදි ප්‍රකාරයෙන්) නියත වූ කායික චෛතසික දුඃඛයට; **ආස්පදෙ** = ස්ථාන වූ; **සංසාරෙ**= අග් මුල් නැති සසර; **සංසරන්ති** = සැරි සරා ඇවිදිති; **වත**= අහෝ ම ය; **අපායබහුලෛඃ** = (නරක තිර්‍යක් ප්‍රේතාදි) අපායොත්පත්ති බහුල කොට ඇති; **ආද්‍යන්තවද්භිඃ** = උත්පාද ස්ථිති භඞ්ග සහිත වූ; **ඒතෛඃ පදෛඃ** = ඒ බ්‍රහ්මාදි පදයෙන්; **දෙහභෘතාං** = සත්වයන්ට; **කිම්**= කවර ප්‍රයෝජන ද? **තස්මාත්**=

එහෙයින්; **නිත්‍යං** = අවිනශ්වර වූ; **අනාදි මධ්‍යනිධනම්** = උත්පාද ස්ථිති භඞ්ග රහිත වූ, **බෞද්ධං පදං** = බුදුන් විසින් අනුදන්නා ලද නිර්වාණ පදය; **ප්‍රාර්ථිතාම්** = (නුවණැත්තන් විසින්) කැමති වනු ලැබේවා.

**භාවය**:- බ්‍රහ්ම විෂ්ණු මහේශ්වර පදවි ලැබ ද තෘෂ්ණාව අවිනෂ්ට බැවින් නැවතත් එකාන්තයෙන් දුකට පිහිට වූ සසර සැරි සරති. අද්‍යෙම යි. අපායොත්පත්ති බහුල කොට ඇති ඒ පදවිවලින් සත්ත්වයන්ට කවර වැඩෙක් ද? එබැවින් බුදුන් විසින් අනුදන්නා ලද උත්පාදස්ථිතිභඞ්ග රහිත අවිනශ්වර වූ නිර්වාණපදය ප්‍රාර්ථනය කරණු ලැබේවා.

**විස්තර**:- ත්‍රිමූර්තිය ඇදහීමෙන් සසරින් නිදහස් විය නො හැකි බවත්, බෞද්ධ නිවණ පැතීමෙන් ම සසරින් එතර විය හැකි බවත් මෙයින් දැක්වේ. බ්‍රහ්ම, විෂ්ණු මහේශ්වර ව උපන්නත් නැවතත් එයින් චුත ව අපායොත්පත්ති ලබති.

**බ්‍රාහ්මං** = බ්‍රහ්මණ ඉදං බ්‍රාහ්මං, **වෛෂ්ණවං** = විෂ්ණොරිදං වෛෂ්ණවං, **ඓශ්වරං** = ඊශ්වරස්‍යෙදං ඓශ්වරං, **බෞද්ධං** = බුද්ධස්‍යෙදං බෞද්ධං. හතර ම ඉදමර්ථයෙහි 'අණ්' ප්‍රත්‍යයාන්ත තද්ධිත යි.

**සංසරන්ති** = සම් පූර්ව 'සෘ ගතෞ' ලට් ප්‍ර. බහු වචන යි.

**දෙහභෘතාම්** = ශරීර දරන්නවුන්ට, සත්ත්වයන්ට. "දෙහාන් බිභ්‍රතීති දෙහභෘතඃ, තෙෂාම්." දෙහභෘත් ශබ්ද ෂෂ්ඨී බහු වචන යි.

**අපායබහුලෛඃ** – "අපායා බහුලා යෙෂාං තෙ = අපාය බහුලාඃ, තෛඃ." ෂෂ්ඨී බහුව්‍රීහි යි. ත්‍රිමූර්තිය අදහන්න වුන්ට අපායොත්පත්ති බහුල ය.

**ආද්‍යන්තවද්භිඃ** = "ආදිශ්චාන්තශ්ච ආද්‍යන්තෞ, තෞ එෂාං ස්ත ඉති = ආද්‍යන්තවන්තඃ, තෛඃ." මූල, අග දෙක ඇත්තෝ ආද්‍යන්තවද් නමු. මෙහි මූල අග දෙක නම් උත්පත්ති, භඞ්ග දෙක යි මූල අග ඇති කල්හි මැද ද තිබිය යුතු ම ය. මැද නම් ස්ථිතිය යි. මෙසේ හෙයින් "ආද්‍යන්තවත්' ශබ්දයෙන් උත්පත්ති, ස්ථිති, භඞ්ග තුණ ම ගැණේ. නිවණ උත්පත්ති, ස්ථිති, භඞ්ග රහිත ය බ්‍රහ්මත්වාදීහු උත්පත්ති ස්ථිති භඞ්ග සහිත බැවින් නිවන් නො වෙති. "බ්‍රහ්මත්වාදියට පැමිණීම නිවන් දැකීම ය" යන වෛදික මතය මෙයින් ප්‍රතික්ෂෙප කෙරෙයි.

**අනාදිමධ්‍යනිධනං** = "ආදියව මධ්‍යයක්ව නිධනයක්ව ආදි මධ්‍ය නිධනානි, න සන්ති තානි යස්‍යති = අනාදිමධ්‍යනිධනම්". උත්පත්ති, ස්ථිති, භඞ්ග රහිත වූයේ යි. බුදුරජාණන් වහන්සේ වදාළ නිවණ උත්පත්ති, ස්ථිති, භඞ්ග රහිත ය. එබැවින් එය නිත්‍ය ය. ඊට පැමිණි කෙනෙක් නැවත කවදාවත් සසරට නො පැමිණෙති.

**ප්‍රාප්ඨිතාම්** = ප්‍ර පූර්‍ව "අර්ඞ් යාචනෙ" ලොට් කර්මකාරක ප්‍ර. එක වචන යි.

**වෘත්තය** = ශාර්දූල වික්‍රීඩිත යි.

5. **විද්‍යාකාරං සූක්ෂ්මං විභු විශදමාකාරරහිතං**
**නිරීහං නීරූපං නිරවධි කෘපාබීජ මජරම්,**
**සමස්තඥං සර්වෝපධිරහිතමෛශ්‍යාදමෘතදං**
**ජිතානඞ්ගෛඝෛඃ සෙව්‍යං භවතු මම තද් වස්තු ශරණම්.**

**පදාර්ථ**:- **සූක්ෂ්මං** = පරවාදීන්ට අවිෂය වූ උදයව්‍යයාදි විදර්ශනා ඥානයෙන් දෙශනා කිරීමට සමර්ථ හෙයින්) සියුම් වූ; **විභු** = (අනන්ත වූ විෂය ඇති බැවින්) සකල ව්‍යාපී වූ; **විශදං** = නිර්මල වූ; **ආකාර රහිතං** = (හ්‍රස්ව දීර්ඝාදි) සංස්ථාන රහිත වූ; **නිරීහම්** = තෘෂ්ණා රහිත වූ; **නීරූපම්** = (නීල පීතාදි) වර්ණ රහිත වූ; **නිරවධි** = නිස්සීම වූ; **කෘපාබීජම්** = මහා කරුණාවට උත්පත්ති කාරණ කොට ඇති; **අජරම්** = ජරා රහිත වූ නොහොත් නිවන් අරමුණු කොට පවත්නා වූ; **සමස්තඥං** = සියල්ල දන්නා වූ; **සර්වෝපධිරහිතම්** = සියලු කාමෝපධි ස්කන්ධෝපධි ක්ලෙශෝපධි අභිසංස්කාරෝපධි රහිත වූ; **ඓශ්‍යාත්** = (අෂ්ට පර්ශීත්භි අකම්ප්‍ය වූ) ඊශ්වරභාවයෙන් යුක්ත ධර්මදෙශනාව හෙතු කොට ගෙණ; **අමෘතදං** = නිවන් සැප දෙන්නා වූ; **ජිතානඞ්ගෛඝෛඃ** = දිනන ලද මාරයා ඇති ශ්‍රාවක යන් විසින්; **සෙව්‍යං** = සෙවනය කට යුතු වූ; **විද්‍යාකාරං** = ඥාන ස්වරූප වූ; **තද් වස්තු** = ඒ සර්වඥතාඥාන පදාර්ථය තෙමේ; (**මම** = මට;) **ශරණම් භවතු** = පිහිට වේවා.

**භාවය**:- විද්‍යාකාරත්වාදි ගුණ ඇති ඒ උතුම් සර්වඥතාඥානය මට පිහිට වේවා.

**විස්තර**:- මෙහි විශෙෂණ පද රාශියකින් සර්වඥතාඥානය වර්ණිත ය. "ආකාර රහිතම්" යනුවෙන් හ්‍රස්ව දීර්ඝාදි සටහන් රහිත බව ද, "නීරූපම්" යනුවෙන් නීල පීතාදි වර්ණ රහිත බව ද දක්වේ.

**නිරූපම්** = "නිර්ගතං රූපං යස්මාත් තත්නිරූපම්." පඤ්චමී බහුව්‍රීහි යි. **නිර් + රූපම් = නීරූපම්.** එක් තැන රකාර දෙකක් සිටි කල්හි මුල් රකාරය ලොප් ව ඊට මුලින් සිටි ස්වරය දීර්ඝ වේ (=රි ලොපො දීඝශ්ච.)

**ඓශ්‍යාත්** = අධිපති බැවින්: "ඊශස්‍ය භාව ඓශ්‍යම්, තස්මාත්" භාවයෙහි 'යණ්' ප්‍රත්‍යයාන්ත තද්ධිත යි.

**අමෘතදම්** = නිවන් ගෙණ දෙන: "අමෘතං දදාතීති = අමෘතදම්." 'අමෘත' ශබ්දෙපපද "ඩු දාඤ් දානෙ" ධාතු යි.

**ජිතානඞ්ගෛඃ** = 'ජිතො'නඞ්ගඃ යෙන සො ජිතානඞ්ගඃ, තෛඃ" තෘතීයා බහුව්‍රීහි යි. කාමාශාව දුරු කළ ශ්‍රාවකයෝ මෙයින් ගැණෙති.

**විද්‍යාකාරම්**:- ඥානස්වරූප: "විද්‍යා ආකාරො යස්‍ය තද් විද්‍යාකාරම්." ෂෂ්ඨී බහුව්‍රීහි යි. "විද්" නම් ඥානය යි.

**භවතු** = "භූ සත්තායාම්" ලොට් ප්‍ර. එක වචන යි.

**වෘත්තය**:- මේ පද්‍යයේ පටන් පද්‍ය 7 ක් අත්‍යෂ්ටි ඡන්දසට අයත් ශිඛරිණී යි. **රසෛ රුද්‍රෛශ්ඡින්නා යමනසභලා ගඃ ශිඛරිණී** = යගණ, මගණ, නගණ, සගණ, භගණ, ලඝු, ගුරු යන මෙයින් ද, සයකින් හා එකොළොසකින් කරණ ලද යතියෙන් ද යුක්ත වූයේ **ශිඛරිණී** නම්.

**6. අණීයො'ණොඃ ක්ලෙශාප්‍රතිහතමනන්තඤ්ච මහතො
මහීයො මාහාත්ම්‍ය ප්‍රවිජිතජගද් භූරිකරුණම්,
ද්විබාහං නිර්බාහං ද්විපදමපදං සත්‍රිවදනං
ද්විනෙත්‍රං නිර්නෙත්‍රං සගුණමගුණං තන් නු ශරණම්**

**පදාර්ථ**:- **අණීයො'ණොඃ** = සූක්ෂ්ම වස්තුවට අතිශයින් සූක්ෂ්ම වූ; **මහතඃ** = මහත් වූ වස්තුවට ද: **මහීයඃ** = අතිශයින් මහත් ව පවත්නා වූ; **ක්ලෙශාප්‍රතිහතම්** = රාගාදි කෙලෙසින් නො මඩනා ලද්ද වූ; **අනන්තම්** = කෙළවරක් නැත්තා වූ; **මාහාත්ම්‍ය ප්‍රවිජිත ජගත්** = මහානුභාව ගුණයෙන් ජය ගන්නා ලද සත්ව ලොකයා ඇති; **භූරිකරුණම්** = බොහෝ කරුණාවෙන් යුක්ත වූ; **ද්විපදං** = (ස්වභාව පාදය, ඍද්ධි පාදය යන) පාද ද්වයක් ඇත්තා වූ; **අපදං** = (කෙලශයන්ට) අස්ථාන වූ; **ද්විබාහං** = (ආඥා හස්තය, ශ්‍රද්ධා හස්තය යන) හස්ත ද්වයක් ඇත්තා වූ;

**නිබ්බාහම්** = කෙලශ නිර්ඝහක වූ; **සත්‍රිවදනම්** = (අනිමිත්ත විමොක්ෂ මුඛය, අප්‍රණිහිත විමොක්ෂ මුඛය, ශුන්‍යතා විමොක්ෂ මුඛය යන) මොක්ෂ මුඛ තුණකින් යුක්ත වූ; **ද්විනෙත්‍රං** = (ස්වභාව නෙත්‍රය, දිව්‍ය නෙත්‍රය යන) නෙත්‍ර ද්වයක් ඇත්තා වූ; **නිර්නෙත්‍රං** =(ශාස්වතොච්ඡේද) මිථ්‍යාදෘෂ්ටි රහිත වූ; **සගුණම්**= (ශීල සමාධ්‍යාදි) ගුණ සහිත වූ; **අගුණම්** = (සත්ව රජස්තමො යන) ගුණ ත්‍රය රහිත වූ; **තත් තු** = ඒ බුද්ධපදාර්ථය තෙමේ වනාහි; (**මම** = මට;) **ශරණම්** (**භවතු** = ) පිහිට (වේවා )

**භාවය**:- අතිශය සූක්ෂ්මත්‍වාදි ගුණ ඇති ඒ උතුම් බුදු බව මට පිහිට වේවා.

**විස්තර**:- මේ පද්‍යයේ පටන් පද්‍ය තුණකින්, විශෙෂණ රාශියකින් බුද්ධත්‍වය වර්ණිත ය.

**අණීයසෝ'ණෝඃ**=අණෝඃ අණීයඃ = සියුම් වස්තුවටත් වඩා අතිශයින්. සියුම් වූ· 'අණෝඃ' යනු 'අණු' ශබ්ද පඤ්චම්‍යෙක වචන යි.

**අණීයඃ**= ඉතා කුඩා: 'අණීයස්' ශබ්ද ප්‍රථමෛක වචනයි. "ඉදං මෙතෙෂාමතිශයෙන අණු ඉති = අණීයඃ" අතිශයාර්ථයෙහි "ඊයසු" ප්‍රත්‍යයාන්ත තද්ධිත යි.

**කෙලශාප්‍රතිහතම්** = කෙලෙසුන් විසින් නො මඩනා ලද: "කෙලශෛරප්‍රතිහතං=කෙලශාප්‍රතිහතම්" තෘතියා තත්පුරුෂයි.

**මහීයඃ** = අතිශයින් මහත් වූ: 'මහීයස්' ශබ්ද ප්‍ර. එක වචන යි. "ඉදං මෙතෙෂාමතිශයෙන මහදිති මහීයඃ." මෙ ද අතිශයාර්ථ 'ඊයසු' ප්‍රත්‍යයාන්ත තද්ධිත යි.

**මාහාත්ම්‍ය ප්‍රවිජිත ජගත්** = මහාත්ම භාවයෙන් දිනන ලද ලොකය ඇති: "මහාත්මනො භාවො මාහාත්ම්‍යම්." භාව යෙහි 'යණ්' ප්‍රත්‍යයාන්ත තද්ධිත යි. "ප්‍රකර්ෂේණ විජිතම් = ප්‍රවිජිතම්, මාහාත්ම්‍යෙන ප්‍රවිජිතං ජගද් යෙන තත් = මාහාත්ම්‍ය ප්‍රවිජිත ජගත්." තෘතියා බහුව්‍රීහි යි

**සත්‍රිවදනම්** = "ත්‍රිණි වදනානි සමාහෘතානි ත්‍රිවදනම්, සහ ත්‍රිවදනෙන යද්වර්තතෙ තත් සත්‍රිවදනම්." සමාහාර ද්විගු ගර්භ සහපූර්වපද බහුව්‍රීහි යි. මෙහි ත්‍රිවදන නම් විමොක්ෂ මුඛ තුණ යි. **ද්විබාහ, නිර්බාහ, ද්විපද, අපද, ද්විනෙත්‍ර, නිර්නෙත්‍ර, සගුණ, අගුණ** යන විශෙෂණ පද ව්‍යාඛ්‍යාන යෙහි පැහැදිලි ලෙස දැක්වේ.

7. සජ්ජනානන්දං තථ්‍යං සරසහෘදයං සූක්තිසද්මං
සතාං සේව්‍යං සම්‍යක්සමධිගතතත්ත්වං සමමනඃ,
ස්වතඃ සිද්ධං සාධ්‍යං සකලඵලදං සෞම්‍යවදනං
සදීයං සර්වීයං භවතු මම තද් වස්තු ශරණම්.

**පදාර්ථ:-** **සජ්ජනානන්දං** = (උද්ඝටිතඥාදි සත්පුරුෂයන්) සන්තෝෂ කර වූ; **තථ්‍යං** = (යථාර්ථඥතයෙන් යුක්ත හෙයින්) තථ්‍ය වූ; **සරස හෘදයං** = අර්හත්වාදි ගුණ සහිත වූ සිත් ඇති; **සූක්ති සද්මම්** = (ත්‍රිපිටක ධර්ම සඞ්ඛ්‍යාත) ප්‍රවචනයට වාසස්ථාන වූ; **සතාං සේව්‍යම්** = නුවණැත්තන් විසින් සේවා කට යුතු වූ; **සම්‍යක් සමධිගත තත්ත්වම්** = අවිරුද්ධ කොට තමා විසින් දත්තා ලද අනිත්‍යාදි ස්වභාව ඇති; **සමමනඃ** = (ශත්‍රු මිත්‍රෝදාසීන සියලු සත්ත්වයන් කෙරෙහි) සාධාරණ වූ සිත් ඇති; **ස්වතඃසිද්ධම්** = (පරෝපදේශ රහිත ව රාගාද්‍යශේෂ මල විවික්ත හෙයින්) පරිනිෂ්පන්න වූ; **සාධ්‍යම්** = සමස්ත බෝධිසත්ත්වයන් විසින් සුව සේ සිද්ධ කට යුතු වූ; **සකල ඵලදං** = සියලු ස්වර්ග මෝක්ෂ සම්පද් දෙන්නා වූ; **සෞම්‍යවදනම්** = ප්‍රසාදවහ වූ මුඛ මණ්ඩලයක් ඇත්තා වූ; **සදීයම්** = ස්වකීය ශාරිපුත්‍ර ස්ථවිරාදීන්ට හිත වූ; **සර්වීයං** = (තදන්‍ය වූ) සියලු සත්ත්වයන්ට හිත වූ; **තද් වස්තු** = ඒ බුද්ධපදාර්ථය තෙමේ; **මම** = මට; **ශරණම් භවතු** = පිහිට වේවා.

**භාවය:-** සජ්ජනානන්දත්වාදි ගුණ ඇති ඒ උතුම් බුද්ධත්වය මට පිහිට වේවා.

**විස්තර:-** බුද්ධත්වය දක්වෙන "තද්වස්තු" යන්නට සෙසු සියල්ල විශේෂණ යි.

**සරසහෘදයම්** = "සහ රසෛර්‍යද් වර්තතෙ තත් සරසම්, සරසම් හෘදයං යස්‍ය තත් සරසහෘදයම්." බහුව්‍රීහි ගර්භ බහුව්‍රීහි යි. මෙහි 'රස' නම් අර්හත්වාදි ගුණයෝ යි.

**සූක්ති සද්මම්** = යහපත් වචනයන්ට වාසස්ථාන වූ; "සූක්තීනාං සද්මං සූක්තිසද්මම්." ෂෂ්ඨී තත්පුරුෂ යි.

**සම්‍යක් සමධිගත තත්ත්වම්** = අනිත්‍යාදි ස්වභාවය මනා කොට අවබෝධ කළ: "සම්‍යක් සමධිගතං තත්ත්වං යේන තත් සම්‍යක් සමධිගතතත්ත්වම්" තෘතීයා බහුව්‍රීහි යි.

**සදීයම්** = සතාං හිතං සදීයං = සත්පුරුෂයන්ට හිත වූ. **සර්වීයම්** = සර්වේෂාං හිතං සර්වීයම් = සියල්ලන්ට හිත වූ, 'සදීය, සර්වීය' දෙක ම හිතාර්ථයෙහි 'ඊය' ප්‍රත්‍යයාන්ත තද්ධිත යි

**8. ස්වයම්භූතාභිඥං භවභයහරං භීතිරහිතං**
**ස්ඵුරද්භාග්‍යං භොගොජ්ඣිතමහතවීර්‍යං මදනජිත්,**
**චතුර්මාර්ගිං ශුද්ධප්‍රකෘතිං ච තථාසන්ත්‍රාසමිදං**
**මුදං ලොකොත්කෘෂ්ටාමතනු තනුතාං වසතු ජගතාම්.**

**පදාර්ථ:-** **ස්වයම්භූතාභිඥම්** = (ගුරූපදෙශ රහිත වූ) ස්වකීය පාරමිතානුභාවයෙන් සංසිද්ධ වූ ඍද්ධිවිධාදි ෂඩ් අභිඥාවන් ඇති; භවභයහරම්, සසරභය දුරු කරන්නා වූ; **භීතිරහිතම්**= (චතුර්වෛශාරද්‍යාදි අභිඥානයෙන් යුක්ත හෙයින්) භය රහිත වූ; ස්ඵු**රද්භාග්‍යම්,** බබලන්නා වූ ද්වාත්‍රිංශද්වර මහාපුරුෂ ලක්ෂණයෙන් යුක්ත හෙයින් භාග්‍ය සහිත වූ; **භොගොජ්ඣිතම්**= රූපාදි විෂයානුභවය හැරියා වූ; **අහතවීර්‍යම්** = නො නස්නා ලද වීර්‍ය ඇති; **මදනජිත්** = මරුන් දිනුවා වූ; **චතුර්මාර්ගිම්**= (දෘෂ්ටි ශඞ්කාදි කෙලශක්ෂයට කාරණ වූ) චතුර්විධ මාර්ගයට පැමිණියා වූ; **තථා** = ඒ කෙලශක්ෂය පරිද්දෙන් ම; **ශුද්ධප්‍රකෘතිං ච,** නිර්මල වූ සිත් ඇති; **අසන්ත්‍රාසම්** = ප්‍රතඝීවයක් නො කරන්නා වූ; **ඉදං වසතු** = මේ බුද්ධපදාර්ථය තෙමේ; **ජගතාම්** = ලෝක වාසීන්ට, **ලොකොත්කෘෂ්ටාම්** = ලොකොත්තර වූ; **මුදම්**= සන්තොෂය; **අතනු** = නො මඳ ව; **තනුතාම්**= කෙරේවා.

**භාවය:-** ස්වයම්භූතාභිඥත්වාදි ගුණ ඇති ඒ උතුම් බුද්ධත්වය ලෝ වැස්සන්ට ලොකොත්තර සන්තොෂය ඇති කෙරේවා.

**ස්වයම්භූතාභිඥම්**="ස්වයං භූතා අභිඥා යස්‍ය තත් ස්වයම්භූතාභිඥම්" ෂෂ්ඨී බහුව්‍රීහි යි. බුදුරදුන්ගේ ෂඩභිඥා පරොපදෙශ රහිත ව ස්වකීය පාරමිතානුභාවයෙන් ම සිද්ධ වූවෝ ය. ෂඩභිඥා නම් ඉද්ධිවිධ, දිබ්බසොත, පරචිත්ත විජානන, පුබ්බෙනිවාසානුස්සති, දිබ්බචක්ඛු, ආසවක්ඛය යන සය යි.

**භොගොජ්ඣිතම්**= "භොගාන් උජ්ඣිතං භොගොජ්ඣිතම්." ද්විතීයා තත්පුරුෂ යි. මෙහි **භොග** නම් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්ප්‍රෂ්ටව්‍ය යන පඤ්චකාම වස්තූහු යි. බුදුහු ඒ සියල්ල සහමුලින් දුරු කළ සේක.

**චතුර්මාර්ගිම්** = "චත්වාරො මාර්ගා යස්‍ය තච්චතුර්මාර්ගිම්." ෂෂ්ඨී බහුව්‍රීහි යි. සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන චතුර්විධ මාර්ගඥානයන් අවබොධ කළා වූ.

**තනුතාම්** = 'තනු විස්තාරෙ' ලොට් ආත්මනෙපද ප්‍ර. එක වචන යි.

9. ක්වචින්නීලං පීතං ක්වචිදපි ච රක්තං ක්වචිදපි
ක්වචිච්චන්ද්‍රච්ඡායං ක්වචිදපි ච මාඤ්ජිෂ්ඨරුචිරම්,
ක්වචිත් ප්‍රාභාස්වර්‍ය්‍යං යදයති ච වර්ණව්‍යතිකරාච්
ඡිඛාෂට්කං තෛස්තෛර්දධදුපරි තද්වස්තු ශරණම්.

**පදාර්ථ:-** **යත්** = යම් වස්තුවෙක්; **ක්වචිත්** = සමහර තැනෙක්හි; **නීලං** = නිල් පැහැයට ද; **ක්වචිදපි ච** = සමහර තැනෙක්හි; **පීතං** = රන්වන් පැහැයට ද; **ක්වචිදපි** = සමහර තැනෙක්හි; **රක්තඤ්ච** = රත් පැහැයට ද; **ක්වචිත්** = සමහර තැනෙක්හි; **චන්ද්‍රච්ඡායං** = චන්ද්‍රකාන්තියට බඳු වූ සුදු පැහැයට ද; **ක්වචිදපි ච** = සමහර තැනෙක්හි; **මාඤ්ජිෂ්ඨරුචිරම්** = මනොඥ වූ මදට වන් පැහැයට ද; **ක්වචිත්** = සමහර තැනෙක්හි; **වර්ණව්‍යතිකරාත්** = නීලපීතාදි වර්ණ සඞ්කරත්වයෙන්; **ප්‍රාභාස්වර්‍ය්‍යං ච** = ප්‍රභාස්වර වර්ණත්වයට ද; **අයති** = පැමිණේ ද; **උපරි** = මස්තකයෙහි; **තෛස්තෛඃ** = නීලපීතාදි වූ ඒ ඒ වර්ණයෙන් යුත්; **ශිඛා ෂට්කම්** = සිළු සයක් ඇති සිරස් පතක්; **දධත්** = උසුලන්නා වූ; (**යත්** = යම් වස්තුවෙක් ඇද්ද;) **තද් වස්තු** = ඒ වස්තුව; (**මම** = මට) **ශරණම්** (**භවතු**=) පිහිට (වේවා.)

**භාවය:-** නීල පීත ලොහිතාවදාත මාඤ්ජිෂ්ඨ ප්‍රභාස්වර යන ෂඩ් වර්ණයෙන් බබලන, ඒ එක් එක් වර්ණයෙන් යුත් සිළු සයක් ඇති සිරස්පතක් දරණ බුදුරජ තෙමේ මට පිහිට වේවා

**විස්තර:-** මේ පද්‍යයෙන් හා මීළඟ පද්‍ය දෙකින් ද සර්වඥයන් වහන්සේ වර්ණිතය හ.

**ක්වචිත්** = ලිඞ්ගත්‍රයයෙහි ම සියලු විභක්ති වචනාන්ත 'කිම්' ශබ්දයෙන් පර ව ද 'කිම්' ශබ්දයෙන් නිපන් නිපාතයන් කෙරෙන් පර ව ද අනියමාර්ථයෙහි චිත්, චන යන ප්‍රත්‍යයෝ යෙදෙති එබැවින් මෙහි 'කිම්' ශබ්දයෙන් නිපන් ක්ව යන නිපාතයෙන් පරව චිත්` ප්‍රත්‍යය විය.

**ප්‍රාභාස්වර්‍ය්‍යම්** = ප්‍රභාස්වර බව: 'ප්‍රභාස්වරස්‍ය භාවඃ ප්‍රාභාස්වර්‍ය්‍යම්." භාවයෙහි 'යණ්' ප්‍රත්‍යයාන්ත තද්ධිත යි.

**වර්ණව්‍යතිකරාත්** = හෙත්වර්ථයෙහි පඤ්චමී යි. මෙයින් ප්‍රභාස්වර බවට හෙතු දක්වූහ. ප්‍රභාස්වර වර්ණය නම් වර්ණයන් ගේ සඞ්කලනයෙන්, මිශ්‍රත්වයෙන් ලැබෙන්නෙකි "වර්ණානාං ව්‍යතිකරො වර්ණව්‍යතිකරඃ, තස්මාත්." ෂෂ්ඨී තත්පුරුෂ යි.

**අයති** = 'අය ගතෞ' ලට් පරස්මෛපද ප්‍ර එක වචන සි. 'අය' ධාතුව ආත්මනෙපදී ය සි ශ්‍රීමත් **තාරානාථයෝ** කීහ.

**දධත්** = 'ඩු ධාඤ් ධාරණපොෂණයොඃ' ධාතුවෙන් සිද්ධ 'ශතෘ' ප්‍රත්‍යයාන්ත වර්තමාන කෘදන්ත සි. ද්විරුක්ත ධාතුවක් බැවින් "ශ්‍රිතො නුම්" සි විහිත නුමාගමය නො වේ.

10. **පරාභේද්‍යං ජාම්බූනදරුචිර වර්ණං ත්‍රිශරණං**
**ත්‍රියානං ත්‍රිප්‍රඥං ත්‍රිභුවන ශරණං ත්‍රිවචනම්,**
**කෘපාපාත්‍රම් මන්දස්මිත මරුණසච්චීවරධරං**
**කෘතධ්‍යානං සිද්ධාසනන්‍යස්තපාද් වසතු ශරණම්.**

**පදාර්ථ**:- **පරාභේද්‍යං** = විපක්ෂයන් විසින් අභේද්‍ය වූ වජ්‍රකාය ඇත්තා වූ; **ජාම්බූනද රුචිර වර්ණම්** = ජම්බු නදියෙහි උපන් උත්තම සවර්ණයක් මෙන් මනොඥ වූ දෙහශොභා ඇති; **ත්‍රිශරණම්** = (බුද්ධ, ධර්ම, සඞ්ඝ සඞ්ඛ්‍යාත) රත්නත්‍රය ස්වරූප වූ; **ත්‍රියානම්**, (බුද්ධ, ප්‍රත්‍යෙකබුද්ධ, ශ්‍රාවක යන) යානත්‍රය ස්වරූප වූ; **ත්‍රිප්‍රඥම්** = අනිත්‍ය, දුඃඛ, අනාත්ම සඞ්ඛ්‍යාත ත්‍රිලක්ෂණ ප්‍රඥාවෙන් යුක්ත වූ; **ත්‍රිභුවන ශරණම්**, තුන් ලොවට පිහිට වූ; **ත්‍රිවචනම්** = (සූත්‍රාභිධර්ම විනය සඞ්ඛ්‍යාත) වචනත්‍රයක් ඇති; **කෘපාපාත්‍රම්** = කරුණාවට ආධාර වූ; **මන්දස්මිතම්** = (බ්‍රහ්ම විහරණයෙන් යුක්ත හෙයින්) මන්ද හාස්‍යයෙන් ප්‍රසන්න වූ මුඛ ඇති; **අරුණ** = ලාක්ෂා රසය මෙන් රත් වූ; **සත් චීවරධරම්** = (බ්‍රහ්මයා විසින් දෙන ලද) යහපත් සිවුරක් දරන්නා වූ; **සිද්ධාසන න්‍යස්තපාත්** = සිද්ධාසන ක්‍රමයෙන් නිබද්ධ වූ ශ්‍රී පාද යුග්මයක් ඇති; **කෘතධ්‍යානං** = කරණ ලද මහා කරුණා සමාපත්ති ඇති; **(තත්) වසතු** = (ඒ) බුද්ධපදාර්ථය තෙමේ; **(මම** = **මට;) ශරණම් (භවතු=)** පිහිට (වේවා.)

**භාවය**:- පරාභේද්‍යත්වාදි ගුණ සමන්විත සර්වඥ තෙමේ මට පිහිට වේවා.

**විස්තර**:- **පරාභේද්‍යම්** = සතුරන් විසින් නො බිඳිය හැකි: "පරෛ රභේද්‍යං පරාභේද්‍යම්." තෘතීයා තත්පුරුෂ සි. බුදුරජාණන් වහන්සේට අනතුරක් කිරීමට සමර්ථ වූවෙක් මුළු තුන් ලොව ම නැත.

**ජාම්බූනදරුචිරවර්ණම්** = දඹරන් මෙන් මනහර වර්ණ ඇති. "ජම්බූනද්‍යාං භවං ජාම්බූනදම්, තදිව රුචිරං වර්ණං යස්‍ය තද් ජාම්බූනදරුචිරවර්ණම්." ෂෂ්ඨී බහුව්‍රීහි සි. හිමාලයෙහි වූ මේරු, මන්දර පර්වතවල පිහිටි දඹගස්වල ඉඳුනු

ගෙඩි බිම වැටීමෙන් පොඩි වී වැගුරුණු ඇත් කයට බඳු පාට ඇති දඹ යුෂ ජම්බු නදියට ගලා වැටෙයි. ඉන් පසු ඒ ගං ඉවුරු දෙකෙහි මැටි ඒ දඹ යුෂ හා මිශ්‍ර ව අවු සුලං වැදීමෙන් තද වී රත්රන් බවට පැමිණේ. ඒ **දඹරන්** ය.

**ත්‍රියාණම්** = යාන තුණක් ඇති: මෙහි 'යාන' නම් නිවන් ලබන ප්‍රතිපදා යි. නිවන් දක්ක හැක්කේ බුදු වීමෙන් හෝ පසේබුදු වීමෙන් හෝ රහත් වීමෙන් හෝ පමණෙකි. "ත්‍රීණි යානානි යස්‍ය තත් ත්‍රියාණම්." ෂෂ්ඨි බහුව්‍රිහි යි.

**සිද්ධාසනසපිතපාත්** = සිද්ධාසන ක්‍රමයෙන් බඳනා ලද පා යුවලක් ඇති. බද්ධ පර්‍යඞ්කයෙන් (=එරමිණිය ගොතා) වැඩ හුන්: "සිද්ධාසනෙන සපීතෞ පාදෞ යස්‍ය තත් සිද්ධාසන සපිතපාත්." ෂෂ්ඨි බහුව්‍රිහි යි. **ත්‍රිශරණම්, ත්‍රිප්‍රඥම්, ත්‍රිභුවන ශරණම්, ත්‍රිවචනම්** යන පද සත්තයෙන් පැහැදිලි වේ.

11. **ප්‍රසන්නං ඵුල්ලෙන්දීවරනයනයුග්මං ත්‍රිපිටකම්,**
**මුහු ර්ව්‍යාකුර්වාණං සුරනරගණෙභ්‍යඃ කරුණයා,**
**පරං ශාන්තං ස්වර්ණොපලරජතලොෂ්ටෙෂු ච සමං**
**දෘශාං නව්‍යාතිථ්‍යං භවතු මම තද්වස්තු ශරණම්.**

**පදාර්ථ:-** **ප්‍රසන්නම්** = (ක්ලේශ කාලුෂ්‍යාපගමයෙන්) පැහැදුනා වූ; **ඵුල්ලෙන්දීවර** = ප්‍රබුද්ධ නීලොත්පල හා සදෘශ වූ; **නයන යුග්මං** = නුවන් සඟලක් ඇති; **කරුණයා** = කරුණාවෙන්; **සුරනර ගණෙභ්‍යඃ** = දිව්‍ය මනුෂ්‍ය සමූහයන්ට; **මුහුඃ** = වරින් වර; **ත්‍රිපිටකම්** = සූත්‍රාදි ත්‍රිපිටක ධර්මය; **ව්‍යාකුර්වාණං** = දේශනා කරන්නා වූ; **පරම්** = අත්‍යර්ථයෙන්; **ශාන්තං** = කෙලෙසුන් සන්සිඳවූ හෙයින්) ශාන්ත වූ; **ස්වර්ණ** = රන; **උපල** = පහණ; **රජත** = රිදී ය; **ලොෂ්ටෙෂු** = කැබලිති ය යන මෙහි; **සමම්** = (උපෙක්ෂා බුද්ධි ඇති හෙයින්) සම වූ; **දෘශාං** = සත්ව ලොකයාගේ නෙත්‍රයන්ට; **නව්‍යාතිථ්‍යම්** = අමුතු පඬුරක් වැන්නා වූ; **තද් වස්තු** = ඒ බුද්ධපදාර්ථය තෙමේ; **මම** = මට; **ශරණම් භවතු** = පිහිට වේවා.

**භාවය:-** පැහැදුනු පුබුදු නිලුපුල් බඳු නෙත් යුවලක් ඇති කරුණා වෙන් නිතර දෙව් මිනිසුන්ට ත්‍රිපිටක ධර්මය දේශනා කරණ, පරම ශාන්ත, රන් රිදී මැණික් කැබලිති යන මෙහි සම දැකුම් ඇති ලොකයාගේ ඇසට අලුත් තුටු පඬුරක් මෙන් අතිශයින් ප්‍රිය වූ ඒ සර්වඥ තෙමේ මට පිහිට වේවා.

**විස්තර**:- **ඵුල්ලෙන්දීවරකාන්තයුග්මං**= "ඵුල්ලඤ්ච තදින්දීවරඤ්චෙති ඵුල්ලේන්දීවරම්, **කාන්ත**යෝර්යුග්මං කාන්තයුග්මම්, ඵුල්ලේන්දීවරමිව **කාන්ත**යුග්මං යස්‍ය තත් ඵුල්ලේන්දීවරකාන්තයුග්මම්." කර්මධාරය, තත්පුරුෂ ගර්භ ෂෂ්ඨි බහුව්‍රීහි යි. බුදුරදුන්ගේ නෙත් යුවල පුබුදු තිලුපුල් වැනි බව මෙයින් කිහ.

**ව්‍යාකුර්වාණම්** = ප්‍රකාශ කරණ: වි-ආ පූර්ව 'ඩු කෘඤ් කරණෙ' ධාතුවෙන් නිපන් 'ශාන' ප්‍රත්‍යයාන්ත වර්තමාන කෘදන්ත යි.

**සුරනරගණෙභ්‍යඃ** = දෙව්මිනිසුන් සමූහයාට: "සුරාශ්ච නරාශ්ච සුරනරාඃ, තෙෂාං ගණාඃ සුරනරගණාඃ, තෙභ්‍යඃ." ද්වන්ද්ව ගර්භ ෂෂ්ඨි තත්පුරුෂ යි.

**ස්වර්ණෝපල රජත ලොෂ්ටෙෂු** = "ස්වර්ණානි ච උපලානි ච රජතානි ච ලොෂ්ටානි ච ස්වර්ණෝපලරජතලොෂ්ටානි, තෙෂු." ද්වන්ද්ව සමාස යි. මෙහි 'උපල' නම් මැණික් ය. 'ලොෂ්ට' නම් කැට කැබලිති ය. බුදුරජාතන් වහන්සේ හිතාහිත සියලු සත්ත්වයන් කෙරෙහි සම සිත් වූ සේක් ම වටිනා නො වටිනා සියලු ද්‍රව්‍යයන් කෙරෙහි ද සමසිත් වූ සේක. රන් රිදී මුතු මැණික් ආදි වටිනා දෙයෙහි වැඩි ඇල්මකුත්, කැට කැබිලිති ආදි නො වටිනා දෙයෙහි නො ඇල්මකුත් උන්වහන්සේ තුළ නැත. සියල්ලෙහි සමසිත්හ

**නව්‍යාතිථ්‍යම්** = අලුත් තෑග්ග: "නවෙ භවං නව්‍යම්, අතිථෙර්හිතම් ආතිථ්‍යම්, නවඤ්ච තද් ආතිථ්‍යඤ්චෙති **නව්‍යාතිථ්‍යම්**." කර්මධාරය යි. අලුත් තෑග්ග ඇසට ඉතා ප්‍රියඞ්කර ය. එසේ ම බුද්ධ දර්ශනය ද ඉතා ප්‍රිය ය. කොපමණ දක්කත් ඇති වීමෙක් නැත. කෙතෙක් දූක පල පුරුදු කෙනෙකුන්ට වුව ද බුද්ධරූපය පෙණෙන්නේ ඊට කලින් නුදුටු එකක් මෙනි. එහෙයින් ම ශ්‍රීමද් **විද්‍යාචක්‍රවර්තීහු** "දූක පරණ නො වන්නා වූ"යි බුදුරදුන් වැණූහ.

12. **ශරණමිති සද්ග්‍රං සාධු ගච්ඡාමි බුද්ධං**
**ශරණමිති විරාගාග්‍රිය මථෙවම් ධර්මම්,**
**ශරණමිති ගණානා මග්‍රියං යාමි සඞ්ඝං**
**ශරණමිති පුනස් ත්‍රින් ද්විත්‍රිවාරං ව්‍රජාමි.**

**පදරු** **ශරණමිති**=සකල සංසාර දුඃඛයන් දුරු කරන්නේ ය යි සිතා; **සද්ග්‍රම්**= සියලු වීතරාගීන්ට අග්‍ර වූ; **බුද්ධං**,= සර්වඥයන් වහන්සේ; **සාධු** = මනා කොට; **ගච්ඡාමි** = භජනය කෙරෙමි. **විරාගා**

ග්‍රියම් = විරාග ධර්මයන්ට උත්තම වූ; ධම්මං = සපර්‍යාප්ති ක නව ලෝකොත්තර ධර්මය ද; ශරණමිති = සංසාර දුඃඛය නසන්නේ ය යි; (සාධු = මනා කොට;) අසෙවම් = සේවනය කෙරෙමි; ගණානාම් = සියලු ගණයන් අතුරෙන්; අග්‍රියම් = උතුම් වූ; සඞ්ඝම් = අෂ්ටාර්‍යපුද්ගල සඞ්ඝයා; ශරණමිති = මට පිහිට ය යි; (සාධු = මනා කොට;) යාමි = දනිමි. පුනඃ = නැවත ද; දවිත්‍රිවාරම් = දෙවිටක් තුන් විටක් ම; ත්‍රීන් = (මේ බුද්ධ ධර්ම සඞ්ඝ යන) රත්නත්‍රය; ශරණමිති = පිහිට ය යි; (සාධු = මනා කොට;) ව්‍රජාමි = භජනය කෙරෙමි.

**භාවය:-** සියලු සත්පුරුෂයන්ට අග්‍ර වූ බුදුරජාණන් වහන්සේ ද, සියලු විරාග ධර්මයන්ට ශ්‍රෙෂ්ඨ වූ ශ්‍රී සද්ධර්මය ද, සියලු ගණයන්ට ශ්‍රෙෂ්ඨවූ ආර්‍යපුද්ගල සඞ්ඝයා ද ශරණ කොට යමි. නැවත දෙවරක්, තුන් වරක් ද ශරණ යමි.

**විස්තර:-** මෙසින් ශ්‍රීමත් වඤ්ජාරතීහු රත්නත්‍රය ශරණ යෙති.

**සදග්‍රම්** = "සතාං අග්‍රං සදග්‍රම්." ෂෂ්ඨී තත්පුරුෂ යි. මෙහි සත්පුරුෂයෝ නම් වීතරාග උත්තමයෝ යි.

**ගච්ඡාමි, අසෙවම්, යාමි, ව්‍රජාමි** = පිළිවෙළින් "ගම්ලෘ ගතෞ, අනු පූර්ව ඉණ් ගතෞ, යා ගතෞ, ව්‍රජ ගතෞ" යන ඒකාර්ථවත් ධාතුවලින් සිද්ධ ලට් ප්‍ර. එක වචන ක්‍රියා යි.

**අග්‍රියම්, අග්‍රියම්** = "අග්‍රෙ භවඃ අග්‍රියඃ, අග්‍රියඃ, තම්." අග්‍ර ශබ්දයෙන් භවාර්ථයෙහි 'ඊය, ඉය" ප්‍රත්‍යය දෙකින් නිපන් තද්ධිත යි.

**ධම්මම්** = පර්‍යාප්තිය සහිත සතර මග, සතර ඵල, නිවණ යන නව ලෝකොත්තර ධර්මය.

**සඞ්ඝම්** = සෝවාන් මාර්ගස්ථ, ඵලස්ථ, සකෘදාගාමි මාර්ගස්ථ, ඵලස්ථ, අනාගාමි මාර්ගස්ථ, ඵලස්ථ, අර්හත්මාර්ගස්ථ, ඵලස්ථ යන අෂ්ටාර්‍යපුද්ගල සඞ්ඝයා යි. බාහිර සියලු ම ශාස්තෘවරයන්ගේ ශ්‍රාවක ගණයන්ට වඩා මේ අයර්‍යපුද්ගල සඞ්ඝයා ශ්‍රෙෂ්ඨ බව ගණානාමග්‍රියං යන්නෙන් දක්වූහ.

ශරණ නම් පිහිට යි. යමෙකුගේ පිහිට බලාපොරොත්තු වීම ශරණ යෑම යි.

**වෘත්තය:-** අතිශක්වරී ඡන්දසට අයත් මාලිනී යි. **නනමය යයුතෙයං මාලිනී භොගිලොකෛඃ** = නගණ, නගණ, මගණ, යගණ, යගණ යන මෙයින් යුත්, අටකින් හා සතකින් කරණ ලද යති ඇති වෘත්තය මාලිනී නම්.

**13.** පුනරපි ශරණං ව්‍රජාමි බුද්ධං
පුනරපි ලොකගුරුං ගුරුං කරොමි,
පුනරපි කථයාමි නෞමි වන්දෙ
ත්වයි මම ගෞතම නෛව තෘප්තිරාසෙත.

**පදාර්ථ:-** **පුනරපි** = නැවත ද; **බුද්ධං** = සර්වඥයන් වහන්සේ; **ශරණං ව්‍රජාමි** = ශරණ කොට යෙමි. **පුනරපි** = නැවත ද; **ලොකගුරුං** = සමස්ත ලොකයාහට හිතොපදෙශකත්වයෙන් ගුරු වූ සර්වඥයා; **ගුරුං කරොමි** = ගුරු කෙරෙමි. **පුනරපි** = නැවත ද; **කථයාමි** = (ඒ බුදුන්ගේ ගුණ) කියමි. **නෞමි** = (ඒ බුදුන් ගද්‍යපද්‍යයෙන්) සතුති කෙරෙමි. **වන්දෙ** = (කායාදි ද්වාරත්‍රයෙන්) වඳිමි. **ගෞතම** = ගෞතම ගොත්‍ර ඇති සර්වඥයෙනි; **ත්වයි** = තුඹවහන්සේ කෙරෙහි; **මම** = මාගේ; **තෘප්තිඃ** = ශරණ ගමනාදියෙහි ලා පිණා යාමෙක්; **නෛව ආසෙත** = නො ම ඇති.

**භාවය:-** නැවත ද මම බුදුරදුන් සරණ යමි. උන්වහන්සේ මගේ ගුරුවරයා කෙරෙමි. උන්වහන්සේගේ ගුණ කියමි. උන්වහන්සේට සතුති කෙරෙමි. වඳිමි. ගෞතමයන් වහන්ස, ඔබවහන්සේ කෙරෙහි මට ඇති විමෙක් නැත.

**විස්තර:-** **ලොකගුරුම්** = "ලොකානාං ගුරු ලෝකගුරුඃ, තම්." ෂෂ්ඨී තත්පුරුෂ යි. බුදුරජානන් වහන්සේ සියලු තුන් ලෝ වැස්සන්ගේ ම ආචාර්‍ය්‍යවරයා බව මෙයින් දක්වේ.

**කථයාමි** = 'කථ වාක්‍යප්‍රබන්ධෙ' ලට් ප. උත්තම පුරුෂෛක වචන යි.

**නෞමි** = 'ණු ස්තුතෞ' ලට් උත්තම පුරුෂෛක වචන යි.

**වන්දෙ** = 'වදි අභිවාදනස්තුත්‍යොඃ' ලට් ආත්මනෙපද උ. එකවචන යි.

**ආසෙත** = 'ආස් උපවෙශනෙ' ලට් ප්‍ර එක වචන යි. මේ ධාතුව ආත්මනෙපදී යි.

**වෘත්තය:-** මෙයත්, මීළඟ පද්‍යයත් අර්ධසම වෘත්ත ගණයට අයත් පුෂ්පිතාග්‍රා යි. **අයුජි නයුගරෙඵතො යකාරො යුජි ච නජෞ ජරගාශ්ච පුෂ්පිතාග්‍රා** = විෂම පාදවල නගණ, නගණ, රගණ, යගණ යන මෙයින් ද, සම පාදවල නගණ, ජගණ, ජගණ, රගණ, ගුරු යන මෙයින් ද යුක්ත වූ වෘත්තය පුෂ්පිතාග්‍රා නම්.

14. ත්‍රිභුවනමසඞ්ඛ්‍යාන් නිරූප්‍ය යුෂ්මත්
පදසරසිරුහරේණුමාශ්‍රිතො 'හම්,
ශරණමය මයඤ්ච දෛවතං මෙ
ගතිරපරා මම නාස්ති නාස්ති නාස්ති.

**පදාර්ථ**:- **අහම්** = මම; **ත්‍රිභුවනම්,** = (ස්වර්ග මර්ත්‍ය පාතාල යන) භුවනත්‍රයෙහි සියලු මුනිවරයන්; **අසඞ්ඛ්‍යාන්** = නොයෙක් වර; **නිරූප්‍ය** = ඔවුන් විසින් කරණ ලද ශාස්ත්‍ර බැලීමෙන් පරීක්ෂා කොට; **යුෂ්මත්** = (සර්වඥයන් වහන්ස) ඔබගේ; **පද සරසිරුහ රේණුම්** = පාදපද්ම ධූලිය; **ආශ්‍රිතඃ** = ආශ්‍රය කෙළෙම් හෙවත් මා මුදුනෙහි පැළැන්දෙමි; **අයම්** = මේ ශ්‍රීපාද රේණුව; **මෙ** = මට; **ශරණම්** = පිහිට ය. **අයඤ්ච** = මේ ශ්‍රීපාද ධූලිය ම; **මෙ** = මට; **දෛවතම්** = දෙවි ය. **මම** = මට; **අපරා ගතිඃ** = (ඒ පාද ධූලිය හැර) අන් පිහිටෙක්; **නාස්ති** = නැති; **නාස්ති** = නැති; **නාස්ති** = නැති.

**භාවය**:- සර්වඥයන් වහන්ස, මම තුන්ලොව ම නොයෙක් වර පරීක්ෂා කොට ඔබගේ පා දූලි ඇසුරු කෙළෙමි. එය ම මට පිහිට ය. එය ම මගේ දෙවියා ය. ඒ හැර වෙන පිහිටෙක් මට ඒකාන්තයෙන් ම නැත්තේ ය.

**විස්තර**:- අනුන්ගේ කියමනකට සරණ ගියා නො ව නිතර පරීක්ෂා කිරීමෙන් තමන්ට ප්‍රත්‍යක්ෂ ලෙස වැටහීමෙන් ම සරණ ගිය බව මෙයින් දක්වයි.

**නිරූප්‍ය** = නි 'පූර්ව' රූප රූපාඤ්චිත කරණෙ' පූර්වක්‍රියා යි.

**යුෂ්මත් පදසරසිරුහ රේණුම්** = ඔබ පාපියුම් දූලි: "සරස්‍යාං රොහතීති සරසීරුහම්, යුෂ්මාකං පදං යුෂ්මත්පදම්, තදෙව සරසීරුහං යුෂ්මත්පදසරසීරුහම්, තස්‍ය රේණුඃ යුෂ්මත්පද සරසීරුහ රේණුඃ, තම්." කර්මධාරය ගර්භ ෂෂ්ඨී තත්පුරුෂ යි.

**දෛවතම්** = දෙවියා: "දෙවතා එව දෛවතම්." ස්වාර්ථයෙහි 'අණ්' ප්‍රත්‍යයාන්ත තද්ධිත යි.

**නාස්ති නාස්ති නාස්ති** = 'න' නිපාත පූර්ව 'අස් භුවි' ලට් ප්‍ර. එකවචන යි. මෙහි එක ම ක්‍රියාපදය තෙවරක් උසුරු වීමෙන් අවධාරණාර්ථයක් දෙයි.

**15\. අනිත්‍යමඛිලං දුඃඛ මනාත්මෙති ප්‍රවාදිනෙ,**
**නමො බුද්ධාය ධර්මාය සඞ්ඝාය ච නමො නමඃ.**

**පදාර්ථ:-** **අඛිලං** = සියලු සංස්කාර ධර්මය; **අනිත්‍යම්** = (උත්පාද ව්‍යය පරිවර්තනත්වාදි කාරණයෙන්) අනිත්‍ය ය යි කියා ද; **දුඃඛං** = (ජාති ජරා ව්‍යාධි ධර්මාදි කාරණයෙන්) දුඃඛ ය යි කියා ද; **අනාත්මෙති** = (අවශවර්තිත්වාදි කාරණයෙන් ආත්මයක් නැති හෙයින්) ආත්ම රහිත ය යි කියා ද; **ප්‍රවාදිනෙ** = ප්‍රකාශ කොට කථනය කරන්නා වූ; **බුද්ධාය** = බුද්ධ රත්නයට ද; **නමඃ** = නමස්කාර වේවා; **ධර්මාය** = ධර්ම රත්නයට ද; **නමඃ** = නමස්කාර වේවා; **සඞ්ඝාය ච** = සඞ්ඝරත්නයට ද; **නමඃ** = නමස්කාර වේවා.

**භාවය:-** සියලු සංස්කාර ධර්ම අනිත්‍ය ය, දුඃඛ ය, අනාත්ම ය යි වදාරණ බුදුරජාණන් වහන්සේට ද, ධර්මයට ද, සඞ්ඝයාට ද මාගේ නමස්කාරය වේවා.

**විස්තර:-** **ප්‍රවාදිනෙ** = 'ප්‍රවාදින්' ශබ්ද චතුර්ථ්‍යෙක වචන යි. ප්‍රකර්ෂේණ වදති ශීලෙනෙති ප්‍රවාදී, තස්‍ය." ප්‍ර පූර්ව 'වද වචනෙ' ධාතු යි. තාච්ඡීල්‍යයෙහි 'ණිනි' ප්‍රත්‍යය යි.

**බුද්ධාය, ධර්මාය, සඞ්ඝාය** = 'නමස්' නිපාත යොගයෙහි චතුර්ථී යි.

**වෘත්තය:-** අනුෂ්ටුප් ඡන්දසට අයත් පථ්‍යාවක්ත්‍ර යි. **යුජොර්ජෙන සරිද්භර්තුඃ පථ්‍යාවක්ත්‍රං ප්‍රකීර්තිතම්** = සම පාදයන්හි අකුරු සතරකින් පර ව ජගණය යෙදීමෙන් **පථ්‍යාවක්ත්‍ර** වෘත්තය වේ. විෂම පාදයන්හි අකුරු සතරකින් පර ව යගණය යෙදිය යුතු ය. පාද සතරෙහි ම ප්‍රථමාක්ෂර යෙන් පර ව නගණ, සගණ නො යෙදිය යුතු ය.

16\. **භො වීතරාග භගවංස්තවපාදමෙව**
**වන්දෙ මුනීන්ද්‍ර මුහුරෙවමිමං ප්‍රවන්දෙ,**
**භූයඃ පුනඃ පුනරිමං පුරතඃ පරස්තාත්**
**පාර්ශ්වද්වයොරුපරි දික්ෂු විදික්ෂු වන්දෙ.**

**පදාර්ථ:-** **වීතරාග** = පහ වූ රාග ඇති; **භො භගවන්** = පින්වත් වූ සර්වඥයන් වහන්ස; **තව** = තුඹවහන්සේගේ; **පාදමෙව** = ශ්‍රීපාදය ම; **වන්දෙ** = වදිමි; **මුනීන්ද්‍ර** = මුනිශ්‍රෙෂ්ඨ වූ තථාගතයන් වහන්ස; **එවම්** = මෙසේ ම; **මුහුඃ** = කෙණෙහි කෙණෙහි; **ඉමම්** = මේ ශ්‍රීපාදය ම; **ප්‍රවන්දෙ** = සකසා වදිමි. **භූයඃ** = බොහෝ සේ; **පුනඃ පුනඃ** = නැවත නැවතත්; **පුරතඃ** = ඉදිරි

යෙහි ද; **පරස්තාත්** = පස්සෙහි ද; **පාර්ශවද්වයෝඃ** = දෑලයෙහි ද; **උපරි** = මත්තෙහි ද; **දික්ෂු** = සතර දිශාවෙහි ද; **විදික්ෂු** = සතර අනුදිශාවෙහි ද; **ඉමම්** = මේ ශ්‍රීපාදය ම; **වන්දේ** = වදිමි.

**භාවය**:- වීතරාග වූ පින්වත් බුදුරජාණන් වහන්ස, මම ඔබ වහන්සේගේ ශ්‍රීපාදය ම වදිමි. ඇසිල්ලක් පාසා වදිමි. මනා කොට වදිමි. නැවත නැවතත් බොහෝ සේ ඉදිරියෙහි ද, පස්සෙහි ද, දෑලයෙහි ද, මත්තෙහි ද, සතර දිශාවෙහි ද, සතර අනුදිශාවෙහි ද ඔබ ශ්‍රීපාදය ම වදිමි.

**විස්තර**:- මම කවර දිශාවකට හැරුණත් නිතර ම ඔබ වහන්සේගේ ශ්‍රීපාදය ම වදිමි යි කී නියා යි.

**පාර්ශවද්වයෝඃ** = දෙපසෙහි: 'පාර්ශවද්වි' ශබ්ද සප්තමී ද්විවචන යි. ''පාර්ශවානාං ද්වෞ පාර්ශවද්වෞ, තයෝඃ.'' ෂෂ්ඨී තත්පුරුෂ යි.

**දික්ෂු, විදික්ෂු** = 'දිශ්, විදිශ්' ශබ්ද සප්තමී බහුවචන යි. දිග් වාචි 'දිශ්' ශබ්දයෙක් ද, 'දිශා' ශබ්දයෙක් ද වෙයි.

**වෘත්තය**:- ශක්වරී ඡන්දසට අයත් වසන්තතිලකා යි. **උක්තා වසන්ත තිලකා තභජා ජගෞ ගඃ** = තගණ, භගණ, ජගණ, ජගණ යන ගණවලින් හා ගුරු දෙකකින් ද යුක්ත වූ වෘත්තය **වසන්ත තිලකා** යි.

**17. ගතමිහ භවතා පථා ච යෙන**
**ස්ථිතමපි යත්‍ර ච යත්‍ර වා නිෂණ්ණම්,**
**ශයිතමපි මුනීන්ද්‍ර යත්‍ර යෝගාත්**
**තදපි ශතං ප්‍රණමාමි පුණ්‍යතීර්ථම්.**

**පදාර්ථ**:- **මුනීන්ද්‍ර** = මුනිරාජ වූ සර්වඥයන් වහන්ස; **භවතා** = පූජ්‍ය වූ ඔබ වහන්සේ විසින්; **ඉහ** = මේ ලොකයෙහි; **යෙන පථා** - යම් මඟෙකින්; **ගතඤ්ච** = වඩනා ලද ද; **යත්‍ර වා** = යම් තැනෙක්හි; **ස්ථිතමපි** = වැඩ සිටිනා ලද ද; **යත්‍ර වා** = යම් තැනෙක්හි; **නිෂණ්ණං** = වැඩ හිඳිනා ලද ද; **යත්‍ර** = යම් තැනෙක්හි; **යෝගාත්** = සමාධියෙන්; **ශයිතමපි** = සැතපෙන ලද ද; **තත් පුණ්‍යතීර්ථම් අපි** = ඒ පවිත්‍ර වූ සිද්ධස්ථාන ද; **ශතම් ප්‍රණමාමි** = සියක් වර වදිමි.

**භාවය**:- මුනීන්ද්‍රයන් වහන්ස, පුණ්‍යතීර්ථස්ථාන වූ ඔබ වහන්සේ වැඩම කළ මාර්ග ද, වැඩ සිටි තැන් ද, වැඩ හුන් තැන් ද, සමාධියෙන් සැතපුනු තැන් ද මම සියක් වර වදිමි.

**විස්තර:-** බුදුරජාණන් වහන්සේ ස්පර්ශ කළ සියලු ම ස්ථාන පුණ්‍ය තීර්ථ බව මෙයින් කීහ. පුණ්‍යතීර්ථ නම් පින් වැඩෙන පවිත්‍ර ස්ථාන යි.

**ගතම්, ස්ථිතම්, නිෂණ්ණම්, ශයිතම්** = පිළිවෙළින් "ගමෟ ගතෞ, ෂ්ඨා ගතිනිවෘත්තෞ, ෂදෟ විශරණගත්‍යවසාදනෙෂු, ශීඞ් ස්වප්නෙ" යන ධාතුවලින් නිපන් භාව කෘදන්ත යි. යෑම, සිටීම, හිඳීම, නිදීම යන අර්ථ යි.

**පථා** = 'පථින්' ශබ්ද තෘතියෛක වචන යි "පන්ථාඃ, පන්ථානෞ, පන්ථානඃ; පන්ථානම්, පන්ථානෞ, පථඃ" යනාදීන් වරනැගේ.

**යොගාත්** = හෙත්වර්ථයෙහි පඤ්චමී යි. මෙහි 'යොග' නම් සමාධිය යි. බුදුරජාණන් වහන්සේගේ නිදීම නම් සමාධිගත ව වැඩ හිඳීම යි.

**ප්‍රණමාමි** = ප්‍ර පූර්ව 'ණමු ප්‍රහ්වත්වෙ ශබ්දෙ ච' ලට්, උ. එකවචන යි.

**වෘත්තය:-** මෙයත්, මීලඟ පද්‍යයත් පුෂ්පිතාග්‍රා යි.

18. **සමජනි භගවාන් ස්වයං සම යස්මින්**
**සකලමබොධි ච යත්‍ර ධර්මචක්‍රම්,**
**විශදතරමදීපි යත්‍ර යස්මින්**
**නමෘතමපූරි තදප්‍යහං නමාමි.**

**පදාර්ථ:-** **භගවාන්** = ඒ භාග්‍යවත් වූ සම්‍යක් සම්බුද්ධ තෙමේ; **යස්මින්** = යම් තැනෙක්හි; **සමජනි සම** = උපන්නේ ද; **තදපි** = ඒ කපිලවාස්තු පුරයෙහි ලුම්බිනී වනොද්‍යානය ද; **යත්‍ර** = යම් තැනෙක්හි; **සකලම්** = ත්‍රෛලොක්‍ය වර්ති වූ සර්වධර්මයන්; **ස්වයම්** = තෙමේ ම; **අබොධි ච** = අවබොධ කෙළේ ද; **තදපි** = ඒ මහාබොධි මූලය ද; **යත්‍ර** = යම් තැනෙක්හි; **විශදතරම්** = අතිශයින් නිර්මල වූ; **ධර්මචක්‍රම්** = දම්සක් පැවතුම් සූත්‍රය; **අදීපි** = ප්‍රකාශ කෙළේ ද; **තදපි** = ඒ බරණැස් නුවර ඉසිපතනාරාමය ද; **යස්මින්** = යම් තැනෙක්හි; **අමෘතමපූරි** = නිරුපධිශෙෂ නිර්වාණ ධාතුව සම්පූර්ණ කෙළේ ද; **තදපි** = ඒ කුසිනාරා නුවර ශාලවනොද්‍යානය ද; **අහම්** = මම; **නමාමි** = නමස්කාර කෙරෙමි.

**භාවය:-** භාග්‍යවතුන් වහන්සේ ඉපිද වදාළ කිඹුල්වත් නුවර ලුම්බිනී සල් උයන ද, බුදු වී වදාළ බුද්ධගයාවෙහි මහබෝ මැඩ ද,

දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කොට වදාළ බරණැස් නුවර ඉසිපතනාරාමය ද, පිරිණිවන් පෑ වදාළ කුසිනාරා නුවර මල්ලයන්ගේ සල් උයන ද මම වඳිමි.

**විස්තර:-** මෙයින් බුද්ධරජාණන් වහන්සේ පිළිබඳ ප්‍රධාන මඞ්ගල කරුණු සිදු වූ ස්ථාන දැක්වූහ.

**සමජනි, අබොධි, අදිපි, අපූරි** = පිළිවෙළින් 'සම්' පූර්ව "ජනී ප්‍රාදුර්භාවෙ, බුධ බොධනෙ, දීපි දීප්‍යෞ, පූරි ආප්‍යායනෙ" යන ධාතුවලින් නිපන් ලුඞ් ආත්මනෙපද ප්‍ර. එකවචන යි. මෙහි 'සම' යන නිපාතය නිරර්ථක ය. එය වර්තමාන කාලික ක්‍රියාවක් සමග යෙදුන හොත් (භවති සම = වූයේ ය, ගච්ඡති සම= ගියේ ය යනාදි වශයෙන්) අතීතාර්ථයක් ගෙණ දෙයි එහෙත් මෙහි යෙදුනු ක්‍රියා අතීත කාලික ම බැවින් මේ 'සම' යන්න ශ්ලොක පාදය පිරීම සඳහා යෙදුනකැයි සිතිය හැකි ය.

19. **සර්වඥවක්ත්‍රසරසිරුහ රාජහංසං**
**කුන්දෙන්දුසුන්දරරුචිං සුරවෘන්දවන්ද්‍යම්,**
**සද්ධර්මචක්‍රසහජං ජනපාරිජාතං**
**ශ්‍රීදන්තධාතුමමලං ප්‍රණමාමි භක්ත්‍යා.**

**පදාර්ථ:- සර්වඥ** = සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ; **වක්ත්‍රසරසිරුහ** = ශ්‍රී මුඛ පද්මයට; **රාජහංසං** = හංස රාජයකු වැනි වූ; **කුන්දෙන්දු** = කොඳ සඳ පැහැයක් මෙන්; **සුන්දර** = සොඳුරු වූ; **රුචිම්** = ශොභා ඇති; **සුරවෘන්ද** = බ්‍රහ්ම විෂ්ණු මහෙශ්වරාදි දිව්‍ය සමූහයා විසින්; **වන්ද්‍යම්** = නමස්කාර කට යුතු වූ; **සද්ධර්මචක්‍ර සහජං** = සුවාසූ දහසක් ධර්මස්කන්ධයට සහෝදර වූ; **ජනපාරිජාතම්** = උපාසක ජනයාට කල්ප වෘක්ෂයක් බඳු වූ; **අමලං** = නිර්මල වූ; **ශ්‍රී දන්තධාතුම්** = ශ්‍රීමත් දන්ත ධාතූන් වහන්සේ; **භක්ත්‍යා** = ආදරයෙන්; **ප්‍රණමාමි** = වඳිමි.

**භාවය:-** සර්වඥයන් වහන්සේගේ ශ්‍රී මුඛ පද්මයට හංස රාජයකු වැනි, කොඳ පැහැයට හා සඳ පැහැයට බඳු මනහර ශොභා ඇති, දිව්‍ය සමූහයා විසින් වැන්ද යුතු වූ, ධර්මස්කන්ධයට සහෝදර වූ, මහාජනයාට කල්ප වෘක්ෂයක් බඳු ශ්‍රීමද් දන්ත ධාතූන් වහන්සේ මම ආදරයෙන් වඳිමි.

**විස්තර:- සර්වඥවක්ත්‍ර සරසිරුහ රාජහංසම්** = "හංසානාං රාජා රාජහංසඃ, වක්ත්‍රමෙව සරසිරුහං වක්ත්‍රසරසිරුහම්, සර්වඥස්‍ය වක්ත්‍ර සරසිරුහං සර්වඥවක්ත්‍ර සරසිරුහම්, තස්‍ය රාජහංස ඉව

සම්ඥවක්ත්‍ර සරසීරුහරාජහංසඃ, නම්." කර්මධාරය, තත්පුරුෂ ගර්භ කර්මධාරය යි. හංසයන් කරණ කොට ගෙණ පියුම් ශොභාවත් වෙයි. බුදුරදුන්ගේ මුහුණ පියුමෙකි. දන්ත ධාතුව ඒ පියුම ශොභාවත් කරණ හංස රාජයෙකි. දළදාවෙන් බුදුරදුන්ගේ මුහුණ දීප්තිමත් වූ බව මෙයින් කීහ.

**කුන්දෙන්දු සුන්දර රුචිම්** = "සුන්දරී ච සා රුචිශ්චෙති සුන්දර රුචිඃ, කුන්දශ්ච ඉන්දුශ්ච කුන්දෙන්දවඃ, තෙෂාමිව සුන්දර රුචිර්‍යස්‍ය ස කුන්දෙන්දුසුන්දරරුචිඃ, නම්." කර්මධාරය, අන්‍ය ගර්භ ෂෂ්ඨී බහුව්‍රීහි යි. මෙයින් දළදාවෙහි වර්ණය දැක්වූහ. කොඳමල් හා චන්ද්‍රයා සුදු ය. එසෙයින් ම දන්ත ධාතුන් වහන්සේ ද ශුභ්‍ර වර්ණයෙන් බබලත්.

**සුරවෘන්දවන්ද්‍යම්** = "සුරාණාං වෘන්දානි සුරවෘන්දානි, තෛර්වන්ද්‍යඃ සුරවෘන්දවන්ද්‍යඃ, නම්." තත්පුරුෂ ගර්භ තෘතීයා තත්පුරුෂ යි. දන්ත ධාතුන් වහන්සේ සියලු සත්වයන් විසින් වැන්ද යුතු බව මෙයින් දැක්වේ. මෙහි 'සුර' ශබ්දයෙන් බ්‍රහ්මයෝ ද ගැණෙති. ප්‍රධාන දෙවිවරු බ්‍රහ්මයෝ ය. එහෙයින් ම **සුරප්‍රධානෛඃ පරිධාර්‍යමාණො දේහාංශුජාලෛරනුරඤ්ජයංස්තාන්** යි ශ්‍රීමද් අශ්වඝොෂයෝ කීහ. එහි 'සුරප්‍රධාන' නම් බ්‍රහ්මයෝ යි. දිව්‍යබ්‍රහ්මයන් විසින් වැන්ද යුතු නම් අවශෙෂ සත්වයන් විසින් වැන්ද යුතු බව නො කිවමනා ය.

**සද්ධර්මචක්‍ර සහජම්** = "සද්ධර්මස්‍ය චක්‍රං සද්ධර්මචක්‍රම්, තෙන සහ ජාතඃ සද්ධර්මචක්‍රසහජඃ, නම්." තත්පුරුෂ ගර්භ තෘතීයා තත්පුරුෂ යි. මෙහි 'චක්‍ර' ශබ්දය සමූහාර්ථයෙහි ය. ධර්ම සමූහය බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් නිකුත් වූහ. දළදාව නිකුත් වූයේ ද එයිනි. එහෙයින් ශ්‍රී සද්ධර්මයත්, දළදාවත් සහෝදරයෝ ය.

**ජනපාරිජාතම්** = "ජනස්‍ය පාරිජාත ඉව ජනපාරිජාතඃ, නම්." කර්මධාරය යි. 'පාරිජාත' (= කප් රුක) නම් දෙව්ලොව ඇතැයි සැලකෙන සිතූ පැතූ දෑ දෙන රුකෙකි. දන්ත ධාතුන් වහන්සේ ද ගරු බුහුමන් පුද සැලකිලි කළවුන්ට සිතූ පැතූ දෑ දෙති. එබැවින් මහාජනයාට කප් රුකක් වැනි ය.

**ශ්‍රී දන්තධාතුම්** = "දන්ත එව ධාතු දන්තධාතුඃ, ශ්‍රීමාංශ්ච ස දන්තධාතුශ්චෙති ශ්‍රී දන්තධාතුඃ, නම්."

කර්මධාරය ගර්භ කර්මධාරය යි. කෝට්ටේ නගරයෙහි ගොඩ නගනලද තුන්මහල් දළදා මාලිගයෙහි දන්ත ධාතූන් වහන්සේ එකල වැඩ සිටියහ. "වඩු දළදා හිමි තෙමහල් පහය රැඳි" යන සැළලිහිණි සන්දෙස පාඨයෙන් ඒ බව හැඟේ.

**වෘත්තය** = මෙයත්, මීලඟ පද්‍ය දෙකත් වසන්ත තිලකා යි.

20. **නාගාලයොපරිධරාලය චක්‍රවාල**
**මූර්ධනි ත්‍රිකූටගතකාඤ්චන ශෛලශෘඞ්ග,**
**බොධිද්‍රුමූල නිහිතාක්ෂය ධාතුබිම්බං**
**බිභ්‍රන් නමාමි ශිරසා ජිනචෛත්‍යමග්‍රම්.**

**පදාර්ථ:-** **නාගාලයොපරි** = නාග භවන මත්තෙහි පිහිටි; **ධරාලය** = භූමි තලය සම්බන්ධ වූ; **චක්‍රවාලමූර්ධනි** = සක්වලගල මත් තෙහි; **ත්‍රිකූටගත** = ත්‍රිකූට පර්වත මස්තකයෙහි පිහිටි; **කාඤ්චන ශෛල ශෘඞ්ග** = මහාමේරු පර්වත ශිඛරයෙහි; **බොධිද්‍රුමූල** = බෝධි වෘක්ෂ මූල සමීප ගත වූ වජ්‍රාසනයෙහි; **නිහිත** = පිහිටුවන ලද; **අක්ෂය ධාතු බිම්බම්** = පන් දහසක් හවුරුදු මුළුල්ලෙහි ක්ෂය නො වන්නා වූ ශාරීරික ධාතූන් වහන්සේ හා බුද්ධ ප්‍රතිමාවන්; **බිභ්‍රන්** = උසුලන්නාවූ; **අග්‍රම්** = උතුම් වූ; **ජින චෛත්‍යම්** = සර්වඥ චෛත්‍යය; **නමාමි** = වදිමි.

**භාවය:-** නාලොව මුදුනෙහි සක්වළගල මතුයෙහි ත්‍රිකූට පර්වතයෙහි මහමෙර මත පිහිටි බෝමුල විදුරසුන්හි පිහිටුවන ලද ක්ෂය නො වන ධාතු ශරීරය දරණ උතුම් බුදු පිළිමය මම වදිමි.

**විස්තර:-** මෙයින් දඹදිව බුද්ධගයාවෙහි මහබෝමැඩ පිහිටි බුද්ධ ප්‍රතිමාවට නමස්කාර කෙරෙයි. මහාබෝධිය පිහිටි තැන විස්තර වශයෙන් මෙහි දැක්වේ. මහාබෝධිය පිහිටියේ මහමෙර මුදුනෙහි ය. මහමෙර පිහිටියේ ලිග්ගල් ගෙඩි තුණක් මෙන් සිටි ත්‍රිකූට පර්වත මස්තකයෙහි ය. ත්‍රිකූට පර්වත පිහිටියේ සක්වළ ගල මතුයෙහි ය. ඒ සියල්ලට ම යටින් නාලොව පිහිටියේ ය. මේ මෙහි දැක්වෙන අයුරු යි. මෙහි 'මහමෙර' නම් මහපොළොව යි.

**ධරාලය චක්‍රවාල මූර්ධනි** = "ධරාලයස්‍ය චක්‍රවාලඃ ධරාලය චක්‍රවාලඃ, තස්‍ය මූර්ධා ධරාලයචක්‍රවාලමූර්ධා, තස්මින්," තත්පුරුෂ ගර්භ තත්පුරුෂ යි.

**ත්‍රිකූටගත කාඤ්චන ශෛලශෘඞ්ග** = ත්‍රීණි කූටානි යස්‍ය ස ත්‍රිකූටඃ, ත්‍රිකූටං ගතං ත්‍රිකූටගතම්, කාඤ්චනඤ්ච තත් ශෛලඤ්චෙති කාඤ්චනශෛලම්, ත්‍රිකූටගතඤ්ච තත් කාඤ්චනශෛලඤ්චෙති ත්‍රිකූටගතකාඤ්චනශෛලම්, තස්‍ය ශෘඞ්ගං ත්‍රිකූටගතකාඤ්චන ශෛල ශෘඞ්ගම්, තස්මින්." කර්මධාරය ගර්භ ෂෂ්ඨී තත්පුරුෂ යි.

**බොධිද්‍රුමූල නිහිතාක්‍ෂය ධාතුබිම්බම්** = "බොධිශ්ච ස ද්‍රුශ්චෙති බොධිද්‍රුඃ, තස්‍ය මූලං බොධිද්‍රුමූලම්, තස්මින් නිහිතං බොධිද්‍රුමූල නිහිතම්, අක්‍ෂයාශ්ච තෙ ධාතවශ්චෙති = අක්‍ෂය ධාතවඃ, තෙෂාං බිම්බම් අක්‍ෂය ධාතුබිම්බම්, බොධිද්‍රුමූල නිහිතඤ්ච තද් අක්‍ෂය ධාතු බිම්බඤ්චෙති බොධිද්‍රුමූලනිහිතාක්‍ෂය ධාතුබිම්බම්, තත්." බෝමැඩ වූ බුද්ධ ප්‍රතිමාවෙහි මහාර්ඝ සර්වඥ ධාතු තැන්පත් කොට තිබෙන බව මෙයින් දක්වේ. වෘක්‍ෂවාචි ද්‍රු' ශබ්දයෙක් ද, 'ද්‍රුම' ශබ්දයෙක් ද වෙයි එයින් මෙහි ද්‍රු' ශබ්දය යි.

**බිභ්‍රත්** = ඩු භෘඤ් ධාරණ පොෂණයොඃ' ධාතු යි. වර්තමාන කෘදන්ත යි.

21. **හෛමාලවාලවලයාන්තර රත්නවෙදි**
**වජ්‍රාසනොල්ලසිතමූලමගෙන්ද්‍රබොධිම්,**
**යං ප්‍රාප්‍ය මාරවිජයානුපදං ප්‍රපෙදෙ**
**සර්වඥතාං ස භගවාංස්තමහං නමාමි.**

**පදාර්ථ:-** **සඃ භගවාන්** = ඒ සර්වඥ තෙමේ; **යං ප්‍රාප්‍ය** = යම් බොධි මූල සමීපයකට පැමිණ; **මාරවිජය** = දිව්‍යපුත්‍ර මාරයා අභිභවනය කිරීමට; **අනුපදම්** = ඉක්බිති ව; **සර්වඥතාං** = සර්වඥ බවට; **ප්‍රපෙදෙ** = පැමිණියේ ද; **හෛමාලවාලවලයාන්තර** = සවර්ණමය වූ තෝතැනි මඬුලු අතුරෙහි පිහිටි; **රත්නවෙදි** = මැණික්මුවා පිල්කඩ ඇති; **වජ්‍රාසන** = විදුරස්නෙන්; **උල්ලසිත** = සෙවුනා ලද; **මූලම්** = මුල් ඇති; **තං අගෙන්ද්‍ර බොධිං** = ඒ වෘක්‍ෂරාජ වූ බොධීන් වහන්සේ; **අහම්** = මම; **නමාමි** = වඳිමි.

**භාවය:-** සර්වඥයන් වහන්සේ යම් බෝමූලක දී පස් මරුන් දිනා බුදුබවට පැමිණි සේක් ද, රන්මුවා තෝතැනි මඬුල්ල අතර මැණික්මුවා පිල්කඩෙහි පිහිටි විදුරස්නෙන් බබලන වෘක්‍ෂරාජ වූ ඒ බෝධීන් වහන්සේ මම වඳිමි.

විස්තර:- දඹදිව බුද්ධගයාවෙහි පිහිටි ශ්‍රී මහාබෝධියට මෙසින් නමස්කාර කෙරෙයි.

**හෛමාලවාලවලයානතර රත්නවෙදිවජ්‍රාසනොල්ලසිත මූලම්** = හෙම්නා නිර්‍මිතං හෛමම්, "හෛමඤ්ච තද් ආලවාලඤ්චෙති හෛමාලවාලම්, තස්‍ය වලයං හෛමාලවාල වලයම්, තස්‍ය අනතරං හෛමාලවාලවලයානතරම්, රත්නෛර් නිර්‍මිතා වෙදීරත්නවෙදිඃ, වජ්‍රේණ නිර්‍මිතම් ආසනං වජ්‍රාසනම්, හෛමාලවාලවලයානතර රත්නවෙද්‍යාං වජ්‍රාසනං හෛමාලවාලවලයානතර රත්නවෙදිවජ්‍රාසනම්, තෙන උල්ල සිතං මූලං යස්‍ය ස හෛමාලවාලවලයානතර රත්නවෙදි වජ්‍රාසනොල්ලසිත මූලඃ, තම්." දීඝී වූ ෂෂ්ඨි බහුව්‍රීහි සමාස යෙකි. ගර්භ සමාස විග්‍රහ යි. මෙහි "උල්ලසිතම්" යනු 'උද්' පූර්‍ව'ලස කානෙතෟ' ධාතුවෙන් නිපන් 'ක්ත' ප්‍රත්‍යයානත වර්‍තමාන කෘදනත යි. 'ආලවාල' නම් තෝතැන්න යි. හෙවත් දිය රඳා සිටීම පිණිස ගස වටේ සාදන ලද පහත් බිම් පෙදෙස යි. ශ්‍රී මහාබොධිය වටේ වූ තෝතැන්න රණින් නිමවන ලද්දෙකි. බෝසතුන්ට බුදු වීම සඳහා වැඩ හිඳීමට පහල වූ වජ්‍රාසනය ඒ තෝතැනි වලල්ල අතරෙහි වෙයි. එයින් බෝමුල බබලයි.

**අගෙන්ද්‍ර බොධිම්** = අගානාම් ඉන්ද්‍රඃ = අගෙන්ද්‍රඃ, අගෙන්ද්‍රශ්ච ස බොධිශ්චෙති = අගෙන්ද්‍රබොධිඃ තම්." තත්පුරුෂ ගර්භ කර්මධාරය යි මහාබෝධිය සියලු වෘක්‍ෂයන්ට ප්‍රධාන ය.

**ප්‍රාප්‍ය** = ප්‍ර පූර්‍ව 'ආපෘ ව්‍යාප්තෞ' ධාතු යි. පූර්‍ව ක්‍රියා යි.

**මාරවිජයානුපදම්** = මාරාණාං විජයො මාරවිජයඃ, පදමනතික්‍රම්‍ය = අනුපදම්, මාරවිජයාදනුපදං මාරවිජයානු පදම්." තත්පුරුෂ, අව්‍යයීභාව ගර්භ පඤ්චමී තත්පුරුෂ යි. මෙහි 'මාර' යන්නට 'දිව්‍යපුත්‍ර මාරයා' යි සන්නයෙහි අර්ථ කී නමුත් එයින් පස් මරහු ම ගැණෙති. ක්ලෙශමාර, ස්කන්ධමාර, අභිසංස්කාර මාර, මෘත්‍යුමාර, දිව්‍යපුත්‍ර මාර යන පස් මරුන් ම දිනා බෝසත්හු බුදුබවට පැමිණියහ.

**ප්‍රපෙදෙ** = ප්‍ර පූර්‍ව 'පද් ගතෞ' පරොක්‍ෂ ලිට් ආ. ප්‍ර. එකවචන යි. 'පද්' ධාතුව 'වි' පූර්‍ව වූ කල්හි විනාශයට, මරණයට පැමිණීම ප්‍රකාශ කෙරෙයි.

22. මූර්ධන් බුද්ධං නම ත්වං ශ්‍රවණ ශෘණු සදා
ධර්මමද්වෛධවාදි
ප්‍රෝක්තං සර්වඥරූපං නයන නිරූපමං
පශ්‍ය ජිඝ්‍රාඞ්ඝ්‍රිපද්මම්,
ඝ්‍රාණ ත්වං චාර්කබන්ධෝඃ ස්තුහි සඛි රසනෙ
ශ්‍රීඝනං පූජයෙථාඃ
සිද්ධං පාණෙ ව්‍රජාංඝ්‍රෙ ජිනසදන
මදස්සද්ගුණං චිත්ත චින්ත.

**පදාර්ථ:-** **මූර්ධන්** = (එම්බා මාගේ) හිස; **ත්වං** = තෝ; **බුද්ධං** = බුදුන්; **නම** = වඳු; **ශ්‍රවණ** = කණ; **ත්වං** = තෝ; **අද්වෛධවාදි ප්‍රෝක්තම්** = බුදුන් විසින් වදාරණ ලද; **ධර්මං** = ත්‍රිපිටක ධර්මය; **සදා** = හැම කල්හි; **ශෘණු** = අස; **නයන** = ඇස; **ත්වං** = තෝ; **නිරූපමං** = උපමා විෂයාතික්‍රාන්ත වූ; **සර්වඥරූපං** = සර්වඥයන් වහන්සේගේ මනොඥ වූ රූපය; **පශ්‍ය** = බල; **ඝ්‍රාණ** = නාසය; **ත්වං ච** = තෝ ද; **අර්කබන්ධෝඃ** = බුදුරජහුගේ; **අංඝ්‍රිපද්මම්** = පාපියුම; **ජිඝ්‍ර** = ඉඹූ; **සඛි රසනෙ** = එම්බා යෙහෙළි වූ දිව; **ශ්‍රීඝනම්** = බුදුන්ට; **ස්තුහි** = ස්තොත්‍ර කර; **පාණෙ** = හස්තය; **ත්වං** = තෝ; **සිද්ධම්** = බුදුන්ට; **පූජයේථාඃ** = පුෂ්පාදියෙන් පූජා කර; **අංඝ්‍රෙ** = පාදය; **ත්වං** = තෝ; **ජිනසදනං** = බුදුන් වැඩ හිඳිනා තැනට; **ව්‍රජ** = යව; **චිත්ත** = පින්වත් වූ චිත්තය; **ත්වං** = තෝ; **අදස් සද්ගුණම්** = මේ බුදුන්ගේ නව අරහාදි සත්ගුණ; **චින්ත** = සිත.

**භාවය:-** එම්බා හිස, තෝ බුදුන් වඳු, එම්බා කණ, තෝ බුදු දහම් අස, එම්බා ඇස, තෝ බුදුරුව බල, එම්බා නැහැය, තෝ බුදුන්ගේ පා පියුම් සිඹු, එම්බා දිව, තෝ බුදුන්ට ස්තුති කර, එම්බා අත, තෝ බුදුන් පුද. එම්බා පය, තෝ බුදුන් වෙත යව. එම්බා සිත, තෝ බුදුගුණ සිත.

**විස්තර:-** මෙසින් ශ්‍රීමච්චන්ද්‍රභාරතීහු ස්වකීය අවයවයන් අමතා ඒ ඒ අවයවය විසින් බුදුරදුන්ට කළ හැකි සැලකිලි කරන්නට විධාන කළහ. හිසින් කළ හැක්කේ වැඳීම ය. එබැවින් බුදුන් වඳින්නට හිස මෙහෙයූහ. කණින් කළ හැක්කේ ඇසීම ය. එබැවින් බණ අසන්නට කණ මෙහෙයූහ. එපරිද්දෙනි.

**නම, ශෘණු, පශ්‍ය, ජිඝ්‍ර, ස්තුහි, ව්‍රජ, චින්ත** = පිළිවෙළින් "නමු ප්‍රහ්වත්වේ ශබ්දෙ ච, ශ්‍රු ශ්‍රවණෙ, දෘශිර්

ප්‍රෙක්ෂණේ, ඝ්‍රා ගන්ධොපාදානෙ, ෂ්ටුඤ් ස්තුතෞ, ව්‍රජ ගතෞ, චිති චින්තායාං" ධාතු ආශීඃප්‍රේරණ ලොට් ප. ම. එකවචන යි. 'දෘශිර්, ඝ්‍රා' දෙකට 'පශ්‍ය, ජිඝ්‍ර' ආදෙශ යි.

**අද්වෛධවාදි ප්‍රොක්තම්** = "ද්විප්‍රකාරෙණ ද්වෛධා, ද්වෛධා භාවං ද්වෛධං. න ද්වෛධම් අද්වෛධම්, අද්වෛධං වදති ශීලෙනෙති = අද්වෛධවාදී. තෙන ප්‍රොක්තඃ = අද්වෛධවාදි ප්‍රොක්තඃ, තම්." තෘතීයා තත්පුරුෂ යි.

**ප්‍ර + උක්තඃ = ප්‍රොක්තඃ** = ප්‍ර පූර්ව 'වද් වචනෙ' ධාතු යි. 'ක්ත' ප්‍රත්‍යයාන්ත අතීත කෘදන්ත යි. ඒකාන්ත සත්‍යවාදී බැවින් දෙවැදෑරුම් කථාවෙක් බුදුරදුන්ට නැත. එහෙයින් උන්වහන්සේ "අද්වෛධවාදීන්" නම් වෙති.

**අඞ්ඝ්‍රිපද්මම්** = "අඞ්ඝ්‍රිරෙව පද්මම් අඞ්ඝ්‍රිපද්මම්, තද්." කම්ධාරය යි.

**අර්කබන්ධොඃ** = "අර්කස්‍ය බන්ධුඃ අර්කබන්ධුඃ, තස්‍ය." ෂෂ්ඨී තත්පුරුෂ යි. මෙයින් බුදුරදුන් සූර්‍යවංශික බව දැක්වූහ.

**පූජයෙථාඃ** = 'පූජ පූජායාම්' විධිලිඞ් ආ. ම. එක වචන යි.

**ජිනසදනම්** = "ජිනස්‍ය සදනං ජිනසදනම්, තද්." ෂෂ්ඨී තත්පුරුෂ යි. 'සදන' නම් වාස භවනය යි.

**වෘත්තය** = මෙයක් මීලඟ පද්‍ය දෙකත් ස්‍රග්ධරා යි.

23. **බුද්ධො ධර්මශ්ච සඞ්ඝස් ත්‍රිතයමිති මහානර්ඝරත්නං**
**මුමුක්ෂොර්**
**අද්‍යාරභ්‍යාහමෙභ්‍යස් ත්‍රිභවභයභිදෙ සංදදාම්‍යාත්මභාවම්,**
**එෂො'හං තත්පරඃ ස්‍යාම් පරමයනමිතො**
**නාස්ති මෙ සත්‍ය මෙතත්**
**ස්‍යාමස්‍යාභනන්තු ශිෂ්‍යස්ත්‍රිදශනුතමිදං**
**කොපිකාලො නමාමි.**

**පදාර්ථ**:- මුමුක්ෂොඃ = නිවන් දක්නා කැමති සත්ත්වයාට; **බුද්ධඃ** = සම්බුද්ධ ද; **ධර්මශ්ච** = නව ලොකොත්තර ධර්මය ද; **සඞ්ඝඃ ඉති** = අෂ්ටාර්‍යපුද්ගල සඞ්ඝයා ද යන; **ත්‍රිතයම්** = මේ වස්තු **තුණ**; **මහානර්ඝරත්නම්** = මාහැඟි රත්නයෙකි; **අහම්** = මම; **අද්‍ය ආරභ්‍ය**=අද පටන්; **එභ්‍යඃ**=මේ රත්නත්‍රයට; **ත්‍රිභවභයභිදෙ**= (කාමභවය රූපභවය අරූපභවය යන) භවත්‍රයෙහි; (ජාති ජරාදි) භය නසන පිණිස; **ආත්මභාවම්** = මේ පඤ්චස්කන්ධය; **සංදදාමි**= ආත්ම සන්නිර්‍යාතනය කොට දෙමි; **එෂඃ අහම්** = මේ මම;

**තත්පරඃ ස්‍යාම්** = ඒ රත්නත්‍රය උතුම් කොට ඇත්තෙමි; **මෙ** = මට; **ඉතඃ පරම්** = මේ රත්නත්‍රයෙන් අන්‍ය වූ; **අශරණං** = මාගීයෙක්; **නාස්ති** = නැති; **එතත්** = මේ; **සත්‍යම්** = සැබව; **අහනත්‍ර** = මම වනාහි; **අස්‍ය** = මේ තුණුරුවන්ගේ; **ශිෂ්‍යඃ ස්‍යාම්** = අතැවැසි වෙමි. **ත්‍රිදශ නුතම්** = දෙවියන් විසින් සතුති කරණ ලද; **ඉදං** = මේ රත්නත්‍රය; **කොටි ඝඃඨඃ** = කෙළ ගණන් වර; **නමාමි** = වඳිමි.

**භාවය**:- සසරින් මිදෙනු කැමැත්තහුට බුදු, දම්, සඟ යන තුණ මාහැඟි රුවන් ය. එහෙයින් මම අද පටන් තුන් බවයෙහි බිය නසනසුලු ඒ තුණුරුවනට මගේ අත්බව පවරා දෙමි. ඒ තුණුරුවන පරම කොට ඇත්තේ වෙමි. ඒ හැර මට අන් මඟෙක් නැත. මේ සැබව. මම මේ තුණුරුවනෙහි අතැවැස්සෙක් වෙමි. දෙවියන් විසින් පසසන ලද මේ තුණුරුවනට මම කෙළගණන් වර වඳිමි.

**විස්තර**:- මෙයින් චතුර්විධ ශරණ ගමනය දැක්වූහ. ආත්ම සන්නියාතන, තත්පරායණතා, ශිෂ්‍යභාවොපගමන, ප්‍රණිපාත ය යි ශරණගමන ක්‍රම සතරෙකි. "මම අද පටන් මාගේ ආත්මය තුණුරුවනට පුදමි" යි ආත්ම පරිත්‍යාගය කිරීම **ආත්මසන්නියාතනය** යි. "මම අද පටන් තුණුරුවන් පිහිට කොට ඇත්තේ වෙමි" යි රත්නත්‍රය පිහිට කොට ඇති බව **තත්පරායණතා** යි. "මම අද පටන් තුණුරුවනට අතැවැස්සෙක් වෙමි"යි ශිෂ්‍යභාවයට පැමිණීම **ශිෂ්‍යභාවොප ගමනය** යි. "මම අද පටන් රත්නත්‍රයට ම වැඳුම් පිදුම් සත්කාරාදිය කරමි" යි මෙසේ ඉතා යටත් පහත් බවට පැමිණීම **ප්‍රණිපාතය** යි. මෙහි "අද්‍යාරභ්‍යාහං සන්නද්‍රුම්‍යාත්ම භාවම්" යන්නෙන් ආත්මසන්නියාතනය ද, 'තත්පරඃ ස්‍යාම්"යි තත්පරායණතාව ද, "ස්‍යාමස්‍යාහනත්‍ර ශිෂ්‍යඃ" යි ශිෂ්‍යභාවොප ගමනය ද, "කොටිකෘත්වො නමාමි" යි ප්‍රණිපාතය ද දැක්වූහ.

**ත්‍රිතයම්** = "ත්‍රයාණාං සමූහඃ = ත්‍රිතයම්." 'ත්‍රි' ශබ්දයා කෙරෙන් 'තයච්' ප්‍රත්‍යය යි.

**මුමුක්ෂොඃ** = ඉච්ඡාර්ථ කෘදන්ත 'මුමුක්ෂු' ශබ්ද ෂෂ්ඨ්‍යෙක වචන යි.

**ආරභ්‍ය** = ආ පූර්ව 'රභ රාභස්‍යෙ' ධාතු යි. පූර්වක්‍රියා යි.

**ත්‍රිභව භය භිදෙ** = "ත්‍රයො භවාඃ සමාහෘතාඃ = ත්‍රිභවම්, ත්‍රිභවෙ භයං ත්‍රිභවභයම්, තද් භිනත්තීති ත්‍රිභවභයභිද්, තස්සෙම." 'ත්‍රිභවභය' ශබ්දෙප පද 'භිදිර් විදාරණෙ' ධාතුවෙන් නිපන් ක්විබන්ත යි.

**ස්‍යාම්** = 'අස් භුවි' විධිලිඞ් ප. උ. එකවචන යි.

**ත්‍රිදශ නුතම්** = "දශානාං ත්‍රයස්ත්‍රිදශාඃ, තෛර්නුතං ත්‍රිදශනුතම්, තත්." තත්පුරුෂ ගර්භ තත්පුරුෂ යි.

**කෝටිකෘත්වඃ** = "කෝටි වාරාන් ඉති කෝටිකෘත්වඃ." 'කෝටි' ශබ්දයා කෙරෙන් වාරාර්ථයෙහි 'කෘත්වසුච්' ප්‍රත්‍යය යි.

24. **නාහං ලාභාර්චනාර්ථී න ච භයචකිතො නාපි සත්කීර්තිකාමො**
**න ත්වං සූර්‍ය්‍යාංශුවංශප්‍රභව ඉති මුනෙ නාපි විද්‍යාශයා තෙ,**
**පාරම්පර්‍ය්‍යාන්න ච ත්වං ශරණමුපගතඃ කින්තු තෙ සාජ්ජන්‍යං**
**සම්‍යග්ඥානං සමීක්ෂ්‍ය ත්වයි භවජලධිං සන්තරීතුං ප්‍රවෘත්තඃ.**

**පදාර්ථ:-** **මුනෙ** = සර්වඥයන් වහන්ස; **අහම්** = මම; **ලාභාර්චනාර්ථී** = ලාභ සත්කාර කැමති ව; **ත්වම්** = තුඹවහන්සේ; **න ශරණං උපගතඃ** = සරණ කොට නො ගියෙමි; **භයචකිතශ්ච**=භයින් වෙවුලුම් ගෙණ ද; **න**=ශරණ ගත නො වෙමි; **සත්කීර්තිකාමො'පි** = යහපත් වූ කීර්ති කැමැති ව ද; **න** = ශරණ ගත නො වෙමි; **ත්වම්** = තුඹවහන්සේ; **සූර්‍ය්‍යාංශු වංශ ප්‍රභව ඉති** = සූර්‍ය්‍යවංශයෙහි උපන් සේකැයි සිතා ද; **න** = ශරණ ගත නො වෙමි; **තෙ** = තුඹවහන්සේගේ; **විද්‍යාශයාපි** = ශ්‍රැති ස්මෘති ව්‍යාකරණාදි වූ විද්‍යාවෙහි ආශාවෙන් ද; **න** = ශරණ ගත නො වෙමි; **පාරම්පර්‍ය්‍යාත් ච** = පිතෘ පිතාමහාදි භාවයෙන් ද; **න** = ශරණ ගත නො වෙමි; **කින්තු** = වැලි එකෙක් ඇති; **තෙ** = තුඹවහන්සේගේ; **සාජ්ජන්‍යං** = සජ්ජන හිත වූ කරුණාව ද; **සම්‍යග්ඥානං** = සම්‍යක් සම්බෝධි ඥානය ද; **සමීක්ෂ්‍ය** = බලා; **භවජලධිං** = සංසාර සාගරය; **සන්තරීතුං** = මනා කොට තරණය පිණිස; **ත්වයි** = තුඹවහන්සේ කෙරෙහි; **ප්‍රවෘත්තඃ** = (උපාසක භාවයෙන්) පැමිණියෙමි.

**භාවය:-** මුනීන්ද්‍රයන් වහන්ස, මම ලාභ සත්කාර බලාපොරොත්තු වෙන් වත්, බියෙන් තැති ගෙණ වත්, කීර්තිය කැමැත්තෙන් වත්, සූර්‍ය්‍යවංශයෙහි උපන් සේකැයි කියා වත්, විද්‍යාව ඉගෙණ ගණු කැමැත්තෙන් වත්, නැයෙකැයි සලකා වත්, ඔබවහන්සේ සරණ කොට නො ගියෙමි. හුදෙක් මුළු ලෝවැස්සා කෙරෙහි පතළ මහාකරුණාව ද, සර්වඥතාඥානය ද නුවණැසින් දැක සසරින් එතර වනු පිණිස ඔබ සරණ ගියෙමි.

විස්තර:- මෙහිත් සරණ පිහිටන හැටිත්, නො පිහිටන හැටිත් දක්වන ලදී. ඉහත සඳහන් චතුර්විධ ශරණ ගමනයෙන් ප්‍රණිපාතය චතුර්විධ ය. ඥාති, භය, ආචාර්‍ය්‍ය, දක්ෂිණාර්හ වශයෙනි. නෑකම් සලකා හෝ බියෙන් හෝ ආචාර්‍ය්‍යත්වය සලකා හෝ සරණ යැමෙන් සරණ නො පිහිටයි. දක්ෂිණාර්හ භාවය සලකා සරණ යැමෙන් ම සරණ පිහිටයි. ලාභාදි අපේක්ෂාවකින් හෝ උසස් කුලවතෙකැයි සලකා හෝ සරණ යැමෙන් සරණ නො පිහිටන බව මෙහි කීහ.

**ලාභාර්චනාර්ථී** = "ලාභාශ්චාර්චනානි ච ලාභාර්චනානි, තානි අර්ථයතීති ලාභාර්චනාර්ථී." ද්වන්ද්ව ගර්භ තද්ධිත යි.

**සර්වාංශුවංශප්‍රභවඃ** = "සර්වා අංශවො යස්‍ය ස සර්වාංශුඃ, තස්‍ය වංශඃ සර්වාංශුවංශඃ, තස්මින් ප්‍රභවො යස්‍ය ස සර්වාංශුවංශ ප්‍රභවඃ." බහුව්‍රීහි, තත්පුරුෂ ගර්භ ෂෂ්ඨී බහුව්‍රීහි යි 'සර්වාංශු' නම් හිරු යි.

**පාරම්පර්‍ය්‍යාත්** = "පරම්පරායා භාවඃ පාරම්පර්‍ය්‍යම්, තස්මාත්." භාවයෙහි 'යණ්' ප්‍රත්‍යයාන්ත තද්ධිත යි.

**සාර්වජන්‍යම්** = "සර්වජනස්‍ය හිතං සාර්වජන්‍යම්." හිතාර්ථයෙහි 'යණ්' ප්‍රත්‍යයාන්ත තද්ධිත යි. **සමීක්ෂ්‍ය** = 'සම්' පූර්ව ඊක්ෂ දර්ශනෙ' ධාතු යි. පූර්වක්‍රියා යි **සන්තරීතුම්** = 'සම්' පූර්ව 'තෘ ප්ලවන තරණයොඃ" ධාතු යි තුමන්ත ක්‍රියා යි. **ප්‍රවෘත්තඃ** = 'ප්‍ර' පූර්ව 'වෘතු වර්තනෙ' ධාතු යි. 'ක්ත' ප්‍රත්‍යයාන්ත අතීත කෘදන්ත යි.

25. **ත්වද් වෛරාග්‍ය සමස්තභූතකරුණා ප්‍රඥාදි නානාගුණස්**
**ඵූර්ජච්චන්දන පඞ්කසින්ධුපතිතො ගන්තුං ක්ෂමො නාන්‍යතඃ,**
**භූපා වා යදි දණ්ඩයන්ති විබුධා නින්දන්ති වා බාන්ධවා**
**මුඤ්චන්ති ක්ෂණමප්‍යහං ජිනපිතර් ජීවාමි න ත්වාං විනා.**

පදාර්ථ:- **ත්වද්** = තුඹවහන්සේගේ; **වෛරාග්‍ය** = වීතරාග බව ය; **සමස්තභූත කරුණා** = සියලු සත්වයන් කෙරෙහි පතළ කරුණාව ය, **ප්‍රඥාදි** = නිර්මල යොගිඥානය යන මේ ආදි වූ; **නානාගුණ** = නොයෙක් ගුණ නැමැති; **ස්ඵූර්ජත්** = සුවඳ විහිදෙන්නා වූ; **චන්දන පඞ්කසින්ධු** = සඳුන් කලල් සමුදුරෙහි; **පතිතඃ** = හුණුවා වූ මම; **අන්‍යතඃ** = අන් සමයකට; **ගන්තුං** = යන්නට; **න ක්ෂමඃ** = නො හැක්කෙමි; **යදි** = ඉදින්; **භූපාඃ** = මිථ්‍යා ලබ්ධි ගත් රජදරුවෝ; **දණ්ඩයන්ති වා** = බෞද්ධ වන්ට කාරණා කිම් දැයි දඩ ගසිත් නමුත්; **විබුධාඃ** = දුර්විදග්ධ පඬිවරු;

**නින්දන්ති වා** = නින්දා කෙරෙත් නමුත්; **බාන්ධවාඃ** = මාගේ බන්ධු ජනයෝ; **මුඤ්චන්ති** = වෙන් කොට හරිත් නමුත්; **පිතඃ** = මාගේ පිය වූ; **ජින** = පස් මරුන් දිනූ බුදුරජාණන් වහන්ස; **අහම්** = මම; **ත්වාං විනා** = නුඹවහන්සේ හැර; **ක්ෂණමපි** = ඇසිල්ලකුත්; **න ජීවාමි** = ජීවත් නො වෙමි.

**භාවය:-** ඔබවහන්සේගේ විරාග භාව ය, සියලු සතුන් කෙරෙහි පතළ මහා කරුණාව ය, නිර්මල ප්‍රඥාව ය යනාදි ප්‍රකට වූ නා නා ගුණයන්හි පැහැදුනු මම අන්‍යාගමකට යන්නට අසමර්ථ වෙමි. පස්මරුන් දිනූ බුදුපියාණන් වහන්ස, රජවරුන් දඩ ගණිතත්, පණ්ඩිතයන් නින්දා කරතත්, නෑදෑයන් මා අත් හැර දමතත් ඔබගෙන් වෙන් ව මොහොතකුදු මම ජීවත් නො වෙමි.

**විස්තර:-** **ත්වද්වෛරාග්‍ය සමස්තභූත කරුණා ප්‍රඥාදි නානා ගුණස්ඵූර්ජද්වෘජිනපඞ්කසින්ධු පතිතඃ** = "විරාගස්‍ය භාවඃ වෛරාග්‍යම්, සමස්තාශ්ච තෙ භූතාශ්චෙති සමස්තභූතාඃ, තෙෂු කරුණා සමස්තභූතකරුණා, ප්‍රඥා ආදිර්යෙෂාං තෙ ප්‍රඥාදයඃ, වෛරාග්‍යඤ්ච සමස්තභූතකරුණා ච ප්‍රඥාදයශ්ච වෛරාග්‍යසමස්තභූතකරුණාප්‍රඥාදයඃ, නානා ප්‍රකාරා ගුණාඃ = නානාගුණාඃ, වෛරාග්‍යසමස්තභූතකරුණාප්‍රඥාදයශ්ච තෙ නානාගුණාශ්චෙති වෛරාග්‍යසමස්තභූතකරුණා ප්‍රඥාදිනානාගුණාඃ; තව වෛරාග්‍ය -පෙ- නානාගුණාඃ = ත්වද්වෛරාග්‍ය -පෙ- නානාගුණාඃ, වෘජිනානාං පඞ්කඃ = වෘජිනපඞ්කඃ, ස්ඵූර්ජංශ්ච ස වෘජිනපඞ්කශ්චෙති ස්ඵූර්ජද්වෘජිනපඞ්කඃ, ස එව සින්ධුඃ ස්ඵූර්ජද්වෘජිනපඞ්කසින්ධුඃ, ත්වද්වෛරාග්‍ය -පෙ- ගුණා එව ස්ඵූර්ජද්වෘජිනපඞ්කසින්ධුඃ, ත්වද්වෛරාග්‍ය -පෙ- ගුණස්ඵූර්ජද්වෘජිනපඞ්කසින්ධුඃ, තස්මින් පතිතඃ = ත්වද්වෛරාග්‍ය -පෙ- සින්ධුපතිතඃ". දිඝී වූ සප්තමී තත් පුරුෂාන්ත සමාස පදයෙකි. මෙහි ද ගර්භසමාස විග්‍රහ යි.

**දණ්ඩයන්ති, නින්දන්ති, මුඤ්චන්ති** = පිළිවෙළින් "දණ්ඩ දණ්ඩපාතනෙ, නිදි කුත්සායාම්, මුච ලෘ මොක්ෂණෙ" ධාතු ලට් ප. ප්‍ර බහුවචන යි.

**භූපාඃ, විබුධාඃ,** = මෙහි 'භූප' ශබ්දයෙන් මිථ්‍යාදෘෂ්ටික රජවරු ද, 'විබුධ' ශබ්දයෙන් නින්දිත පණ්ඩිතයෝ ද ගැණෙත්.

**වෘත්තය:-** මෙයත්, මීළඟ පද්‍යයත් ශාර්දූල වික්‍රීඩිත යි.

26. **ස්වර්ගේ වා වසතිර්මමාස්තු නිරයෙ තිර්යක්ෂු කිං වාසුරෙ**
**ප්‍රේතානාං නගරේ'ථ වා නරපුරෙ බ්‍රහ්මාද්‍යන්‍යතඃ කර්මණා,**
**භෝ සර්වඥ තතස් තතස් තව ගුණාන් කර්ණාමෘතස්‍යන්දිනො**
**නිෂ්පාපානවලම්බතාං මම මනො මාන්‍යා සුඛප්‍රාර්ථනා.**

**පදාර්ථ:-** **ස්වර්ගේ වා** = දිව්‍යලොකයෙහි ද; **නිරයෙ** = නරකයෙහි ද; **තිර්යක්ෂු කිං වා** = තිරිසනුන් කෙරෙහි ද; **අසුරෙ** = අසුර භවනයෙහි ද; **අථ වා** = නොහොත්; **ප්‍රේතානාං නගරේ** = ප්‍රේත භවනයෙහි ද; **නරපුරෙ** = මනුෂ්‍ය ලොකයෙහි ද; **බ්‍රහ්මාද්‍යන්‍යතඃ** = නොහොත් බ්‍රහ්මලොකාදි අන් කිසි තැනෙක්හි ද; **කර්මණා** = කුශලාදි කර්ම බලයෙන්; **මම**=මාගේ; **වසතිඃ** = වාසය කිරීම; **අස්තු** = වේවා; **භො සර්වඥ** = භාග්‍යවත් වූ සර්වඥයන් වහන්ස; **තතස්තතඃ** = ඒ ඒ උපනුපන් තන්හි; **කර්ණාමෘත ස්‍යන්දිනඃ** = අසත්තවුන්ගේ කණට අමා ඔතාක් වැනි වූ; **නිෂ්පාපාන්** = රාගාදි පව් රහිත වූ; **තව ගුණාන්** = ඔබවහන්සේගේ ෂඩ් අසාධාරණ ඥානාදි ගුණයන්; **මම මනඃ** = මාගේ චිත්තය තෙමේ; **අවලම්බතාං** = එල්බේවා; **මම** = මට; **අන්‍යා සුඛප්‍රාර්ථනා** = මේ ඇර අන් සැප පැතීමෙක්; **මා (අස්තු)** = නො (වේවා.)

**භාවය.-** දෙව්ලොව හෝ නිරයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ අසුර භවනයෙහි හෝ ප්‍රේත ගතියෙහි හෝ මිනිස් ලොව හෝ බ්‍රහ්මලොකාදි අන් කිසි තැනෙක හෝ කර්ම බලයෙන් මාගේ විසීම වේවා. ඒ උපනුපන් හැම තැන්හි ම කණට අමා ඔතාක් වැනි ඔබගේ යහ ගුණයන් හි මගේ සිත එල්බේවා. අනික් සැප පැතීමෙක් මට නො වේවා.

**විස්තර:-** කොතන විසුවත් මම ඔබ ගුණ සිහි කරමි. ඊට වඩා අන් සැපයෙක් මට නැතැ යි කී නියා යි.

**වසතිඃ** = 'වස් නිවාසෙ' ධාතු යි. 'ති' ප්‍රත්‍යයාන්ත භාව කෘදන්ත යි.

**තිර්යක්ෂු** = 'තිර්යච්' ශබ්ද සප්තමී බහු වචන යි.

**තතස්තතඃ** = සප්තම්‍යර්ථ නිෂ්පන්න නිපාත යි.

**කර්ණාමෘතස්‍යන්දිනඃ** = "අමෘතං ස්‍යන්දන්ති ශීලෙනෙති= අමෘතස්‍යන්දිනඃ කර්ණේෂු අමෘතස්‍යන්දිනඃ කර්ණාමෘතස්‍යන්දිනඃ" සප්තමී තත්පුරුෂ යි.

**නිෂ්පාපාන්** = "නිර්ගතාඃ පාපා යෙභ්‍යස්තෙ නිෂ්පාපාඃ, තාන්." පඤ්චමී බහුව්‍රීහි යි.

**අවලම්බතාම්** = 'අව' පූර්ව 'ලබි ආලම්බනෙ' ලොට් ආ ප්‍ර. එකවචන යි.

27. **තවෛවාහං දාසො ගුණපණ්‍යගෘහීතො'ස්මි භවතා**
**තවෛවාහං ශිෂ්‍යස් ස්වවචනවිනීතො'ස්මි භවතා,**
**තවෛවාහං පුත්‍රස් ස්මෘතිකෘතසුඛස් ත්වද් ගතිගතො**
**ගුරො බුද්ධ ස්වාමින් මම ජනක මාං පාහි භවතඃ.**

**පදාර්ථ**:- **භවතා** = නුඹවහන්සේ විසින්; **ගුණපණ්‍යගෘහීතඃ** = ඥාන දයාදි ගුණ නැමැති පණම් දී ගන්නා ලද; **අහම්** = මම; **තව එව** = නුඹවහන්සේගේ ම; **දාසඃ අස්මි** = ගැත්තෙක්මි; **භවතා**= භවත්හු විසින්; **ස්වවචනවිනීතඃ** = ස්වකීය සූත්‍ර විනය ධර්මයෙන් හික්මවන ලද; **අහම්** = මම; **තව එව** = නුඹවහන්සේගේ ම; **ශිෂ්‍යඃ අස්මි** = අතැවැස්සෙක්මි; **ත්වද් ගතිගතඃ** = නුඹවහන්සේගේ ම ආර්ය අෂ්ටාංගික මාර්ග අනුව ගියා වූ; **ස්මෘතිකෘතසුඛඃ** = සිහි කිරීමෙන් උපදනා සැප ඇති; **අහම්** = මම; **තව එව** = නුඹවහන්සේගේ ම; **පුත්‍රඃ අස්මි** = පුත්‍රයෙක්මි; **ස්වාමින්** = මාගේ ස්වාමිදරු වූ; **ගුරො** = මාගේ ගුරු වූ; **මම ජනක** = මාගේ පිය වූ; **බුද්ධ** = බුදුරජාණන් වහන්ස; **භවතඃ** = සංසාර යෙන්; **මාම් පාහි** = මා රක්‍ෂා කළ මැනවි.

**භාවය**:- ඔබවහන්සේ විසින් ගුණ නමැති මිල දී ගන්නා ලද මම ඔබගේ ම දාසයෙක් වෙමි. ඔබගේ ම කීකරු ශිෂ්‍යයෙක් වෙමි. ඔබ අනුව ගිය ඔබගේ ම පුත්‍රයෙක් වෙමි මාගේ පින්වත් ස්වාමීනි, ගුරුවරය, පියාණෙනි, බුදුරජාණන් වහන්ස, මා සසරින් රැක ගණු මැනවි.

**විස්තර**:- මෙහින් ඉතා යටහත් පහත් පැවතුම් ඇති බව දැක්වේ

**ගුණපණ්‍යගෘහීතඃ** = "ගුණා එව පණ්‍යා ගුණපණ්‍යාඃ, තෛර්ගෘහීතො ගුණපණ්‍යගෘහීතඃ." කර්මධාරය ගර්භ තෘතීයා තත් පුරුෂ යි.

**අස්මි** = 'අස් භුවි' ලට් උ. එකවචන යි.

**ස්මෘතිකෘතසුඛඃ** = "ස්මෘත්‍යා කෘතං සුඛං යස්‍ය ස ස්මෘතිකෘතසුඛඃ." ෂෂ්ඨී බහුව්‍රීහි යි

**පාහි** = 'පා රක්‍ෂණෙ' ලොට් ප ම එකවචන යි.

**වෘත්තය**:- මේකත්, මීලඟ පද්‍යයත් ශිඛරිණී යි.

28. **පිතා මාතා** භ්‍රාතා **ත්වමසි** භගිනී **ත්වඤ්ච විපදි**
**සමිරං මිත්‍රං බන්ධුඃ ප්‍රභුරමෘතදීක්ෂාගුරුතමඃ,**
**ත්වමෛශ්වර්‍ය්‍යං භොගස් ත්වමසි ධනධාන්‍යඤ්ච මහිමා**
**යශො විද්‍යා ප්‍රාණාස් ත්වමසි මම සර්වඥ සකලම්.**

**පදාර්ථ:-** **සර්වඥ** = සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජෝත්තමයාණන් වහන්ස; ( **මම** = මට); **ත්වං** = නුඹවහන්සේ; **පිතා අසි** = පිය වන සේක; **මාතා** = මවු වන සේක; **භ්‍රාතා** = මල්බෑ වන සේක; **භගිනී** = බුහුනන් වන සේක; **ත්වඤ්ච** = නුඹවහන්සේ; **විපදි** = දුකක් ඇති කල්හි; **සමිරම මිත්‍රං** = දෘඪ මිත්‍ර වන සේක; **බන්ධුඃ** = නෑ වන සේක; **ප්‍රභුඃ** = ස්වාමි වන සේක; **අමෘතදීක්ෂා** = මොක්ෂොපදෙශයට; **ගුරුතමඃ**=පරම ගුරු වන සේක; **ත්වම්** = නුඹවහන්සේ; (මම = මට;) **ඓශ්වර්‍ය්‍යම්** = පොහොසත් බවත් වන සේක; **ත්වම්** = නුඹවහන්සේ; **භොගඃ අසි** = සැපත් වන සේක; **ධනධාන්‍යඤ්ච** = (මණි කනක රජතාදි) ධනය හා (ශාලි ව්‍රීහි ආදි) ධාන්‍යත් වන සේක; **මහිමා** = අනුභාවයත් වන සේක; **යශඃ** = කිර්තියත් වන සේක; **විද්‍යා** = ශාස්ත්‍රයත් වන සේක; **ප්‍රාණාඃ** = ජීවිතයත් වන සේක; (බොහෝ කොට කීමෙන් ප්‍රයොජන කිම් ද?) **ත්වම්** = නුඹ වහන්සේ, (**මම** = මට); **සකලම් අසි** = සියල්ල ම වන සේක.

**භාවය:-** සර්වඥ රාජෝත්තමයාණන් වහන්ස, මාගේ පියාත් ඔබ ය, මවුත් ඔබ ය, සහෝදරයාත්, සහෝදරීත්, විපතෙහි දී පිහිට වන මිතුරාත්, නෑයාත්, ස්වාමියාත්, නිවණට උපදෙස් දෙන පරම ගුරුවරයාත් ඔබ ම ය, එසේ ම මාගේ අධිපතිකමත් ඔබ ය, මගේ සම්පතත්, රන් රිදී මුතු මැණික් ආදි ධනයත්, ශාලි ව්‍රීහි ආදි ධාන්‍යත්, අනුභාවයත්, කීර්තියත් ශාස්ත්‍රයත්, ප්‍රාණයත් ඔබ ම ය, කොටින් කියතොත් මගේ සියල්ල ම ඔබවහන්සේ වන සේක.

**විස්තර:-** ඔබවහන්සේගෙන් පිටත් කිසිවක් මට නැතැයි කී නිසා යි.

**අසි** = 'අස් භුවි' ලට් ප ම. එකවචන යි.

**අමෘතදීක්ෂාගුරුතමඃ** = "අමෘතස්‍ය දීක්ෂා = අමෘතදීක්ෂා, අයමෙතෙෂාමතිශයෙන ගුරුඃ = ගුරුතමඃ, අමෘතදීක්ෂායාං ගුරුතමඃ = අමෘතදීක්ෂාගුරුතමඃ." සප්තමී තත්පුරුෂ යි.

**ඓශ්වර්‍ය්‍යම්** = 'ඊශ්වරස්‍ය භාව ඓශ්වර්‍ය්‍යම්." භාවයෙහි 'ෂ්ණ' ප්‍රත්‍යයාන්ත තද්ධිත යි. අධිපතිකම ය.

**භොගඃ** = උපභොග, පරිභොග සම්පද් ය.

**ප්‍රාණාඃ** = ජීවිතය: ජීවිතාර්ථයෙහි වූ 'ප්‍රාණ' ශබ්දය බහුවචනාන්ත යි.

29. විගතරාග මුනීන්ද්‍ර දයාම්බුධෙ
සුගත භග්නවෘහද්භවපඤ්ජර,
අධිගතාමෘත බුද්ධ මනොම්බුජං
මම තවානඝ ගන්ධකුටීයතාම්.

**පද අර්ථ**:- **විගතරාග** = පහ වූ රාග ඇති; **මුනීන්ද්‍ර** = ෂඩ්විධ මුනීන්ට ශ්‍රෙෂ්ඨ වූ; **දයාම්බුධෙ** = මහා කරුණාවට සමුද්‍රයක් මෙන් විපුලාධාර වූ; **සුගත** = ශොභන වූ කාශගති, ඥානගති ඇති; **භග්න** = බිඳිනා ලද; **වෘහද්භව පඤ්ජර** = මහත් වූ සංසාර නමැති මැදිරි ඇති; **අධිගතාමෘත** = පැමිණි නිවන් ඇති; **බුද්ධ** = චතුස්සත්‍යයන් දක්නා වූ; **අනඝ** = නිෂ්පාපී වූ සර්වඥයන් වහන්ස; **මම** = මාගේ; **මනොම්බුජං** = හෘදය පද්මය; **තව** = නුඹ වහන්සේට; **ගන්ධකුටීයතාම්** = ගඳකිළියක් මෙන් හැසිරේවා.

**භාවය**:- රාගය දුරු කළ උත්තමය, මුනීන්ද්‍රයන් වහන්ස, මහා කරුණාවට සමුද්‍රයක් වූ උත්තමය, සුගතයන් වහන්ස, මහත් වූ සසර කූඩුව බිඳ දැමූ පින්වතුන් වහන්ස, නිවන් අවබොධ කළ අමා මැතියති, සර්වඥයන් වහන්ස, පව් නැසූ ශුද්ධොත්තමය, මාගේ චිත්තපද්මය ඔබවහන්සේට ගඳකිළියක් මෙන් වේවා.

**විස්තර**:- මෙයින් එක් එක් ගුණ වචනයෙන් බුදුරජාණන් වහන්සේට ආමන්ත්‍රණය කොට උන්වහන්සේ සිය සිතෙහි වැඩ වස්වා ගන්හ. සිත ගඳකිළියක් කිරීමෙන් ඒ බව ප්‍රකාශ වේ. 'ගන්ධකුටි' යනු බුදුරජාණන් වහන්සේ වැඩ වසන තැනට ම ව්‍යවහාර වන විශෙෂ නාමයෙකි. **මහද ගඳකිළි කරු** යන ප්‍රතිරාජ පරිවෙණාධිපතීන් වහන්සේගේ යෙදුම අනුව මෙය රචිත බව පෙනේ.

**භග්නවෘහද්භවපඤ්ජර** = වෘහච්ච සො භවශ්චෙති වෘහද්භවඃ, ස එව පඤ්ජරං වෘහද්භවපඤ්ජරම්, භග්නං වෘහද්භවපඤ්ජරං යෙන ස භග්නවෘහද්භවපඤ්ජරඃ." සම්බොධන එකවචන යි. කර්මධාරය ගර්භ තෘතීයා බහුව්‍රීහි යි.

**අනඝ** = පව් නැත්තා: 'නාස්ති අඝං යස්‍ය සො'නඝඃ, (හෙ) අනඝ."

**ගන්ධකුටීයතාම්** = "ගන්ධකුටිරිව ආචරතු = ඉති ගන්ධකුටීයතාම්." නාම ධාතුක ලොට් ආ. ප්‍ර. එකවචන යි. 'ගන්ධකුටි"

ශබ්දයා කෙරෙන් 'යඩ්' ප්‍රත්‍යය ව පූර්වයට දීර්ඝ වීමෙන් 'ගන්ධ කුටීය' යන නාමධාතුව සිද්ධ යි.

**වෘත්තය**:– ජගතී ඡන්දසට අයත් ද්‍රුතවිලම්බිත යි. **ද්‍රුත විලම්බිත මාහ නභෞ භරෞ** = නගණ, භගණ, භගණ, රගණ යන මෙයින් යුක්ත වූයේ **ද්‍රුතවිලම්බිත** නම්.

30. **අනාත්මන්‍යනිත්‍යෙ'ශුභෙ දුඃඛදුඃඛෙ**
**දුරන්තෙ'ත්‍ර සංසාරචක්‍රෙ භ්‍රමන්තම්,**
**ත්වමෙකො'සි මාං ත්‍රාතුමීශො දයාබ්ධෙ**
**ප්‍රභො'තඃ ප්‍රසීද ප්‍රසීද ප්‍රසීද.**

**පදාර්ථ**:– **අනාත්මනි** = ආත්ම රහිත වූ; **අනිත්‍යෙ** = නිත්‍ය රහිත වූ; **අශුභෙ** = ශුභ රහිත වූ; **දුඃඛදුඃඛෙ** = අතිශයින් දුක් වූ; **දුරන්තෙ** = කෙළවරක් නැත්තා වූ; **අත්‍ර සංසාර චක්‍රෙ** = මේ සංසාර වෘත්තයෙහි; **භ්‍රමන්තම්** = කර්මක්ලේශ වේගයෙන් හැසිරෙන්නා වූ; **මාං** = මා; **ත්‍රාතුම්** = රක්‍ෂා කිරීමට; **එකඃ** = අසහාය වූ; **ත්වම්** = නුඹවහන්සේ; **ඊශඃ අසි** = පොහොසත් වන සේක; **අතඃ** = එහෙයින්; **දයාබ්ධෙ** = කෘපා සාගර වූ; **ප්‍රභො** = ස්වාමීන් වහන්ස; **ප්‍රසීද** = පැහැද වදාල මැනවි; **ප්‍රසීද** = පැහැද වදාල මැනවි; **ප්‍රසීද** = (අතිශයින්) පැහැද වදාල මැනවි.

**භාවය**:– අනිත්‍ය දුඃඛ අනාත්ම වූ ද අශුභ වූ ද, කෙළවරක් නැත්තා වූ ද මේ සංසාර චක්‍රයෙහි කැරකෙන මා රැක ගන්නට ඔබ ම සමත් ය එහෙයින් කරුණාසාගර වූ ස්වාමීන් වහන්ස, මා කෙරෙහි ඒකාන්තයෙන් පැහැද වදාල මැනව.

**විස්තර**:– සසරින් මා ගලවන්නට ඔබ හැර වෙන කෙනෙක් සමර්ථ නො වෙති යි යුසේ යි.

**භ්‍රමන්තම්** = වර්තමාන කෘදන්ත භ්‍රමත්' ශබ්ද ද්විතීයෛක වචන යි.

**දයාබ්ධෙ, ප්‍රභො** = 'දයාබ්ධි, ප්‍රභු' ශබ්ද සම්බොධනෛක වචන යි.

**ත්‍රාතුම්** = 'ත්‍රෛඞ් පාලනෙ ධාතු යි. තුමන්ත ක්‍රියා යි.

**ප්‍රසීද** = 'ප්‍ර' පූර්ව 'ෂද්‍ලෘ විශරණ ගත්‍යවසාදනෙෂු' ලොට් ප. ම. එකවචන යි. 'සීද' ආදෙශ යි. තුන් වරක් උසුරු වීමෙන් අතිශයාර්ථයක් දෙයි.

**වෘත්තය**:- මේ පද්‍යයත් මීලඟ පද්‍යයත්, ජගතී ඡන්දසට අයත් භුජඞ්ග ප්‍රයාත යි. **භුජඞ්ගප්‍රයාතං භවෙද්‍යෛශ්චතුර්භිඃ**= **යගණ සතරකින්** යුක්ත වූ වෘත්තය **භුජඞ්ගප්‍රයාත නමි.**

**31. ප්‍රසීදේශ දේවේශ ලෝකේශ ජිෂ්ණෝ**
**ජගද්වන්ද්‍ය මද්වන්ද්‍ය සද්වන්ද්‍ය බුද්ධ,**
**අඝෝරෙ භවාරෙ ස්මරාරෙ තමොරෙ**
**තවෛවාස්මි භක්තො වපුර්වාඞ්මනොභිඃ.**

**පදාර්ථ**:- ඊශ = පරාර්ථ කරණයෙහි සමර්ථ වූ; **දේවේශ** = ඉන්ද්‍රාදි දෙවියන්ට නායක වූ; **ලෝකේශ** - සකලලොකයාට ඊශ්වර වූ; **ජිෂ්ණෝ** = මාරයා ජය ගන්නා සුලු වූ; **ජගද්වන්ද්‍ය** = ලොකවාසීන් විසින් වැන්ද යුතු වූ; **මද්වන්ද්‍ය** = මා විසින් වැන්ද යුතු වූ; **සද්වන්ද්‍ය** = සාරද්වතීය පුත්‍රාදි බුද්ධිමතුන් විසින් වැන්ද යුතු වූ; **බුද්ධ** = සර්වඥයන් වහන්ස; **ප්‍රසීද** = පැහැද වදාළ මැනව; **අඝෝරෙ** = පව් නසන්නා වූ; **භවාරෙ** = සංසාරොත්පත්ති නසන්නා වූ; **ස්මරාරෙ** = කාම තෘෂ්ණා නසන්නා වූ; **තමොරෙ** = මොහාන්ධකාරය නසන්නා වූ තථාගතයන් වහන්ස; **වපුඃ වාක් මනොභිඃ** = කාය වාග් මනස් යන ද්වාරත්‍රය කරණ කොට ගෙණ; **තවෛව** = ඔබවහන්සේට ම; **භක්තඃ අස්මි** = භක්ති ඇත්තේ වෙමි.

**භාවය**:- ඊශ්වරයන් වහන්ස, දෙවියන්ට ශ්‍රෙෂ්ඨ උත්තමය, ලොකාධිපතීන් වහන්ස, දිනනසුලු මහොත්තමය, ලෝවැස්සා විසින් වැන්ද යුතු උත්තමය, මා විසින් වැන්ද යුතු සවාමීන් වහන්ස, සත්පුරුෂයන් විසින් වැන්ද යුතු මහොත්තමය, බුදුරජාණන් වහන්ස පව් නසන උත්තමය, සසර නසන උතුමානනි, කාමාශා නසන ශුද්ධොත්තමයානනි, මොහාන්ධකාරය නසන ජිනෙන්ද්‍රයන් වහන්ස, කාය වාඞ් මනස් යන ද්වාරත්‍රය කරණ කොට ගෙණ මම ඔබවහන්සේ කෙරෙහි ම භක්ති ඇත්තේ වෙමි.

**විස්තර**: මෙහිත් ද එක් එක් ගුණ වචනයෙන් බුදුරජාණන් වහන්සේට ආමන්ත්‍රණය කොට සවකීය භක්ත්‍යවනත භාවය සැල කෙරෙයි.

**ජිෂ්ණො** = "ජයති ශීලෙනෙති ජිෂ්ණුඃ." 'ජි ජයෙ' දහින් තාච්ඡීල්‍යයෙහි ඉෂ්ණු' ප්‍රත්‍ය යි. සම්බොධන එකවචන යි.

**ජගද්වන්ද්‍ය, මද්වන්ද්‍ය, සද්වන්ද්‍ය** = "වන්දිතවේ‍යා වන්ද්‍යඃ, ජගද්භිර්ජගතාං වා වන්ද්‍යො ජගද්වන්ද්‍යඃ, මයා මම වා වන්ද්‍යො මද්වන්ද්‍යඃ, සද්භිඃ සතාං වා වන්ද්‍යඃ සද්වන්ද්‍යඃ." සම්බොධන **එක** වචන යි. තෘතීයා හෝ ෂෂ්ඨී තත්පුරුෂ යි.

**අඝොරෙ, භවාරෙ, සමරාරෙ, තමොරෙ** = 'අඝසො'රිඃ = අඝොරිඃ, භවස්‍යාරිඃ = භවාරිඃ, සමරස්‍යාරිඃ = සමරාරිඃ, තමසො'රිඃ = තමොරිඃ." ෂෂ්ඨී තත්පුරුෂ යි. සම්බොධනෛක වචන යි. 'අරි' නම් සතුරා යි. ඉකාරාන්ත, උකාරාන්ත ශබ්දයන්ගේ අන්ත්‍ය ස්වරයට සම්බොධනෛක වචනයෙහි දී ගුණ වේ. පාප වාචි 'අඝ' අඝස්' ශබ්ද දෙකෙකි. මෙහි 'අඝස්' ශබ්දය යි.

**භක්තඃ** = "භක්තිරස්‍යාස්තීති භක්තඃ." **ණ** ප්‍රත්‍යයාන්ත අස්ත්‍යර්ථ තද්ධිත යි.

**වපුර්වාඞ්මනොභිඃ** = "වපුශ්ච වාක් ච මනශ්ච වපුර්වාඞ්මනාංසි, තෛඃ." ද්වන්ද්ව සමාස යි.

32. **ස තව කුලසුතස් ස එව භක්තඃ**
**ස භවති ශාසනධුර්වහස් ස ශිෂ්‍යඃ,**
**ස ච ශරණගතස් ස එව දාසඃ**
**කථමපි යො න විලඞ්ඝයෙත් තවාඥාම්.**

**පදාර්ථ**:- **යඃ** = යම් සත්වයෙක් තෙමේ; **කථමපි** = දුක සේත්; **තව** = නුඹ වහන්සේගේ; **ආඥාම්** = (ශික්ෂාපද ප්‍රඥප්ති සංඛ්‍යාත වූ) අනුශාසනාව; **න විලඞ්ඝයෙත්** = නො ඉක්මවා ද; **සඃ** = ඒ තෙමේ; **තව** = නුඹවහන්සේගේ; **කුලසුතඃ** = කුලපුත්‍ර වන්නේ ය; **සඃ එව** = ඒ තෙමේ ම; **භක්තඃ** = භක්ති ඇත්තේ ය; **සඃ එව** = ඒ තෙමේ ම; **ශාසනධුර්වහඃ භවති** = ශාසන ධුරය උසුලන්නේ වේ; **සඃ එව** = ඒ තෙමේ ම; **ශිෂ්‍යඃ** = අතැවැසි වන්නේ ය; **ස ච** = ඒ තෙමේ ම; **ශරණගතඃ** = ඔබ ශරණ ගත වන්නේ ය. **සඃ එව** = ඒ තෙමේ ම; **තව** = නුඹ වහන්සේගේ; **දාසඃ** = මෙහෙකරු වන්නේ යි.

**භාවය**:- ඉතා දුක සේ නමුත් ඔබගේ අණ පිළිපදින පුද්ගලයා ම ඔබ වහන්සේගේ පුත්‍රයා ය, භක්තිමතා ය, ශාසන ධුරය උසුලන්නා ය. ශිෂ්‍යයා ය, ශරණ ගතයා ය, දාසයා ය

**විස්තර**:- කෙසේ හෝ බුදුරදුන්ගේ අණ කඩ කරන්නෝ බුද්ධ පුත්‍රාදි භාවයට නො පැමිණෙති යි කී නියා යි.

**ශාසනධූර්වහඃ** = "ශාසනස්‍ය ධූඃ ශාසනධූඃ, තාං වහතීති ශාසනධූර්වහඃ." තත්පුරුෂ ගර්භ තත්පුරුෂ යි. මෙහි ශාසන ධූරය නම් භික්ෂුත්වය යි.

**විලඞ්ඝයෙත්** = 'වි' පූර්ව 'ලඝි ගතෞ" ප්‍රයොජ්‍ය විධි ලිඞ් ප. ප්‍ර. එකවචන යි.

**වෘත්තය**:- මේ පද්‍යයේ පටන් 85 වන පද්‍යය තෙක් ඇති පද්‍ය සූපණ්ස ම පුෂ්පිතාග්‍රා යි.

33. **ජගදුපකෘතිරෙව බුද්ධ පූජා**
**තදපකෘතියනව ලොකනාථ පීඩා,**
**ජින ජගදපකෘත් කථං න ලජ්ජෙ**
**ගදිතුමහං තව පාදපද්මභක්තඃ.**

**පදාර්ථ**:- බුද්ධ = සර්වඥයන් වහන්ස; **ජගදුපකෘතිරෙව** = ලෝ වැස්සන්ට උපකාර කිරීම ම; **තව** = තුඹ වහන්සේට; **පූජා** = පුද පඬුරු වන්නේ ය. **ලොකනාථ** = ලොකස්වාමීන් වහන්ස; **තදපකෘතිඃ** = ඒ ලොකවාසීන්ට ද්‍රොහ කිරීම; **තව** = තුඹ වහන්සේට; **පීඩා** = දුක් වන්නේ ය; **ජින** = පස් මරුන් දිනූ සර්වඥයන් වහන්ස; **ජගදපකෘත්** = (ප්‍රාණඝාත අදත්තාදානාදි වශයෙන්) ලෝ වැස්සන්ට අවැඩ කරන්නා වූ; **අහම්** = මම; **තව** = තුඹවහන්සේගේ; **පාදපද්ම භක්තඃ** = ශ්‍රීපාද පද්මය භජනය කරණ එකෙක්මි යි; **ගදිතුම්** = කියන්නට; **කථං න ලජ්ජෙ** = කෙසේ ලජ්ජිත නො වෙම් ද?

**භාවය**:- පින්වත් බුදුරජාණන් වහන්ස, ලෝවැස්සන්ට උපකාර කිරීම ම ඔබට කරණ පූජාව යි ඔවුන්ට ද්‍රොහ කිරීම ම ඔබට කරණ පීඩාව යි. එහෙයින් ප්‍රාණඝාත අදත්තාදානාදි වශයෙන් ලෝසතුන්ට අපරාධ කරණ මම ඔබ පාපියුම් සෙවුනෙකැයි කියන්නට කෙසේ ලජ්ජිත නො වෙම් ද? වෙම් මැ යි.

**විස්තර**:- බුදුන් පුදන හැටිත්, උන් වහන්සේට අගෞරව සිදු වන සැටිත් මෙයින් දක්වෙයි. යමකු ප්‍රාණඝාතාදි අපරාධ කරතොත් ඔහු නියම බෞද්ධයකු නො වන බව ද, එබඳු යමකු "මම බෞද්ධයෙක්මි" යි කියා ගණිතොත් ඔහු ලජ්ජා නැති එකකු බව ද මෙයින් හඟවයි.

**ජගදුපකෘතිඃ** = "උපකරණමුපකෘතිඃ ජගතාමුපකෘතිඃ = ජගදුපකෘතිඃ." ෂෂ්ඨී තත්පුරුෂ යි.

**ජගදපකෘත්** = "අපකරොතීති = අපකෘත්." අප පූර්ව කෘඤ් කරණෙ, ක්විබන්ත යි. "ජගතාමපකෘත් = ජගදපකෘත්." ෂෂ්ඨී තත්පුරුෂ යි.

**ලජ්ජෙ** = 'ඕ ලජ්ජී ව්‍රීඩායාම්' ලට් ආ. උ. එක වචන යි. **ලස්ජ් + ඒ, ලද්ජ් + ඒ = ඣබෙ ජබාඃ, ලජ්ජ් + ඒ = ස්තොඃ ශ්චුභිඃ ශ්චුඃ, ලජ්ජෙ = ස්වරහීනං පරේණ සංයොජ්‍යම්.** මේ පදසිද්ධිය සාරස්වතයෙහි ව්‍යාකූල ය.

**ගදිතුම්** = "ගද වාක්‍යෙ' තුමන්ත (=තාදර්ථ්‍ය) ක්‍රියා යි.

**පාදපද්මභක්තඃ** = "පාදමෙව පද්මං පාදපද්මම්, තස්මින් භක්තඃ පාදපද්මභක්තඃ" කම්ධාරය ගර්භ සප්තමී තත්පුරුෂ යි.

34. **ධනජනවිභවාසුදෙහරාජ්‍යං**
**යදුපකෘතෙ ශතධා ත්වයා ප්‍රදත්තම්,**
**තමහිතමපකර්තුරස්‍ය ලොකං**
**ක්ව මම කෘපා මුදිතා ක්ව වා ක්ව මෛත්‍රී.**

**පදාර්ථ:-** **ත්වයා** = නුඹවහන්සේ විසින්; **යදුපකෘතෙ** = යම් ලොකොපකාරයක් පිණිස; **ධන** = (මුක්තා මාණික්‍යාදි) ධනය; **ජන** = (පුත්‍ර කලත්‍රාදි) ජනයෝ ය; **විභව** = (ගෘහ ක්ෂෙත්‍රාදි) සම්පත්තිය; **අසු** = ප්‍රාණය; **දෙහ** = ශරීරය; **රාජ්‍යං** = රජ සැප ය යන මේ සියල්ල; **ශතධා** = සිය ගණන් වර; **ප්‍රදත්තම්** = දෙනලද ද; **අහිතම්** = (යම් කිසි කාරණයකින්) වෛරී වූ; **තං ලොකම්** = ඒ සත්ව ලොකයාහට; **අපකර්තුඃ** = අවැඩ කරන්නා වූ; **අස්‍ය මම** = මේ මාගේ; **කෘපා** = පර දුඃඛාපනයන ලක්‍ෂණ වූ කරුණා තොමෝ; **ක්ව** = කොහි ද? **මුදිතා** = පරසම්පත්ති ප්‍රමොද ලක්‍ෂණ මුදිතා තොමෝ; **ක්ව වා** = කොහි ද? **මෛත්‍රී** = පරහිතාකාර ප්‍රවෘත්ති ලක්‍ෂණ වූ මෛත්‍රී තොමෝ; **ක්ව** = කොහි ද?

**භාවය:-** ඔබවහන්සේ විසින් ලෝවැස්සාට උපකාර පිණිස මුතු මැණික් ආදි ධනය, පුත්‍ර කලත්‍රාදි ජනයෝ ය, සම්පත්තිය, ප්‍රාණය, ශරීරය, රජකම ය යන සියල්ල සිය ගණන් වර දෙන ලදී. එහෙත් මා ඒ ලෝවැස්සාට අහිත ව අපරාධ කරතොත් ඒ මට කරුණාවක් හෝ මුදිතාවක් හෝ මෛත්‍රියක් හෝ කොහෙත් ම නැත.

**විස්තර**:- බුද්ධරාජයාණන් වහන්සේ විසින් අචේතනික සචේතනික සියලු වස්තු ප්‍රදානය කරණ ලද්දේ මුළු ලෝකයාට හිත පිණිස ය. එහෙයින් යමකු ඒ ලෝකයාට අපරාධ කරතොත් ඔහුට මෛත්‍රී කරුණා මුදිතාදි ගුණ ස්වල්පයකුත් නැතැයි මෙයින් උගන්වයි. මෙහි 'අහිතම්' යන්න 'ලෝකම්' යන්නට විශේෂණ කොට සන්හයෙහි අර්ථ කී නමුත් එය 'අපකර්තුඃ' යන්නට ක්‍රියා විශේෂණ කොට ගැණීම වඩා මැනවැයි හැගේ.

**ධනජනවිභවාසුදෙහ රාජ්‍යම්** = "ධනඤ්ච ජනාශ්ච විභවාශ්ච අසු ච දෙහශ්ච රාජ්‍යඤ්ච ධනජනවිභවාසුදෙහ රාජ්‍යම්." සමාහාර ද්වන්ද්ව යි.

**යදුපකෘතෙ** = "උපකරණ මුපකෘත්" භාව ක්ත්වාන්ත යි. යස්‍ය උපකෘත් = යදුපකෘත්, තස්මෙ." ෂෂ්ඨී තත්පුරුෂ යි.

**ප්‍රදත්තම්** = ප්‍ර පූර්ව 'දා' ධාතු යි, අතීත කෘදන්ත යි. 'දා' හට 'දද්' ආදෙශයෙන් සිද්ධ යි.

**අපකර්තුඃ** = 'අපකර්තෘ' ශබ්ද ෂෂ්ඨ්‍යන්ත වචන යි.

**මුදිතා** = අනුන්ගේ යහපතට සතුටු වීම යි.

35. **උපපතිමසතීව චිත්තවෘත්තිර්**
**ව්‍රජති භවන්තමපාස්‍ය පඤ්චකාමම්,**
**අපි ච විෂයිණො න මොක්ෂසිද්ධිඃ**
**කිමු කරවාණි මුනීන්ද්‍ර දෙහි දාස්‍යම්.**

**පදාර්ථ**:- **උපපතිං** = සොර සැමියකු වෙතට යන; **අසතීව** = දුෂ්ට ස්ත්‍රියක මෙන්; **චිත්තවෘත්තිඃ** = මාගේ මතඃ ප්‍රවෘත්ති තොමෝ; **භවන්තං අපාස්‍ය** = නුඹවහන්සේ හැර; **පඤ්ච කාමම්** = රූප ශබ්දාදි වූ විෂය කරා; **ව්‍රජති** = (ආලම්බන කරණ වශයෙන්) යන්නී ය; **අපි ච** = තව ද; **විෂයිණඃ** = පඤ්චකාම විෂය අනුභව කරණ පුරුෂයාහට; **මොක්ෂසිද්ධිඃ** = නිවන් සිද්ධ වීමෙක්; **න** = නැත්තේ ය; **කිමු කරවාණි** = (එහෙයින්) කුමක් කෙරෙම් ද? **මුනීන්ද්‍ර** = සර්වඥයන් වහන්ස; **දාස්‍යම්** = දාසභාවය හෙවත් උපාසක භාවය; **දෙහි** = මට දුන මැනව.

**භාවය**:- සිය සැමියාට හොරෙන් සොර සැමියකු වෙත යන වෛශ්‍යාවක මෙන් මගේ සිත ඔබ හැර පස්කම් වෙත ඇදී යයි. එහෙත් පස්කම් සැප සෙවුනහුට නිවණෙක් නැත. මුනීන්ද්‍රයන් වහන්ස, මාගේ දුබලකම ගැණ කුමක් කරම් ද? මා දාසයෙකු කර ගත මැනවි.

**විස්තර**:- බෞද්ධයෙකුගේ වුවත් හිත නො දනුවත් ව ම පස්කම් සැපතෙහි ඇලෙන බවත්, එය ඉතා දුබලකමක් බවත්, එබන්දන්හට නිවන් නො ලැබෙන බවත් මෙයින් දක්වේ.

**අසතී** = පතිව්‍රතයෙන් තොර ස්ත්‍රිය යි. 'පතිව්‍රතය' නම් පරපුරුෂයන් ගැණ කිසි ම අපේක්‍ෂාවක් නැති ව සිය සැමියාගෙන් ම සතුටු වන බව යි.

**අපාස්‍ය** = 'අප' පූර්ව 'ආස් උපවේශනෙ' ධාතු යි. පූර්ව ක්‍රියා යි.

**විෂයිණඃ** = 'විෂයින්' ශබ්ද ෂෂ්ඨ්‍යන්ත වචන යි. "විෂයාණ්‍යස්‍ය සන්තීති විෂයී, තස්‍ය." 'ඉන්' ප්‍රත්‍යයාන්ත අස්ත්‍යර්ථ තද්ධිත යි.

**කරවාණි** = 'කෘ' ධාතු යි ලොට් ප. උ. එකවචන යි.

**දේහි** = 'දා' ධාතු යි. ලොට් ප. ම. එකවචන යි.

36 ප්‍රියතම පුරුෂොත්තමාග්‍ර බුද්ධ
ශ්‍රමහර සිද්ධ ජගත් ප්‍රසිද්ධ කීර්තෙ,
භව ශරණමනුත්තර ප්‍රසාදින්
ප්‍රතිපදමස්මි තවෛව දාසදාසඃ.

**පදාර්ථ**:- **ප්‍රියතම** = අතිශයින් ප්‍රිය වූ; **පුරුෂොත්තමාග්‍ර** = (ප්‍රත්‍යෙකබුද්ධාදි වූ) උත්තම පුරුෂයන්ට අග්‍ර වූ; **බුද්ධ** = චතුස්සත්‍යය දත්තා වූ; **ශ්‍රමහර** = සංසාර ඛෙදය හරණා වූ; **සිද්ධ** = (රාගාද්‍යශෙෂ මල විවික්ත හෙයින්) පරිනිෂ්පන්න වූ; **ජගති ප්‍රසිද්ධ කීර්තෙ** = ලොකප්‍රසිද්ධ වූ කීර්ති ශබ්ද ඇති භාග්‍යවතුන් වහන්ස; **ශරණම් භව** = මට පිහිට වුව මැනවි; **ප්‍රසාදින්** = (ක්ලෙශ කාලුෂ්‍ය රහිත බැවින්) ප්‍රසාදවත් වූ; **අනුත්තර** = (තමහට අධික පුද්ගලයක්හු නැති බැවින්) අනුත්තර වූ ශාස්තෘන් වහන්ස; **ප්‍රතිපදං** = අඩියක් පාසා; **තව එව** = ඔබ වහන්සේගේ ම; **දාසදාසඃ අස්මි** = දාසයන්ටත් දාසයෙමි.

**භාවය**:- අතිශයින් ප්‍රිය වූ උත්තමය, උතුම් පුරුෂයන්ට ශ්‍රෙෂ්ඨය, බුදුරජාතන් වහන්ස, සසරදුක දුරු කරණ ස්වාමීනි, බලාපොරොත්තු සමෘද්ධ කර ගත් උතුමානනි, මුළු ලොව පතළ කීර්ති ඇත්ත, ප්‍රසාදවත් වූ ශුද්ධොත්තමය, තමහට වඩා ශ්‍රෙෂ්ඨයකු නැති ශාස්තෘන් වහන්ස, මට පිහිට වනු මැනවි. මම ඔබ පසු පස යන ඉතා පහත් දාසයෙක් වෙමි.

**විස්තර:-** මෙයින් ද එක් එක් ගුණ නාමයෙන් බුදුරජාණන් වහන්සේ අමතා සවකීය දුසත්වය ප්‍රතිඥා කළහ.

**පුරුෂොත්තමාග්‍ර** = මෙය "පුරුෂොත්තම + අග්‍ර" යි ආමන්ත්‍රණ පද දෙකක් ලෙස ද ගත හැකි ය. "පුරුෂයන්ට ශ්‍රෙෂ්ඨය, සියල්ලන්ට ශ්‍රෙෂ්ඨය" කියා ඒ දෙකට වෙන වෙන ම අර්ථ ගත යුතු යි.

**ජගත්ප්‍රසිද්ධකීර්ති** = ජගති ප්‍රසිද්ධා කීර්තිර්යස්‍ය ස ජගත්ප්‍රසිද්ධකීර්තිඃ." ෂෂ්ඨී බහුව්‍රීහි යි.

**ප්‍රතිපදම්** = "පදං පදං ප්‍රති ප්‍රතිපදම්." අව්‍යයීභාව සමාස යි.

37. **දශබල කලිකාලදුර්බලො'හං**
**චිරදුරිතාර්ණවතුඞ්ගභඞ්ගමග්නඃ,**
**තව කථමනුයාමි ධර්මනාවං**
**ජින මම දෙහි කෘපාකරාවලම්බම්.**

**පදාර්ථ:-** **දශබල** = (ස්ථානාස්ථානඥානාදි වූ) දශවිධ බලයෙන් යුක්ත වූ සර්වඥයන් වහන්ස; **කලිකාල** = පාප පුද්ගලයන් ඇති කාලය හෙතු කොට ගෙණ; **දුර්බලඃ** = ශ්‍රද්ධාදි බල රහිත වූ; **චිරදුරිතාර්ණව** = බොහෝ කලක් පුරුදු වූ රාගාදි පාප නැමැති සමුද්‍රයෙහි; **තුඞ්ගභඞ්ගමග්නඃ** = උස්වූ රළ පහරින් ගැලුනා වූ; **අහම්** = මම; **තව** = නුඹ වහන්සේගේ; **ධර්මනාවම්**= තව ලොවුතුරා දහම් නැමැති නැවට; **කථං අනුයාමි** = කෙසේ එලඹෙම් ද? **ජින** = සර්වඥයන් වහන්ස; **මම** = මට; **කෘපාකරාවලම්බම්** = කරුණා නැමැති අතලොබුවක්; **දෙහි** = දුන මැනවි.

**භාවය:-** දශබලධාරීන් වහන්ස, පව්වූ පුගුලන් බහුල කාලයක උපන් බැවින් දුබල වූ බොහෝ කාලයක් මුළුල්ලෙහි පවෙහි ගැලී සිටින මම කෙසේ එක්වර ම ඔබගේ ධර්මය අවබොධ කරම් ද? එබැවින් පින්වත් සර්වඥයන් වහන්ස, කරුණාවෙන් මට ධර්මය අවබොධ කොට වදාළ මැනවි.

**විස්තර:-** මෙහි පව් මුහුද ලෙස ද, පාපවේග එහි රළ පහර ලෙස ද, ධර්මය නැවක් ලෙස ද, කරුණාව අතක් ලෙස ද රූපණය කළහ. ප්‍රකෘතියෙන් මත් දුබල වූ බොහෝ කලක් මුහුදු රළෙහි ගැලී සිටියෙකුට එක වරට ම නැවකට නැග්ග

නො හැක. යමකු අත දුන්නොත් එය අල්ලා ගෙණ නැගිය හැක. එසෙයින් පාපීන් බහුල කාලයක ඉපදීමෙනුත් දුශ්ශීල වූ, කලක් මුළුල්ලෙහි පව් මුහුදු රළෙහි ගැලී සිටිනා මට එක් වරට ම ඔබගේ දහම් නැවට නැංග නො හැක. එබැවින් මට අල්ලා ගෙණ ගොඩ නගිනු සඳහා ඔබගේ කරුණා නමැති අත දෙනු මැනවැ යි අලඞ්කාරයෙන් කිහ. මෙහි දුශ්ශීලභාවයට හෙතු දෙකෙකි. පව්ටන් බහුල කාලයක ඉපදීම එකෙකි. පරිසරය අනු ව මිනිසුන් ද හැඩ ගැසෙන බැවින් පව්ටන් අතර උපන් තැනැත්තේත් පව්ටෙක් ම වේ. බොහෝ කලක් පවෙහි ගැලි සිටීම අනික ය. කලක් පවෙහි ගැලී සිටීමෙන් පවට ම පුරුදු වේ.

**දශබල** = "දශ බලානි යස්‍ය ස දශබලඃ" (මින් පසු දුෂ්කර සමාස විග්‍රහ පමණක් දැක්වේ. සමාස නාම චින්ත්‍ය යි )

බුදුරජාණන් වහන්සේට ඥාන බල දශයෙකි. ස්ථානාස්ථාන ඥානය, විපාක ඥානය, සර්වත්‍ර ගාමිනී ප්‍රතිපද ඥානය, අනෙකධාතු නානාධාතු ලොක ඥානය, නානාධිමුක්තිකතා ඥානය, ඉන්ද්‍රිය පරාපරතාඥානය, ධ්‍යාන විමොක්ෂ සමාධි සමාපත්ති ඥානය, පූර්වේ නිවාසානුස්මෘති ඥානය, පරචිත්තවිජානන ඥානය, ආස්‍රව ක්ෂයකර ඥානය යන දශය යි. උන්වහන්සේට සියලු වික්‍රම දැක්වීමට මේ ඥානබල දශය උපකාර වේ. උන් වහන්සේගේ කායබලය ද අතුල්‍ය ය. මිනිසුන් දසකෝටි දහසක ශක්තිය උන්වහන්සේට ඇත්තේ ය. ඒ කායබලය යි. ඊට නාරායණ බලය යි ද කියති.

**කලිකාලදුශ්ශීලඃ** = "කලීනාං කාලඃ කලිකාලඃ, තස්මාද් දුශ්ශීලඃ කලිකාලදුශ්ශීලඃ." 'කලි' ශබ්දයෙන් පාපීහු වාච්‍ය වෙද්දැ යි පරීක්ෂා කටයුතු යි.

**චිරදුරිතාර්ණව තුඞ්ගභඞ්ගමග්නඃ** = දුරිතාන්‍යෙවාර්ණවො දුරිතාර්ණවඃ, තුඞ්ගාශ්ච තෙ භඞ්ගාශ්චෙති තුඞ්ගභඞ්ගාඃ, දුරිතාර්ණවස්‍ය තුඞ්ගභඞ්ගාඃ = දුරිතාර්ණවතුඞ්ගභඞ්ගාඃ, තෙෂු මග්නො දුරිතාර්ණවතුඞ්ගභඞ්ගමග්නඃ, චිරං දුරිතා-පෙ-මග්නඃ = චිරදුරිතාර්ණවතුඞ්ගභඞ්ගමග්නඃ" 'දුරිත' නම් වැරදි ක්‍රියා ය. පව් ය.

**ධර්මනාවම්** = "ධර්ම එව නෞර්ධර්මනෞඃ, තාම්." 'ධර්මනෞ' ශබ්ද ද්විතීයෙක වචන යි.

**කෘපාකරාවලම්බම්**="කෘපා එව කරඃ කෘපාකරඃ, තස්මින් අවලම්බඃ කෘපාකරාවලම්බඃ නම්" 'අවලම්බ' යනු 'අව' පූර්ව 'ලබි අවලම්බනෙ' දයින් නිපන් භාව කෘදන්ත යි. "අවලම්බන මවලම්බඃ."

38 **ප්‍රණතිරියමනෙකශස්තවාහං**
**බහු භවදුඃඛමවෙක්‍ෂ්‍ය භීතිභීතඃ**
**ධර ගුරුතරතෘෂ්ණයා පතන්තං,**
**ජින මම දෙහි කෘපාකරාවලම්බම්.**

**පදාර්ථ**:- **තව** = නුඹ වහන්සේට; **අනෙකශඃ** = නොයෙක් වර; **ඉයම් ප්‍රණතිඃ** = මේ මාගේ වැඳීම ය; **අහම්** = මම; **බහු භවදුඃඛම්** = බොහෝ වූ සංසාර දුඃඛය; **අවෙක්‍ෂ්‍ය** = බලා; **භීතිභීතඃ** = ඉතා බියපත් වීමි. **ගුරුතරතෘෂ්ණයා** = අතිශයින් බර වූ තෘෂ්ණාවෙන්; **පතන්තං** = හෙන්නා වූ (මා); **ධර** = දරුව මැනව; **ජින** = ධර්මරාජයන් වහන්ස; **කෘපාකරාවලම්බම්** = කරුණා නැමැති අතලොබුව; **මම** = මට; **දෙහි** = දුන මැනව්.

**භාවය**:- මම නොයෙක් අයුරින් ඔබවහන්සේට වඳිමි. මම බොහෝ වූ සසර දුක දැක ඉතා බියපත් ව සිටිමි බලවත් තෘෂ්ණාව හෙතු කොට ගෙණ අපායට වැටෙන මා ඔබගේ කරුණාවෙන් ගලවා ගත මැනවි

**විස්තර**:- මගේ තෘෂ්ණාව ඉතා බලවත් බැවින් මා අපායට වැටිය හැකි ය. එහෙයින් එහි නො වැටී එල්බ සිටිනු සඳහා ඔබගේ කරුණා නමැති අත මට දුනමැනවැ යි මෙහි ද අලඞ්කාරයට නගා කිහ. යමක එල්බ සිටින්නෙක් පහළට නො වැටෙයි.

**අනෙකශඃ** = "අනෙකප්‍රකාරෙණ = අනෙකශඃ." ප්‍රකාරාර්ථ යෙහි 'ශස්' ප්‍රත්‍යය යි.

**ගුරුතරතෘෂ්ණයා** = "ඉයමෙතාසාමතිශයෙන ගුර්වීති ගුරුතරා, ගුරුතරා ච සා තෘෂ්ණාචෙති ගුරුතරතෘෂ්ණා, තයා."

**ධර** = 'ධෘඤ් ධාරණෙ' ලොට් ප. ම. එකවචන යි.
**පතන්තම්** = වර්තමාන කෘදන්ත 'පතත්' ශබ්ද ද්විතීයෛක වචන යි.

39. **ජගති තව කෘපා හි නිර්විශේෂා**
**ප්‍රපව තයා ජින මාඤ්ච දෝෂ දූෂ්ටං,**
**අලමහමිහ නෝ සුඛී තයේන්දුර්**
**න සමකරශ්චරතීහ සාධ්වසාධ්වෝඃ.**

**පදාර්ථ:-** **ජින** = සම්‍යක් සම්බුද්ධයන් වහන්ස; **තව** = නුඹ වහන්සේගේ; **කෘපා හි** = කරුණාව වනාහි; **ජගති** = සමස්ත ලොකයා කෙරෙහි; **නිර්විශේෂා** = සාධාරණ ව පවත්නී ය; **තයා** = ඒ සකල ලොක සාමාන්‍ය කරුණාවෙන්; **දෝෂ දූෂ්ටං** = රාග ද්වේෂාදියෙන් දූෂිත වූ; **මාං ච** = මා ද; **ප්‍රපව** = පවිත්‍ර කොට වදාළ මැනව; **අහම්** = මම; **තයා** = ඒ කරුණා සජාත මාත්‍රයකින්; **අලං** = අත්‍යර්ථයෙන්; **සුඛී** = සුවපත් වෙමි. (ඒ එසේ මැයි); **ඉහ** = මේ ලොකයෙහි; **ඉන්දුඃ** = චන්ද්‍ර තෙමේ; **සාධ්වසාධ්වෝඃ** = සිල්වත් වූ සත්පුරුෂයන් කෙරෙහි ද, චෞරාදි වූ අසත්පුරුෂයන් කෙරෙහි ද; **සමකරඃ** = සම වූ ශීතල රශ්මි ඇත්තේ ම; **නෝ න චරති** = නො හැසිරෙන්නේ නො වෙයි, හැසිරෙන්නේ මැයි.

භාවය:- සඳරැස් සත් අසත් සියල්ලන් කෙරෙහි **එක සේ** පැතිරෙයි. බුදුරජාතන් වහන්ස, **එසෙයින් ම** ඔබගේ කරුණාව ද සියලු ලෝවැස්සා කෙරෙහි **සම සේ පතළා ය.** රාගාදියෙන් කිලිටි වූ මා ද එයින් පිරිසිදු කොට වදාළ මැනව. එයින් මම ඉතා ම සුවපත් වෙමි.

**විස්තර:-** මෙයින් බුදුරදුන්ගේ **කරුණාවෙහි** සාධාරණත්වය දක්වූහ.

**ප්‍රපව** = 'ප්‍ර' පූර්ව 'පූඞ් ශෝධේ' ලෝට් ප. ම. එකවචන යි. භ්වාදි ගණයට අයත් 'පූ' ධාතුව ආත්මනෙපදි ය යි ශ්‍රීමත් **තාරානාථයෝ** කියති. ඒ අනු ව නම් ශුද්ධ පාඨය 'ප්‍රපවස්ව' යනු යි. එවිට වෘත්තය බිඳේ. එබැවින් මෙය **චන්ද්‍රභාරතීන්ගේ** ම සදොස් යෙදුමක් බව පෙණේ.

**චරති** = 'චර ගතෞ' ලට් ප. ප්‍ර. එකවචන යි. මෙහි **නෝ න** යන ප්‍රතිෂේධාර්ථ නිපාත දෙකක් යෙදීමෙන් ප්‍රකෘතාර්ථය දෙයි "උභෞ නඤෞ ප්‍රකෘතාර්ථමනුසරතඃ" යනුවෙන් ඒබැව් දක්වූහ. මේ නිපාත ද්වය යෙදුනේ විශේෂ ලක්ෂණයක් පිණිස නො ව ශ්ලොකපාද පූරණය සඳහා ය.

**සාධ්වසාධ්වෝඃ** = "සාධුශ්චාසාධුශ්චෙති සාධ්වසාධූ," තයොඃ. සප්තමී ද්විවචන යි.

40. **උපචිත බහු මොහජාතමන්ධං**
**විගතදයං විගතාත්මබන්ධුගන්ධම්,**
**අපගතගුණවිද්‍යමුද්ගතාඝං**
**ජනමවිවෙකමවාශු දීනබන්ධො.**

**පදාර්ථ:-** **උපචිත බහු මොහජාතං** = රැස් කරණ ලද බොහෝ වූ අවිද්‍යා සමූහ ඇති; **අන්ධම්** = එහෙයින් ම නුවණැස් නැත්තා වූ; **විගතදයං** = කාරුණාවෙන් තොර වූ; **විගතාත්මබන්ධුගන්ධම්**= සිය නෑයන්ගෙන් වියෝ වූ; **අපගත ගුණවිද්‍යං** = ගුණයෙන් හා විද්‍යාවෙන් වෙන් වූ; **උද්ගතාඝම්** = උත්සන්න වූ පව් ඇති; **අවිවේකම්** = කාය විවෙක, චිත්ත විවෙක රහිත වූ; **ජනං** = මේ අසරණ ජනයා; **දීනබන්ධො** = බැගෑපත්තුන්ට බන්ධු වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්ස; **ආශු** = වහා; **අව** = රක්‍ෂා කළ මැනව.

**භාවය:-** දුප්පතුන්ට හිත වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්ස, අතිශයින් අඥාන වූ එහෙයින් ම අන්ධ වූ කාරුණාවෙන් තොර නෑදෑ බන්ධු වර්ගයාගෙන් වෙන් වූ ගුණයක් හෝ උගත් කමක් නැති පව්වූ වූ නො සන්සුන් ගති ඇති මේ අසරණ ජනයා වහා රැක ගණු මැනවි.

**විස්තර:-** උක්ත ප්‍රකාර පිරිහුණු ජනයා එකී ලාමක තත්ත්වයෙන් නගා සිටුවනු සඳහා වහා ඔවුන්ට පිහිට වනු මැනවැයි කී තියා යි.

**උපචිතබහුමොහජාතම්** = "මොහස්‍ය ජාතං මොහජාතම්, බහු ච තද් මොහජාතඤ්චෙති බහුමොහජාතම්, උපචිතං බහුමොහජාතං යෙන ස උපචිතබහුමොහජාතඃ, තම්."

**විගතදයම්** = "විගතා දයා යස්මාත් ස විගතදයඃ, තම්."

**විගතාත්මබන්ධුගන්ධම්** = "ආත්මනො බන්ධව අත්මබන්ධවඃ, තෙෂාං ගන්ධඃ (=සම්බන්ධඃ) ආත්මබන්ධුගන්ධඃ, විගත ආත්මබන්ධුගන්ධො යස්මාත් ස විගතාත්මබන්ධුගන්ධඃ, තම්."

**අපගතගුණවිද්‍යම්** = 'ගුණශ්ච විද්‍යා ච ගුණවිද්‍යෙ, අපගතෙ ගුණවිද්‍යෙ යස්මාත් සො 'පගතගුණවිද්‍යඃ, තම්."

**උද්ගතාඝම්** = "උද්ගතම් අඝං යස්‍ය ස උද්ගතාඝඃ, තම්."

**අවිවෙකම්** = "නාස්ති විවෙකො යස්‍ය සො'විවෙකඃ, තම්."

**අව** = 'අව රක්‍ෂණෙ' ලොට් ප. ම. එක වචන යි. **ආශු** = ශීඝ්‍රාර්ථයෙහි නිපාත යි.

41. **අකරවමුරුදුෂ්කෘතම් පුරා යද්**
**මම වපුෂා වචසා ච චේතසා ච,**
**අනුකලමඛිලං ප්‍රලීයතාං තත්**
**තව චරණස්මරණෙන සර්වවේදින්.**

**පදාර්ථ:-** **පුරා** = පූර්ව ජාතියෙහි; **මම** = මාගේ; **වපුෂා** = ශරීරයෙන් ද; **වචසා ච** = වචනයෙන් ද; **චේතසා ච** = චිත්තයෙන් ද; **යත් උරු දුෂ්කෘතම්** = මාතෘ ඝාතාදි වූ යම් මහත් පාපයක්; **අකරවම්** = කෙළෙම් ද; **අඛිලං තත්** = ඒ සියලු පාපය තෙමේ; **සර්වවේදින්** = සර්වඥයන් වහන්ස; **තව** = නුඹ වහන්සේගේ; **චරණස්මරණෙන** = ශ්‍රීපාදය සිහි කිරීමෙන්; **අනුකලම්** = ක්ෂණ ක්ෂණයෙහි; **ප්‍රලීයතාම්** = නැසේවා.

**භාවය:-** භවත් සර්වඥයන් වහන්ස, මා විසින් පෙර ජාතිවල කය, වචන, හිත යන තුන් දෙරින් කරණ ලද සියලු ම බලවත් පව් ඔබගේ ශ්‍රී පාදය සිහි කිරීමෙන් ම වහ වහා නැසේවා.

**විස්තර:-** **අකරවම්** = 'කෘ' ධාතු යි. ලඞ් ප. උ. එක වචන යි

**අනුකලම්** = "කලමනතික්‍රම්‍යානුකලම්." අව්‍යයීභාව යි. මෙහි 'කලා' ශබ්දය ස්වල්ප කාලාර්ථ යි

**ප්‍රලීයතාම්** = ප්‍ර පූර්ව 'ලී ශ්ලෙෂෙ' ලොට් ආ. ප්‍ර. එක වචන යි.

**සර්වවේදින්** = "සර්වං වෙත්තීති සර්වවෙදී." 'සර්ව' ශබ්දෙපපද 'විද් ඥානෙ' ධාතු යි. 'ඉන්' ප්‍රත්‍යයාන්ත කෘදන්ත යි.

42. **සුගත තව පුරඃ පුරඃ පෘථිව්‍යාම්**
**මධුරමතෙ පතිතො'ස්මි දණ්ඩනත්‍යා,**
**අකුශලමඛිලං තවානුභාවාත්**
**ප්‍රපතතු නොත්පතතාත් පුනස් සමෙහව.**

**පදාර්ථ:-** **මධුරමතෙ** = යහපත් වූ නුවණ ඇති; **සුගත** = සර්වඥයන් වහන්ස; **තව** = නුඹ වහන්සේගේ; **පුරඃ පුරඃ** = ඉදිරි ඉදිරියෙහි; **දණ්ඩනත්‍යා** = දණ්ඩ නමස්කාරයෙන්; **පෘථිව්‍යාං** = පොළොවෙහි; **පතිතො'ස්මි** = බැස වැන්දෙමි. **තවානුභාවාත්** = නුඹ වහන්සේගේ අනුභාවයෙන්; **අඛිලම් අකුශලම්** = මාගේ සියලු පාපය තෙමේ; **ප්‍රපතතු** = (ඒ නමස්කාරය හා) වැටේවා; **පුනඃ** = නැවත; **සමෙහව** = නැගිටීම හා එක් ව; **නොත්පතතාත්** = (එම පාපය) නො නැගී සිටීවා.

**භාවය**:- මිහිරි නුවණ ඇති සුගතයන් වහන්ස, ඔබ ඉදිරියෙහි පොළොවෙහි මම දණ්ඩ නමස්කාරයෙන් වැටෙමි. මගේ සියලු අකුසල් ඔබ අනුහසින් ඒ මාගේ වැටීම සමග ම වැටේවා, හෙවත් යට පත් වේවා. නැවත මාගේ නැගිටීම හා සමග නො නැගිටීවා, හෙවත් මතු නො වේවා.

**විස්තර**:- **මධුරමතෙ** = "මධුරාමතිර්යස්‍ය ස මධුරමතිඃ." සම්බොධන යි

**දණ්ඩනතඃ** = "දණ්ඩ ඉව නතිර් දණ්ඩනතිඃ, තයා."

**අනුභාවාත්** = හෙතුවර්ථයෙහි පස්වැනි යි.

**ප්‍රපතතු, නොත්පතතාත්** = 'ප්‍ර' පූර්ව, 'න + උද්' පූර්ව 'පත්‍ෟ පතනෙ' ලොට් ප. ප්‍ර. එක වචන යි.

43. **තව චරණ සරොජමෙව වන්දෙ**
**තව පදපඞ්කජමෙව පූජයාමි,**
**තව පදයුගමෙව භාවයෙ'හං**
**තව පදමෙව සදෛව දෛවතම්මෙ.**

**පදාර්ථ**:- **තව** = නුඹ වහන්සේගේ; **චරණසරොජමෙව** = ශ්‍රීපාද පද්මය ම; **අහං** = මම; **වන්දෙ** = වඳිමි. **තව** = නුඹ වහන්සේගේ; **පාදපඞ්කජමෙව** = ශ්‍රීපාද පද්මය ම; **පූජයාමි** = පුදමි. **තව** = නුඹ වහන්සේගේ; **පදයුගමෙව** = ශ්‍රීපාද යුග්මය ම; **භාවයෙ** = සිතින් සලකමි; **තව** = නුඹ වහන්සේගේ; **පදමෙව** = ශ්‍රීපාදය ම; **සදෛව** = හැම කල්හි ම; **මෙ** = මට; **දෛවතම්** = දේවතා වන්නේ යි.

**භාවය**:- ඔබ වහන්සේගේ පා පියුම ම මම වඳිමි. එය ම පුදමි. එය ම සිහි කරමි. එය ම හැම කල්හි මගේ දෙවියා ය.

**විස්තර**:- **චරණ සරොජම්** = "සරසි ජාතං සරොජං, චරණමෙව සරොජං චරණසරොජම්, තත්."

**පදපඞ්කජම්** = "පඞ්කෙ ජාතං පඞ්කජං, පදමෙව පඞ්කජං පදපඞ්කජම්, තත්."

**භාවයෙ** = 'භූ සත්තායාම්' ප්‍රයොජ්‍ය ලට් ප. උ. එක වචන යි.

44. **කමපි න කථයාමි නාචයාමි**
**කමපි න නෞමි න විනයාමි නෙහෙ,**
**කමපි න ශරණං ව්‍රජාමි හිත්වා**
**තව චරණං පිතරසමි කිඞ්කරයෙත.**

**පදාර්ථ:-** **තව** = නුඹ වහන්සේගේ; **චරණං හිත්වා** = ශ්‍රීපාදය හැර; **කමපි** = කිසිවක්හු, **න කථයාමි** = නාමග්‍රහණ වශයෙන් නො කියමි. **කමපි** = කිසිවක්හු; **නාර්චයාමි** = නො පුදමි. **කමපි** = කිසිවක්හු; **න නෞමි** = සතුති නො කෙරෙමි. **කමපි** = කිසිවක්හු; **න චින්තයාමි** = නො සිතමි. **කමපි** = කිසිවක්හු; **නෙහෙ** = නො පතමි. **කමපි** = කිසිවක්හු; **න ශරණං ව්‍රජාමි** = ශරණ කොට නො යමි; **පිතඃ** = හිතකාරී වූ පියාණන් වහන්ස; **තෙ** = නුඹ වහන්සේගේ; **කිඞ්කරඃ අස්මි** = දාසයෙක් වෙමි.

**භාවය:-** මාගේ පියාණන් වහන්ස, ඔබ වහන්සේගේ ශ්‍රීපාදය හැර අන් කිසිවක නම මම නො කියමි. කිසිවක් නො පුදමි. කිසිවකට සතුති නො කරමි. කිසිවක් නො සිතමි. නො පතමි. සරණ නො යමි. මම ඔබගේ කිකරු දාසයෙක්මි.

**විස්තර:-** ඒ සියල්ලම කරන්නේ ඔබ වහන්සේගේ ශ්‍රීපාදයට ය යි කී නියා යි.

**අර්චයාමි** = 'අර්ච පූජායාම්' ලට් ප. උ. එක වචන යි.

**නෙහෙ** = න + ඊහෙ, 'ඊහ චෙෂ්ටායාම්' ලට් ආ. උ. එක වචන යි.

45. **සදසි සදසි වාචි වාචි සිද්ධං**
**පථි පථි සද්මනි සද්මනීහ බුද්ධම්,**
**භුවි භුවි මම වාරි වාරි චෙතඃ**
**කලයතු නිත්‍යමිමං හි ලොකනාථං.**

**පදාර්ථ:-** **ඉහ** = මෙ ලොකයෙහි; **සදසි සදසි** = සබයක් සබයක් පාසා ද; **වාචි වාචි** = වචනයක් වචනයක් පාසා ද; **පථි පථි** = මඟක් මඟක් පාසා ද; **සද්මනි සද්මනි** = ගෙයක් ගෙයක් පාසා ද; **භුවි භුවි** = බිමක් බිමක් පාසා ද; **වාරි වාරි** = දියක් දියක් පාසා ද; **සිද්ධම්** = අඛණ්ඩිතාඥා ප්‍රමාණ සිද්ධ වූ; **බුද්ධං** = සර්වඥ දන්නා වූ; **ඉමං ලොකනාථං හි** = මේ ලොකස්වාමී වූ බුදුරජාණන් වහන්සේ; **මම චෙතඃ** = මාගේ චිත්තය තෙමේ; **නිත්‍යම්** = අතුරු නැති ව; **කලයතු** = සිතාවා.

**භාවය:-** මාගේ සිත තෙමේ සභාවක් පාසා ද, වචනයක් පාසා ද, මාර්ගයක් පාසා ද, ගෙයක් පාසා ද, බිමක් පාසා ද, ජලයක් පාසා ද, ලොකස්වාමී වූ සර්වඥ දත් බුදුරජාණන් වහන්සේ ම සිතාවා

**විස්තර**:- කොතන සිටියත් නිතර ම මට බුදුරජ තෙමේ සිහි වේවා යි යූ සේ යි.

**භුවි, වාරි** = 'භූ, වාර්' ශබ්ද සප්තම්‍යෙක වචන යි.

**කලයතු** = 'කල ප්‍රේරණේ' ලොට් ප. ප්‍ර. එක වචන යි.

46. අවිරතමවලෝකයාමි බුද්ධං
ගතරජසා මනසාපි චක්ඛුෂෙව,
ස්වපිමි නිශි නිධාය යද්ධෘදි ත්වාං
න මම සමං විරහස් ත්වයාත එව.

**පදාර්ථ**:- **ගතරජසා** = පහ වූ රාගාදි රජස් ඇති; **මනසාපි** = (මාගේ) චිත්තයෙන් ද; **චක්ඛුෂෙව** = ඇසින් දක්නාක් මෙන්; බුද්ධං = (සකල ඥෙය මණ්ඩලය සම්‍යාකාරයෙන් දත්තා වූ) සර්වඥයන් වහන්සේ = **අවිරතම්** = නිරන්තරයෙන්; **අවලොක යාමි** = බලමි; **යත්** = යම් හෙයකින්; **නිශි** = රාත්‍රියෙහි; **ත්වාං** = නුඹ වහන්සේ; **හෘදි** = මාගේ හෘදයෙහි; **නිධාය** = පිහිටුවා; **ස්වපිමි** = සයනය කෙරෙම් **ද**; **අත එව** = එහෙයින් ම; **ත්වයා සමම්** = නුඹ වහන්සේ හා එක් ව; **මම** = මාගේ; **විරහඃ න** = වෙන් වීමෙක් නැති.

**භාවය**:- රාගාදියෙන් පවිත්‍ර වූ මගේ හිතට ද ඇසට පෙණෙන්නාක් මෙන් බුදුහු පෙණෙති. රෑ ද මා ඔබ සිහි කර ගෙණ ම නිදන බැවින් ඔබගෙන් වෙන් වීමෙක් මට ඇත්තේ ම නැත.

**විස්තර**:- නිතර ම මම ඔබ සමග වෙසෙමි යි කී තියා යි.

**අවලොකයාමි** = 'අව' පූර්ව 'ලොක දර්ශනෙ' ලට් ප. උ. එක වචන යි.

**ස්වපිමි** = 'ඤි ෂ්වප් ශයෙ' ලට් ප. උ. එක වචන යි.

**නිශි, හෘදි** = 'නිශ්, හෘද්' ශබ්ද සප්තම්‍යෙක වචන යි.

**නිධාය** = 'නි' පූර්ව 'ඩු ධාඤ් ධාරණපොෂණයොඃ' ධාතු යි. පූර්වක්‍රියා යි.

47. මම තදිහ දිනං හි දුර්දිනං ස්‍යාද්
අසිතඝනාස්ථගිතං න දුර්දිනමෙම,
යදමෘතසම බුද්ධරත්නනාම
ස්මෘතිරහිතං දිනමස්‍ය මා තදස්තු.

**පදාර්ථ**:- **ඉහ** = මේ ලොකයෙහි; **අසිතඝන** = කාල මෙඝයෙන්; **ස්ථගිතං** = වසන ලද; **දිනං** = දිනය; **මෙ** = මට; **න දුර්**

**දිනං ස්‍යාත්** = දුර්දින නම් නො වන්නේ ය. **අමෘතසම** = අමෘතයක් හා සමාන වූ; **බුද්ධරත්න නාම ස්මෘති** = උතුම් වූ සර්වඥයන්ගේ නාම ස්මරණයෙන්; **රහිතම්** = වෙන් වූ; **යත්** = යම් දිනයෙක් ඇද්ද; **තද් හි** = ඒ දිනය ම; මම = මට; **දුර්දිනම්** = දුර්දින නම් වන්නේ ය; **අස්‍ය** = ඒ මට; **තත්** = එබඳු දුර් දිනයෙක්; **මා අස්තු** = නො වේවා.

**භාවය:**– කලු වලාකුළින් වැසුනු දිනය මට දුර්දිනයෙක් නො වේ. අමා වැනි බුදු රුවන සිහි නො වන දිනය ම දුර්දිනයෙකි. එබඳු දිනයෙක් මට නො වේවා.

**විස්තර:**– දුර්දිනය නම් වැලැලි දිනය යි, හෙවත් වැසි අඳුරු සහිත දිනය යි. මට බුදුරදුන් සිහි නො වන දිනයත් එබඳු ය යි මෙහි කීහ.

**අසිතඝනසංඝිතම්** = "අසිතශ්ච ස ඝනශ්චෙත්‍යසිතඝනඃ, තෙන සංඝිතම් = අසිතඝනසංඝිතම්."

**අමෘතසම්බුද්ධරත්නනාමස්මෘතිරහිතම්** = "අමෘතෙන සමම්මෘතසමම්, බුද්ධ එව රත්නං බුද්ධරත්නම්, අමෘතසමඤ්ච තද් බුද්ධරත්නඤ්චෙති = අමෘතසම්බුද්ධරත්නම්, තස්‍ය නාම = අමෘතසම්බුද්ධරත්නනාම, තස්‍ය ස්මෘතිඃ = අමෘතසම්බුද්ධරත්නනාමස්මෘතිඃ, තයා රහිතම් = අමෘතසම්බුද්ධරත්නනාමස්මෘති රහිතම්."

48. **අමෘතද ෂඩභිඥ ධර්මරාජ**
**ත්‍රිභුවනවන්ද්‍ය මුනීන්ද්‍ර ගෞතමෙති,**
**අහරහරනුකීර්ත්‍යසෙ නෘභිර්යෛ-**
**රහමහිතානපි තාන් නමාමි ධන්‍යාන්.**

**පදාර්ථ:**– **අමෘතද** = අමෘතදය; **ෂඩභිඥ** = ෂඩභිඥය; **ධර්මරාජ** = ධර්මරාජය; **ත්‍රිභුවනවන්ද්‍ය** = ත්‍රිභුවන වන්ද්‍යය; **මුනීන්ද්‍ර** = මුනීන්ද්‍රය; **ගෞතමෙති** = ගෞතමය යන මේ ප්‍රකාරයෙන්; **යෛඃ නෘභිඃ** = යම් සත්ත්ව කෙනෙකුන් විසින්; **අහරහඃ** = දවසක් දවසක් පාසා; **අනුකීර්ත්‍යසෙ** = (බුදුන්ගේ නම්) කියනු ලැබේ ද; **ධන්‍යාන්** = පින්වත් වූ; **තාන්** = ඒ සත්ත්වයන්; **අහිතානපි** = මට වෛරී වුවත්; **අහම්** = මම; **නමාමි** = නමස්කාර කෙරෙමි.

**භාවය:**– අමෘතදායින් වහන්ස, ෂඩ් අභිඥා ඇත්ත, ධර්මරාජයන් වහන්ස, තුන්ලෝ වැසියන් විසින් වැන්ද යුත්ත, මුනීන්ද්‍රයාණන්

වහන්ස, ගෞතමයන් වහන්ස කියා මෙසේ දින පතා බුදු රදුන්ගේ නම්වලින් අමතන්නවුන් මට විරුද්ධ වුවත් මම ඒ පින්වතුන්ට වදිමි.

**විස්තර:**- බුදුරදුන්ගේ නම් කියන්නවුන්ට මම වදිමි යි කී නියා යි. **අමාතද** = "අමෘතං දදතීති = අමෘතදඃ." නිවණ ගෙණ දෙන්නා.

**ෂඩභිඥ** = "ෂඩ් අභිඥා යස්‍ය ස ෂඩභිඥඃ." සෘද්ධි විධ ඥානය, දිව්‍යශ්‍රොත්‍ර ඥානය, පරචිත්තවිජානන ඥානය, පූර්වේනිවාසානුස්මෘති ඥානය, දිව්‍යචක්ෂුර් ඥානය, ආශ්‍රවක්ෂයකර ඥානය යන අභිඥා සයක් බුදුරජානන් වහන්සේට ඇත්තේ ය.

**අනුකීත්තයතෙ** = 'අනු' පූර්ව 'කෘත සංශබ්දෙ' කම්කාරක ලට් ප්‍ර. එක වචන යි.

49. දශබල ජින සිද්ධ වජ්‍රබුද්ධ
සුගත තථාගත බුද්ධ ශාක්‍යසිංහ,
ඉති නිගදති යඃ ක්වචිත් කදාචිත්
තමභිනමාම්‍යපි දාසවංශජාතම්.

**පදාර්ථ:**- **දශබල** = දශබල ය යි කියා ද; **ජින** = ජින ය යි කියා ද; **සිද්ධ** = සිද්ධ ය යි කියා ද; **වජ්‍රබුද්ධ** = වජ්‍රබුද්ධි ය යි කියා ද; **සුගත** = සුගත ය යි කියා ද; **තථාගත** = තථාගත ය යි කියා ද; **බුද්ධ** = බුද්ධ ය යි කියා ද; **ශාක්‍යසිංහ** = ශාක්‍යසිංහ ය යි කියා ද; **යඃ** = යම් සත්වයෙක්; **ක්වචිත්** = කිසි තැනෙක්හිත්; **කදාචිත්** = කිසි කලෙක්හිත්; **ඉති නිගදති** = මෙසේ (බුදුන්ගේ නම් සිහි කොට) කියා නම්; **තම්** = ඔහු; **දාසවංශජාතමපි** = ගැති කුලෙහි උපන්නත්; **අභිනමාමි** = ආදරයෙන් වදිමි.

**භාවය:**- දශබලධාරීන් වහන්ස, ජිනෙන්ද්‍රයන් වහන්ස, සවකිය බලාපොරොත්තු සමෘද්ධ කර ගත් උත්තමය, වජ්‍රායුධයකට බඳු බුද්ධි ඇත්ත, සුගතයන් වහන්ස, තථාගතයන් වහන්ස, බුදුරජානන් වහන්ස, ශාක්‍යසිංහයන් වහන්ස කියා මෙසේ කවදා කොහි දී නමුත් බුදුරදුන්ගේ නම්වලින් අමතන්නවුන් දාස කුලයෙහි උපන්නවුන් වුවත් මම ඔවුන්ට වදිමි.

**විස්තර:**- බුදුරදුන්ගේ නම් කියන්නවුන් දාසයන් වුවත් මම ඔවුන්ට වදිමි යනු මෙහි ආශය යි.

**ශාක්‍යසිංහඃ** = "ශාක්‍යානාං සිංහ ඉව ශාක්‍යසිංහඃ." බුදුරජානන් වහන්සේ ශාක්‍ය කුලයෙහි උපන්නවුන්ට සිංහ යෙකු මෙනි. ඔවුන් සියල්ලන්ට ශ්‍රෙෂ්ඨ බැවිනි.

50. මදනජිදපරාජිතෙඩ්‍ය ශාස්තර්
විභව විනායක විශ්වවිද් වරෙණ්‍ය,
කවිවර වදතාං වරෙශ ශුද්ධෝ
දනසුත ශාක්‍යමුනෙ මුනෙ ප්‍රසීද.

**පදාර්ථ:-** **මදනජිත්** = දෙවපුත්‍ර මාරයා ජය ගත්තා වූ; **අපරාජිත**= කිසිවක්හට නො පරදනා වූ; **ඊඩ්‍ය** = සතුති කට යුතු වූ; **ශාස්තඃ** = දෙවි මිනිසුන්ට අනුශාසනා කරන්නා වූ; **විභව** = උත්පත්ති රහිත වූ; **විනායක** = නායකයන් රහිත වූ; **විශ්වවිද්**= සියල්ල දත්තා වූ; **වරෙණ්‍ය** = උතුම් වූ; **කවිවර** = චතුර්විධ කවීන්ට නායක වූ; **වදතාං** = වාදීන් අතුරෙන්; **වර** = ශ්‍රෙෂ්ඨ වූ; **ඊශ** = ජගදීශ්වර වූ, **ශුද්ධොදන සුත** = සුදොවුන් මහරජහුගේ පුත්‍ර වූ; **ශාක්‍යමුනෙ** = ශාක්‍යසිංහ වූ; **මුනෙ** = සර්වඥයන් වහන්ස; **ප්‍රසීද** = පැහැද වදාළ මැනවි.

**භාවය:-** කාමය දුරු කළ උත්තමය, නො පරදින සුලු ජිනෙන්ද්‍රය, පැසසිය යුත්ත, ශාස්තෘවරයාණෙනි, උත්පත්ති රහිතයාණෙනි, තමහට වඩා නායකයකු නැත්තාතනි, සර්වඥවරය, සර්වෝත්තමය, ශ්‍රෙෂ්ඨ කවිවරය වාගීශ්වරය, ඊශ්වරය; ශුද්ධොදන රජුගේ පුත්‍රයාතන් වහන්ස, ශාක්‍යසිංහයන් වහන්ස, මුනීන්ද්‍රයන් වහන්ස, මා කෙරෙහි පැහැද වදාළ මැනවි.

**විස්තර:-** මෙයින් ද එක් එක් ගුණ වචනයෙන් බුදුරදුන් අමතා සවකීය භක්ත්‍යවනත භාවය සැල කෙරෙයි. සන්තයෙහි දක්වුන චතුර්විධ කවීහු නම් සුතබුද්ධ, චතුසච්චබුද්ධ, පච්චෙකබුද්ධ, සබ්බඤ්ඤුබුද්ධ යන සිවු බුදුවරු යි.

**මදනජිත්** = "මදනමජෛෂීදිති මදනජිත්." 'මදන' ශබ්දොපපද 'ජි ජයෙ' ධාතු යි. අතීත කෘදන්ත යි. මෙහි 'මදන' යන්නට දෙවපුත්‍ර මාරයා යි සන්තයෙහි අර්ථ කී නමුත් මදන ශබ්දයෙන් කාමදෙවයාත් (=අනඞ්ගයාත්) පුරාවත් වාච්‍ය වන බව ශබ්දකොෂයන්හි දක්වේ.

**ඊඩ්‍ය** = "ඊඩිතව්‍ය ඊඩ්‍යඃ." සතුති කට යුත්තා 'ඊඩ සතුතෞ' ධාතු යි.

51. අමෘතමපි නිපීය නිර්ජරෙන්ද්‍රාඃ
පුනරපි තෙ'පි ශුනීස්තනං ධයන්ති,
සකෘදපි තව වාක්සුධාරසඥො
න විශති ජාතු ස මාතුරෙව ගර්භම්.

**පදාර්ථ:-** **නිර්ජරෙන්ද්‍රාඃ** = ඉන්ද්‍රොපෙන්ද්‍රාදි දිව්‍යරාජයෝ; **අමෘතමපි නිපීය** = අමෘත පානය කොට ද; **පුනරපි** = නැවතත් (අන්‍ය ජන්මයෙක්හි;) **තෙ'පි** = ඒ දෙවියෝ පවා; **ශුනීස්තනං** = බැල්ලගේ තනය; **ධයන්ති** = කිරි පිණිස බොති. **සකෘදපි** = එක් වරකුත්; **තව** = නුඹ වහන්සේගේ; **වාක්සුධා රසඥඃ** = වචනාමෘත රස දත්තා වූ (යම් පුරුෂයෙක් ඇද්ද;) **සඃ** = ඒ තෙමේ; **ජාතු** = කිසි කලෙකත්; **මාතුඃ ගර්භං** = මවු කුසට; **න විශති එව** = නො වදනේමැ යි.

**භාවය:-** ශක්‍ර බ්‍රහ්මාදි දෙවියෝ පවා නැවතත් බලු යෝනියෙහි ද උපදිති එහෙත් ඔබ වහන්සේගේ ධර්මය අවබොධ කළ පුද්ගල තෙමේ නැවත කවදාවත් මවු කුසකට නො පැමිණේ.

**විස්තර:-** නිවන් දුටුවෝ නැවත නූපදිති යි කී තියා යි.

**නිපීය** = 'නි' පූර්ව 'පා පානෙ' ධාතු යි. පූර්වක්‍රියා යි.

**නිර්ජරෙන්ද්‍රාඃ** = "නිර්ගතා ජරා යෙභ්‍යසෙත නිර්ජරාඃ, තෙෂාම් ඉන්ද්‍රාඃ = නිර්ජරෙන්ද්‍රාඃ ." ප්‍රධාන දෙවියෝ යි

**ශුනීස්තනම්** = "ශුන්‍යාඃ ස්තනං ශුනීස්තනම්." ශුනක වාචි 'ශවන්' ශබ්දයෙහි ස්ත්‍රීලිඞ්ග රූපය 'ශුනී' යනු යි.

**ධයන්ති** = 'ධෙට් පානෙ' ලට් ප. ප්‍ර. බහුවචන යි.

**වාක්සුධාරසඥඃ** = "වාග් එව සුධා වාක්සුධා, තස්‍යාඃ රසං ජානාතීති වාක්සුධාරසඥඃ."

**විශති** = 'විශ් ප්‍රවෙශෙ' ලට් ප. ප්‍ර. එක වචන යි.

52. **අහමිහ භගවන්නලං න සොඪුං**
**ජනනජරාමරණාමයාදි බාධාම්,**
**කුරු මම කරුණාං දිශො න ජානෙ**
**ගුරු තදපවක්‍ෂ්‍ය ච තිර්‍යගාදි දුඃඛම්.**

**පදාර්ථ:-** **ඉහ** = මේ සංසාරයෙහි; **ජනනජරාමරණාමයාදි** = ජාති ජරා මරණ රොගාදි වූ; **බාධාම්** = පීඩාව; **සොඪුම්** = ඉවසන්නට; **අහං** = මම; **න අලං** = නො පොහොසත්මි; **ගුරු** = මහත් වූ; **තත්** = ඒ ජාති ජරාදි දුඃඛය ද; **තිර්‍යගාදි දුඃඛඤ්ච** = තිරිසන් ප්‍රෙතාදි වූ දුඃඛය ද; **අපවක්‍ෂ්‍ය** = බලා; **දිශො න ජානෙ** = මේ දුකින් පිටත් ව යන දිශාවන් නො දනිමි; **භගවන්** = සර්වඥයන් වහන්ස; **මම** = මට; **කරුණාං කුරු** = ඒ දුකින් ගැලවෙන පරිද්දෙන් කරුණා කළ මැනවි,

**භාවය**:- මේ සංසාරයෙහි පවත්නා ජාති ජරා ව්‍යාධි මරණාදි දුක් ඉවසන්නට මට නො හැකි ය. ඒ දුක් පමණක් නො ව තිරිසන් ප්‍රෙතාදි අපාය දුක් ද දැකත් එයින් නික්මෙන දික් මම නො දනිමි. එබැවින් භාග්‍යවතුන් වහන්ස, ඒ දුම්ල වූ අඥාන වූ මට එකී දුකින් ගැලවෙනු පිණිස කරුණා කල මැනවි සසරින් නිදහස් වන මග කියා දෙනු මැනවි.

**විස්තර**:- **සොඪුම්** = 'ෂහ ක්ෂමායාම්' ධාතු යි. තාදර්ථි ක්‍රියා යි. **ජනනජරාමරණාමයාදි බාධාම්** = ජනනඤ්ච ජරා ච මරණඤ්ච ආමයශ්ච ජනනජරාමරණාමයාඃ, තෙ ආදෞ යස්‍ය ස ජනන ජරාමරණාමයාදිඃ, ස එව බාධා ජනනජරාමරණාමයාදිබාධා, තාම්."

**කුරු** = 'කෘ' ධාතු ලොට් ප. ම. එකවචන යි.

**ජානෙ** = 'ඥ' අවබොධනෙ' ලට් ආ උ. එක වචන යි.

53. තදුපරි පරිචිනත්‍ය වෘද්ධකාලෙ
කරචරණාදි දෘගාදි පාරවශ්‍යම්,
අගතිකමතිවෙපතෙ මනො මෙ
ජින කිමහං කරවෙ ප්‍රභො ප්‍රසීද.

**පදාර්ථ**.- **උපරි වෘද්ධකාලෙ** = මතු වයොවෘද්ධ අවස්ථාවෙහි; **තත් කරචරණාදි** = ඒ හස්ත පාදාදීන්ගේ ද; **දෘගාදි** = චක්ෂුඃ ශ්‍රොත්‍රා දීන්ගේ ද; **පාරවශ්‍යම්** = පරවශභ භාවය හෙවත් තමහට සිකරු නො වන බව; **පරිචිනත්‍ය** = සිතා; **අගතිකම්** = ශමථ විදර්ශනාදි පිහිටක් නැත්තා වූ; **මෙ මනඃ** = මාගේ චිත්තය; **අතිවෙපතෙ** = අතිශයින් කම්පිත වන්නේ ය **ජින** = සර්වඥයන් වහන්ස; **අහම්** = මම; **කිං කරවෙ** = කුමක් කෙරෙම් ද; **ප්‍රභො** = ස්වාමීන් වහන්ස; **ප්‍රසීද** = පැහැද වදාළ මැනවි.

**භාවය**:- මතු මහලු කාලයෙහි සිදු විය හැකි අත්, පා ඇස්, කන් ආදි අවයවයන්ගේ අවසඟ බව සිහි වී අසරණ වූ මගේ සිත බෙහෙවින් වෙවුලයි. පින්වත් ස්වාමීන් වහන්ස, මම එට පිළියම් වශයෙන් කුමක් කරම් ද? මට පිහිට වනු මැනවි.

**විස්තර**:- **කරචරණාදි දෘගාදිපාරවශ්‍යම්** = "කරශ්ච චරණෙ ච කරචරණානි, තානි ආදෞ යෙෂාං තෙ කරචරණාදයඃ, දෘශෞ ආදෞ යෙෂාං තෙ දෘගාදයඃ, කරචරණාදයශ්ච දෘගාදයශ්ච

කාරවරණාදිදුඃඛාදයඃ, පරෙෂාං වශඃ පරවශඃ, තස්‍ය භාවඃ පාරවශ්‍යම්. කරචරණාදිදුඃඛාදීනාං පාරවශ්‍යං කරචරණාදි දුඃඛාදිපාරවශ්‍යම්, තත්."

**අගතිකම්** = පිහිටක් නැති, අසරණ. "නාස්ති ගතිර්‍යස්‍ය තද් අගති, තදෙව අගතිකම්." ස්වාර්ථයෙහි 'ක' ප්‍රත්‍යය යි.

**අතිවෙපතෙ** = 'අති' පූර්ව 'වෙපෘ කම්පනෙ' ලට් ආ. ප්‍ර. එකවචන යි.

**කරවෛ** = 'කෘ' ධාතු ලොට් ආ. උ. එක වචන යි.

54\. **ශ්‍රවණ පථගතො'ප්‍යදෘෂ්ටපූර්වෙ**
**සුඛකෘති වස්තුනි යත් තනොමි තෘෂ්ණාම්,**
**අවිරතමත එව ශාන්තිබීජෙ**
**ත්වයි වලතෙ රමතෙ මමාන්තචෙතඃ.**

**පදාර්ථ:-** **අදෘෂ්ටපූර්වෙ'පි** = පෙර ඇසින් නුදුටු විරූ ද; **ශ්‍රවණපථ ගතෙ** = ශ්‍රොත්‍රද්වාරයට පැමිණියා වූ; **සුඛකෘති** = සැප ඇති කරන්නා වූ; **වස්තුනි** = පදාර්ථයෙහි; **යත්** = යම් හෙයකින්; **තෘෂ්ණාං තනොමි** = අභිලාෂ කෙරෙම් ද; **අතඃ එව** = එහෙයින් ම; **ශාන්තිබීජෙ** = දුඃඛ ශමථයට කාරණ වූ; **ත්වයි**= නුඹ වහන්සේ කෙරෙහි; **මමාන්තචෙතඃ** = මාගේ චිත්තය තෙමේ; **අවිරතම්** = නිරන්තරයෙන් ම; **වලතෙ** = එක් වන්නේ ය; **රමතෙ** = ඇලෙන්නේ ය.

**භාවය:-** සැප ගෙණ දෙන වස්තුවක් ගැණ ඇසූ පමණින් එය පෙර නුදුටු දෙයක් වුවත් එහි ආශාව උපදී. එසෙයින් ම නිවණට හෙතු වූ ඔබ කෙරෙහි මගේ සිත නිතර ම ඇලෙයි.

**විස්තර:-** යම් කිසි වස්තුවක් සැප ගෙණ දේ නම් එය පෙර දුක පුරුදු නැතත් ඒ ගැණ ඇසූ විගස ඒ වස්තුව කෙරෙහි ආශාවෙක් ඇති වෙයි. ඔබ නිවන් ගෙණ දෙන බැවින් සැප ගෙණ දෙන වස්තුවෙකි. එබැවින් පෙර මා විසින් ඔබ දුක පුරුදු නැතත් ඔබ කෙරෙහි මගේ සිත නිතර ම ඇලෙයි යූ සේ යි.

**අදෘෂ්ටපූර්වෙ** = "පූර්වේ අදෘෂ්ටම් අදෘෂ්ටපූර්වම්, තස්මින්."

**තනොමි** = 'තනු විස්තාරෙ' ලට් ප උ එකවචන යි.

**වලතෙ, රමතෙ** = 'වල සංවරණෙ, රමු ක්‍රීඩායාම්' ලට් ආ. ප්‍ර. එකවචන යි.

**අවිරතම්** = ක්‍රියා විශෙෂණ යි.

55. සම්පදි රමතෙ න මෙ මනො'තස්
සුරනරශර්මණි පූර්ව පූර්ව භුක්තෙ,
අනුදිනමනුභූය ශර්කරාශා
මපි විරතිං කුරුතෙ හි දෘෂ්ටදොෂඃ.

**පදාර්ථ:-** **පූර්ව පූර්ව භුක්තෙ** = පූර්ව පූර්ව ජන්මයෙහි අනුභව කරණ ලද; **සම්පදි** = විපරිණාම දුඃඛ සහිත වූ; **සුරනරශර්මණි** = දිව්‍ය මනුෂ්‍ය සැපයෙහි; **මෙ මනඃ** = මාගේ චිත්තය තෙමේ; **න රමතෙ** = නො ඇලෙන්නේ ම ය; **අනුදිනම්** = දවසක් දවසක් පාසා; **අනුභූය** = අනුභව කොට; **ශර්කරාශාමපි** = කඩ සකුරෙහි ද; **දෘෂ්ටදොෂඃ** = දක්නා ලද අජීර්ණාදි දොෂ ඇති පුරුෂ තෙමේ; **අතඃ විරතිං** = ඒ ශර්කරානුභවයෙන් වැළැක්ම; **කුරුතෙ හි** = කරන්නේ මැයි.

**භාවය:-** දිනපතා වැළඳීමෙන් සකුරුවල ඇති අජීර්ණතාදි දොස් දුටු විට එය අත් හරියි එසෙයින් ම පෙර පෙර ජාතිවල දී විඳ පළ පුරුදු වීමෙන් දෙව් මිනිස් සැපවල ඇති විපරිණාම දුඃඛත්වය අවබොධ වීම නිසා මගේ සිත එහි නො ඇලෙයි.

**විස්තර:-** සකුරු පැණි රස වුවත් එහි ඇති දොසක් පෙණුනොත් සකුරු කන්නට කිසිවෙක් කැමති නො වේ. එසේ ම දෙව් මිනිස් සැප මිහිරි වුවත් එය විපරිණාම දුඃඛ බැවින් හෙවත් පෙරළීමෙන්, වෙනස් වීමෙන් දුක් ගෙණ දෙන නිසා මම ඊට කැමති නො වෙමි යි මෙයින් දක්වූහ. සකුරුවල දොස් පෙණෙන්නේ ඒවා නිතර කන්නහුට ය. එසේ ම දෙව් මිනිස් සැපවල අස්ථිර බව වැටහෙන්නේ ද ඒවා නිතර විඳ පළ පුරුදු වූවහුට ය.

**සම්පදි** = "සහ විපදා යද්වර්තතෙ තත් සම්පත්, තස්මින්."

**පූර්වපූර්වභුක්තෙ** = "පූර්වෙ පූර්වෙ භුක්තං පූර්වපූර්වභුක්තම්, තස්මින්."

56. කරතලගතමප්‍යමූල්‍ය චින්තා
මණිමවධීරයතීඞ්ගිතෙන මූර්ඛඃ
කථමහමපහාය බුද්ධරතනං
ජගති ධනී ගුණවාංශ්ච පණ්ඩිතශ්ච

**පදාර්ථ:-** **මූර්ඛඃ** = මන්දභාග්‍ය වූ බාල තෙමේ; **කරතලගතම්** = හස්ත තලයට පැමිණියා වූ; **අමූල්‍ය** = මිල කළ නො හැකි; **චින්තාමණිම් අපි,** සිතුමිණි රුවන ද; **ඉඞ්ගිතෙන** =

ඉඟියෙකින් ම; **අවධීරයති** = අවඥ කෙරෙයි. (එපරිද්දෙන් ම;) **අහම්** = මම; **ජගති** = ලොකයෙහි; බුද්ධරත්නම් = (චින්තාමාණික්‍යයෙන් රත්න නම් වූ) බුදු රුවන; **අපහාය** = හැර; **කථම්** = කෙසේ; **ධනී** = ධනවත් වෙම් ද; **ගුණවාංශච** = ගුණවත් වෙම් ද; **පණ්ඩිතශ්ච** = පණ්ඩිත වෙම් ද? (නො වෙම් මැයි.)'

**භාවය**:- මෝඩ මිනිසා සිය අතට පැමිණි මහාර්ඝ සිතුමිණ පවා නින්දා කොට අත් හැර දමයි. එමෙන් ම මමත් ලොකයෙහි ම ශ්‍රෙෂ්ඨ රත්නය වූ බුද්ධරත්නය අත් හැර දැම්මොත් කෙසේ නම් ධනවතෙක් හෝ ගුණවතෙක් හෝ පණ්ඩිතයෙක් හෝ වන්නෙම් ද? නො වන්නෙම් මැ යි.

**විස්තර**:- 'සිතුමිණ' නම් සිතූ පැතූ දෑ දෙනැයි සැලකෙන මැණිකෙකි. එහි වටිනාකම නියම කළ නො හැකි ය. එහෙත් මෝඩයා ඒ බැව් නො දනී. එබැවින් ඔහුට එය ලැබුනත් ඒ ගැණ වචනයක් වත් නො කියා ඉඟි කිරීමෙන් ම අවඥා සහගත ලෙස එය ප්‍රතික්ෂෙප කරයි. එහෙයින් ඔහුට කවදා වත් පොහොසත් විය නො හැක. එසේ ම බුද්ධරත්නය වනාහි මුළු ලොකයෙහි ඉතා ම වටිනා මැණික ය. මට දැන් එය ලැබී තිබේ. එහෙත් මම එය නො පිළිගෙණ එයින් වෙන් ව ක්‍රියා කළොත් මට කවදාවත් ධනවතකු හෝ ගුණවතකු හෝ පණ්ඩිතයකු හෝ විය නො හැකි ය. මෙහි 'ධනවත් වීම' නම් සප්තාර්ය ධනයෙන් පොහොසත් වීම යි. ධනවතකු, ගුණවතකු හෝ පණ්ඩිතයකු වීමට නම් බුද්ධ භක්තිකයකු විය යුතු ය යනු මෙහි සාරය යි.

**අවධීරයති** = 'අව' පූර්ව 'ධිර අවඥායාම්' ලට් ප. ප්‍ර. එක වචන යි. මේ ධාතුව 'අව' උපසර්ගයෙන් වෙන් ව නො යෙදේ.

**ඉඞ්ගිතෙන** = ඉඟි කිරීමෙන්: සවකීය ශරීරාවයවවලින් අදහස් හැඟවීම ඉඟි කිරීම යි

57. **ස භවති මතිමාන් ස නා කුලීනස්**
**ස ච ගුණවාන් ස ච කීර්තිමාන් ස ශූරඃ,**
**ස ජගති මහිතස් සුඛී ස එව**
**තවයි ජින යස්‍ය සුනිශ්චලාසක්ති භක්තිඃ.**

**පදාර්ථ**:- **ජින** = සර්වඥයන් වහන්ස; **තවයි** = නුඹ වහන්සේ කෙරෙහි; **යස්‍ය** = යමෙකුගේ; **සුනිශ්චලා** = අතිශයින් දෘඪ වූ;

**භක්තිරස්ති** = ආදරයෙක් ඇද්ද; **සඃ** = ඒ තෙමේ; **මතිමාන් භවති** = නුවණැති වන්නේ ය. **ස නා** = ඒ පුරුෂ තෙමේ; **කුලීනඃ** = කුලජ වන්නේ ය. **ස ච** = ඒ පුරුෂ තෙමේ; **ගුණවාන්** = ගුණවත් වන්නේ ය. **ස ච** = ඒ පුරුෂ තෙමේ; **කීර්තිමාන්** = ප්‍රශස්ත වූ කීර්ති ඇත්තේ ය. **සඃ** = ඒ තෙමේ; **ශූරඃ** = නිභීය වන්නේ ය. **සඃ** = ඒ තෙමේ; **ජගති** = ලෝකයෙහි; **මහිතඃ** = පූජිත වන්නේ ය. **සඃ එව** = ඒ තෙමේ ම; **සුඛී** = සුවපත් වන්නේ යි.

**භාවය:-** සර්වඥයන් වහන්ස, ඔබ වහන්සේ කෙරෙහි අචල භක්ති ඇති පුද්ගල තෙමේ ම නුවණ ඇත්තා **ද**, කුලවතා **ද**, ගුණවතා **ද**, කීර්ති ඇත්තා **ද**, ශූරයා **ද**, පිදිය යුත්තා **ද** වෙයි. එහෙයින් සැප ඇත්තා හෙතෙමේ ම ය

**විස්තර:-** බුදුරදුන් කෙරෙහි භක්ති නැත්තේ නුවණැති බැව් ආදි කිසි ම උසස් තත්ත්වයකට නො පැමිණෙයි කී නියා යි.

58. **අපි සකලමධීත මත්‍ර තෙන**
**ශ්‍රුතමපි සර්ව මනුෂ්ඨිතඤ්ච තෙන,**
**අපි ජිත මජිතෙන තෙන විශ්වං**
**ත්වයි ජින යස්‍ය සුනිශ්චලාස්ති භක්තිඃ.**

**පදාර්ථ:-** **ජින** = සර්වඥයන් වහන්ස; **ත්වයි** = නුඹ වහන්සේ කෙරෙහි; **සුනිශ්චලා** = අතිශයින් ස්ථිර වූ; **භක්තිඃ** = ආදරය; **යස්‍ය** = යමක්හට; **අස්ති** = ඇද්ද; **තෙන** = ඔහු විසින්; **අත්‍ර** = මේ ලෝකයෙහි; **සකලමපි** = සියලු ශාස්ත්‍රය ම; **අධීතං** = හදාරණ ලද්දේ ය; **තෙන** = ඔහු විසින්; **සර්වමපි** = සියලු ම ඇසිය යුතු දෙය; **ශ්‍රුතම්** = අසන ලද්දේ ය; **තෙන** = ඔහු විසින්; **සර්වං** = සියලු කට යුතු දෙය; **අනුෂ්ඨිතඤ්ච** = කොට නිමවන ලද්දේ ය; **අජිතෙන** = අපරාජිත වූ ඔහු විසින්; **විශ්වමපි** = මුළු ලොව ම; **ජිතම්** = දිනන ලදී.

**භාවය:-** බුදුරජාතන් වහන්ස, ඔබ වහන්සේ කෙරෙහි අචල භක්ති ඇති පුද්ගල තෙමේ ලෝකයෙහි සියල්ල උගතා **ද**, සියල්ල ඇසූ පුද්ගලයා **ද**, සියල්ල කළ පුද්ගලයා **ද**, සියල්ල දිනූ පුද්ගලයා **ද** වෙයි

**විස්තර:-** අචල බුද්ධ භක්තිකයාට ලෝකයෙහි වෙන උගත යුත්තක් හෝ ඇසිය යුත්තක් හෝ කළ යුත්තක් හෝ දිනිය යුත්තක් හෝ නැතැයි කී නියා යි මෙහි 'අචල බුද්ධ භක්තිකයා' නම් රහතුන් වහන්සේ යි.

59\. ත්‍යජති නිජ පරම්පරාදරෙණ
ඉතරසමයසඵජනො න දෘෂ්ටදෘෂ්ටිම්,
අසුහරමපි ගෞරවෙණ මාතුර්
න බලු ශිශුර්විෂමොදකානතු මුඤචත්.

**පදාර්ථ:-** ඉතරසමයසඵජනඃ = (වෙදාන්ත වෛෂණවාදි වූ) අන්‍ය සමයෙක්හි පිහිටි මනුෂ්‍ය තෙමේ; **නිජ පරම්පරාදරෙණ** = ස්වකීය වූ පිතෘ පිතාමහාදි වූ පරම්පරාවෙහි භක්තියෙන්; **දෘෂ්ට දෘෂ්ටිම්** = තමා විසින් දැක ගත් දෘෂ්ටිය; **න ත්‍යජති** = නො හරණේ යි; (ඒ එසේ මැයි.) **මාතුඃ** = මව කෙරෙහි; **ගෞරවෙණ** = ආදරයෙන්; **අසුහරමපි** = ප්‍රාණ හර වූ ද; **විෂ මොදකානතු** = වස සහිත අග්වට; **ශිශුඃ** = බාල තෙමේ; **න මුඤචත් බලු**; නො හරණේ මැයි.

**භාවය:-** ලදරු තෙමේ මව විසින් දෙන ලද පණ නසන විෂ සහිත අග්ගලා ද මව කෙරෙහි ඇති විශ්වාසය කරණ කොට ගෙණ අනුභව කෙරෙයි. එපරිද්දෙන් ම අන්‍ය ලබ්ධික මිනිස් තෙමේ සිය පියමුතු පරපුර කෙරෙහි ඇති භක්තිය කරණ කොට ගෙණ තමා ගත් මිථ්‍යා දෘෂ්ටිය අත් නො හරියි.

**විස්තර:-** පරම්පරාගත අන්‍ය ලබ්ධික මිනිසා තමන් අදහන ආගමෙහි දෙසක් දුට ද, සිය පරපුරෙහි වූවන් විසින් අදහන ලද ආගම බැවින් අත් නො හැර එය ම. අදහන බව මෙයින් දක්වෙයි.

**ත්‍යජති** = 'ත්‍යජ හානෞ' ලට් ප. ප්‍ර. එක වචන යි.

**ඉතරසමයසඵජනඃ** = "ඉතරශ්ච ස සමයශ්චෙතීතර සමයඃ, තස්මිං සතිෂ්ඨතීති = ඉතරසමයසඵඃ, ස ච ස ජනශ්චෙති = ඉතරසමයසඵජනඃ."

**මොදකාම්** = අග්ගලාː පිටි බැද පැණි දමා පිඩු කිරීමෙන් සාදනු ලබන කැවිලි වෙසෙසෙකි.

**මුඤචත්** = 'මුචළු මොක්ෂණෙ' විධිලිඞ ප. ප්‍ර. එක වචන යි

60\. කාපිපතිරහමස්මි පණ්ඩිතසෙන
ජින න ජහාමි කථනතු දුගෘහීතම්,
නුදති හි තමසඝාතිං ප්‍රවෘතනාං
මිහිරමරීචි සභාසිනි සුදෘෂ්ටිඃ.

**පදාර්ථ:-** **ජින** = සර්වඥයන් වහන්ස; **අහම්** = මම; **තෙ** = නුඹවහන්සේගේ; **කවිපතිඃ අස්මි** = ගුණ කියන හෙයින් කවිවරයෙක්මි; (**අහම්** = මම; **තෙ** = නුඹ වහන්සේගේ); **පණ්ඩිතඃ** = (පාලි ධර්ම පරිඥත හෙයින්) පණ්ඩිතයෙක්මි; (එසේ වූ මම;) **දුර්ග්‍රහිතම්**= වරදවා ගත් මාගේ මිථ්‍යාඥනය; **කථන්නු** = කෙසේ නම්; **න ජහාමි** = නො හරිම් ද? (හරිම් මැයි;) **මිහිර මරීචි සහායිනී**= අභිනව සූර්‍ය්‍ය කිරණයන් යහලු කොට ඇත්තා වූ; **සුදෘෂ්ටිඃ**= (කාච පටලාදි රහිත වූ) නෙත්‍රය තෙමේ; **ප්‍රවෘත්තාං** = (රාත්‍රි කාලයෙහි) පැවැත්තා වූ; **තමසස් තතිං** = අන්ධකාර සමූහය; **නුදති හි** = දුරු කරන්නේ මැයි.

**භාවය** – මනා පෙණුම ඇති ඇස හිරුරැස් සහාය කොට ගෙණ අඳුර දුරු කරයි. එමෙන් ම සර්වඥයන් වහන්ස, මම ඔබ වහන්සේගේ ගුණ කියන කවිවරයෙක්මි. ධර්මය දන්නා පණ්ඩිතයෙක්මි. එසේ වූ මම ඔබගේ ඒ ගුණ හා ධර්මය සහාය කොට ගෙණ මා වරදවා ගත් මිථ්‍යා දෘෂ්ටිය ඒකාන්තයෙන් දුරු කරමි.

**විස්තර**:- ඇසට මනා පෙණුම ඇතත් රාත්‍රි කාලයෙහි අඳුරෙන් වැසීම හෙතු කොට ගෙණ රූපාදිය දක්ක නො හැක. එහෙත් හිර උදා වූ විට හිරු එළියේ උපකාරයෙන් අඳුර දුරු කොට ඒ රූපාදිය දක්ක හැකි ය. එහෙයින් ම කවියෙකු වූ, පණ්ඩිතයෙකු වූ මට ඔබගේ ගුණයේත් ධර්මයේත්, උපකාර යෙන් අවිද්‍යාව නිසා මා වරදවා ගත් මිථ්‍යා දෘෂ්ටිය ඒකාන්තයෙන් දුරු කළ හැකි ය. එහෙයින් මම එය දුරු **කරමි.**

**ජහාමි** = 'ඔ හාක් ත්‍යාගෙ' ලට් ප. උ. එක වචන යි. ද්විරුක්ත ධාතුවෙකි.

**මිහිරමරීචිසහායිනී** = "මිහිරස්‍ය මරීචිර් මිහිරමරීචිඃ සා සහායිනී යස්‍යාඃ සා මිහිරමරීචිසහායිනී."

61. **සුගතපද පරාඞ්මුඛස්‍ය පුංසඃ**
**කිමු තපසා යශසා ච කිං කිමන්‍යෛඃ**
**සුගතපදපරාඞ්මුඛස්‍ය පුංසඃ**
**කිමු තපසා යශසා ච කිං කිමන්‍යෛඃ.**

**පදාර්ථ:-** **සුගතපද** = සර්වඥයන් වහන්සේගේ ශ්‍රීපාද පද්මයට, **පරාංමුඛස්‍ය**=පිටි පෑ වා වූ; **පුංසඃ**=පුරුෂයාගේ; **තපසා**=ඉන්ද්‍රිය නිග්‍රහාදි තපසින්; **කිමු**=ප්‍රයොජන කිම් ද; **යශසා ච** = යශ පරිවාර සම්පත්ති

යෙන් ද; **කිම්** = ප්‍රයොජන කිම් ද; **අනෙන්‍යඃ** = අන්‍ය ධනධාන්‍යාදි නොයෙක් ඉසුරෙන් ද; **කිං** = ප්‍රයොජන කිම් ද? **සුගතපද්** = සර්වඥයන් වහන්සේගේ ශ්‍රීපාදයට; **අපරාඞ්මුඛස්‍ය** = විමුඛ නුවූ හෙවත් ආදර සහිත වූ; **පුංසඃ** = පුරුෂයාහට; **තපසා** = ඉන්ද්‍රිය නිග්‍රහාදි වූ තපසින්; **කිමු** = ප්‍රයොජන කිම් ද; **යශසා ච** = යශ පරිවාර සම්පත්තියෙන් ද; **කිම්** = ප්‍රයොජන කිම් ද; **අනෙන්‍යඃ** = අන්‍ය ධනධාන්‍යාදි නොයෙක් ඉසුරෙන් ද; **කිං** = ප්‍රයොජන කිම් ද; (එම බුදුන් කෙරෙහි චිත්තප්‍රසාදයෙන් ම ස්වර්ගාපවර්ග සම්පත් සිද්ධ වන්නේ ය යි සේ යි.)

**භාවය**:- බුදුරජාණන් වහන්සේගේ ශ්‍රීපාදයට පිටි පෑවා වූ මිනිසාට තපසින් වත්, කීර්තියෙන් වත්, අන්‍ය වූ ධන ධාන්‍යාදි සම්පතින් වත් කිසි වැඩෙක් නැත. එසේ ම ශ්‍රීපාදයට අභිමුඛ වූ හෙවත් ආදර සහිත වූ මිනිසාට ද ඒ තපස් කීර්ති ධන ධාන්‍යාදියෙන් වැඩෙක් නැත.

**විස්තර**:- ශ්‍රී පාදයට පිටි පෑ මිනිසා නම් බුදුන් නො අදහන අන්‍ය ලබ්ධිකයා ය. ඔහුට සසරින් නිදහස් විය නො හැක. බුදුන් නො අදහා තපස් ආදිය කිරීම වත්, කීර්ති ධන ධාන්‍යාදිය ලැබීම වත් සසරින් නිදහස් වීමට ඔහුට පිහිට නො වේ. එබැවින් එයින් ඔහුට වැඩෙක් නැත. ශ්‍රී පාදයට අභිමුඛ වූ හෙවත් ආදර සහිත වූ මිනිසා නම් බුදුන් අදහන බුද්ධ භක්තිකයා ය. බුදුන් කෙරෙහි වූ භක්තිය ම ඔහුට සසරින් නිදහස් වීමට ප්‍රමාණවත් ය. ඒ සඳහා අන්‍ය වූ තපස් ආදියක් ඔහුට අනවශ්‍ය ය. එබැවින් ඔහුට ද ඒ තපස් ආදියෙන් වැඩෙක් නො වේ.

මෙහි 1 වැනි 3 වැනි පාද හා 2 වැනි 4 වැනි පාද සමාන බැවින් මෙය දුෂ්කර බන්ධනයක් වූ **සමුද්ග යමකයෙකි**. එහෙත් අර්ථ දෙක අදහස් වශයෙන් වෙනස් ය. පළමු වන පාදය **සුගතපද + පරාඞ්මුඛස්‍ය** කියා ද, තුන් වන පාදය **සුගතපද් + අපරාඞ්මුඛස්‍ය** කියා ද වෙන් කොට ගැණීමෙන් ඒ වෙනස ලැබේ.

**සුගතපදපරාඞ්මුඛස්‍ය**= "සුගතස්‍ය පදං සුගතපදම්, පරාක් ප්‍රතිලොම ගාමි මුඛං යස්‍ය ස පරාඞ්මුඛඃ, සුගතපදස්‍ය පරාඞ්මුඛඃ = සුගතපදපරාඞ්මුඛඃ, තස්‍ය." තුන් වන පාදයෙහි වූ මේ පදය "සුගතස්‍ය පත් සුගතපද්, න පරාඞ්මුඛො 'පරාඞ්මුඛඃ, සුගතපදෙ' පරාඞ්මුඛඃ = සුගතපදපරාමුඛඃ, තස්‍ය." කියා විග්‍රහ කළ යුතු යි.

මේ පද්‍යයෙහි අඩි දෙකේ අදහස් වෙනස් ලෙස දැක්වෙන සේ පැරණි සන්නයෙහි අර්ථ කියා තිබෙන්නට ඇති නමුත් මෑතක දී මෙය මුද්‍රණය කළවුන් විසින් අඩි දෙකේ ම අදහස් සමාන වන සේ එය අවුල් කොට තිබුනි.

62. **සුගතපදෙ න භක්තිරස්ති යෙෂා**
**අජනනිරෙව මහීතලෙ'ස්තු තෙෂාම්,**
**කථිතමිහ කෘතාගසාං නරාණාං**
**නිරයගතිර් නියතං න චාන්‍යතො යත්.**

**පදාර්ථ:-** **යෙෂාම්** = යම් කෙනෙකුන්ට; **සුගත පදෙ** = බුදුන්ගේ ශ්‍රීපාද යෙහි; **භක්තිඃ** = ආදරය; **නාස්ති** = නැද්ද; **මහීතලෙ** = භූ ලෝක යෙහි; **තෙෂාම්** = ඔවුන්ගේ; **අජනනිරෙව** = නො ඉපදීම ම; **අස්තු** = වේවා (කුමක් හෙයින් ද?) **යත්** = යම් හෙයකින්; **ඉහ** මේ මනුෂ්‍ය ලෝකයෙහි (ඉපිද); **කෘතාගසාං** = කරණ ලද මාතෘ ඝාතාදි ආනන්තර්‍ය කර්ම ඇති; **නරාණාං** = මනුෂ්‍යයන්ට; **නිරයගතිඃ** = නරක ප්‍රාප්තිය; **නියතම්** = නියත ම ය; **අන්‍යතඃ** = අන් තිරශ්චීන භාවයෙක්හි ඉපදී කළ ආනන්තර්‍ය කර්මයෙන්; **න ච** = නරකොත්පත්තිය නියත නො වන්නේ ය යි; **කථිතම්** = ආගමයෙහි කියන ලදී. (එහෙයිනි.)

**භාවය:-** මේ ලෝකයෙහි ආනන්තර්‍ය කර්ම කළ මිනිසුන්ට නරකොත්පත්තිය නියත ය. තිරිසන් ආදීන්ට එසේ නො වේ. එබැවින් බුද්ධභක්තිය නැති මිනිසාගේ නූපදීම ම මැනවි.

**විස්තර:-** මිනිසකු ව ඉපද මාතෘඝාතාදි ආනන්තර්‍ය කර්ම කළොත් හෙතෙමේ මරණින් මතු ඒකාන්තයෙන් ම නරකයෙහි උපදී. එහෙත් තිරිසන් ආදි සතකු ව ඉපද ආනන්තර්‍ය කර්ම කළොත් ඔහුට නරකොත්පත්තිය නියත නො වේ. ඔහු මරණින් මතු නරකයෙහි උපදින්නටත් පුළුවන, නූපදින්නටත් පුළුවන. එබැවින් බුද්ධභක්තිය නැත්තකු ව උපදිනුවට වඩා නූපදීම ම යෙහෙකි.

**කෘතාගසාම්** = "කෘතානි අගාංසි යෛස්තෙ කෘතාගසඃ, තෙෂාම්". මෙහි 'අගස්' ශබ්දයෙන් ආනන්තර්‍ය කර්ම ගැණේ. නිරය ගතිය නියත වන්නේ ආනන්තර්‍ය කර්ම කිරීමෙනි.

63. විදිතසකලශාස්ත්‍රමුන්නතානාං
කුලභවමුත්තමරූපයෞවනාඪ්‍යම්,
ජිනභවදනුපාසකං නෘපාශං
ත්‍යජතු මනො මම නීචවත්තු ජාත්‍යා.

**පදාර්ථ:-** **ජින** = සර්වඥයන් වහන්ස, **විදිත** = දන්නා ලද; **සකල ශාස්ත්‍රං** = සියලු ශාස්ත්‍ර ඇත්තා වූ; **උන්නතානාං කුලභවං** = ක්‍ෂත්‍රිය බ්‍රාහමණාදි වූ උසස් කුලයෙහි උපන්නා වූ; **උත්තම රූපයෞවනාඪ්‍යම්** = උතුම් වූ රූප යෞවන (ධන ධාන්‍යාදීන්) යුක්ත වූ; **භවදනුපාසකං** = නුඹවහන්සේගේ උපාසක නො වන්නා වූ; **නෘපාශං** = අධම මනුෂ්‍යයා; **මම මනස්තු** = මාගේ චිත්තය වනාහි; **ජාත්‍යා** = ජාතිය කරණ කොට ගෙණ; **නීචවත්** = චණ්ඩාලාදි යටත් කුලයෙහි උපන්නක්හු මෙන්; **ත්‍යජතු** = දුරු කොට හරීවා.

**භාවය:-** සියලු ශාස්ත්‍ර උගත්, උසස් කුලයෙහි උපන්, උතුම් රූප යෞවනාදිය ඇති මිනිසා පවා ඔබවහන්සේ වෙත උපාසක භාවයෙන් නො එලඹේ නම් මගේ සිත ඒ අධම මිනිසා සැඩොලකු මෙන් දුරු කෙරේවා.

**විස්තර:-** යමෙක් ඔබ සරණ නො යේ නම් ඔහු සියලු ශාස්ත්‍ර උගතකු වුවත්, කොතෙක් උසස් කුලවතකු වුවත්, ඉතා ම ශොභන රූප යෞවනාදිය ඇත්තකු වුවත් ඔහු මම සැඩොලකු මෙන් බැහැර කෙරෙමි යි කී තියා යි.

**නෘපාශම්** = නින්දිත මිනිසා, "කුත්සිතො නා නෘපාශඃ, නම්." 'නෘ' ශබ්දයා කෙරෙන් 'පාශ' ප්‍රත්‍යය යි. **පාශප් කුත්සායාම්** යනු තල්ලක්‍ෂණ යි.

64. පරිහෘතමදමානමත්සරාදිඃ
සකරුණශීලසමාධිමාන් විවෙකී,
තව පදදෘඪභක්තිරනන්‍යජො'පි
ප්‍රතිභවමස්තු නරොත්තමඃ සඛා මෙ.

**පදාර්ථ:-** **පරිහෘත** = දුරු කරණලද; **මද** = ජාති මදාදි සූවිසි මදය; **මාන** = මම උතුමැයි යන චිත්තොන්නතිය; **මත්සරාදිඃ** = (මාගේ ඓශ්වර්‍ය්‍යය අනුන්ට නො වේ වා යි යන) මාත්සර්‍ය්‍යය යන මේ ආදි වූ පාපයන් ඇති; **සකරුණ** = කරුණා සහිත වූ; **ශීලසමාධිමාන්** = ශීලාචාර සමාධි විදර්ශනා ඇත්තා වූ; **විවෙකී**= කාය විවෙක, චිත්ත විවෙක, උපධි විවෙක ඇත්තා වූ; **තව** =

නුඹ වහන්සේගේ; **පදෙ** = ශ්‍රීපාදයෙහි; **දෘඪභක්තිඃ** = ස්ථිර වූ භක්ති ඇති; **නරෝත්තමඃ** = උත්තම පුරුෂ තෙමේ; **අශෝභන ජෝ'පි** = සැඩොල් කුලෙහි උපන්නේ නමුදු; **ප්‍රතිභවං** = ජාතියක් ජාතියක් පාසා; **මෙ** = මට; **සඛාසතු** = යහලු වේවා

**භාවය**:- මද මාන මාත්සය්‍ය දුරු කළ කරුණා ශීල සමාධි විවේකාදි ගුණ ඇති ඔබ කෙරෙහි භක්තිමත් මිනිසා සැඩොලෙකු වුව ද භවයක් පාසා මට යහලු වේවා.

**විස්තර**:- ඉහත සඳහන් ගුණ ඇති බෞද්ධයා සැඩොලකු වුවත් උපනුපන් ජාතියෙහි මම ඔහු ආශ්‍රය කරම් යි යු යේ යි.

**පරිහෘතමදමානමත්සරාදිඃ** = "මදශ්ච මානශ්ච මත්සරශ්ච මදමානමත්සරාඃ, තෙ ආදෞ යස්‍ය ස මදමානමත්සරාදිඃ, පරිහෘතො මදමානමත්සරාදියේන ස පරිහෘතමදමාන මත්සරාදිඃ."

**සකාරුණ්‍යශීලසමාධිමාන්** = "සහ කාරුණ්‍යා යො වර්තතෙ ස සකාරුණඃ, ශීලඤ්ච සමාධිශ්ච ශීලසමාධී, තාවස්‍ය සත ඉති ශීලසමාධිමාන්, සකාරුණශ්ච ස ශීලසමාධිමාංශ්චෙති සකාරුණශීලසමාධිමාන්."

**සඛා** = 'සඛින්' ශබ්ද ප්‍රථමෛක වචන යි.

65. **විහිත ජිනපදාර්චනස්‍ය භක්තුර්**
**දශදිවසානපි ජීවිතං ප්‍රශස්තම්,**
**න තු නියුතසහස්‍රකල්ප කොටිම්**
**අකෘතමුනීන්ද්‍රපදාබ්ජ පූජනස්‍ය.**

**පදාර්ථ**:- **විහිත** = කරණ ලද; **ජින** = සර්වඥයන් වහන්සේගේ; **පදාර්චනස්‍ය** = ශ්‍රීපාද පූජා ඇති; **භක්තුඃ** = උපාසකයාගේ; **දශදිවසානපි** = දශ දවසක් මුළුල්ලෙහි ද; **ජීවිතම්** = ජීවත් වීම; **ප්‍රශස්තම්** = යහපත් වන්නේ ය **අකෘත** = නො කරණ ලද; **මුනීන්ද්‍ර** = තථාගතයන් වහන්සේගේ; **පදාබ්ජ පූජනස්‍ය** = ශ්‍රීපාද පද්ම පූජා ඇති පුරුෂයාගේ; **නියුතසහස්‍ර කල්ප කොටිම්** = සුවහස් කෙළ ගණන් කප් මුළුල්ලෙහි; (**ජීවිතම්** = ජීවත් වීම ද;) **න තු** = ප්‍රශස්ත නො වන්නේ යි.

**භාවය:-** බුදුන් නො පුදන්නහු සුවහස් කෙළ ගණන් කප් මුළුල්ලෙහි ජීවත් වීමට වඩා බුදුන් පුදන්නහු දශ දිනක් මුළුල්ලෙහි ජීවත් වීම උතුම් ය.

**විස්තර:-** මේ කියමන;

"යො ච වස්සසතං ජීවෙ දුස්සීලො අසමාහිතො,
එකාහං ජීවිතං සෙය්‍යො සීලවන්තස්ස ඣායිනො."

යන ධම්පදය අනු ව කියන ලද්දෙකි.

**දශදිවසාන්, නියුතසහස්‍රකල්පකොටිම්** = අත්‍යන්ත සංයොගයෙහි ද්විතීයා යි. 'නියුත' නම් ලක්‍ෂය යි. කෝටි ලක්‍ෂ දහසක් යනු මෙහි අර්‍ථ යි.

**භක්තුඃ** = 'භක්තෘ' ශබ්ද කර්තෘර්ථයෙහි ෂෂ්ඨ්‍යන්ත වචන යි.

66. **ස භවති සුරසුන්දරීසඛො'න්‍යෛඃ
කෘතමභිනන්දති වා'ර්චනස්ච භක්ත්‍යා,
ත්‍රිදශනරගුරො ත්වදීයපූජාං
මගතිතයා යදි කර්තුමක්‍ෂමඃ ස්‍යාත්.**

**පදාර්ථ:-** **ත්‍රිදශනරගුරො** = දිව්‍ය මනුෂ්‍යයන්ට ගුරු වූ ධර්ම රාජයන් වහන්ස; (**යඃ** = යමෙක් තෙමේ); **අගතිතයා**= දුප්පත් බැවින්; **ත්වදීය පූජාම්** = නුඹවහන්සේ පිළිබඳ වූ පූජාවක්; **කර්තුං** = කරන්නට; **යදි** = ඉදින්; **අක්‍ෂමඃ ස්‍යාත්,** = නො පොහොසත් වූයේ නමුත්; **සඃ** = ඒ තෙමේ; **තව** = නුඹ වහන්සේට; **අන්‍යෛඃ** = වෙන කෙනෙකුන් විසින්; **කෘතම්** = කරණ ලද; **අර්චනස්‍ය** = පූජාව ද; **භක්ත්‍යා** = ශ්‍රද්ධාතිශය යෙන්; **අභිනන්දති වා** = සාධු සාධු යි අනුමෝදන් වී නම්; (ඒ තෙමේ); **සුරසුන්දරීසඛඃ** = දෙවඟනන් පිරිවර කොට ඇත්තේ; **භවති** = වන්නේ ය හෙවත් ශක්‍ර දෙවරාජ ව උපදනේ යි.

**භාවය:-** දෙවිමිනිසුන්ට ගුරු වූ බුදුරජාණන් වහන්ස, දුප්පත් බැවින් ඔබවහන්සේට පූජාවක් කිරීමට අපොහොසත් යමෙක් වෙන කෙනෙකුන් විසින් කරණ ලද පූජාව සැදැහැ බැතියෙන් අනුමෝදන් වේ නම් හෙතෙමේ ද දෙවඟනන් පිරිවරා ගත් දෙවියෙක් ව උපදින්නේ ය.

**විස්තර:-** පුණ්‍යානුමොදනාවෙන් පවා දෙව්ලොව උපදිති යි මෙයින් කීහ.

**සුරසුන්දරී සඛඃ** = ' සුරාණාං සුන්දය්‍යඃ සුරසුන්දය්‍යඃ, තාසාං සඛා සුරසුන්දරීසඛඃ."

**අගතිතයා** = "නාස්ති ගතිය්‍යස්‍ය සෝ'ගතිඃ, තස්‍ය භාවෝ'ගතිතා, තයා."

67. **සුරුචිරමතිචිත්‍රචිත්‍රරූපං**
**නයනපථං නයතිහ යසනවාචනීම්,**
**රහයති පුරුෂං තමප්‍යුදරං**
**චිරතරසඤ්චිතදුෂ්කෘතං කවීන්ද්‍ර.**

**පදාර්ථ:**- **කවීන්ද්‍ර** = ප්‍රඥවන්තයන්ට අග්‍ර වූ සර්වඥයන් වහන්ස: **ඉහ**= මේ ලොකයෙහි; **තව** = තුඹ වහන්සේගේ; **අවනීම්** = පිදිය යුතු වූ; **සුරුචිරං** = ද්වාත්‍රිංශද්වර මහාපුරුෂ ලක්‍ෂණයෙන් මනොඥ වූ; **අතිචිත්‍රං** = අශීත්‍යනුව්‍යඤ්ජනයෙන් ඉතා විසිතුරු වූ; **චිත්‍රරූපං** = සිතියම්හි කළ රූපය ද; **යඃ** = යම් මනුෂ්‍යාදි සත්වයෙක්; **නයනපථං** = චක්‍ෂුර්ද්වාරයට; **නයති** = ආලම්බන වශයෙන් පමුණුවා ද, හෙවත් ප්‍රසන්න ව බලා ද; **උදරං**= පුණ්‍යෝදයෙන් මහත් වූ; **තං පුරුෂමපි**=ඒ පුරුෂයා ද; **චිරතර සඤ්චිත** = ඉතා බොහෝ කලක් මුළුල්ලෙහි රැස් කරණ ලද; **දුෂ්කෘතං** = පාපය තෙමේ; **රහයති** = තදඞ්ගප්‍රහාණාදි වශ යෙන් හරණේ යි.

**භාවය:**- කවීන්ද්‍රයන් වහන්ස, යමෙක් ඔබ වහන්සේගේ පිදිය යුතු ඉතා මනහර විසිතුරු සිතියම් රූපය සිය ඇස් හමුවට පමුණුවා නම් හෙතෙමේ ද බොහෝ කලක් මුළුල්ලෙහි රැස් කරණ ලද පව් දුරු කෙරෙයි.

**විස්තර:**- සිතියමෙක්හි අඳනා ලද බුද්ධරූපයක් දෙස සැදැහැයෙන් බැලීමෙන් පවා බොහෝ පව් දුරු වන බව මෙයින් දක්වයි.

**අතිචිත්‍ර චිත්‍රරූපම්** = "චිත්‍රෙ රූපං චිත්‍රරූපම්, අතිශයිතං චිත්‍රමතිචිත්‍රම්, අතිචිත්‍රඤ්ච තච්චිත්‍රරූපඤ්චෙති = අතිචිත්‍රචිත්‍රරූපම්, තත්."

**රහයති** = අද්‍යතන චුරාදි 'රහ ත්‍යාගෙ' ලට් ප. ප්‍ර. එක වචන යි. මෙහි කර්තෘ 'දුෂ්කෘතම්' යන්න යි. කර්මය 'පුරුෂම්' යනු යි.

68. **මණිකනකශිලාදිනිර්මිතාං යඃ**
**ප්‍රණමති තෙ ප්‍රතිමාං තයොශ්ච තුල්‍යම්,**
**ඵලමිහ මනසඃ සසම්ප්‍රසාද**
**දනුපරතං ජින යො'ග්‍රතො නමෙත් ත්වාම්.**

**පදාර්ථ:-** ජින = සර්වඥයන් වහන්ස; **මණිකනකශිලාදි** = මාණික්‍ය සවර්ණ පාෂාණාදි වූ යම් කිසි දෙයකින්; **නිර්මිතාං** = නිර්මිත කරණ ලද; **තෙ** = නුඹ වහන්සේගේ; **ප්‍රතිමාංච** = පිළිමය ද; **යඃ** = යමෙක්; **ප්‍රණමති** = නමස්කාර කෙරේ ද; **අනුපරතම්** = ජීවමාන වූ; **ත්වාම්** = නුඹවහන්සේ; **අග්‍රතඃ** = අභි මුඛයෙහි; (**යඃ** = යමෙක්;) **නමෙත්** = වඳී ද; **මනසඃ** = චිත්තයාගේ; **සසම්ප්‍රසාදත්** = සමාන ශ්‍රද්ධාව හේතු කොට ගෙණ; **ඉහ** = මෙහි; **තයොඃ** = ඒ නමස්කාර කළා වූ දෙදෙනාට; **ඵලං** = ස්වර්ගාපවර්ග සම්පත්තිය; **තුල්‍යම්** = සමාන වන්නේ ය.

**භාවය:-** ජිනෙන්ද්‍රයන් වහන්ස, යමෙක් මැණික්, රන්, ගල් යනාදියෙන් කරණ ලද ප්‍රතිමාවට වඳී ද, යමෙක් ජීවමාන ඔබ වහන්සේට වඳී ද, ඒ දෙදෙනාගේම ශ්‍රද්ධාව සමාන බැවින් පුණ්‍ය ඵලයත් සමාන ය.

**විස්තර:-** ජීවමාන බුදුරජාණන් වහන්සේට වැඳීමෙනුත්, උන් වහන්සේගේ ප්‍රතිමාවට වැඳීමෙනුත් ලැබෙන පිණ සමාන බව මෙයින් දැක්වූහ.

**මණිකනක ශිලාදිනිර්මිතාම්** = "මණයශ්ච කනකානි ච ශිලාශ්ච මණිකනකශිලාඃ, තා ආදයො යෙෂාං තෙ මණිකනක ශිලාදයඃ, තෛර් නිර්මිතා මණිකනකශිලාදිනිර්මිතා, තාම්."

**ප්‍රණමති** = ප්‍ර පූර්ව 'නම්' ධාතු යි. නකාරයට ණත්වය යි.

**සසම්ප්‍රසාදත්** = "සමානඃ සම්ප්‍රසාදඃ = සසම්ප්‍රසාදඃ, තස්මාත්." 'සමාන' ශබ්දයට 'ස' ආදේශ යි.

**අනුපරතම්** = නො මැරුණු; "න උපරතම් අනුපරතම්." 'න + උප' පූර්ව 'රමු ක්‍රීඩායාම්' ධාතු යි, 'ක්ත' ප්‍රත්‍යයාන්ත අතීත කෘදන්ත යි. උප පූර්ව 'රම්' ධාතුව මරණාර්ථයෙහි වැටේ.

**අග්‍රතඃ** = ඉදිරියෙහි; සප්තම්‍යර්ථයෙහි නිෂ්පන්න නිපාත යි.

**නමෙත්** = 'නම්' ධාතු යි. විධිලිඞ් ප. ප්‍ර. එක වචන යි.

69. **සකෘදපි තව පාදපද්මපූජාං**
**වනකුසුමෛරපි යඃ කරොති ධීමාන්,**
**අවනතසුරසඞ්ඝමෞලිමාලොජ්**
**ජ්වලමමලං ශ්‍රයතෙ නමාධිපත්‍යම්.**

**පදාර්ථ**: **යඃ ධීමාන්** = යම් නුවණැති පුරුෂයෙක් තෙමේ; **වනකුසුමෛරපි** = වනපස මලින් නමුත්; **සකෘත්** **අපි** = එක් වරක් වත්; **තව**=නුඹ වහන්සේගේ; **පාදපද්ම** = ශ්‍රීපාද පද්මයට; **පූජාං කරෝති**, = රත්නත්‍රය ප්‍රණාම කම්ඵල විශ්වාස ඇති ව පූජා කෙරේ ද; **අවනත** = භක්තියෙන් නැමුනා වූ; **සුරසඞ්ඝ** = දෙව සමූහයාගේ; **මෞලිමාලා** = කිරුළු මල්දමින්, **උජ්ජ්වලම්**= නෙවුනා වූ; **අමලම්** = නිර්මල වූ; **ආධිපත්‍යම්** = අධිපති භාවය තෙමේ, හෙවත් ඉන්ද්‍ර පදවිය තෙමේ; **තම්** = ඔහු; **ශ්‍රයතෙ** = ඇසුරු කරන්නේ යි.

**භාවය**:- නුවණැති යමෙක් වනපස මලින් නමුත් එක් වරක් හෝ ඔබගේ සිරිපා පියුම් පුද ද, හෙතෙමේ දෙවියන් විසින් වඳිනු ලබන සක්දෙව්රජ පදවියට පැමිණේ.

**විස්තර**:- බුදුරජාණන් වහන්සේ එක් වරක් හෝ කැලෑ මලකින් වත් පිදුවොත් ශක්‍ර පදවිය ලැබෙන බව මෙන් කිහ.

**අවනත සුරසඞ්ඝ මෞලිමාලොජ්ජ්වලම්** = 'සුරාණාං සඞ්ඝඃ සුරසඞ්ඝඃ, අවනතශ්ච ස සුරසඞ්ඝශ්චෙත්‍යවනත සුරසඞ්ඝඃ, මෞලීනාං මාලා මෞලිමාලාඃ, අවනතසුරසඞ්ඝස්‍ය මෞලිමාලා අවනතසුරසඞ්ඝමෞලිමාලාඃ, තාභිරුජ්ජ්වලම් = අවනතසුරසඞ්ඝමෞලිමාලොජ්ජ්වලම්." අවට සිටි දෙවියන් හිස නමා වඳින විට ඔවුන්ගේ හිස පැලඳි කිරුළුවල වූ මල්දම් කරණ කොට ගෙණ සක්දෙව්රජ බබලයි. ශක්‍රයාට දෙවියන් වඳින බව මෙයින් හඟවයි.

**ශ්‍රයතෙ** = 'ශ්‍රිඤ් සෙවායාම්' ලට් ආ ප්‍ර. එක වචන යි. මෙහි කර්තෘ 'ආධිපත්‍යම්' යන්න යි. සන්නයෙහි අර්ථ දක්වෙන්නේ එසේ ය. එහෙත් 'සඃ' යි කර්තෘ අධ්‍යාහාර කොට 'ආධිපත්‍යම්' යන්න කර්මය කරණ ලද්දේ නම් ඊට වඩා මැනවැයි හඟිමි.

70. යඳි භවති සරූපමෙකචිත්ත
ක්ෂණශරණොද්භවපුණ්‍යවාඤ්ඡමෙවඃ,
ගණශරණ සමන්තභද්‍ර සාධො
'බිලතඟසො'ප්‍යතිරිච්‍යතෙ තදා තත්.

**පදාර්ථ**:- **ගණශරණ** = අෂ්ටාර්‍ය්‍යපුද්ගල සඞ්ඝයාට පිහිට වූ; **සාධො**= මෛත්‍රී ක්ෂමෝපශමාදි ගුණයෙන් යුක්ත වූ; **සමන්තභද්‍ර** = සමන්තභද්‍ර වූ සර්වඥයන් වහන්ස; **එකචිත්තක්ෂණ** = එක චිත්තක්ෂණයෙහි; **ශරණොද්භව** = ශරණ ගමනයෙන් උපන්

තා වූ; පුණ්‍යවෘන්දමුච්චෛඃ = උස් වූ කුසල් සමූහය තෙමේ; යදි = ඉදින්; සරූපමභවිෂ්‍යත් = රූප සහිත වී නම්; තදා = එකල්හි; තත් = ඒ කුශල කර්මය තෙමේ; අඛිල නභසො'පි = සියලු අනන්ත ආකාශයටත් වඩා; අතිරිච්‍යතෙ = පුරා සිටීමෙන් ඉතිරි වන්නේ මැයි.

**භාවය:-** අෂ්ටාර්‍ය පුද්ගල මහාසඞ්ඝයාට පිහිට වූ සමන්තභද්‍ර සත්පුරුෂයාණන් වහන්ස, එකචිත්තක්ෂණික ශරණ ගමනයෙන් ජනිත උස් වූ පුණ්‍ය සමූහය ඉදින් රූපවත් වීනම් එය මුළු අහස පුරා ඉක්මවා සිටී.

**විස්තර:-** එක් වරක් බුදුන් සරණ යැමෙන් හට ගන්නා පින් රැස පැතිර සිටීමට මුළු අහසත් ඉඩ මදි ය යි කී නියා යි.

**එකචිත්තක්ෂණශරණොද්භවපුණ්‍යවෘන්දම්** = "චිත්තස්‍ය ක්ෂණං චිත්තක්ෂණම්, එකඤ්ච තච්චිත්තක්ෂණශ්චෙති එක චිත්තක්ෂණම්, තස්මිං ශරණම් එකචිත්තක්ෂණශරණම්, තෙනොද්භවම් = එකචිත්තක්ෂණශරණොද්භවම්, පුණ්‍යස්‍ය වෘන්දං පුණ්‍යවෘන්දම්, එකචිත්තක්ෂණශරණොද්භවඤ්ච තත් පුණ්‍යවෘන්දශ්චෙති = එකචිත්තක්ෂණශරණොද්භව පුණ්‍යවෘන්දම්." 'උච්චෛඃ' යනු අව්‍යයෙකි.

**අතිරිච්‍යතෙ** = 'අති' පූර්ව 'රිච සම්පර්කේ වියොගෙ ච' කර්මකාරක ලට් ප්‍ර. එකවචන යි.

71. **තව ගුණකථනෙ තු යඃ ප්‍රසන්නස්**
**තමනුවිශන්ති මුනෙ ගුණාස් ත්වදීයාඃ,**
**උදයති ශශිනි ප්‍රසන්නමින්දු**
**පලමිව තත්කිරණාවලිතුෂාරඃ.**

**පදාර්ථ -** මුනෙ = සර්වඥයන් වහන්ස; **තව** = නුඹ වහන්සේගේ; **ගුණකථනෙ** = ගුණ වර්ණනා කිරීම නිමිත්ත කොට ගෙණ; **යස්තු**=යමෙක්; **ප්‍රසන්නඃ**=පැහැදුනේ ද; **ත්වදීයාඃ**=නුඹ වහන්සේ පිළිබඳ වූ; **ගුණාඃ** = මෛත්‍රී කරුණාදි වූ ගුණයෝ; **තම්** = ඔහු කරා; **අනුවිශන්ති** = පැමිණෙන්නාහ. (කුමක් මෙන් ද යත්?) **ශශිනි** = චන්ද්‍රයා; **උදයති** = උදා වන කල්හි; **ප්‍රසන්නම්** = බබලන්නා වූ; **ඉන්දුපලං** = චන්ද්‍රකාන්ත පාෂාණයට (ප්‍රවිෂ්ට වන්නා වූ); **තත්කිරණාවලිතුෂාරඃ** **ඉව** = එම චන්ද්‍රයාගේ රශ්මි සමූහය සම්බන්ධ වූ ශීතල ගුණය මෙනි

**භාවය:-** මුනීන්ද්‍රයන් වහන්ස, සඳ උදා වන කල්හි චන්ද්‍රකාන්ත පාෂාණයට සඳරැස් පිළිබඳ සිහිල් ගුණය පිවිසෙයි. එපරිද්දෙන් ම ඔබ ගුණ කියන, පැහැදුන මිනිසා කරා ඔබගේ ගුණයෝ පැමිණෙති.

**විස්තර:-** බුදුගුණ කියන්නා කෙරෙහි ද බුදුගුණ පිහිටන බව මෙයින් දැක්වේ.

**අනුවිශන්ති** = 'අනු' පූර්ව 'විශ් ප්‍රවෙශෙ' ලට් ප. ප්‍ර. එකවචන යි.

**උදයති** = වර්තමාන කෘදන්ත 'උදයත්' ශබ්දය යි. භාව සප්තමී යි.

**ඉන්දුපලම්** = ඉන්දු + උපලම්, චන්ද්‍රකාන්තපාෂාණ, සඳකැන් මිණ; (= දිය තරිප්පු;) මේ ගලට සඳ එළිය වැටුන කල ඇතුළට කා වැදීමෙන් දිය වැගිරෙයි.

**තත්කිරණාවලිතුෂාරඃ** = "තස්‍ය කිරණානි තත්කිරණානි, තෙෂාමාවලී තත්කිරණාවලී, තස්‍යාස්තුෂාරඃ = තත්කිරණාවලී තුෂාරඃ."

> 72. **සකෘදපි සමදාසී දෙව කිඤ්චිද්**
> **භවරතිමුක්ෂජතා ජනෙන තුභ්‍යම්,**
> **සුගත තදඛිලාන් ලුනාති ධාරා**
> **වදසිරිවද්‍රුමමාස්‍රවාදිදොෂාන්.**

**පදාර්ථ:-** **දෙව** = විශුද්ධි දෙව් වූ; **සුගත** = සම්‍යක් සම්බුද්ධයන් වහන්ස; **භවරතිම** = (කාමභවය, රූපභවය, අරූපභවය යි යන) භවත්‍රයෙහි ඇල්ම; **උක්ෂජතා** = හරණා වූ; **ජනෙන** = මොක්ෂාර්ථි ජනයා විසින්; **කිඤ්චිත්** = ස්වල්ප වූ යම් කිසි දෙයක්; **සකෘදපි**=එක් වරක් නමුත්; **තුභ්‍යම්**,= තුඹ වහන්සේට; **සමදාසී** = මනා කොට දෙන ලද ද; **තත්** = ඔහුගේ ඒ දාන චිත්තය තෙමේ; **ධාරාවත්** = මුවහත් සහිත වූ; **අසිඃ**=කඩුව; **ද්‍රැමම් ඉව** = වෘක්ෂයක් මෙන්; **අඛිලාන්** = සියලු; **ආස්‍රවාදි දොෂාන්** = චතුරාස්‍රව, චතුරොඝාදි වූ සියලු පාපයන්; **ලුනාති** = මතු අර්හත් මාර්ගඥානයෙන් ඡෙදනය කරන්නේ යි.

**භාවය:-** සම්‍යක් සම්බුද්ධයන් වහන්ස, භවයෙන් එතර වනු කැමැත්තකු විසින් යම් කිසි ස්වල්පමාත්‍ර දෙයක් පවා එක්

වරක් හමුත් ඔබවගත්සේව දෙන ලද නම් ඔහුගේ ඒ දානය මූවගත් සහිත කඩුව ගසක් සිඳින්නාක් මෙන් සියලු ආස්‍රවාදි දෙෂයන් මුලුපුන් කෙරෙයි.

**විස්තර:-** මූවහත් සහිත කඩුවෙන් එක් වරට ම ගස කැපෙයි. එසෙයින් ම භවයෙන් නික්මෙන අදහසින් ඉතා සුලු දෙයක් පවා එක් වරක් හමුත් බුදුරජාණන් වහන්සේට පිදීමෙන් සියලු කෙලෙස් නැසෙන බව මෙයින් දක්වූහ. මතු අර්හත්මාර්ග ඥානය ඉපදීමට එය හෙතු වන බැවිනි.

**සමදසි** = 'සම්' පූර්ව 'ද' ධාතු යි. කම්කාරක ලුඩ් ප්‍ර. එකවචන යි.

**උත්සජනා** = 'උද්' පූර්ව 'සෘජ් විසගේ' දයින් නිපන් වර්තමාන කෘදන්ත 'උත්සෘජත්' ශබ්දය යි. තෘතීයෛක වචන යි

**ලුනාති** = 'ලූඤ් ඡේදනෙ' ලව් ප. ප්‍ර. එකවචන යි.

මෙහි පිළිවෙළින් 66 වන පද්‍යයෙන් පුණ්‍යානුමොදනය ද, 67 වැන්නෙන් බුද්ධරූපය බැලීම ද, 68 වැන්නෙන් වැඳිම ද, 69 වැන්නෙන් මල් පූජාව ද, 70 වැන්නෙන් ශරණ ගමනය ද, 71 වැන්නෙන් ගුණ කීම ද, 72 වැන්නෙන් දන් දී ම ද එක් වරක් හමුත් කිරීම මහත්ඵල බව දක්වූහ.

73. **කෘතමිහ සුකෘතං මෘෂාදෘශා යජ්**
**ජනයති තත් කිල තස්‍ය දුර්විපාකම්,**
**ක්ෂිතිසලිලරසං සවතික්තභාවං**
**නයති යථා පිචුමන්දබීජමුප්තම්.**

**පදාර්ථ:-** **ඉහ** = මේ ලොකයෙහි; **මෘෂාදෘශා** = මිථ්‍යා දෘෂ්ටිය හෙතු කොට ගෙණ; **යත්** **සුකෘතම්** = යම් කුශලයෙක්; **කෘතම්** = කරණ ලද ද; **තත්** = ඒ කුශලය තෙමේ; **තස්‍ය** = ඔහට; **කිල** = නිශ්චයෙන්; **දුර්විපාකම්** = අනිෂ්ට විපාකය; **ජනයති** = උපදවා; (කුමක් මෙන් ද;) **උප්තම්** = බිම හිඳුවන ලද; **පිචුමන්දබීජම්** = කොසඹ බිජු තෙමේ; **ක්ෂිති සලිල රසං** = පෘථිව්‍යප් රසය; **සවතික්තභාවං** = තමාගේ තික්ත භාවයට; **යථා නයති** = යම් සේ පමුණුවා ද; (එමෙනි.)

**භාවය**:- මිථ්‍යා දෘෂ්ටියෙන් කළ යහපත් ක්‍රියාව වුව ද අනිෂ්ට විපාකයක් දෙයි. කෙසේ ද යත්? සිටුවන ලද කොසඹ ඇටයට ඇද් ගන්නා පෘථිවි රසය ද තිත්ත භාවය වැඩීමට හෙතු වන්නාක් මෙනි.

**විස්තර**:- කොසඹ ඇටයක් සිටවූ විට ඊට ඇද ගන්නා පොළොවෙහි වූ ක්ෂාර ගතිය තිත්ත රසය වැඩීමට ම හෙතු වේ. මූලය නරක බැවිනි. එමෙන් ම වැරදි අදහසින් කළ හොඳ ක්‍රියාවෙන් ද නරක ප්‍රතිඵලයක් ම ලැබේ. මූල හෙතුව සදොස් බැවිනි.

**ජනයති, නයති** = 'ජනී ප්‍රාදුර්භාවෙ, නීඤ් ප්‍රාපණෙ' ලට් ප. ප්‍ර. එකවචන යි.

**ක්ෂිතිසලිල රසම්** = "ක්ෂිතෞ ක්ෂිතෙර්වා සලිලං ක්ෂිතිසලිලම්, තස්‍ය රසඃ ක්ෂිතිසලිලරසඃ, තම්."

**උප්තම්** = 'ටු වප් බීජ තන්තු සන්තානෙ' ධාතු යි. කර්මකාරක අතීත කෘදන්ත යි.

**74.** **තව පදනලිනෙ නිපත්‍ය භූයො**
**නිපතති නෛව චතුර්ෂ්වපායකෙෂු,**
**න හි කුශලකරො නරඃ කදාපි**
**ක්වචිදපි දුර්ගතිමෙති නාථ කශ්චිත්.**

**පදාර්ථ**:- **තව** = නුඹ වහන්සේගේ; **පද නලිනෙ** =ශ්‍රීපාද පද්මයෙහි; **නිපත්‍ය** = වැද හෙව; **භූයඃ** = නැවත; **චතුර්ෂු අපායකෙෂු** = නරකාදි සතර අපායෙහි; **නෛව නිපතති**= නො වැටෙන්නේ ම ය; **හි** = ඒ එසේ මැයි. **නාථ** = ස්වාමීන් වහන්ස; **කුශල කරඃ** = අනවද්‍ය ඉෂ්ට විපාක ලක්ෂණ වූ කුශලය සිද්ධ කරන්නා වූ; **කශ්චිත් නරඃ** = කිසි සත්වයෙක්; **ක්වචිදපි** = කොතැන්හිත්; **කදාපි** = කිසි කලෙකත්; **දුර්ගතිම්** = අපායට; **න එති** = නො පැමිණෙන්නේ යි.

**භාවය**:- ස්වාමීන් වහන්ස, ඔබ පාපියුමෙහි වැටී නැවත අපායෙහි නො වැටෙන්නේම ය. ඒ එසේ මැ යි. කුසල් කරණ මිනිසා කවද වත් දුගතියකට නො පැමිණෙයි. එහෙයිනි.

**විස්තර**:- බුදුරදුන්ගේ පා ලඟ වැද වැටීම පිණෙකි. එබැවින් එසේ වැඳ වැටෙන්නා කවද වත් අපායකා නූපදී ය යි කී තියා යි.

**නිපතාය** = 'නි' පූර්ව 'පද් ගතෞ' ධාතු යි. පූර්වක්‍රියා යි.

**එති** = 'ඉණ් ගතෞ' ලට් ප ප්‍ර. එකවචන යි.

**අපායකෙසු** = "අපායා එව = අපායකාඃ, තෙසු." ස්වාර්ථයෙහි 'ක' ප්‍රත්‍යය යි.

75. **ඉති භවදුපදෙශතො විදිත්වා**
**තව පදපඞ්කජපූජනෙ රතො'ස්මි,**
**දෘඪයතු භගවන් යුගෙ යුගෙ මෙ**
**කුමතිමුචො'ස්‍ය භවෙ භවෙ'ර්‍යභක්තිම්.**

**පදාර්ථ:-** **ඉති** = මෙසේ; **භවදුපදෙශතඃ** = නුඹ වහන්සේ විසින් වදාරණ ලද ධර්මෝපදෙශයෙන්; **විදිත්වා** = දැන; **තව** = නුඹ වහන්සේගේ; **පදපඞ්කජ පූජනෙ** = ශ්‍රීපාද පද්මයට පූජා කිරීමෙහි; **රතො'ස්මි** = ඇලුනේ වෙමි; **භගවන්** = භාග්‍යවත් වූ තථාගතයන් වහන්ස; **යුගෙ යුගෙ** = යුගයක් යුගයක් පාසා; **භවෙ භවෙ** = ජාතියක් ජාතියක් පාසා; **කුමතිමුචඃ** = දුර්දෘෂ්ටි දුර ලන; **අස්‍ය මෙ** = මේ මාගේ; **අර්‍යභක්තිම්** = තුණුරුවන්හි ආදරය; **දෘඪයතු** = ස්ථිර කරණ සේක්වා.

**භාවය:-** මෙසේ (ඔබ පාපියුම්හි වැඳ වැටීම මහත්ඵල බව) ඔබ වහන්සේගේ ධර්මෝපදෙශවලින් දැන ඔබ පාපියුම් පිදීමෙහි ඇලුනෙමි. භාග්‍යවතුන් වහන්ස, යුගයක් පාසා භවයක් පාසා මිථ්‍යාදෘෂ්ටි දුරු කරණ ඒ මාගේ බුද්ධ භක්තිය දැඩි කරණ සේක්වා.

**විස්තර:-** **විදිත්වා** = 'විද් ඥානෙ' ධාතු යි. පූර්වක්‍රියා යි.

**දෘඪයතු** = "දෘඪං කරොත්විති දෘඪයතු." නාමධාතුක ලොට් ප: ප්‍ර. එක වචන යි. 'දෘඪ' ශබ්දයා කෙරෙන් 'ණි' ප්‍රත්‍යය වීමෙන් නිපන් නාම ධාතුව 'දෘඪය' යනු යි.

**යුගෙ යුගෙ** = මෙහි 'යුග' නම් කාල විශෙෂයෙකි. **සත්‍ය, ත්‍රෙතත්,** ද්වාපර, **කලි** ය යි යුග සතරෙකි.

**අර්‍යභක්තිම්** = ස්වාමි භක්තිය, (=ස්වාමි වූ බුදුරදුන් කෙරෙහි භක්තිය;) "අර්‍යෙ භක්තිරර්‍යභක්තිඃ, තාම්." ස්වාම්‍යර්ථයෙහි පවත්නා **අර්‍ය, ආර්‍ය** ශබ්ද දෙකෙකි. මෙහි 'අර්‍ය' ශබ්දය යි.

76. සථිරමපි භගවන් ඎණං තවොපෙනෞ
කරචරණාදිදෘශාදි වෛරිවගීඃ,
ව්‍යථයති භාදයං බලාද් විචාල්‍ය
ත්වමිදමනාථමනීශ පාහි පාහි.

**පදාර්ථ:-** **භගවන්** = භාග්‍යවතුන් වහන්ස; **තව** = නුඹ වහන්සේගේ; **උපෙනෞ** = (ත්‍රිලක්ෂණාදි වූ උපදෙශ) වචනයෙහි; **ඎණම්** = ඇසිල්ලක්; **සථිරමපි** = නිශ්චල වුවත්; **අනාථම්** = සමාධි ප්‍රඥදි පිහිටක් නැත්තා වූ; **ඉදං භාදයං** = මේ චිත්තය; **කරචරණාදි** = හස්ත පාද මුඛාදි වූ ද; **දෘශාදි** = චක්ෂුශ් ශ්‍රොතාදි වූ ද; **වෛරිවගීඃ** = අනනුකූල ශත්‍රැ සමූහය තෙමේ; **බලාත්** = බලයෙන්; **විචාල්‍ය** = චලනය කොට; **ව්‍යථයති** = පීඩා කෙරෙයි; **අනීශ** = විනායක වූ සර්වඥයන් වහන්ස; **ත්වම්** = නුඹ වහන්සේ; **පාහි පාහි** = (මේ හයින්) රක්‍ෂා කොට වදාළ මැනවි

**භාවය:** භාග්‍යවතුන් වහන්ස, ඔබගේ වචනයෙහි ඇසිල්ලක් තමුත් නිශ්චල වූ මාගේ අසරණ හිත අත් පා ආදි වූ ද, ඇස් කන් ආදි වූ ද සතුරු සමූහයා බලයෙන් සොල්වා පෙළයි. විනායකයානන් වහන්ස, එයින් මාගේ සිත ඒකාන්තයෙන් ආරක්‍ෂා කළ මැනවි.

**විස්තර:–** 'අසරණ සිත' නම් සමාධි රහිත සිත යි. සමාධිගත සිත නම් චලනය නො වේ. එය ඉන්ද්‍රියයන් විසින් නො පෙළිය හැකි ය එබැවින් සමාධි රහිත දුර්වල සිත එක් අරමුණක ස්වල්ප වේලාවක් නිශ්චල ව පැවතුනත් හස්ත පාදදි කායද්වාරයට ද, චක්ෂුරාදි ද්වාරවලට ද අරමුණු හමු වූ කල චක්‍ෂුවල ව ඒ ඒ අරමුණුවලට බැස ගණී. එබැවින් අත් පා ආදිය ද, ඇස් කන් ආදිය ද සිතේ නිශ්චල බව නැති කොට සිත පෙළන සතුරෝ ය. මගේ සිත එකී සතුරන්ට පෙළන්නට නො දී රැක ගත මැනවැයි කිමෙන් මගේ සිත ද සමාධිගත වේවා යි අපෙක්‍ෂා කෙරෙති.

**ව්‍යථයති** = 'ව්‍යථ දුඃඛභයචලනයොඃ' ප්‍රයොජ්‍ය ලට් ප. ප්‍ර. එක වචන යි.

**බලාත්** = හෙතුවර්යෙහි පඤ්චමී යි.

**විචාල්‍ය** = 'වි' පූර්ව 'චල කම්පනෙ' ප්‍රයෝජ්‍ය පූර්වක්‍රියා යි.

77. යදි නයනමයං වශෙ විධාතුං
යතති තද ද්‍රවති ශ්‍රවො යද තද්,
තදනු රසන නාසිකා ශරීරා
ණ්‍යහහ! පරස්පරදුර්ග්‍රහාණි මෙවම්.

**පදාර්ථ**:- **අයං** = මේ ජන තෙමේ; **නයනම්** = නෙත්‍රය; **වශෙ විධාතුං** = සව වශයෙහි පවත්වනු පිණිස, **යදි** = ඉදින්; **යතති** = උත්සාහ කෙරේ ද; **තද** = එකල්හි; **ශ්‍රවඃ** = ශ්‍රොත්‍රය; **ද්‍රවති** = ශබ්දාලම්බනයට දුවන්නේ ය. **යද** = යම් කාලෙක්හි; **තත්** = ඒ ශ්‍රොත්‍රය වසඟ කරණු පිණිස උත්සාහ කෙරේ ද; **තදනු** = ඊට ඉක්බිති ව; **රසන** = ජිහ්වෙන්ද්‍රිය; **නාසිකා** = ඝ්‍රාණෙන්ද්‍රිය; **ශරීරාණි** = කායෙන්ද්‍රිය යන මොහු ද; **එවම්** = එසේ ම; **පරස්පරදුර්ග්‍රහාණි** = ඔවුනොවුන් විසින් රඳවා ගත නො හැක්කාහු යි; **අහහ** = ඛෙදයකි.

**භාවය**:- ඇස වසඟ කර ගැණීමට වෑයම් කරණ කල්හි කන ශබ්දය කරා දුවයි. එය වසඟ කරන්නට උත්සාහ කරණ විට දිව, නැහැය, කය යන ඉන්ද්‍රියයෝ ඒ ඒ අරමුණු ගණිත්. අහෝ! ඛෙදයෙකි.

**විස්තර**:- එක් ඉන්ද්‍රියයක් නිශ්චල කර ගන්නා විට අනික් ඉන්ද්‍රියයන් අරමුණු ගන්නා බැවින් පඤ්චෙන්ද්‍රියයන් ම එක් වර නිශ්චල කර ගැණීම දුෂ්කර ය. ඔවුන් නිශ්චල නො වන කල්හි සිතේ නිශ්චල බවෙක් නැත. සිත නිශ්චල කර ගැණීමට නම් පඤ්චෙන්ද්‍රියයන් නිශ්චල කරගත යුතු බැවිනි.

**යතති, ද්‍රවති** = 'යත ප්‍රතියත්නෙ, ද්‍රැ ගතෞ' ලට් ප. ප්‍ර. එක වචන යි.

**රසන නාසිකා ශරීරාණි** = "රසනඤ්ච නාසිකා ච ශරීරඤ්ච රසනනාසිකාශරීරාණි." පරස්පරං දුර්ග්‍රහීතව්‍යානි = **පරස්පරදුර්ග්‍රහාණි**; හිත නිශ්චල කර ගැණීම ඉතා දුෂ්කර බව මේ 76, 77 පද්‍ය දෙකින් දක්වූහ.

78. ගතිරතිචපලස්‍ය චෙතසස්‍යා
දිහ නහසිච නහඤ්චතො'සුරොධා,
කථමපි හජතෙ ක්‍රමෙණ ධෛර්‍ය්‍යං
චිරමිදමභ්‍යසනෙන සද්විරක්තාතා.

**පදාර්ථ**:- **ඉහ** = මේ පඤ්චස්කන්ධයෙහි; **අතිචපලස්‍ය** = ඉතා චඤ්චල වූ; **චෙතසඃ** = චිත්තයාගේ; **ගතිඃ** = ප්‍රවෘත්ති තොමෝ;

**නභසි** = ආකාශයෙහි; **නභස්වතඃ** = මාරුතයාගේ; **ගතිරිව**= ගතිය මෙන්; **අනුරෝධ්‍යා ස්‍යාත්**; සැප සේ නො වැළැක්විය හැකි වන්නී ය. **ඉදං** = මේ (අතිචපල වූ චිත්තය) තෙමේ; **සද්විරක්ත්‍යා** = මනා වූ වෛරාග්‍යයෙන්; චිරම්, බොහෝ කලක් මුළුල්ලෙහි = **අභ්‍යාසෙන** = සමාධි ප්‍රඥා භාවනාව කරණ කොට ගෙණ; **ක්‍රමෙණ** = මාර්ග පිළිවෙළින්; **කථමපි**= දුක සේ; **ස්ථෛර්‍යම්භජෙත** = ධීර භාවයට පැමිණෙන්නේ යි.

**භාවය**:- අහසෙහි සුළඟ පිළිබඳ ගමන මෙන් ඉතා චපල වූ මේ සිතේ පැවැත්ම වැළැක්වීම දුෂ්කර ය. මනා විරතියෙන් බොහෝ කලක් මුළුල්ලෙහි පුරුදු කිරීමෙන් අනුක්‍රමයෙන් මේ සිත සථිර භාවයට පැමිණේ.

**විස්තර**:- අහසෙහි ගමන් කරණ සුළඟ ඉතා වේගවත් ය. චඤ්චල ය. එය වැළැක්වීම ඉතා දුෂ්කර ය. එසේ ම මේ සිත ද ඉතා වේගවත් ය. චපල ය එබැවින් එය නිශචල කිරීම ද අතිශයින් දුෂ්කර ය. එහෙත් පස්කම් රසයෙන් වෙන් කොට තැබීමෙන්, බොහෝ කලක් එසේ පැවැත්මට පුරුදු කිරීමෙන්, පිළිවෙළින් සෝවාන් ආදි මාර්ගඵලාවබෝධ කිරීමෙන් ඉතා දුක සේ මේ සිත නිශ්චල භාවයට පමුණුවා ගත හැකි ය.

සිත වසඟ කර ගත හැකි ක්‍රමය මෙයින් දක්වන ලදී.

**නභස්වතඃ** = "නභෝ'ස්‍යාස්තීති නභස්වාන්, තස්‍ය." 'නභස්වත්' ශබ්ද ෂෂ්ඨ්‍යෙක වචන යි.

**සද්විරක්ත්‍යා** = මනා වෙන් වීමෙන්, "සතී ච සා විරක්තිශ්චෙති සද්විරක්තිඃ, තයා." 'විරක්ති' නම් පඤ්ච කාමයෙන් වෙන් වීම යි.

79. විශදමපි මනඃ ස්වභාවතෝ මෙ
චිරකෘතකිල්බිෂකාලිමාවෘතං ස්‍යාත්,
කුශල ජලලවෛඃ කථන්නු ධෞතම්
භවති මයේදෘශචෙතසාර්ජිතෛස්තෛඃ.

**පදාර්ථ**:- **ස්වභාවතඃ** = ප්‍රකෘතියෙන්; **විශදමපි** = ප්‍රභාස්වර වූ ද; **මෙ මනඃ** = මාගේ චිත්තය තෙමේ; **චිරකෘත** = අනාදි වශයෙන් සිද්ධ වූ; **කිල්බිෂ** = අවිද්‍යා තෘෂ්ණාදි පාප නමැති; **කාලිමාවෘතම්** = මලින භාවයෙන් වසන ලද්දේ; **ස්‍යාත්** = වන්නේ යි. **මයා** = මා විසින්; = **ඊදෘශ චෙතසා** = මෙබඳු වූ අවිද්‍යා

තෘෂ්ණා සහගත චිත්තයෙන්; **අර්ජිතෛඃ** = රැස් කරණ ලද්දා වූ; **තෛඃ කුශල ජල ලවෛඃ** = ඒ කාමාවචර කුසල් නැමැති දිය බිඳුවලින්; **කථන්නු** = කෙසේ නම්; **ධෞතතාං භවති** = ශුද්ධ වේ ද? (නො වේ මැයි.)

**භාවය**:- ප්‍රකෘතියෙන් පවිත්‍ර වූ ද මගේ සිත බොහෝ කලක් මුළුල්ලෙහි රැස් කරණ ලද පව් නැමැති කිලුටෙන් වැසුනේ ය. එබැවින් එබඳු අපිරිසිදු සිතින් රැස් කරණ ලද දිය බිඳු වැනි ඉතා සවල්ප කුසල්වලින් මගේ සිත කෙසේ පවිත්‍ර වේ ද? නො වේ මැ යි.

**විස්තර**:- සිත සවභාවයෙන් පිරිසිදු ය. එහෙත් එය බොහෝ කලක් මුළුල්ලෙහි පුරුදු වූ අවිද්‍යා තෘෂ්ණා ආදි කෙලෙස්වලින් කිලිටි වේ. **පභස්සරමිදං භික්ඛවෙ චිත්තං, තඤ්ච ඛො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං** යි ඒ බැව් වදාළහ. එසේ කිලිටි වූ සිතින් කළ කුසල් නම් කාමාවචර කුසල් ය. ඒවා ජල බිඳු වැනි ඉතා කුඩා කුසල් ය. ඒ කාමාවචර කුසල්වලින් දෙව් මිනිස් සැප මිස චිත්ත පාරිශුද්ධියක් නො ලැබේ. චිත්ත පාරිශුද්ධියක් ලැබීමට ලොකොත්තර කුසල් ම අවශ්‍ය ය.

**චිරකෘතකිල්විෂකාලිමාවෘතම්**= "චිරං කෘතං චිරකෘතම්, චිරකෘතඤ්ච තත් කිල්විෂඤ්චෙති චිරකෘතකිල්විෂම්, කාලස්‍ය භාවඃ කාලිමා." (= පාපය යි. කාල ශබ්දයා කෙරෙන් භාවයෙහි 'ඉමනි' ප්‍රත්‍යය යි.) චිරකෘතකිල්විෂමෙව කාලිමා චිරකෘතකිල්විෂකාලිමා, තෙන ආවෘතං චිරකෘතකිල්විෂකාලිමාවෘතම්."

**අර්ජිතෛඃ** = 'අජ් අජ්නෙ' දයින් නිපන් කම්කාරක අතීත කෘදන්ත 'අර්ජිත' ශබ්ද තෘතීයා බහුවචන යි.

80. **ශුචිතර වචනාමෘතප්‍රවාහෛ**
**රඝමලිනීකෘතචිත්තසන්තතිං මාම්,**
**අනඝවර නිතාන්තමාශ්‍රිතජනං**
**සපදි විශොධය දුග්ධවත්තනමාම්.**

**පදාර්ථ**:- **අනඝවර** = සර්වඥයන් වහන්ස; **අඝ** = රාගාදි පාපයෙන්; **මලිනීකෘත** = කිලුටු කළ; **චිත්ත සන්තතිම්** = සිත් සතන් ඇත්තා වූ; **නිතාන්තම්** = අත්‍යර්ථයෙන්; **ආශ්‍රිතජනම්** = මනො

දුඃඛයෙන් තවන ලද; **මාම්** = මා; **ශුචිතර** = අතිශයින් පවිත්‍ර වූ; **වචනාමෘත ප්‍රවාහෛඃ** = කෙවල වදන් නැමැති අමා වතුරෙන්; **සපදි** = ඇසිල්ලකින්; **විශෝධ්‍ය** = ශුද්ධ කොට වදාළ මැනව යි; **දණ්ඩවන් නමාමි** = දණ්ඩ නමස්කාර යෙන් වඳිමි.

**භාවය**:- සර්වඥයන් වහන්ස, පවින් කිලිටි වූ සිත් සතන් ඇති, එහෙයින් ම අතිශයින් තැවුනු මා ඔබ වහන්සේගේ ඉතා පිවිතුරු වචන නමැති අමා වතුරෙන් වහා පවිත්‍ර කොට වදාළ මැනවි. මම දණ්ඩ නමස්කාරයෙන් වඳිමි.

**විස්තර**:- ඔබගේ වචන සතුන් පිරිසිදු කෙරෙණ අමා ජලයෙකි. ඔබ මා සමග කථා කිරීමෙන් මම පවිත්‍ර වෙමි. එබැවින් වහා මා සමග කථා කොට මා පිරිසිදු කළ මැනව යි කී නියා යි.

**ශුචිතර වචනාමෘතප්‍රවාහෛඃ** = "ඉදමෙතෙෂාමතිශයෙන ශුචි ශුචිතරම්, වචනමෙවාමෘතං වචනාමෘතම්, ශුචිතරඤ්ච තද් වචනාමෘතඤ්චෙති ශුචිතරවචනාමෘතම්, තස්‍ය ප්‍රවාහාඃ = ශුචිතරවචනාමෘතප්‍රවාහාඃ, තෛඃ."

**අසමලිනීකෘත චිත්තසන්තතිම්** = "අමලිනා මලිනා කෘතෙති මලිනීකෘතා. (අභූත තද්භාවයෙහි 'ච්වි' ප්‍රත්‍යය යි.) අසෛමලිනීකෘතා = අසමලිනීකෘතා, චිත්තස්‍ය සන්තතිශ්චිත්ත සන්තතිඃ, අසමලිනීකෘතා චිත්තසන්තතිර්‍යස්‍ය සඃ = අසමලිනීකෘතචිත්තසන්තතිඃ, තම්."

**ආධිතප්තම්** = ඉතා තැවුනු, "අධිකං තප්ත ආධිතප්තඃ, තම්."

**විශෝධ්‍ය** = 'වි' පූර්ව 'ශුධ ශොධනෙ' ප්‍රයොජ්‍ය ල්‍යප් ප්‍ර. එකවචන යි.

**දණ්ඩවන්නමාමි** = දණ්ඩවත් + නමාමි. දණ්ඩක් සේ වඳිමි. මෙහි 'දණ්ඩවත්' යනු ක්‍රියා විශේෂණ යි. දණ්ඩක් සේ මුළු සිරුරින් පොළොවෙහි දිගා වී වැඳීම "දණ්ඩ නමස්කාරය" යි

81. **සති සකලගුණෛරෝ මුනෞ ප්‍රසන්නෙ**
**කිමිහ දූරාං මමුත්‍ර කිං දූරාපම්,**
**සදමලඛනසස් ඛාදියදූසාඃ**
**සුරපතිතාං මනසාපි නාද්‍රියන්තෙ.**

**පදාර්ථ**:- **යත්**=යම් හෙයකින්; **අමලමනසඃ**=විදර්ශනා භාවනායෙන් නිර්මල වූ සිත් ඇති; **ත්වදීයදාසාඃ**= නුඹ වහන්සේගේ ආඥාකර වූ යොගීහු; **සුරපතිතාම් = ඉන්ද්‍ර බව; මනසාපි = සිතිනුත්; නාද්‍රියන්තෙ** = ආදර නො කෙරෙද් ද; **තත් = එහෙයින්; සකල ගුරෝ** = සියලු ලොවට ගුරු වූ; **මුනෙ** = සර්වඥයන් වහන්ස; **ත්වයි ප්‍රසන්නෙ සති** = ඔබ කෙරෙහි ප්‍රසන්න කල්හි; **ඉහ** = මේ ලොකයෙහි; **දුරාපං කිම්**; = (මට) නො ලැබෙන්නේ කිමෙක් ද; **අමුත්‍ර** = පර ලෙව්හි; **දුරාපං කිම්** = නො ලැබෙන්නේ කිමෙක් ද?

**භාවය**:- සියල්ලන්ට ගුරු වූ බුදුරජාණන් වහන්ස, නිර්මල සිත් ඇති ඔබගේ දාසයෝ දෙව්රජ බවට සිතිනුත් ආදරය නො කෙරෙති. එහෙයින් ඔබ කෙරෙහි පැහැදුනු කල්හි මෙලොව කුමක් නො ලැබිය හැකි ද? පරලොව කුමක් නො ලැබිය හැකි ද? (සියල්ල ම ලැබිය හැකි ය.)

**විස්තර**:- මෙහි බුදුරදුන්ගේ දාසයෝ නම් අචල ශ්‍රද්ධාව ඇති සෝවාන් පුද්ගලයෝ ය. ඔවුන්ට මෙලොවත්, පරලොවත් නො ලැබිය හැක්කෙක් නැත. එහෙත් ඔවුන්ගේ බලාපොරොත්තුව නිවණ කෙරෙහි පමණෙකි. වෙන කිසිවක් ඔව්හු බලාපොරොත්තු නො වෙති. වෙන වෙන උසස් පදවි තබා ශක්‍ර පදවිය ගැණවත් ඔවුන්ගේ කිසි ම ආසාවෙක් නැත. **මනසාපි නාද්‍රියන්තෙ** යනුවෙන් යටි හිතින් වත් බලාපොරොත්තු නො වන බව හඟවයි.

**නාද්‍රියන්තෙ** = 'න + ආ' පූර්ව 'දෘඞ් ආදරෙ' ලට් ආ. ප්‍ර. එක වචන යි.

82. **විදධති භයමින්ද්‍රියාණි භූම්නා**
**විෂයවිෂග්‍රහණෙෂු දොෂදුෂ්ටා,**
**න හි සුවිදිත භාවිදුහදොෂඃ**
**ශිශුරපි දීපශිඛාග්‍රසඞ්ගමෙති සත්‍යාත්.**

**පදාර්ථ** - **දොෂ දුෂ්ටා** = රාගාදි දොෂයෙන් කිලුටු විම හෙතු කොට ගෙණ; **විෂය විෂ ග්‍රහණෙෂු** = රූප ශබ්දාදි ගොචර නැමැති විෂයයන් අයොනිශො මනස්කාරයෙන් ආලම්බනය කිරීමෙහි; **ඉන්ද්‍රියාණි** = (මාගේ;) චක්ෂුරාදි පඤ්චෙන්ද්‍රියයෝ; **භූම්නා** = බොහෝ සේ; **භයං විදධති** = භය ගන්නාහ; **හි**= ඒ එසේ මැයි.

**සුවිදිත** = මනා කොට දන්නා ලද; **භාවි දහදෝෂඃ** = මතු වන සුලු වූ දහන දෝෂ ඇති; **ශිශුරපි** = බාල දරු තෙමේ ද; **දීපශිඛාග්‍ර සඞ්ගාහී** = පහන් දලු අග අල්ලන්නේ; **න ස්‍යාත්** = නො වන්නේ යි

**භාවය:-** පහන් දැල්ල ඇල්ලීමෙන් පිළිස්සෙන බව දන්නා ලදරුවා පවා එය නො අල්ලයි. එමෙන් ම පඤ්චකාම විෂයානුභවයෙන් විය හැකි විපත් ගැණ දන්නා මාගේ නො මේරූ දුර්වල චක්ෂුරාදි පඤ්චේන්ද්‍රියයෝ ද රූපාදි අරමුණු ගැණීමට බොහෝ සෙයින් බිය වෙති.

**විධදති** = 'වි' පූර්ව 'ඩු ධාඤ් ධාරණ පෝෂණයෝඃ' ලට් ප. පු. බහු වචන යි.

**භූම්නා** = "බහෝර්භාවෝ භූමා, තේන." 'භූමන්' ශබ්ද තෘතීයෛක වචන යි. 'බහු' ශබ්දයා කෙරෙන් 'ඉමනි' ප්‍රත්‍යය ව ඉකාර ලෝපයෙන් හා බහු ශබ්දයට 'භූ' ආදේශයෙන් සිද්ධ යි.

**විෂයවිෂග්‍රහණේෂු** = 'විෂයාණ්‍යෙව විෂාණි විෂය විෂාණි, තේෂාං ග්‍රහණානි විෂයවිෂග්‍රහණානි, තේෂු."

**දෝෂදුෂ්ට්‍යා** = "දෝෂෛර්දුෂ්ටිර් දෝෂදුෂ්ටිඃ, තයා."

**සුවිදිතභාවිදහදෝෂඃ** = "භාවි ච ස දහනශ්චේති භාවිදහඃ, ස එව දෝෂඃ = භාවිදහදෝෂඃ, සුවිදිතෝ භාවිදහදෝෂෝ යේන ස සුවිදිතභාවිදහදෝෂඃ."

**දීපශිඛාග්‍ර සඞ්ගාහී** = "දීපස්‍ය ශිඛා දීපශිඛා, තස්‍යා අග්‍රං දීපශිඛාග්‍රම්, තත් සඞ්ගෘහ්ණාතීති දීපශිඛාග්‍රසඞ්ගාහී."

**83. න භවති ජින යාවදේෂ ජීර්ණෝ**
**විෂයපිශාචනිෂේවණේන තාවත්,**
**ක්ෂපිති සුකෘතකාමිණ් ප්‍රයෝජ්‍ය**
**තව ශරණාගතවත්සලාගතිං මාම්.**

**පදාර්ථ.–** **ශරණාගත වත්සල** = ශරණාගතයන් කෙරෙහි කරුණා ඇත්තා වූ; **ජින** = සර්වඥයන් වහන්ස; **ඒෂඃ** = මේ අස්මත් ශබ්ද වාච්‍යයා; **විෂය** = රූපාදි විෂය අනුභව නැමැති; **පිශාච** = යක්ෂයාගේ; **නිෂේවණේන** = සෙවනය කිරීමෙන්; **තාවත්** =

යම් තාක්; **ජීර්ණො න භවති** = ජරාවට පැමිණියේ නොවේ ද; **තාවත්** = ඊට පළමු කොට; **අගතිම්** = පිහිට නැත්තා වූ; **මාම්** = මා; **ඣටිති** = වහා; **සුකෘත කර්මණි** = (දාන ශීලාදි) කුශල කර්මයෙහි; **ප්‍රයොජ්‍ය** = යොදා; **ස්වව** = මනාකොට රක්‍ෂා කළ මැනවි.

**භාවය:-** පිහිට සොයා පැමිණියවුන් කෙරෙහි කරුණා ඇති ජිනෙන්ද්‍රයන් වහන්ස, පඤ්චකාම විෂයානුභාවයෙන් මහලු වන්නට පළමු අසරණ මා වහා කුසල් කිරීමෙහි යොදවා රැක ගත මැනවි.

**විස්තර:-** පස්කම් සැප යකකු මෙනි. යකෙකු ඇසුරු කිරීමෙන් විපතක් මිස කවදා වත් යහපතෙක් නො වේ. එබැවින් පස්කම් සැප සෙවීමෙන් වහා මහලු වේ. මහලු වූ විට ඉන්ද්‍රිය දුර්වල බැවින් කුසල් කළ නො හැකි ය. එහෙයින් මා මහලු වීමට පෙර සුචරිතයෙහි යොදවා වහා ගලවා ගත මැනව යි කී තියා යි.

**විෂය පිශාච නිෂෙවණෙන** = "විෂයමෙව පිශාචො විෂයපිශාචඃ, තස්‍ය නිෂෙවණං විෂයපිශාචනිෂෙවණම්, තෙන."

**ඣටිති** = ශීඝ්‍රාර්ථයෙහි අව්‍යයෙකි.

**ප්‍රයොජ්‍ය** = 'ප්‍ර' පූර්ව 'යුජිර් යොගෙ' ධාතු යි. ප්‍රයොජ්‍ය පූර්වක්‍රියා යි.

**ශරණාගතවත්සල** = "ශරණමාගතාඃ ශරණාගතාඃ, තෙෂු වත්සලඃ = ශරණාගතවත්සලඃ." සම්බොධන යි.

**අගතිම්** = "නාස්ති ගතිර්යස්‍ය සො'ගතිඃ, තම්."

**ස්වව** = සු + අව, 'සු' පූර්ව 'අව රක්‍ෂණෙ' ලොට් ප. ම. එක වචන යි.

84. **ඉදමපි යදි වෙද්මි පුත්‍රදාර**
**ක්‍ෂෙත්‍රානුග්‍රහාදි මරීචිකාම්බුතුල්‍යම්,**
**ස්ථගයති මමතා ච මාමහන්තා**
**තදපි හි මොහවිජෘම්භිතං ගරීයඃ.**

**පදාර්ථ**:- **ඉදං** = මේ; **පුත්‍ර** = දරුවෝ ය; **දාර** = අඹුවෝ ය; **ස්වතනු** = ස්වකීය ශරීරය; **ගෘහාදි** = වාසස්ථානය යන මේ ආදි වූ දෙය; **මරීචිකාම්බු තුල්‍යම්** = මිරිඟු දිය හා සමාන වන්නේ ය යි; **යද්‍යපි** = කිසි සේත්; **වෙද්මි** = දනිමි; **තදපි** = එතෙකුදු වුවත්; **මමතා ච** = මමත්වය ද; **අහන්තා ච** = 'අහං' බුද්ධිය ද; **මාම්** = මා හෙවත් මාගේ ප්‍රඥාව; **ස්ථගයති** = මුවහ කෙරේ; **ඞි** = ඒ එසේ මැයි; **මොහ විජෘම්භිතං** = අවිද්‍යාවගේ පැලඹීම; **ගරීයඃ** = සත්‍ය ප්‍රතිච්ඡාදකත්වයෙන් ඉතා මහත් වන්නේ යි.

**භාවය**:- අඹු දරුවෝ ය, සිය සිරුර ය, ගෙය ය යනාදි මේ සියල්ල මිරිඟු දිය වැනි ය යි මම දනිමි. එහෙත් මම ය, මගේ ය යන හැඟීම මාගේ ඒ දැනීම මුවහ කෙරෙයි. මෝහයේ පැලඹීම එතරම් බලවත් ය.

**විස්තර**:- 'මිරිඟු' නම් හිරුරැස් ය. ඈත සිටින්නන්ට එය රළ සහිත ජලය මෙන් පෙණේ. එහෙත් ලං වන්ට වන්ට එහි කිසිවක් නො පෙණේ, හිස් ය. එමෙන් ම අඹුදරු ආදීහු ද වහා නැසෙන සුලු අස්ථිර වූ හිස් දේවල් ය. ඒ බැව් මා දනිතත් මෝඛ කමින් වූ මමත්වය නිසා මගේ ඒ දැනීම වැසෙයි යූ සේ යි.

**වෙද්මි** = 'විද් ඥානෙ' ලට් ප්‍ර. උ. එකවචන යි.

**පුත්‍රදාරස්වතනුගෘහාදි** = "ස්වස්‍ය තනුඃ ස්වතනුඃ, පුත්‍රාශ්ච දාරාශ්ච ස්වතනුශ්ච ගෘහාණි ච පුත්‍රදාරස්වතනුගෘහාණි, තානි ආදෞ යස්‍ය තත් පුත්‍රදාරස්වතනුගෘහාදි"

**මරීචිකාම්බුතුල්‍යම්** = "මරීචිකා + එව + අම්බු මරීචිකාම්බු, තෙන තුල්‍යං මරීචිකාම්බුතුල්‍යම්."

**ස්ථගයති** = 'ස්ථග සංවරණෙ' ප්‍රයොජ්‍ය ලට් ප. ප්‍ර. එක වචන යි.

**මමතා, අහන්තා**="මම + ඉති භාවඃ = මමතා, අහම්ති භාවඃ = අහන්තා" 'මම, අහම්' යන විභක්ත්‍යන්ත පදයන් කෙරෙන් භාවයෙහි 'ත' ප්‍රත්‍යය හා ස්ත්‍රීයෙහි 'ආ' ප්‍රත්‍යය යි.

**මොහවිජෘම්භිතම්** = 'විජෘම්භනං විජෘම්භිතම්, (=වි පූර්ව 'ජෘභි ජෘම්භනෙ' ධාතු යි 'ක්ත' ප්‍රත්‍යයාන්ත භාව කෘදන්ත යි.) මොහස්‍ය විජෘම්භිතං මොහවිජෘම්භිතම්."

ගරීයඃ = "ඉදමෙතෙෂාමතිශයෙන ගුරු = ගරීයඃ." 'ගරීයස්' ශබ්ද නපුංසක ලිඞ්ගික ප්‍ර. ඒක වචන යි. 'ගුරු' ශබ්දයා කෙරෙන් අතිශයාර්ථයෙහි 'ඊයසු' ප්‍රත්‍යය හා ගුරු ශබ්දයට 'ගර්' ආදෙශ යි.

85 **අජනි ච නිජකාරණෙන සර්වං**
**නිවසති ජීර්‍යති නශ්‍යති ස්වහෙතොඃ,**
**අහමපි හි තථෛව ධාතුපුඤ්ජඃ**
**කථමහමස්‍ය කථං මුනෙ මමෙදම්.**

**පදාර්ථ**:- මුනෙ = සර්වඥයන් වහන්ස; **සර්වම්** = මේ පුත්‍ර කලත්‍රාදි සියලු ධාතු සමූහය තෙමේ; **නිජ කාරණෙන** = ස්වකීය කර්මාදි ප්‍රත්‍යයෙන්; **අජනි** = උපන්නේ ය. **ස්වහෙතොඃ** = ස්වකීය ප්‍රත්‍යය බලයෙන්; **නිවසති** = පවත්නේ ය; **ජීර්‍යති** = ජරාවට පැමිණෙන්නේ ය; **නශ්‍යති** = ක්ෂණ භඞ්ග වශයෙන් නැසෙන්නේ ය. **හි** (= **යස්මාත්**) = යම් හෙයකින්; **අහමපි** = මම ද; **තථෛව**=එසේ ම (කර්ම ප්‍රත්‍යයාදියෙන් ජනිත වූ උත්පත්තිස්ථිති භඞ්ග ඇත්තා වූ); **ධාතුපුඤ්ජඃ**=නිරාත්මක වූ ධාතු සමූහයෙක්මි. (එහෙයින්); **අස්‍ය** = මේ පුත්‍ර කලත්‍රාදි ධාතු සමූහයට; **අහම්** = මම; **කථම්** = කෙසේ (සම්බන්ධි වෙම් ද); **මම** = අස්මත් ශබ්ද වාච්‍ය වූ ධාතු සමූහයට; **ඉදම්** = මේ (පුත්‍ර කලත්‍රාදි ව්‍යවහාරයෙන් යුක්ත වූ ධාතු සමූහය තෙමේ); **කථම්** = කෙසේ සම්බන්ධි වන්නේ ද; (නො වන්නේ මැයි.)

**භාවය**:- බුදුරජාණන් වහන්ස, ඉහත කී පුත්‍ර කලත්‍රාදි සියල්ල ස්වකීය කර්ම ප්‍රත්‍යයෙන් හටගන්නේ ය. එයින් ම පවතියි, දිරයි, නැසෙයි. මම ද එබඳු ම ධාතුපුඤ්ජයෙක්මි. එහෙයින් මා ඒ පුත්‍ර කලත්‍රාදිය සමගත්, ඒ පුත්‍ර කලත්‍රාදිය මා සමගත් කෙසේ සම්බන්ධ වේ ද? (නො වේ මැයි.)

**විස්තර**:- සියලු සංස්කාර ම උත්පත්ති, ස්ථිති, භඞ්ග වශයෙන් පවත්නේ ස්වකීය කර්මාදි ප්‍රත්‍යය හෙතුවෙනි. එබැවින් ඒ සියල්ල ම හුදු ධාතුපුඤ්ජ මිස ඒ කිසිවකුගේ අන්‍යොන්‍ය සම්බන්ධයෙක් නැත. එසේ හෙයින් කිසිවකුට කිසිවක් මම ය, මාගේ ය යි සැලකීමට ඉඩෙක් නැතැයි කී නියා යි. මේ පද්‍යයේ 'සර්වම්' යන්නෙන් මීට මූල පද්‍යයෙහි දැක්වූ අඹුදරු ආදීහු ගැණෙති,

**අජනි** = 'ජනී ප්‍රාදුර්භාවෙ' ලුඞ් අං ප්‍ර එක වචන යි.

**ජීර්‍ය්‍යති, නශ්‍යති** = 'ජෘෂ් ඉර් වයෝ හානෞ, නශ් අදර්‍ශනෙ' ලට් ප. ප්‍ර. එක වචන යි.

86. **ආත්මබුද්ධිරිහ යස්‍ය ජායතෙ
සා ච තස්‍ය ජනයෙදහඞ්කෘතිම්,
සා තනොති සුතරාං භවස්පෘහාං
සෛව මොහජනනී මුහුර්මුහුඃ.**

**පදාර්ථ:-** **යස්‍ය** = යම් පුද්ගලයකුහට; **ඉහ** = මේ රූපාදි පඤ්චස්කන්ධයෙහි; **ආත්මබුද්ධිඃ** = ආත්මදෘෂ්ටි තොමෝ; **ජායතෙ** = උපදී ද; **සා ච** = ඒ ආත්ම දෘෂ්ටිය ද; **තස්‍ය** = ඔහට; **අහඞ්කෘතිම්** = අහඞ්කාරය; **ජනයෙත්** = උපදවන්නේ ය. **සා** = ඒ අහඞ්කෘති තොමෝ; **සුතරාං** = අත්‍යර්ථයෙන්; **භවස්පෘහාම්** = භව තෘෂ්ණාව; **තනොති**=කරන්නී ය; **සෛව** = ඒ භව තෘෂ්ණාව ම; **මුහුර්මුහුඃ** = ක්ෂණ ක්ෂණයෙහි; **මොහ ජනනී** = මෝහ උපදවන්නී ය.

87. **තෙන කර්ම කුරුතෙ ශුභාශුභං
තද්ධි දුඃඛජනකං භවත්‍රයෙ,
දුඃඛමූලමත එව සාත්මධීස්
තං ලුනීහි ජින මෙ වචො'සිනා.**

**පදාර්ථ:-** **තෙන** = ඒ මෝහයෙන්; ශුභාශුභං **කර්ම** = කුශලාකුශල කර්මය; **කුරුතෙ** = කරන්නේ ය; **තද්ධි** = ඒ කුශලාකුශල කර්මය තෙමේ; **භවත්‍රයෙ** = කාම භවාදි තුන් භවයෙහි; **දුඃඛ ජනකම්** = ජාති ජරාදි දුක් උපදවන්නේ ය.; **අතඃ එව** = එහෙයින් ම; **සා ආත්මධීඃ**= ඒ ආත්මදෘෂ්ටි තොමෝ; **දුඃඛමූලම්**= (සංසාර) දුඃඛයට මුල් වන්නී ය; **මෙ** = මාගේ; **තාං** = ඒ ආත්ම බුද්ධිය; **ජින** = සම්‍යක් සම්බුද්ධයන් වහන්ස; **වචො'සිනා** = ප්‍රවචන නමැති ඛඩ්ගයෙන්; **ලුනීහි** = සිඳ වදාළ මැනවි.

**86, 87 දෙක්හිම,**

**භාවය:-** රූපාදි පඤ්චස්කන්ධයෙහි නිත්‍ය වූ ආත්මයෙක් ඇතැයි හැඟීමක් ඇති වූ කල්හි එයින් මම ය, මාගේ ය යන මමත්වය ඇති වෙයි. ඒ මමත්වයෙන් භවතෘෂ්ණාව ද, එයින් කට යුතු නො කට යුතු වෙන් කර ගැණීමෙහි මූලාව ද ඇති වෙයි. ඒ මූලාවෙන් කුශලාකුශල කර්ම කෙරෙයි. ඒ හෙතු කොට ගෙණ භවත්‍රයෙහි ජාති ජරාදි දුක් රැස පහල වෙයි. මෙසේ

හෙයින් සියලු සසර දුකට මූල ඉහත කී ආත්මදෘෂ්ටිය යි. සර්වඥයන් වහන්ස, මාගේ ඒ ආත්මදෘෂ්ටිය ඔබගේ වචන නමැති කඩුවෙන් සිඳ වදාල මැනවි.

**විස්තර:-** බුදුරදුන්ගේ වචන කඩුවක් මෙනි. කඩුවෙන් එක් වරට ම යමක් කැපිය හැකි ය. එමෙන් ම ඔබගේ වචන වලින් මාගේ ආත්මදෘෂ්ටිය එක් වරින් ම සිඳ දමනු මැනවැයි කී නියා යි.

**ආත්මදෘෂ්ටිය** නම් සත්කාය දෘෂ්ටිය යි. එය රූපස්කන්ධය පිළිබඳ ව රූපය ආත්මය යි කියා ද, රූපයෙහි ආත්මය පවතී ය යි කියා ද, රූපය ඇසුරු කොට ගෙණ ආත්මය පවතී ය යි කියා ද, රූපයෙහි පැතිරී ආත්මය පවතී ය යි කියා ද සිවු අයුරෙකින් ලැබේ. එසේ ම වේදනා, සඤ්ඤා, සඞ්ඛාර, විඤ්ඤාණ යන සකන්ධ සතර පිළිබඳ ව ද ඒ සිවු සිවු අයුරෙන් ම ලැබෙන බැවින් සත්කාය දෘෂ්ටිය විසි වැදෑරුම් ය. ඒ මේ සත්කාය දෘෂ්ටිය සියලු සසර දුකට හෙතු වන සැටි මේ පද්‍ය දෙකින් අනුක්‍රමයෙන් දක්වන ලදී.

**ජායතෙ** = 'ජනී ප්‍රාදුර්භාවෙ' ලට් ආ. ප්‍ර. එක වචන යි. **ජනයති** යනු ද ඒ ධාතුහුගේ ම ප්‍රයොජ්‍ය විධිලිඞ් ප. ප්‍ර. එක වචන යි.

**භවස්පෘහාම්** = "භවං ස්පෘහයතීති භවස්පෘහා, තාම්." 'භව' ශබ්දෙපපද අදනන්ත චුරාදි '**ස්පෘහ** ඉච්ඡායාම්' ධාතු යි.

**ලුනීහි** = 'ලූඤ් ඡෙදනෙ' ලොට් ප. ම. එක වචන යි.

**වචො'සිනා** = "වච එව අසිර්වො'සිඃ, තෙන."

**වෘත්තය:-** මේ පද්‍ය දෙක ම ත්‍රිෂ්ටුභ් ඡන්දසට අයත් රථොද්ධතා යි. රාන්නරාවිහ රථොද්ධතා ලගෞ = රගණ, නගණ, රගණ, ලඝු, ගුරු යන මෙයින් යුත් වෘත්තය රථොද්ධතා නම්.

88 **අථ සකලවිදං දයාසමුද්‍රං**
**ත්‍රිභුවනකාරණකාරණං කුලීනම්,**
**නිඛිලගතඛනසන්තමස්තිශාන්තිං**
**මුනිජනමානස හංසමීශමීඩෙ.**

**පදාර්ථ**:- **අථ** = (මේ නිවේද නිවේදනයට අනතුරු ව; **සකල විදම්** = සර්වඥ වූ; **දයා සමුද්‍රම්** = කරුණාවට සාගර වූ; **ත්‍රිභුවන කාරණ** = තුන් ලොවට කරුණු වූ අවිද්‍යාව; **කාරණම්**= නසන්නා වූ; **කුලීනම්** = ප්‍රශස්ත කුලයෙහි උපන්නා වූ; **නිඛිල ගතම්** = සමස්ත ලොකයෙහි කායගති ඥානගතියෙන් ව්‍යාප්ත වූ; **අනන්තම්** = ගුණයෙන් කෙළවරක් නැත්තා වූ; **අසති ශාන්තිම්** = සන්සුන් කෙලෙසුන් ඇති; **මුනිජන මානස** = අෂ්ටාර්‍ය්‍ය පුද්ගල සඞ්ඝයාගේ සිත් නැමැති විලට; **හංස** = හංස රාජයකු වැනි වූ; **ඊශම්** = ස්වාමි වූ තථාගතයන්හට; **ඊඩෙ** = ස්තුති කෙරෙමි.

**භාවය**:- ඉක්බිති මම, සර්වඥතාදි අපමණ ගුණ ඇති පරමේශ්වර බුදුරජාණන් වහන්සේට ස්තුති කරමි.

**විස්තර**:- විශේෂණ රාශියකින් බුදුරදුන්ගේ ගුණ වැණුහ. විශේෂණ පදවල අර්ථ සත්තයෙන් පැහැදිලි ය.

**ත්‍රිභුවනකාරණකාරණම්** = "ත්‍රීණි භුවනානි සමාහෘතානි ත්‍රිභුවනම්, තස්‍ය කාරණං ත්‍රිභුවනකාරණම්, තස්‍ය කාරණං ත්‍රිභුවනකාරණකාරණම්, තත්." (මේ දෙවෙනි 'කාරණ' ශබ්දය හිංසාර්ථයෙහි ය. එය 'කෘඤ් හිංසායාම්' ධාතුවෙන් සිද්ධ යි.)

**අසතිශාන්තිම්** = "අසති ශාන්තිර්යස්‍ය සඃ = අසතිශාන්තිඃ, තම්."

**මුනිජනමානසහංසම්** = "මුනයශ්ච තෙ ජනාශ්චෙති මුනිජනාඃ, තෙෂාං මානසං මුනිජනමානසම්, තස්‍ය තස්මින් වා හංස ඉව මුනිජනමානසහංසඃ, තම්." බුදුරජ හංසයෙකි. මහා සඞ්ඝයාගේ සිත විලෙකි. හංසයාගෙන් විල ශොභමාන වේ. එමෙන් ම බුදුරදුන්ගෙන් මහා සඞ්ඝයාගේ සිත් ශොභමාන වේ. පවිත්‍ර වන බැවිනි.

**ඊඩෙ** = 'ඊඩ ස්තුතෞ' ලට් ආ උ. එක වචන යි.

**වෘත්තය** = පුෂ්පිතාග්‍රා යි.

89. ස්නානෙ ඛාදීනි භොජනෙ විතරණෙ ඝ්‍රාණෙ
තථා කර්ණනෙ
**ධ්‍යානස්පර්ශනදර්ශනාදිෂු තථා සම්භාෂණාද්වපි,**
**ප්‍රාතස් සායමථො දිවා ච නිශි ච ත්වත්පාදපද්මෙ විභො**
**විභ්‍රාන්තමෙම රමතාං මුනීන්ද්‍ර සතතං යූනාං යුවත්‍යාමිව,**

**පදාර්ථ** - **ස්නානෙ භෝජනේ** = ස්නානය කිරීමෙහි ද; **භොජනෙ** = බත් අනුභව කිරීමෙහි ද; **විතරණෙ** = දන් දීමෙහි ද; **ඝ්‍රාණෙ** = සුගන්ධාදීන් ඉඹීමෙහි ද; **තථා** = එසේ ම; **ආකර්ණනෙ** = ශබ්ද ඇසීමෙහි ද; **ධ්‍යාන** = ධර්මාලම්බනයන් සිතීමෙහි ද; **ස්පර්ශන** = කායිකාදීන්ගේ ස්පර්ශ කිරීමෙහි ද; **දර්ශනාදිෂු** = (නීල පීතාදි රූපයන්ගේ) දර්ශනය යන මේ ආදියෙහි ද; **තථා** = එසේ ම; **සම්භාෂණාදාවපි** = ඔවුනොවුන් හා කථා කිරීම් ආදියෙහි ද; **ප්‍රාතඃ** = උදෑසන ද; **සායම්** = සවස ද; **අථො** = නැවත; **දිවා** = දවල් ද; **නිශි ච** = රාත්‍රියෙහි ද; **විභො** = ලොකස්වාමී වූ; **මුනීන්ද්‍ර** = මුනිරාජයන් වහන්ස; **ත්වත් පාදපද්ම** = නුඹ වහන්සේගේ ශ්‍රීපාද පද්මයෙහි; **මෙ චිත්තම්** = මාගේ චිත්තය තෙමේ; **යුවත්‍යාම්** = තරුණ ස්ත්‍රිය කෙරෙහි; **යූනාං** = තරුණ පුරුෂයන්ගේ චිත්තය මෙන්; **සතතම්** = නිරන්තරයෙන්; **රමත ම්** = ඇලේවා

**භාවය**:- ස්වාමි වූ මුනීන්ද්‍රයන් වහන්ස, නෑන, අනුභව කරණ, දන් දෙන, සුගන්ධාදිය ආඝ්‍රාණය කරණ, ශබ්ද අසන, ධ්‍යාන වඩන, ස්පර්ශ කරණ, රූපාදිය බලන, කථා කරණ හැම අවස්ථාවල ද, උදය, සවස, දවල්, රාත්‍රි යන සියලු ම වේලාවන්හි ද මාගේ සිත තරුණිය කෙරෙහි ඇලෙන තරුණයන්ගේ සිත මෙන් ඔබ පාපියුමෙහි ඇලේවා.

**විස්තර**:- සියලු ම ක්‍රියා කරණ අවස්ථාවලත්, සියලු ම වේලාවලත් නිතර ම මගේ සිත ඔබ කෙරෙහි ඇලේවා යි යූ සේ යි. මෙහි යූනාං යුවත්‍යාමිව යන අන්‍යාපදේශයෙහි උපමාව ඖදරික බැවින් එය මුක්තාවිව ත්වන්මනඃ යි ශ්‍රී දෙවරක්ෂිත බටුවන්තුඩාවේ පඬිතුමා විසින් ශුද්ධ කරණ ලදී. 'නිරොධ සමාපත්තියෙහි ඇලෙන ඔබ වහන්සේගේ සිත මෙන්" යි එහි අර්ථ ගත යුතු යි. ('මුක්තෞ ත්වද් මනඃ ඉව" යනු එහි අන්වය යි.)

ධ්‍යානස්පර්ශනදර්ශනාදිෂු = "ධ්‍යානඤ්ච ස්පර්ශනඤ්ච දර්ශනඤ්ච ධ්‍යානස්පර්ශනදර්ශනානි, තානි ආදෞ යෙෂාං තෙ ධ්‍යානස්පර්ශනදර්ශනාදයඃ, තෙෂු."

රමතාම් = 'රමු ක්‍රීඩායාම්' ලොට් ආ. ප්‍ර. එක වචන යි.

**වෘත්තය**:- මෙයත්, මීළඟ පද්‍යයත් ශාර්දූල වික්‍රීඩිත යි.

90. මත්ස්වාමින් මදභීෂ්ටකල්පවිටපින් මද්දෛවතෙ මද්ගුරො
මන්මාතර්මදුපාස්‍ය මත්ප්‍රියසඛෙ මත්සද්ගතෙ මත්පිතඃ,
මද්විද්‍යෙ මදශෙෂදුඃඛශමකෘත් මද්භාවනෙ මන්නිධෙ
මන්මොක්ෂ මදුදරභාග්‍ය මදසො මද්බුද්ධ මාම්පාලය.

**පදාර්ථ:-** **මත් ස්වාමින්** = මාගේ ස්වාමි වූ; **මදභීෂ්ට කල්ප විටපින්** = මට අභිමත කල්ප වෘක්ෂයක් බඳු වූ; **මද්දෛවතෙ** = මාගේ ඉෂ්ට දෙවතා වූ; **මද්ගුරො** = මාගේ ආචාර්ය වූ; **මන්මාතඃ** = මාගේ මව වූ; **මදුපාස්‍ය** = මා විසින් භජනය කට යුතු වූ; **මත් ප්‍රියසඛෙ** = මාගේ ප්‍රිය මිත්‍ර වූ; **මත්සද්ගතෙ** = මට මනා පිහිට වූ; **මත්පිතඃ** = මාගේ පිය වූ; **මද්විද්‍යෙ** = මාගේ ශාස්ත්‍ර ඥානය වූ; **මදශෙෂ දුඃඛ ශමකෘත්** = මාගේ සියලු දුක් සන්සිඳුවන්නා වූ; **මද් භාවනෙ** = මාගේ ධ්‍යානාලම්බන වූ; **මන්නිධෙ** = මාගේ නිධාන වූ; **මන්මොක්ෂ** = මාගේ මොක්ෂ වූ; **මදුදරභාග්‍ය** = මාගේ මහත් පින්පිඩු වූ; **මදසො** = මාගේ ජීවිත වූ; **මද්බුද්ධ** = මාගේ සර්වඥයන් වහන්ස; **මාම්පාලය** = මා රක්ෂා කොට වදාළ මැනවි.

**භාවය:-** මාගේ ස්වාමීන් වහන්ස, මාගේ කල්ප වෘක්ෂය, මාගේ දෙවියානනි, මාගේ ගුරුවරයානනි, මාගේ මෑනියනි, මා විසින් සෙවනය කළ යුතු මාගේ මිත්‍රයානනි, මට පිහිට වූ මාගේ පියානනි, මාගේ ශාස්ත්‍රය, මාගේ සියලු දුක් දුරු කරණ උත්තමය, මාගේ භාවනාව, මාගේ නිධානය, මාගේ නිවණ, මාගේ උදර පිණැත්ත, මාගේ ප්‍රාණය, මාගේ බුදුරජානන් වහන්ස, මා රැක ගණු මැනවි.

**විස්තර:-** එක් එක් අයුරෙන් ස්වකීය මමත්වය දක්වා බුදුරජානන් වහන්සේට ආමන්ත්‍රණය කළහ. සම්බොධනය ප්‍රකට වන ලෙස සන්නයෙහි අර්ථ දක්වූයේ නම් මැනවි.

**මදශෙෂදුඃඛශමකෘත්** = "අශෙෂඤ්ච තද් දුඃඛඤ්චෙත්‍ය ශෙෂදුඃඛම්. මම + අශෙෂ දුඃඛං මදශෙෂදුඃඛම්, තච් ශමං කරොතීති මදශෙෂදුඃඛශමකෘත්."

**මදසො** = "මම + අසුඃ = මදසුඃ." 'මදසු' ශබ්ද සම්බොධන එක වචන යි.

**පාලය** = 'පාල රක්ෂණෙ' ලොට් ප. ම. එක වචන යි.

91. බ්‍රහ්මා ජිහ්මානනො'භූද් ගුරුරගුරුරහර්නායකො
'නායකො'සෞ
විෂ්ණුස් තූෂ්ණීං ප්‍රපෙදෙ කවිරකවිරභූදීශ්වරො
'නීශ්වරො'පි,
ශෙෂඃ ශෙෂානුභාවස් තව සුගත නුතෞ ඛණ්ඩිතා
ඛණ්ඩලාකාතිඃ
කො'හං මූඪො වරාකස් ත්‍රිදශනරපතෙ කීර්තනෙ තෙ
ගුණානාම්.

**පදාර්ථ**: **සුගත** = සර්වඥයන් වහන්ස; **තව නුතෞ** = නුඹ වහන්සේට ස්තොත්‍ර කිරීමෙහි; **බ්‍රහ්මා** = මහාබ්‍රහ්ම තෙමේ; **ජිහ්මානනො'භූත්** = ලජ්ජායෙන් අවනත වූ මුව ඇති වූයේ ය. **ගුරුඃ** = සුරාචාර්ය තෙමේ; **අගුරුඃ** = ලඝු වූයේ ය. **අසෞ අහර්නායකඃ** = මේ සහස්‍ර කිරණ තෙමේ; **අනායකඃ** = අප්‍රධාන වූයේ ය; **විෂ්ණුඃ** = පුරුෂොත්තම තෙමේ; **තූෂ්ණීං ප්‍රපෙදෙ** = තුෂ්ණීම් භාවයට පැමිණියේ ය; **කවිඃ** = අසුරාචාර්ය තෙමේ; **අකවිඃ අභූත්** = අපණ්ඩිත වූයේ ය; **ඊශ්වරඃ අපි** = ත්‍රිනෙත්‍ර ද; **අනීශ්වරඃ** = නො පොහොසත් වූයේ ය; **ශෙෂඃ** = අනන්ත නාගරාජ තෙමේ; **ශෙෂානුභාවඃ** = අඩු වූ මහිම ඇත්තේ වූයේ ය; **ආඛණ්ඩලාකාතිඃ** = ශක්‍ර දෙවේන්ද්‍රයාගේ භාෂා තොමෝ; **ඛණ්ඩිතා** = කඩ කරණ ලද්දී ය; **ත්‍රිදශ නර පතෙ** = දෙව් මිනිසුන්ට නායක වූ සර්වඥයන් වහන්ස; **තෙ ගුණානාං කීර්තනෙ** = නුඹ වහන්සේගේ ගුණ කථනයෙහි; **මූඪඃ** = අඥාන වූ; **වරාකඃ** = මන්දභාග්‍ය වූ; **අහම්** = මම; **කඃ** = කවරෙක් ද?

**භාවය:-** තථාගතයන් වහන්ස, ඔබට සතුති කිරීමෙහි ලා (අසමර්ථ බැවින් මුව සතරක් ඇති) මහාබ්‍රහ්මයා බිම බලා ගත්තේ ය. දෙවියන්ට ආචාර්ය වූ ගුරු (= වෘහස්පති) තෙමේ ගුරු නුවූවෙක් විය. සූර්යයා අප්‍රධානයෙක් විය. විෂ්ණු නිශ්ශබ්ද විය. අසුරයන්ට ආචාර්ය වූ කවි (= සිකුරු) තෙමේ කවි නුවූවෙක් විය. ඊශ්වරයා ඊශ්වර නුවූවෙක් විය. (මුව දහසක් ඇති) අනන්ත නාගරාජයා අඩු වූ අනුභාව ඇත්තෙක් විය. ශක්‍රයා ගොළු විය. දෙව්මිනිසුන්ට නායක සර්වඥයන් වහන්ස, ඔබ ගුණ වැණුමෙහි ලා මෝඩ කාලකණ්ණියෙක් වූ මම කවරෙක් ද?

**විස්තර:-** ඉහත කී බ්‍රහ්මාදි මහාබල සම්පන්නයෝ ද බුදුගුණ වැණුමට අසමර්ථ වූවාහු නම් එක් කවක් ඇති මා වැනි මෝඩයෙක් කෙසේ සමර්ථ වේ ද. නො වේ මැයි.

ජිහ්මානනඃ = නැමුනු මුහුණු ඇති. 'ජිහ්මම් ආනනං යස්‍ය ස ජිහ්මානනඃ."

අහර්නායකඃ = දවසට නායකයා, හිරු; "අහ්නො නායකඃ = අහර්නායකඃ."

ප්‍රපෙදෙ = 'ප්‍ර' පූර්ව 'පද් ගතෞ' ලිට් ආ. ප්‍ර. එක වචන යි.

ආඛණ්ඩලෞකඃ = "ආඛණ්ඩලස්‍ය + ඌකඃ = ආඛණ්ඩලෞකඃ." 'ආඛණ්ඩල' නම් ශක්‍රයා යි. ඔහුගේ වචන කැඩුනේ ය, හෙවත් හෙතෙමේ ගොළු විය.

වෘත්තය:- ස්‍රග්ධරා යි.

92. ද්වාත්‍රිංශත් ... (verse)

**දශාධිකවිංශතිඃ සපුරදශිතාන්‍යනුවාන්‍යජශනෛර්**
**මහාපුරුෂලක්ෂණං වපුෂි යස්‍ය දෙදීප්‍යතෙ,**
**කලාමපි න ෂොඩශීං භජති තස්‍ය පුණ්‍යාත්මනශ්**
**චතුර්මුඛමුඛො ගණො දිවිෂදං නෘණාං කා කථා.**

පදාර්ථ:- **යස්‍ය** = යම් සර්වඥයකුගේ; **වපුෂි** = ශ්‍රී ශරීරයෙහි; **අශිත්‍යනුව්‍යඤ්ජනෛඃ**=(තම්බ තුඞ්ග නඛතාදි වූ) ක්ෂුද්‍ර ලක්ෂණ අසූවකින්; **සපුරන්** = බබලන්නා වූ; **දශාධික විංශතිඃ** = දශයක් හා දෙකක් අධික කොට ඇති විස්සක් හෙවත් දෙතිසක්; **මහාපුරුෂ ලක්ෂණම්** = (සුප්‍රතිෂ්ඨිත පාදතලාදි වූ) පූජ්‍ය පුරුෂ ලක්ෂණය තෙමේ; **දෙදීප්‍යතෙ**=අතිශයින් බබලා ද; **තස්‍ය පුණ්‍යාත්මනඃ** = ඒ පින්වත් වූ මහොත්තමයානට; **චතුර්මුඛමුඛඃ** = මහා බ්‍රහ්මයා ප්‍රධාන කොට ඇති; **දිවිෂදං ගණඃ**= දිව්‍ය සමූහය තෙමේ; **ෂොඩශීමපිකලාං**= සොළොස් වන කලාවෙන් කලාවක් ද; **න භජති** = නො සෙවුනේ ය; **නෘණාම්** = මනුෂ්‍යයන් සම්බන්ධ ව; **කා කථා** = කියනු කිම් ද?

භාවය:- මහාබ්‍රහ්මයා ප්‍රධාන කොට ඇති දිව්‍ය සමූහයා ක්ෂුද්‍ර ලක්ෂණ අසූවක් ඇති මහාපුරුෂ ලක්ෂණ දෙතිසකින් බබලන සර්වඥයන් වහන්සේගේ සොළොස් වන කලාවෙන් කලාවකටත් නො පැමිණෙති. මිනිසුන් ගැණ කවර කථා ද?

විස්තර.- සොළොස් වන කලාවෙන් කලාව නම් සොළසින් බෙදු ලැබුන කොටස නැවතත් සොළොස් වරක් සොළසින් බෙදු ලැබෙන කොටස යි. සියලු දෙවියෝ බුදුරදුන් ගැණ

සැලකීමෙහි දී එබඳු සුලු කොටසකුත් නො වටිති එසේ කල්හි මිනිසුන්ගේ ප්‍රමාණය ගැණ කියනු කිම? බුදුරදනු කුඩා ලකුණු අසූවකින් හා මහපුරිස් ලකුණු දෙතිසකින් බබලති. (ධම්ප්‍රදීපිකා, 4 වන පිටේ පටන් 14 වන පිට තෙක් කියවන්න.)

දශද්ව්‍යධික විංශතිඃ = 'දශභ්‍යශ්ච ද්වාභ්‍යාඤ්චාධිකා විංශතිඃ = දශද්ව්‍යධිකාවිංශතිඃ.'' දශයකින් හා දෙකකින් වැඩි විස්ස, දෙතිස යි.

ස්ඵුරත් = නපුංසක ලිඞ්ග ප්‍ර. එක වචන යි. 'ස්ඵුර ස්ඵූර්තෞ' දැයින් නිපන් වර්තමාන කෘදන්ත යි.

දේදීප්‍යතෙ = 'දීපී දීප්තෞ' අතිශයාර්ථයෙහි වූ යඞන්ත ලට් ප්‍ර. එක වචන යි.

චතුර්මුඛ මුඛඃ = ''චත්වාරි මුඛානි යස්‍ය ස චතුර්මුඛඃ, ස මුඛඃ (= ප්‍රධානඃ) යස්‍ය ස චතුර්මුඛමුඛඃ.''

දිවිෂදම් = ''දිවි සීදන්තීති දිවිෂදඃ, තෙෂාම්.'' අලුප්ත තත්පුරුෂ යි. 'දිවිෂද්' ශබ්ද ෂෂ්ඨී බහුවචන යි.

වෘත්තය:- මෙයත්, මීලඟ පද්‍යයත් අත්‍යෂ්ටි ඡන්දසට අයත් පෘථ්වී යි. ජසෞ ජසයලා වසුග්‍රහයතිශ්ච පෘථ්වී ගුරුඃ = ජගණ, සගණ, ජගණ, සගණ, යගණ, ලඝු, ගුරු යන මෙයින් ද, අටකින් හා නවයකින් කරණ ලද යතියෙන් ද යුත් වෘත්තය පෘථ්වී නම්.

93. මහෙන්ද්‍ර නව චාපවත් කනකපර්වතෙ සර්වතඃ
සදා තව මනොහරං ස්ඵුරති සුප්‍රභාමණ්ඩලම්,
ද්‍රුශො භවති ගොචරං නදිහ යස්‍ය තස්‍ය ත්වරාත්
තමස්තතිමනුත්තමාං හරති දූරමන්තර්බහිඃ.

සදෘර්ථ:- තව = නුඹ වහන්සේගේ; මනොහරම් = මනොඥ වූ; සුප්‍රභා මණ්ඩලම් = යහපත් වූ ව්‍යාමප්‍රභා මණ්ඩලය තෙමේ; කනක පර්වතෙ= සුවර්ණමය වූ මහාමෙරු පර්වතයෙහි; සර්වතඃ = හැම දිශාවෙන් වට කරණ ලද; මහෙන්ද්‍ර නව චාපවත් = අභිනව වූ ඉන්ද්‍ර චාපයක් මෙන්; සදා = හැම කල්හි; ස්ඵුරති =

බබලන්නේ ය. **තත්** = ඒ ව්‍යාමප්‍රභා මණ්ඩලය තෙමේ; **ඉහ** = මේ ලොකයෙහි; **යස්‍ය** = යමක්හුගේ; **දෘශෝ ගොචරම් භවති** = දෘග්විෂය වේ ද; **තස්‍ය** = ඔහුගේ; **අන්තඃ** = සිත ඇතුළෙහි පිහිටියා වූ ද; **බහිඃ** = පිටත ඇත්තා වූ ද; **අනුත්තමාම්** = අනුත්කෘෂ්ට වූ; **තමස්තතිම්** = අන්ධකාර පටලය; **ඣරාත්** = සුහු ව; **දූරං හරති** = දුරු කොට හරින්නේ යි.

**භාවය:-** ඔබ වහන්සේගේ ඉතා යහපත් ව්‍යාමප්‍රභා මණ්ඩලය මහාමේරු පර්වතය හාත්පස පිහිටි අලුත් දේ දුන්නක් මෙන් බබලයි. එය යමකුට පෙණුනොත් ඔහුගේ ඇතුළත ද, පිටත ද ඇති මහත් අඳුරු පටලය වහා දුරු වෙයි.

**විස්තර:-** 'ව්‍යාමප්‍රභා මණ්ඩලය' නම් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී ශරීරය හාත්පස බඹයක් පමණ ඇතට පැතිර පවත්නා රැස් වලල්ල යි. එය දුටු විට කෙලෙස් දුරු වීමෙන් අභ්‍යන්තරය හෙවත් සිත දීප්තිමත් වෙයි. සිත ශොභාවත් වීම නිසා බාහිර ශරීරය ඔප වැටෙන බැවින් පිටත ද දීප්තිමත් වෙයි. මෙසේ බුදුරදුන්ගේ රැස් වලල්ල දැකීමෙන් ම ඇතුළත පිටත දෙක ම ශොභාවත් වන බව කීහ. රැස් වලල්ල මහාමේරු පර්වතය අවට පිහිටි දේදුන්නක් මෙනැයි කීමෙන් බුදුහු ද මහාමේරු පර්වතයට සම කොට දක්වූහ.

**මහෙන්ද්‍රනවචාපවත්** = "**නවශ්ච ස චාපශ්චෙති නවචාපඃ, මහෙන්ද්‍රස්‍ය නවචාපො මහෙන්ද්‍රනවචාපඃ, ස ඉව = මහෙන්ද්‍රනවචාපවත්.**"

**ස්ඵුරති, හරති** = 'ස්ඵුර ස්ඵූතෞ, හෘඤ් හරණේ' ලට් ප. ප්‍ර. එකවචන යි.

**ඣරාත්** = ශීඝ්‍රාර්ථයෙහි අව්‍යයෙකි.

**අනුත්තමාම්** = ලාමක, පහත්, 'න + උත්තමා = අනුත්තමා, තාම්."

94. රූපං **ලොචනලොභනං** ශ්‍රවණයොරානන්දසන්දෝහද
වාණී විශ්වවිමොක්ෂකෘත් තව කෘපාවෙශො
'තිශාන්තස්තව,
පාණ්ඩිත්‍යං ප්‍රථිතං ජගත්සු භගවන් සර්වඥනාම්නෛව තෙ
සාම්‍රාජ්‍යස්‍ය ච යෞවනෙ නිරසනං වෛරාග්‍යසීමා ස්ඵුටා.

**පදාර්ථ:-** **භගවන්** = භාග්‍යවත් වූ තථාගතයන් වහන්ස; **තව** = නුඹ වහන්සේගේ; **රූපං** = දෙතිස් මහාපුරුෂ ලක්ෂණයෙන් වොරජතා ශ්‍රී ශරීරය; **ලොචන ලොභනං** = ඇසට රසාඤ්ජනයක් සෙයින් තුෂ්ටි ජනක ය; **වාණී** = මධුර භාරතී තොමෝ; **ශ්‍රවණයොඃ** = අසන්නවුන්ගේ කණට; **ආනන්ද සන්දොහද** = බොහෝ සන්තොෂ දෙන්නී ය; **තව** = නුඹ වහන්සේගේ; **කෘපා** = කරුණා තොමෝ; **විශ්ව විමොක්ෂකෘත්** = උද්ඝටිත ඥාදි වූ සියල්ලවුන්ට දුකින් මිදීම දෙන්නී ය; **තව** = නුඹ වහන්සේගේ; **වේශඃ** = බ්‍රහ්මචිවර ධාරණාදි වූ සැරසීම; **අතිශාන්තඃ** = ඉතා සන්හුන් වන්නේ ය; **තෙ** = නුඹ වහන්සේගේ; **පාණ්ඩිත්‍යම්** = වෛදග්ධ්‍යය; **සර්වඥ නාම්නෛව** = සර්වඥ යන නමින් ම; **ජගත්සු** = ලොකයෙහි; **ප්‍රථිතම්** = ප්‍රසිද්ධ ය. **යෞවනෙ** = තරුණ අවස්ථාවෙන් යුක්ත එකුන්තිස් වයසෙහි; **සාම්‍රාජ්‍යස්‍ය ච** = චක්‍රවර්ති රාජ්‍යය; **නිරසනං** = හැරීම; **තෙ** = නුඹ වහන්සේගේ; **ස්ඵුටා** = ප්‍රකාශ වූ; **වෛරාග්‍ය සීමා** = විරාග භාවයට සීමා වන්නී ය.

**භාවය:-** භාග්‍යවතුන් වහන්ස, ඔබගේ රූපය ඇසට රසඳුනක් මෙන් මනහර ය. වචනය කන් දෙකට අමෘතයක් මෙන් සන්තොෂ ජනක ය. කරුණාව සියල්ලන්ට නිවණ ගෙණ දෙන්නී ය. වෙශය ඉතා ශාන්ත ය. පණ්ඩිත කම 'සර්වඥ' යන නමින් ම මුළු ලොව ප්‍රකට ය. තරුණ කාලයෙහි ම සක්විති රජකම හැර දැමීම නිර්ලෝභී බවට සීමාව ය.

**විස්තර:-** බුදුරජානන් වහන්සේගේ රූපාදි සියල්ල ම ඉතා වැඩ දායක බව මෙයින් දක්වෙයි.

**ආනන්දසන්දොහද** = "ආනන්දස්‍ය සන්දොහ ආනන්දසන්දොහඃ, තං දදාතීති = ආනන්දසන්දොහද."

**විශ්වවිමොක්ෂකෘත්** = "විශ්වස්‍ය විමොක්ෂො විශ්වවිමොක්ෂඃ, තං කරොතීති = විශ්වවිමොක්ෂකෘත්."

**සාම්‍රාජ්‍යස්‍ය** = "සම්‍රාජො භාවඃ = සාම්‍රාජ්‍යම්, තස්‍ය."

**වෛරාග්‍යසීමා** = "විරාගස්‍ය භාවො වෛරාග්‍යම්, තස්‍ය සීමා වෛරාග්‍යසීමා." 'වෛරාග්‍ය' නම් ආශා රහිත බව යි.

බුදුරදුන් කිසිවක් කෙරෙහි ආශා නැති බව දන ගැණීමට තරුණ කාලයෙහි ම සක්විති රජකම හැර දැමීම ප්‍රමාණවත් ය. මෙන සාධක නුවමනා ය.

වෘත්තය:- මේ පද්‍යයේ පටන් පද්‍ය 4 ක් ශාර්දූල වික්‍රීඩිත යි.

95. ශෞර්‍ය්‍යං ත්වද්විෂමේෂුදර්පදලනාදඩගිකෘතං දෛවතෛර්
යද් බාණේෂු සසුරාසුරඃ ප්‍රවිජිතො ලොකොඃ‘ය
ජිහක්ඛරම්,
වීර්‍ය්‍යං තෙ ප්‍රකටි චකාර නිතරාං නිර්වාණසාක්ෂාත්කෘතිඃ
කිං බ්‍රූමො බලමෛවහවං භගවතස් තත් තෙ ජගද්ධුර්වහම්.

පදාර්ථ:- යද් බාණෛඃ = යම් මාරයාගේ ශරයෙන්; සසුරාසුරඃ = සුරාසුර සහිත වූ; අයං ලොකඃ = මේ සත්වලොකය තෙමේ; ජිහත් ඛරම් = නිදුකින්; ප්‍රවිජිතඃ = ප්‍රකර්ෂයෙන් දිනන ලද්දේ ද; විෂමෙෂු = ඒ වශවර්ති මාරයාගේ; දර්ප දලනාත් = එබඩ මැඩීමෙන්; දෛවතෛඃ = දෙවතාවන් විසින්; ත්වත් = නුඹ වහන්සේගේ; ශෞර්‍ය්‍යං = ශූර භාවය; අඩගීකෘතං = ගිවිස්නා ලද්දේ ය; නිර්වාණ සාක්ෂාත්කෘතිඃ = මොක්ෂ සාක්ෂාත්කෘති තොමෝ; තෙ = නුඹ වහන්සේගේ; වීර්‍ය්‍යම් = කෙලෙසුන් නැසීමෙහි නො පසු බස්නා වීර්‍ය්‍යය; නිතරාං = අත්‍යර්ථයෙන්; ප්‍රකටි චකාර = ප්‍රකාශ කළා ය; භගවතඃ = ඓශ්වර්‍ය්‍ය, පුණ්‍ය, යශඃ, ශ්‍රී, සංකල්පසිද්ධි, ප්‍රයත්න යන ෂට් ගුණයෙන් පරිපූර්ණ හෙයින්) භාග්‍යවත් වූ; තෙ = නුඹ වහන්සේගේ; ජගද්ධුර්වහම් = (මහත් කරුණාවෙන්) ලොකාධාර ධුරොද්වහනය කරන්නා වූ; තත් බල මෛවහවම් = ඒ කාය බල සම්පත්තිය; කිම් බ්‍රූමඃ = (අපි) කුමකැයි කියමු ද.

භාවය:- සුරාසුරයන් සහිත මේ සියලු ලොකයා ම පහසුවෙන් දිනූ ඒ අනඩගයාගේ හෙවත් කාමයාගේ එබඩ මැඩීමෙන් ම ඔබ වහන්සේගේ ශූර භාවය දෙවියන් විසින් ද පිළිගන්නා ලදී. නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීමෙන් ම ඔබ වහන්සේගේ නො පසු බස්නා වීර්‍ය්‍යය අතිශයින් ප්‍රකට විය. සමස්ත ලොකභාරය උසුලන ඔබ වහන්සේගේ කායබල සම්පත්තිය ගැණ කුමක් කියමු ද? (කිය යුත්තෙක් ම නැත්තේ ය.)

විස්තර:- ශෞර්‍ය්‍යය, වීර්‍ය්‍යය, බලය යන ගුණයන්ගේ මහත්වය මෙයින් වර්ණිත ය.

**විෂමෙෂුදර්පදලනාත්** = "විෂමා ඉෂවො යස්‍ය ස විෂමෙෂුඃ, තස්‍ය දර්පො විෂමෙෂුදර්පඃ, තස්‍ය දලනං විෂමෙෂුදර්පදලනම්, තස්මාත්." 'විෂමෙෂු' නම් අනඞ්ගයා යි. විෂම වූ සඞ්ඛ්‍යාවක් (=පහක්) ඊතල ඇති බැවින් එනම් වේ. සුරාසුරයන් සහිත සියලු ලොකයා අනඞ්ගයාගේ බලයට යටත් ය. එහෙත් බුදුරජාතන් වහන්සේ ඔහුගේ බලය සහමුලින් ම වනසා දැමූ සේක. මෙහි 'විෂමෙෂු' යන්නට 'වශවර්ති මාරයාගේ' යි සන්නයෙහි අර්ථ කීහ. එහෙත් 'විෂමෙෂු' ශබ්දයෙහි එබඳු අර්ථයක් ඇති බවක් නොපෙණේ.

**ප්‍රකටීචකාර** = "අප්‍රකටං ප්‍රකටං චකාර ඉති = ප්‍රකටීචකාර." අභූත තද්භාවයෙහි 'ච්වි' ප්‍රත්‍යය යි.

**බලවෛභවම්** = "විභවස්‍ය භාවො වෛභවම්, බලමෙව වෛභවං බලවෛභවම්, තත්."

**ජගද්ධූර්වහම්** = "ජගතො ධූර්ජගද්ධූඃ, තාං වහතීති ජගද්ධූර්වහම්, තත්." බුදුරජාතන් වහන්සේ ලොකයා භවයෙන් එතර කරවීමෙන් ඔවුන් පිළිබඳ වග කීමේ භාරය උසුලන බැවින් උන් වහන්සේගේ බලය සමස්ත ලොක භාරය දරන්නේය යි කීහ.

96. **යත්‍රාජාගතුරඞ්ගමාරණවිධිර්වේදෙ'පි තං නින්දසි**
**ප්‍රෙම්ණා ප්‍රාණභෘතාමිතස් සකරුණස් ත්වත්තො**
**මහානාපරඃ,**
**එවං තෙ ගුණසම්පදෙ න විෂයා බුද්ධෙරසූයාත්මනාං**
**තෙ මූඪාඃ ප්‍රලපන්ති හන්ත සුගතො මද්‍යාදනින්දිත්‍යසම්.**

**පදාර්ථ**:- **යත්‍ර වෙදෙ**=යම් වෙදයෙක්හි; **ජාග තුරඞ්ග මාරණ විධිඃ**= (ස්වර්ගාදි ඉෂ්ට කාම්‍යීය පිණිස යාගයෙහි) එළුවන්, අසුන් මැරීම විහිත ද; **තමපි** = ඒ ඍග් යජුස්සාම නම් වෙද ශාස්ත්‍රයට ද; **නින්දසි** = (වාචාගතා, දිට්ඨිගතා, ගහිතා, දුම්මෙධා කාව්‍යපඨානුපපන්නා) යනාදීන් නිඳා කොට වදාරණ සේක; කුමක් හෙයින් ද? **ප්‍රාණභෘතාම්** = සත්වයන්ට; **ප්‍රෙම්ණා** = මෛත්‍රියෙනි; **අතඃ**= එහෙයින්; **ත්වත්තඃ** = නුඹ වහන්සේට වඩා; **මහාන් සකරුණඃ**= මහත් කරුණා ඇත්තා වූ; **අපරඃ** = දිව්‍යබ්‍රහ්මාදි අනිකෙක්; **න** = නැත්තේ ය; **තෙ** = නුඹ වහන්සේගේ; **එවං ගුණ සම්පදඃ** = මේ යථොක්ත ප්‍රකාර මහාකරුණාදි ගුණ

සම්පත්තීහු; **අසූයාත්මනාම්** = ගුණයෙහි දොෂාවිෂ්කාරණය කරන්නා වූ සවභාව ඇති වෛදීන්ගේ; **බුද්ධඃ** = ප්‍රඥවට; **න විෂයාඃ** = ගොචර නො වන්නාහු ය; (එහෙයින්) **තෙ මූඪාඃ** = ඒ මිථ්‍යා ලබ්ධීහු; **අයං සුගතඃ** = මේ බුද්ධාවතාරයෙහි අවතීර්ණ වූ පුරුෂොත්තම තෙමේ; **මද්වෙද නින්දිති** = මාගේ වෙදයට නින්ද කරණ සුලු ය යි; **ප්‍රලපන්ති** = නන් දොඩවති; **හන්ත** = උන්ගේ අකුශලයෙකි.

**භාවය:-** සවකීය බලාපොරොත්තු සමෘද්ධ කර ගැණීම සඳහා එළුවන්, අසුන් මැරීමට විධාන කළ ඍග් යජුස් සාම යනාදි වෙදශාස්ත්‍රයට ඔබ වහන්සේ සියලු සතුන් කෙරෙහි පතළ මෛත්‍රිය නිසා ම නින්ද කරණ සේක. එහෙයින් ඔබට වඩා මහා කාරුණික උත්තමයෙක් වෙන නැත. ඒ ඔබගේ ගුණ සම්පත්තිය ඔබට දොෂාරොපණය කරණ අන්‍ය ලබ්ධිකයන්ගේ ඥානයට විෂය නො වේ. එහෙයින් ම ඒ මිථ්‍යාලබ්ධි ගත් මෝඩයෝ "බුදුහු මාගේ වෙදයට නින්ද කෙරෙති යි නන් දොඩවති. අහෝ! උන්ගේ පවක හැටි!

**විස්තර:-** මහාකරුණාව නිසා ම බුදුරජානන් වහන්සේ වෙදයට නින්ද කරණ බවත්, උන් වහන්සේගේ ගුණ පිළිබඳ වැටහීමක් නැති බැවින් ම අන්‍ය ලබ්ධිකයන් උන් වහන්සේට දොෂාරොපනය කරණ බවත් මෙයින් පැවසූහ.

**ඡාගතුරඞ්ගමාරණවිධිඃ** = ඡාගාශ්ච තුරඞ්ගාශ්ච ඡාගතුරඞ්ගාඃ, මාරණස්‍ය විධිර්මාරණවිධිඃ, ඡාගතුරඞ්ගානාං මාරණ විධිඃ = ඡාගතුරඞ්ගමාරණවිධිඃ."

**ප්‍රාණභෘතාම්** = "ප්‍රාණාන් බිභ්‍රතීති ප්‍රාණභෘතඃ තෙෂාම්." 'ප්‍රාණභෘත්' ශබ්ද ෂෂ්ඨී බහුවචන යි.

**අසූයාත්මනාම්** = "අසූයා ආත්මා යෙෂාං තෙ = අසූයාත්මානඃ, තෙෂාම්." දොෂාරොපණය කිරීම සවභාවය කොට ඇත්තවුන්ගේ.

**ප්‍රලපන්ති** = 'ප්‍ර' පූර්ව 'ලප ව්‍යක්තායාං වාචි' ලට් ප. ප්‍ර. බහුවචන යි.

**මද්වෙදනින්දි** = "මම වෙදෙ මද්වෙදඃ, තං නින්දති ශීලෙනෙති = මද්වෙදනින්දී." 'මද්වෙද' ශබ්දොපපද 'නිදි කුත්සායාම්' ධාතු යි තාච්ඡිල්‍යයෙහි 'ඉනි' ප්‍රත්‍යය යි.

97. **නිමජ්ජත් සුරසුන්දරී කුචවලන් නිර්මන්ද මන්දාකිනී**
**ඵේනක්ෂීරසමුද්‍රකෛරවසඛී සත්කීර්තිලක්ෂ්මීස් තව,**
**යස්‍යානාලිඞ්ගති මන්දභාග්‍යමධුනා භූයාන් න තේනාපි මෙ**
**සඞ්ගස් සඞ්ගගදාදිවෛද්‍ය භගවන්නේකාපි මෙ ප්‍රාර්ථනා.**

**පදාර්ථ:-** **නිමජ්ජත්** = දිය කෙළියෙහි කිමිදුනා වූ; **සුරසුන්දරී** = දෙවඟනන්ගේ; **කුච** = තන පහරින්; **වලත්** = සැලෙන; **නිර්මන්ද** = නො මඳ වූ; **මන්දාකිනී ඵේන** = අහස් ගඟ පෙන පිඩු ය; **ක්ෂීර සමුද්‍ර** = කිරි මුහුද ය; **කෛරව** = කුමුදු වනය යන මොවුන්ට; **සඛී** = යෙහෙළි වූ; **තව** = නුඹ වහන්සේගේ; **සත්කීර්තිලක්ෂ්මීඃ** = ශෝභන වූ කීර්ති ශ්‍රී තොමෝ; **අධුනා** = දැන් (මේ තව වන බුද්ධෝත්පාද කාලයෙහි); **යං මන්දභාග්‍යම්** = යම් මන්දභාග්‍ය පුරුෂයකු; **නාලිඞ්ගති** = ආලිඞ්ගනය නො කරන්නී ද; **තේන** = ඒ පාපිෂ්ඨයා හා එක් ව; **මෙ** = මාගේ; **සඞ්ගො'පි** = එක් තැන් වීමකුත්; **න භූයාත්** = නො වේවා; **සඞ්ග ගද** = තෘෂ්ණා ව්‍යාධියට, **ආදි වෛද්‍ය** = පූර්ව වෛද්‍ය වූ; **භගවන්** = සර්වඥයන් වහන්ස; **මෙ** = මාගේ; **ඒකාපි ප්‍රාර්ථනා** = මෙ ද එක් ප්‍රාර්ථනාවෙකි.

**භාවය:-** තෘෂ්ණා නමැති රෝගයට ආදිම වෛද්‍යවරයා වූ භාග්‍යවතුන් වහන්ස, අහස් ගඟෙහි ජලක්‍රීඩා කරණ දෙවඟනන්ගේ තන පහරින් දිය කැලඹීමෙන් නැංගා වූ පෙන පිඩු ය, කිරි මුහුද ය, කුමුදු මල් ය යන මොවුන් හා සමාන වූ ඔබ වහන්සේගේ කීර්ති නමැති ශ්‍රීකාන්තා තොමෝ යමකු වැළඳ නො ගණී නම් ඒ පාපිෂ්ඨයා සමග එකතු වීමෙක් මට කිසි කලෙකත් නො වේවා. මෙද මාගේ එක් ප්‍රාර්ථනයෙකි.

**විස්තර:-** තෘෂ්ණාව රෝගයෙකි. ඒ රෝගයට පළමුවෙන් ම පිළියම් කළ වෛද්‍යවරයා බුදුරජානන් වහන්සේ ය. උන් වහන්සේට පෙරත් බොහෝ ශාස්තෘවරයන් විසූ නමුත් ඒ එක් ශාස්තෘවරයෙක් වත් තෘෂ්ණාව නිවණට බාධක බව හා එය නැති කිරීමෙන් ම නිවණ ලැබිය යුතු බව ප්‍රකාශ නො කෙළේ ය. ඒ බව පළමුවෙන් ම ප්‍රකාශ කළ ශාස්තෘවරයා බුදුරජානන් වහන්සේ ය. එබැවින් තෘෂ්ණා රෝගයට පිළියම් කළ මූල් වෛද්‍යවරයා බුදුරජානන් වහන්සේ ය යි මෙහි රූපණය කොට දක්වූහ. සර්වඥයන් වහන්සේගේ කීර්තිය හෙවත් ගුණ ඝෝෂය අහස් ගඟේ පෙන පිඩු. කිරි මුහුද, කුමුදු මල් යන වස්තූන් හා සමාන කිරීමෙනුත්, ශ්‍රී කාන්තාව

ලෙස රූපණය කිරීමෙනුත් එය ඉතා ශොභන බවත්, පවිත්‍ර බවත් දක්වූහ. බුදුරජාණන් වහන්සේගේ ගුණශෝභය නො පිළිගන්නා පාපිෂ්ඨයාගේ ආශ්‍රයෙක් මට කවදාවත් නො ලැබේවා යනු මේ පද්‍යයේ සාරාංශය යි.

**නිමජ්ජත්සුරසුන්දරීකුචචලන්නිම්නමන්දාකිනී පෙන ක්ෂීරසමුද්‍රකෛරවසඛී** = "සුරාණාං සුන්දර්‍ය්‍යඃ සුරසුන්දර්‍ය්‍යඃ, නිමජ්ජන්ත්‍යශ්ච තාඃ සුරසුන්දර්‍ය්‍යශ්චෙති නිමජ්ජත් සුරසුන්දර්‍ය්‍යඃ, තාසාං කුචාඃ නිමජ්ජත්සුරසුන්දරීකුචාඃ, තෛශ්චලන්තො නිමජ්ජත්සුරසුන්දරීකුචචලන්තඃ; මන්දාකින්‍යාඃ ඵේනාඃ මන්දාකිනීඵේනාඃ, නිම්නාශ්ච තෙ මන්දාකිනීඵේනාශ්චෙති නිම්නමන්දාකිනීඵේනාඃ, නිමජ්ජත්සුරසුන්දරීකුචචලන්තශ්ච තෙ නිම්නමන්දාකිනීඵේනාශ්චෙති නිමජ්ජත්සුරසුන්දරීකුච චලන්නිම්නමන්දාකිනීඵේනාඃ, තෙ ච ක්ෂීරසමුද්‍රශ්ච කෛරවාණී ච නිමජ්ජත්සුරසුන්දරීකුචචලන්නිම්නමන්දාකිනීඵේනක්ෂීර සමුද්‍රකෛරවාණී, තේෂාං සඛී නිමජ්ජත්සුරසුන්දරී කුචචලන්නිම්නමන්දාකිනීඵේනක්ෂීරසමුද්‍රකෛරවසඛී." මෙහි 'චලත්' ශබ්දය 'ඵේන' ශබ්දයට විශේෂණ වශයෙන් යෙදී තිබේ. එහෙත් එය 'මන්දාකිනී' ශබ්දයට විශේෂණ වශයෙන් යෙදුනේ නම් මැනවි. 'තන පහරින් කැලඹුනු අහස් ගඟෙන් නැගුනු පෙන පිඩු ය'' යි අර්ථ ගත හැක්කේ එවිට ය. දැන් තිබෙන සැටියෙන් ගැණෙන්නේ "තන පහරින් සැලෙන පෙන පිඩු ය'' කියා යි. 'නිම්න' ශබ්දය 'මන්දාකිනී' ශබ්දයට විශේෂණ කොට "මහත් අහස් ගඟ'' ය යි අර්ථ ගත හොත් 'චලත්' ශබ්දය ද 'මන්දාකිනී' ශබ්දයට විශේෂණ කොට පූර්වෝක්ත අර්ථය ගත හැකි නමුත් 'නිම්න' ශබ්දය වඩා ගැළපෙනුයේ 'ඵේන' ශබ්දය සමග ය.

**සත්කීර්තිලක්ෂ්මීඃ** = "සතී ච සා කීර්තිශ්චෙති සත්කීර්තිඃ, සා + එව ලක්ෂ්මීඃ = සත්කීර්තිලක්ෂ්මීඃ."

**ආලිඞ්ගති** = 'ආ' පූර්ව 'ලිගි ගතෞ' ලට් ප. ප්‍ර. එක වචන යි.

**භූයාත්** = 'භූ සත්තායාම්' ආශීර්ලිඞ් ප. ප්‍ර. එක වචන යි.

**සඞ්ගගදාදිවෛද්‍ය** = "සඞ්ග එව ගදඃ සඞ්ගගදඃ, ආදෞ වෛද්‍ය ආදිවෛද්‍යඃ, සඞ්ගගදස්‍යාදිවෛද්‍යඃ = සඞ්ගගදාදිවෛද්‍යඃ." සම්බෝධන යි.

98. යෙ ත්වාං භජන්ති බුද්ධං ශරණමිති න තෙ දුර්ගතිං යාන්ති
සන්තස්
ත්‍යක්ත්වා කායාන් මනුෂ්‍යාන් නිරතිශයසුඛාංස් තෙ
ලභන්තෙ'ථ දිව්‍යාන්,
දුඃස්වප්නො දුර්නිමිත්තං දුරඝිදුරඝිතා දුර්ග්‍රහා දුෂ්ටසත්ත්වා
දුඃඛං දුර්ව්‍යාධයො'පි ක්වචිදිහ කුශලාන් නොපසර්පන්ති
චෛවම්.

**පදාර්ථ** – **යෙ** = යම් සත්ව කෙනෙක්; **ශරණමිති** = සසර දුක් නසා නිවන් සැප එලවති යි සිතා; **බුද්ධං** = සියල්ල දත්තා වූ; **ත්වාම්**= නුඹ වහන්සේ; **භජන්ති** = දතිද් ද (භජනය කෙරෙද් ද); **තෙ සන්තඃ**= ඒ ශරණගත වූ සත්පුරුෂයෝ; **දුර්ගතිං** = නරකාදි සතර අපායට; **න යාන්ති** = නො යති; **තෙ** = රත්නත්‍රය ශරණ පරායණ වූ ඒ උපාසකවරයෝ; **මනුෂ්‍යාන් කායාන්** = මනුෂ්‍ය දෙහයන්; **ත්‍යක්ත්වා** = හැර; **නිරතිශය සුඛාන්** = අතිශයින් සැප ඇත්තා වූ; **දිව්‍යාන් කායාන්** = (ශාඩ්ඩී දෙව නිකායෙන් යටත් නො වන්නා වූ උත්තම) දිව්‍ය ශරීරයන්; **ලභන්තෙ** = (චුති චිත්තයට අනතුරු ව ම නිරායාසයෙන්) ලබන්නාහ; **අථ** = ඉක්බිත්තෙන්; **ඉහ** = මේ ආත්මභාවයෙහි; **කුශලාන්** = මේ ශරණගත වූ පුණ්‍යානුභාවයෙන්; **දුඃස්වප්නාඃ**= නපුරු සීන ද; **දුර්නිමිත්තං** = දුර්නිමිති ද; **දුරඝි දුරඝිතාඃ** = නපුරු සපියන් හා දුෂ්ට ශත්‍රූහු ද; **දුර්ග්‍රහාඃ** = දුඃස්ථිත වූ ග්‍රහයන්ගේ ගෝචර ඵලයෝ ද; **දුෂ්ට සත්ත්වාඃ** = ව්‍යාඝ්‍ර මකරාදි වූ දුෂ්ට ජන්තූහු ද; **දුඃඛම්** = කායික මානසික දුඃඛය ද; **දුර්ව්‍යාධයො'පි** = දුෂ්ට රෝගයෝ ද; **එතාන්** = මේ ශරණ ගතයන් කරා; **ක්වචිත්** = කිසි තැනෙක්හි; **නොපසර්පන්ති ච** = නො එළඹෙන්නාහු ද වෙති.

**භාවය**:- ඔබ පිහිට කොට ගත් (=සරණ ගිය) සත්පුරුෂයෝ අපායට නො පැමිණෙති. මිනිස් ලොවින් චුත ව උසස් සැප ඇති දෙව්ලොව උපදිති. එපමණක් නො ව ඔවුන්ට ඒ සරණගත'වීමේ පිණෙන් මෙලොව කොතැනක දී වත් නපුරු සීන ය, අසුබ ලකුණු ය, විෂඝෝර සපියෝ ය, කෲර සතුරෝ ය, අපල ග්‍රහයෝ ය, නපුරු සත්තු ය, කායික මානසික දුක් ය, දුෂ්ට රෝගයෝ ය යන මොවුන්ගෙන් පීඩාවෙක් නො වේ.

**විස්තර**:- ශරණ ගමනයෙහි ආනෘශංස මෙයින් දැක්වේ. මෙහි මූල් අඩිය;

"යෙ කෙචි බුද්ධං සරණං ගතා සෙ
න තෙ ගමිස්සන්ති අපායං,
පහාය මානුසං දෙහං
දෙවකායං පරිපූරෙස්සන්ති."

යන ගාථාවේ ම පරිවර්තනයෙකි දෙවෙනි අධියෙන් මෙලොව දී ලැබෙන විපාක සිය අදහසින් දක්වන ලදී.

**ත්‍යක්ත්වා** = 'ත්‍යජ හානෞ' ධාතු යි. පූර්වක්‍රියා යි

**දුරභිදුරභිතාඃ** = "දුෂ්ටා අභයො දුරභයඃ, දුෂ්ටා අභිතා දුරභිතාඃ, දුරභයශ්ච දුරභිතාශ්ච දුරභිදුරභිතාඃ."

**නොපසර්පන්ති** = 'න + උප' පූර්ව 'සෘප්ෟ ගතෞ' ලට් ප. ප්‍ර. බහුවචන යි.

**වෘත්තය**:- මේ පද්‍යයේ පටන් 103 තෙක් ඇති පද්‍ය හය ස්‍රග්ධරා යි

99. **ඡත්‍රං බ්‍රහ්මා සම ධනතන මණිමයමමලං චාමරං චක්‍රපාණිඃ**
**ස්තොතාරෞ ගද්‍යපද්‍යෛඃ ගීරගුරුඵණීනශ්ශාඩිබිකො**
**'භූන්මහෙන්ද්‍රඃ,**
**අන්‍යෙ දීපොදකුම්භධ්වජකුසුමලසත්පාණයො**
**භක්තිනම්‍රාඃ**
**තස්ථුර් ව්‍යාඛ්‍යාය ධර්මං භුවමවතරතඃ* ස්වර්ගිතඃ තෙ**
**මුනීන්ද්‍ර.**

**පදාර්ථ**:- **මුනීන්ද්‍ර** = මුනිරාජයන් වහන්ස; **ස්වර්ගිතඃ** = ශක්‍ර භවනයෙහි සිට; **ධර්මම්** = සප්ත ප්‍රකරණය; **ව්‍යාඛ්‍යාය** = (මාතෘ දිව්‍ය පුත්‍රයා ප්‍රමුඛ දිව්‍ය සමූහයාට) දෙශනා කොට; **භුවම්** = භූලොකයෙහි (සකස්පුර දොරට); **අවතරතඃ** = (මැද රුවන් හිණින්) බස්නා වූ; **තෙ** = නුඹ වහන්සේට; **බ්‍රහ්මා** = සහම්පති නම් මහාබ්‍රහ්ම තෙමේ; **මණිමයම්** = මෛඛකනික රත්නයමය වූ; **ඡත්‍රම්**=ධවලාතපත්‍රය; **ධනතන සම**=දූරුයේ ය **චක්‍රපාණිඃ** = විෂ්ණු තෙමේ; **අමලං චාමරම්** = (ධවලොභාසයෙන් බබලන්නා වූ) නිර්මල චාමරය; **ධනතන සම** = දූරුයේ ය. **භර** = ඊශ්වර ය; **ගුරුඃ** = වෘහස්පති ය; **ඵණීනඃ** = අනන්ත නාගරාජ ය (යන මොහු) **ගද්‍ය පද්‍යෛඃ** = ගද්‍ය රචනාවෙන් හා පද්‍ය රචනාවෙන්; **ස්තොතාරඃ** = සතුති කරන්නෝ වූහ. **මහෙන්ද්‍රඃ** = ශක්‍රදෙවෙන්ද්‍ර

*"ශ්‍රුවමමවරුහතඃ" යනු ද පාඨ යි.

තෙමේ; ශාඛබිකඃ = සක් පිඹින්නෙක්; අභූත් = වූයේ ය. අශනාඃ = සෙසු (මාතුමිගාරාජිකාදි සදිව්‍යලොකයෙහි දෙවියෝ); දීප = (මිණි දඬුවැට) පහන; උදකුමභ = (සවණීමය) ජලපූණී කුමහ ය; ධ්වජ = (මණිමය, කනකමය)ධ්වජ පතාකා ය; කුසුම පාරිවජ්ජත්තක, කත්ලාාදි වූ) මල්දම් ය (යන මෙයින්); ලසත් පාතයඃ = තෙවුනා වූ අත් ඇත්තාහු; භක්තිනම්‍රාඃ = ආදරයෙන් අවනත ව; තස්ථුඃ = (උභය පාර්ශ්වයෙහි) සිටියාහු යි

භාවය:- මුනීන්ද්‍රයන් වහන්ස, අභිධර්මය ප්‍රකාශ කොට දෙව් ලොවින් මිනිස් ලොවට බස්නා ඔබ වහන්සේට මහාබ්‍රහමයා මිණිමුවා සේසත දැරී ය. විෂ්ණු නිර්මල වූ චාමරය දැරී ය. ඊශ්වර, වෘහස්පති අනන්ත නාගරාජ යන මොහු ගද්‍ය – පද්‍ය වාක්‍ය වලින් සතුති කළහ. සක්දෙව්රජ සක පිම්බේ ය. සෙසු දෙවියෝ පහන් ය, පුන් කලස් ය, කොඩි ය, මල් ය යන මේවා ගත් ඇති ව භක්තියෙන් නැමී වැඳ ගෙණ සිටියහ.

විස්තර:- බුදුරජානන් වහන්සේ තිර්ථක දමනය සඳහා යමක ප්‍රාතිහාය්‍ර්‍යය පවත්වා දෙව්ලොවට වැඩම කොට සක්දෙව් රජහුගේ පඬු ඇඹුල් සලස්නෙහි වස් එලඹ වැඩ හිඳ මාතෘ දිව්‍යපුත්‍රයා ප්‍රමුඛ දෙවියන්ට අභිධර්ම පිටකය දෙශනා කොට වදාරා වස් අවසානයෙහි නැවත මිනිස් ලොව සඞකාස්‍ය නගරද්වාරයට අවතීණි වූ අවස්ථාවෙහි බ්‍රහමාදි දෙවතාවන් උන් වහන්සේට ගෞරව දක්වූ පරිදි මෙයින් වර්ණිත ය.

**ධෘතන සම** = 'ධෘ ධාඤ් ධාරණ පොෂණයොඃ' ලට් ආ. ප්‍ර. එක වචන යි. 'සම' යොගය බැවින් අතීතාර්ථ විය වර්තමාන කාලික ක්‍රියාවක් සමග 'සම' නිපාතය යෙදුනොත් එයින් අතීතාර්ථයෙක් පැවසෙයි.

**සෙනාකාරඃ** = 'සෙනාතෘ' ශබ්ද යි, ප්‍රථමා බහුවචන යි.

**හරගුරුඑණිනාඃ** = "හරශච ගුරුශච එණි ච හරගුරු එණිනඃ." ඊශ්වරයා වාගීශ්වර ය, වෘහස්පති දෙවියන්ගේ ආචාය්‍ර්‍යවරයා ය, අනන්ත නාගරාජයා මුඛ දහසක් ඇත්තෙකි. මෙසේ මොහු ව්‍යක්ත වචන ඇත්තවුන් බැවින් සතුති කිරීමෙහි දක්ෂයෝ යි.

**ශාඛබිකඃ** = සක් පිඹින්නා; "ශඞඛො 'ස්‍ය තූය්‍ර්‍යමිති ශාඞඛිකඃ." 'ශඞඛ' ශබ්දයා කෙරෙන් තූය්‍ර්‍යාර්ථයෙහි 'ඉක' ප්‍රත්‍යය යි.

**දීපොදකුම්භධ්වජකුසුමලසත්පාණයඃ** = "දීපාශ්ච උදකුම්භාශ්ච ධ්වජාශ්ච කුසුමානි ච දීපොදකුම්භධ්වජ කුසුමානි, තෛලීසන්තඃ පාණයො යෙෂාං තෙ දීපොදකුම්භධ්වජකුසුමලසත්පාණයඃ."

**නසුඃ** = 'ණසා ගති නිවෘතෙනාශ' ලිට් ප. ප්‍ර. බහු වචන යි.

**ව්‍යාඛ්‍යාය** = 'වි + ආ' පූර්ව 'ඛ්‍යා ප්‍රකථනෙ' ධාතු යි. පූර්වක්‍රියා යි.

**අවතරතඃ** = 'අවතරත්' ශබ්ද ෂෂ්ඨ්‍යෙක වචන යි.

100. **මාතෙවාසීත් පරස්ත්‍රී භවති පරධනෙ න ස්පෘහා යස්‍ය පුංසො**
**මිථ්‍යාවාදී න යඃ ස්‍යාන්න පිබති මදිරාං ප්‍රාණිනො යො න හන්‍යාත්,**
**මර්‍යාදාභඞ්ගභීරුස් සකරුණහෘදයස් ත්‍යක්තසර්වාභිමානො**
**ධර්මාත්මා තෙ ස එව ප්‍රභවති භගවන් පාදපූජාං විධාතුම්.**

**පදාර්ථ:-** **යස්‍ය පුංසඃ** = යම් පුරුෂයක්හට; **පර ස්ත්‍රී** = පර භාර්‍යා තොමෝ; **මාතා ඉව** = මවක මෙන්; **ආසීත්** = (රාග සඞ්වාරණය නො කොට දුරු) වී ද; **පර ධනෙ** = අනුන් සන්තක විස්තුවෙහි; **ස්පෘහා න** = අභිලාෂා නැද් ද; **යඃ** = යමෙක් තෙමේ; **මිථ්‍යාවාදී න ස්‍යාත්** = බොරු කියන්නේ නො වේ ද; **මදිරාං න පිබති** = රා නො බොන්නේ ද; **යඃ** = යමෙක් තෙමේ; **ප්‍රාණිනඃ න හන්‍යාත්** = සත්ත්වයන් නො මරන්නේ ද; **මර්‍යාදාභඞ්ග භීරුඃ** = සදාචාර සීමා ලඞ්ඝනයට භය වන සුලු ද; **සකරුණ හෘදයඃ** = කරුණා සහිත සිත් ඇති; **ත්‍යක්ත සර්වාභිමානඃ** = හරණ ලද සියලු ජාති මදාදි අහඞ්කාර ඇති; **ධර්මාත්මා** = ධර්මස්වරූප වූ; **ස එව** = ඒ උපාසක තෙමේ ම; **භගවන්** = සර්වඥයන් වහන්ස; **තෙ,** = නුඹ වහන් සේගේ; **පාදපූජාං විධාතුම්** = ශ්‍රීපාද පූජා කරන්නට; **ප්‍රභවති**= පොහොසත් වන්නේ යි.

**භාවය:-** භාග්‍යවතුන් වහන්ස, පරස්ත්‍රී සෙවනය නො කරණ, අනුන්ගේ ධනයට ආශා නැති, බොරු නො කියන, රා නො බොන, ප්‍රාණඝාත නො කරණ, සදාචාරයෙන් යුත්, කරුණාවත්, නිරහඞ්කාර ධාර්මික උපාසක තෙමේ ම ඔබ වහන්සේගේ ශ්‍රීපාද පූජාවට සමර්ථ ය.

**විස්තර:-** මෙහි මුල් අඩියෙන් පඤ්ච ශීලය ද, අග අඩියෙන් වෙනත් ගුණ ධර්ම ද දැක්වේ. පන්සිල් රකින සදාචාරත්වාදි ගුණ ධර්ම ඇති උපාසක තෙමේ ම බුදුරදුන් පා පිදුමෙහි සමත් ය යි කීමෙන් පන්සිල් වත් නැති දුරාචාර පවිටු පුද්ගලයන්ට උන් වහන්සේගේ ශ්‍රීපාදයට වත් ළං විය නො හැකි බව දැක්වූහ.

**පරස්ත්‍රී මාතා ඉව ආසීත්** = පරභාර්‍ය්‍යා තොමෝ මවක මෙන් වූ ද: අනුන්ගේ බිරිඳ මවක මෙන් පෙණෙන විට ඈ කෙරෙහි කාමුක අදහස් පහළ නො වේ. එබැවින් කාම මිථ්‍යාචාරයෙන් වැළකීම එයින් දක්වයි.

**ආසීත්** = 'අස් භුවි' ලඞ් ප. ප්‍ර. එක වචන යි.

**පරධනෙ ස්පෘහා න** = අනුන්ගේ ධනයෙහි ආශාවෙක් නැද් ද: පරධනයෙහි ආශාවක් නැත් නම් එය නො ගණියි. එබැවින් එයින් නුදුන් දේ ගැන්මෙන් වැළකීම දැක්වේ.

**පිබති** = 'පා පානෙ' ලට් ප. ප්‍ර. එක වචන යි. 'පිබ' ආදෙශ යි.

**හන්‍යාත්** = 'හන් හිංසා ගත්‍යොඃ' විධිලිඞ් ප. ප්‍ර. එක එක වචන යි.

**මෘගීදෘග්භඞ්ගභීරුඃ** = "මෘගීදෘශාං භඞ්ගා මෘගීදෘග්භඞ්ගඃ, තස්මින් භීරුර්මෘගීදෘග්භඞ්ගභීරුඃ".

**සකරුණහෘදයඃ** = "සහ කරුණයා වර්තතෙ තත් සකරුණම්, සකරුණං හෘදයං යස්‍ය ස සකරුණහෘදයඃ."

**ත්‍යක්තසර්වාභිමානඃ** = "සර්වශ්ච සො' භිමානශ්චෙති සර්වාභිමානඃ, ත්‍යක්තඃ සර්වාභිමානො යෙන ස ත්‍යක්ත සර්වාභිමානඃ."

101. **සර්වප්‍රාණාතිපාතාත් පරධනහරණාත් සඞ්ගමාද්ගනානාං**
**මිථ්‍යාවාදාච්ච මද්‍යාද් භවති ජගති යො'කාලභුක්තෙර්**
**නිවෘත්තඃ,**
**සඞ්ගීතස්‍රක්සුගන්ධාභරණවිලසිතා දුච්චශය්‍යාසනාද්-**
**ප්‍යාසීද් ධීමාන් ස එව ත්‍රිදශනරගුරෝ ස්තත්**
**සූතො නාත්‍ර ශඞ්කා.**

**පදාර්ථ:-** **යඃ** = යම් සත්ත්වයෙක්; **සර්ව ප්‍රාණාතිපාතාත්** = සියලු ප්‍රාණඝාතයෙන් ද; **පරධන හරණාත්** = අනුන් අයිති වස්තු සොර සිතින් ගැන්මෙන් ද; **අඞ්ගනායාඃ සඞ්ගමාත්** = ස්ත්‍රී සංසර්ගයෙන් ද; **මිථ්‍යා වාදාත් ච** = බොරු කීමෙන් ද; **මද්‍යාත්** = සුරා පානයෙන් ද; **අකාල භුක්තෙඃ** = විකල් බොජුනෙන් ද; **සඞ්ගීත** = නෘත්‍ය ගීත වාද්‍ය ය; **ස්‍රක් සුගන්ධ** = මල් ගඳ විලවුන් ය; **ආභරණ** = අලඞ්කාර ය; **විලසිතාත්** = සැරසීම් ක්‍රියා ය යන මෙයින් ද; **උච්ච ශය්‍යාසනාදපි** = උසසුන් මහ අස්නෙන් ද; **නිවෘත්තඃ ආසීත්** = වැළැක්කේ වේ ද; **ත්‍රිදශනරගුරෝ** = දෙව්මිනිසුන්ට ගුරු වූ (සර්වඥයන් වහන්ස); **ස ඒව ධීමාන්** = එම අෂ්ටාඞ්ග ශීල ධාරී වූ ප්‍රඥාවත් පුරුෂ තෙමේ ම; **භවත් සුතඃ** = සුශික්ෂානුකරණයෙන් (නුඹ වහන් සේගේ පුත්‍ර වන්නේ ය; **අත්‍ර** = මේ වචනයෙහි; **න ශඞ්කා**= සැකයෙක් නැති.

**භාවය:-** දෙව්මිනිසුන්ට ගුරු වූ බුදුරජාණන් වහන්ස, සියලු ප්‍රාණඝාතයෙන් ද, අන් සතු දේ ගැණීමෙන් ද, ස්ත්‍රී සංසර්ගයෙන් ද, බොරු කීමෙන් ද, මද්‍ය පානයෙන් ද, විකාල භොජනයෙන් ද, නැටුම් ගැයුම් වැයුම් මල් ගඳ විලවුන් ඈ දැරීම් අබරණින් සැරසීම් යන මෙයින් ද, උසසුන් මහ අස්නෙන් ද වැළකුනු ඒ නුවණැත්තා ම ඔබගේ පුත්‍රයා ය. මෙහි සැකයෙක් නැත.

**විස්තර:-** මෙයින් අෂ්ටාඞ්ග ශීලය දක්වන ලදී. බුද්ධ පුත්‍ර භාවයට පැමිණීමට යටත් පිරිසෙයින් අෂ්ටාඞ්ග ශීලයෙන් වත් යුක්ත විය යුතු බව මෙයින් හඟවයි.

**සර්වප්‍රාණාතිපාතාත්** = 'ප්‍රාණස්‍යාතිපාතඃ ප්‍රාණාතිපාතඃ, සර්වශ්ච ස ප්‍රාණාතිපාතශ්චෙති සර්වප්‍රාණාතිපාතඃ, තස්මාත්."

**පරධනහරණාත්** = "පරස්‍ය ධනං පරධනම්, තස්‍ය හරණං පරධනහරණම්, තස්මාත්."

**අකාලභුක්තෙඃ** = "න කාලො 'කාලඃ, තස්මින් භුක්තිඃ = අකාලභුක්තිඃ, (= නො කල්හි කෑම යි.) තස්‍යාඃ."

**සඞ්ගීතස්‍රක්සුගන්ධාභරණවිලසිතාත්** = සඞ්ගීතාශ්ච ස්‍රජශ්ච සුගන්ධාශ්ච ආභරණානි ච විලසිතානි ච සඞ්ගීතස්‍රක්සුගන්ධාභරණවිලසිතම්, තස්මාත්." සමාහාර ද්වන්ද්ව යි.

102. ශ්‍රොතාපත්ත්‍යාදිමාර්ගාඃ සදවයවයුතා ඝ්නන්ති රාගාදි දොෂාන්
දොෂාස්තෙ ඡින්නමූලා හතභවගතයස්තත් ඵලෙ යාන්ති ශාන්තිම්,
මාර්ගාණාං ක්ලෙශහානිඃ සදමෘතමජරං කාරණං ස්‍යාත් නවානාං
ධර්මාණාං හෙතුරෙෂාං තව ජින වචනං තස්‍ය හෙතුස්ත්වමෙව.

**පදාර්ථ:-** **සදවයවයුතාඃ** = (සම්‍යක් දෘෂ්ටි, සම්‍යක් සඞ්කල්පනා, සම්‍යක් කර්මාන්ත, සම්‍යක් ආජීව, සම්‍යක් ව්‍යායාම, සම්‍යක් වචන, සම්‍යක් ස්මෘති, සම්‍යක් සමාධි යන) අංගයන් අෂ්ටාංග යෙන් යුක්ත වූ; **ශ්‍රොතාපත්ත්‍යාදි මාර්ගාඃ** = ශ්‍රොතාපත්ති මාර්ගය ආදි කොට ඇති සකෘදාගාමි මාර්ගය, අනාගාමි මාර්ගය, අර්හත් මාර්ගය යි යන මාර්ගයෝ සතර දෙනා; **රාගාදි දොෂාන්** = රාග, ද්වෙෂ, මොහ යන (සකල ක්ලෙශයන්); **ඝ්නන්ති** = නසන්නාහ. **ඡින්නමූලාඃ** = ඒ මාර්ගයෙන් සිඳුනා ලද (අවිද්‍යා, තෘෂ්ණා නැමැති) මුල් ඇති; **හතභවගතයඃ** = (එහෙයින්) නසන ලද භවප්‍රති සන්ධි ඇති; **තෙ දොෂාඃ** = ඒ රාගාදි ක්ලෙශයෝ; **තත් ඵලෙ** = ඒ මාර්ගයට; (අනතුරු ව උපන්නා වූ ශ්‍රොතාපත්ති ඵලය, සකෘදාගාමි ඵලය, අනාගාමි ඵලය, අර්හත් ඵලය යන) සතර ඵලයෙන්; **ශාන්තිං යාන්ති** = සන්හිඳීමට පැමිණෙන්නාහ; **මාර්ගාණාං** = ඒ චතුර්විධ මාර්ග යන්ගේ; **ක්ලෙශ හානිඃ**=රාගාදි වූ ක්ලෙශයන් නසන්නා වූ අර්ථ සිද්ධිය; **සත්** = පරමාර්ථ සත්‍ය වූ; **අජරම්** = අක්ෂය වූ; **අමෘතං** = නිත්‍ය වූ නිර්වාණයට; **කාරණං ස්‍යාත්** = හෙතු වන්නේ ය; **එෂාං නවානාං ධර්මාණාං** = මේ සතර මග, සතර ඵල, නිර්වාණ යන නව ලොකොත්තර ධර්මයට; **තව වචනං** = නුඹ වහන් සේගේ ත්‍රිපිටක පාලි ධර්මය; **හෙතුඃ** = අධිගම කාරණා වන්නේ යි. **තස්‍ය** = ඒ පාලි ධර්මයට; **ජින** = සර්වඥයන් වහන්ස; **ත්වමෙව** = නුඹ වහන්සේ ම; **හෙතුඃ** = උපදෙශකත්වයෙන් කාරණා වන සේක. (අන්‍ය වූ දෙවබ්‍රහ්මාදි කෙනෙක් කාරණා නො වන්නාහු යි.)

**භාවය:-** සර්වඥයන් වහන්ස, අවයව සහිත හෙවත් අංගයන් අෂ්ටාඞ්ගික මාර්ගයෙන් යුත් ශ්‍රොතාපත්ත්‍යාදි මාර්ග ඥානයෝ සියලු රාගාදි ක්ලෙශයන් නසති. භවොත්පත්ති නැසූ මාර්ගඥානයෙන් මුලුසුන් කරණ ලද ඒ රාගාදි ක්ලෙශයෝ

යථොක්ත මාර්ගඥානයන්ට අනතුරු ව උපදනා ඵලඥානයන් හෙතු කොට ගෙණ සන්සිඳීමට පැමිණෙති. එකී මාර්ග ඥානයන්ගෙන් වන ක්ලෙශ ප්‍රහාණිය අජරාමර නිවණට හෙතු වන්නේ ය. ඒ මේ සතර මග, සතර පල, නිවණ යන නව ලොකොත්තර ශ්‍රී සද්ධර්මයට ඔබගේ ත්‍රිපිටක ධර්මය හෙතු වන්නේ ය. ඒ ත්‍රිපිටක ධර්මයට ඔබ වහන්සේ ම හෙතු වන සේක.

විස්තර:- සෝවාන් ආදි මාර්ගඥානවලින් කෙලෙසුන් මුලුසුන් වන බවත්, ඵලඥානවලින් ඔවුන් සන්සිඳෙන බවත්, එයින් නිවණ අවබොධ වන බවත්, එකී නව ලොවුතුරා දහමට තෙවළා දහම හෙතු වන බවත්, ඒ දහමට බුදුන් වහන්සේ ම හෙතු වන බවත් මෙයින් පැවසූහ.

**ශ්‍රොතාපත්‍යාදිමාර්ගාඃ** = "ශ්‍රොතඃ + ආපත්තිඃ ශ්‍රොතාපත්තිඃ, සා ආදෞ යෙෂාං තෙ ශ්‍රොතාපත්ත්‍යාදයඃ, තෙ ච තෙ මාර්ගාශ්චෙති ශ්‍රොතාපත්ත්‍යාදිමාර්ගාඃ." සංස්කෘත ව්‍යාකරණානුකූල ව නම් **ශ්‍රොත ආපත්ති** කියා මිස "ශ්‍රොතාපත්ති" යි නො ලැබිය හැකි ය. විසර්ගය ලොපශ් වූ පසු නැවත සන්ධි නො වන බැවිනි. මේ 'ශ්‍රොතාපත්ති' ශබ්දය වනාහි පාලි 'සොතාපත්ති' ශබ්දය ම සංස්කෘතයට නගා ගන්නා ලද්දෙකි. මෙබඳු ශබ්දවලට **බෞද්ධ සංස්කෘතය** යි කියති.

මෙහි 'ශ්‍රොතස්' නම් නිවන් අරමුණු කොට උපදනා චිත්ත පරම්පරාව යි. එය ගඟක ගලා බස්නා දිය පහරක් මෙන් වේගවත් බැවින් එනම් වේ. පළමු කොට ම ඒ චිත්ත පරම්පරාව (= චිත්ත වීථිය) ඉපදවීම ශ්‍රොතාපත්තිය යි, හෙවත් සෝවාන් වීම යි.

**සද්වයවයුතාඃ** = "සන්තශ්ච තෙ' වයවාශ්චෙති සද්වයවාඃ, තෛර්යුතාඃ = සද්වයවයුතාඃ." මෙහි 'අවයව' නම් **සම්‍යක් දෘෂ්ටි** ආදි මාර්ගාඞ්ග අට ය. මාර්ගාඞ්ග වූ ඒ චෛතසික අවෙන් ම යුක්ත ව නිවන් අරමුණු කොට උපදනා සිත් මාර්ග සිත් ය.

**සනාතනි** = 'හන් හිංසාගත්‍යොඃ' ලට් ප. ප්‍ර. බහු වචන යි. හකාරයට සකාරදෙශ යි.

**භනභවගතයඃ** = "භවෙෂු ගතිර්භවගතිඃ, හනා භවගතිර්යෙෂාං තෙ හනභවගතයඃ." භවගති නම් භවොත්පත්තිය යි.

103. විංශත් සත්කායදෘෂ්ටිශිඛරමමලඥානවජ්‍රේණ භිත්වා
රාගද්වේෂාදිපාපාන් තදුදිතමඛිලං කර්ම චොන්මූලයන්තඃ,
චත්වාරො ලබ්ධමාර්ගාස් තදනුගුණ ඵලාස් තෙ'පි චත්වාර එවං
ත්වත්තො වාෂ්ටාර්යසඞ්ඝඃ ප්‍රභවති න පුනශ්චින්තයාමො
මුනීන්ද්‍ර.

**පදාර්ථ:-** **අමල** = මල රහිත වූ; **ඥාන වජ්‍රේණ** = මාර්ගඥාන නැමැති වජ්‍රායුධයෙන්; **විංශත් සත්කායදෘෂ්ටි** = ("රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං" යනාදි ක්‍රමයෙන් පඤ්චස්කන්ධයෙහි එකි එකී ස්කන්ධයට සතර සතර බැගින් විංශති ප්‍රභේදගත සත්කාය දෘෂ්ටි නැමැති; **ශිඛරං** = (ශිඛර විස්සකින් යුක්ත වූ) පර්වතය; **භිත්වා** = (සමුච්ඡේද ප්‍රහාණයෙන්) බිඳ; **රාග ද්වේෂාදි පාපාන්** = ලෝභ ද්වේෂාදි පාපයන් හා; **තදුදිතම්** = ඒ (රාග ද්වේෂාදියෙන්) පහළ වූ; **අඛිලං කර්ම ච**=සියලු (ප්‍රාණාති පාතාදි වූ) කර්මය ද; **උන්මූලයන්තඃ** = මුල් සිඳ ගත්තා වූ; **ලබ්ධමාර්ගාඃ** = (ශ්‍රෝතාපත්ති මාර්ගය, සකෘදාගාමි මාර්ගය, අනාගාමි මාර්ගය, අර්හත් මාර්ගය යන) සතර. මගට පැමිණියා වූ; **චත්වාරඃ** = සතර දෙනෙක; **තදනුගුණ ඵලාඃ** = ඒ ඒ මාර්ගයෙන් ක්ෂය කරණ ලද කෙලෙශයන් සන්සිඳීමෙන් අනුකූලවූ ශ්‍රෝතාපත්ති ඵලය, ශකෘදාගාමි ඵලය, අනාගාමි ඵලය, අර්හත් ඵලය යන චතුර්විධ ඵලසථ වූ; **තෙ'පි** = ඒ ආර්ය පුද්ගලයෝ ද; **චත්වාරඃ** = සතර දෙනෙක; **ඒවං** = මෙසේ; **පුනඃ**, = නැවත; **අෂ්ටාර්ය සඞ්ඝඃ**=අට වැදෑරුම් වූ ආර්ය සඞ්ඝයා; **මුනීන්ද්‍ර** =සර්වඥයන් වහන්ස; **ත්වත්තඃ** = නුඹ වහන්සේ කෙරෙන්; **ප්‍රභවති** = වෙත ය යි කියා; **න චින්තයාමඃ** = නො සිතමු.

**භාවයඃ=** මුනීන්ද්‍රයන් වහන්ස, විසි වැදෑරුම් සත්කාය දෘෂ්ටිය හා සියලු රාගාදි පාපයන් ද, එයින් හටගත් සියලු කුශලා කුශල කර්මයන් ද මුලුසුන් කොට සතර මාර්ගයට පැමිණි පුද්ගලයෝ සතර දෙනෙක් ද, මාර්ගයට අනතුරු ව උපදනා සතර ඵලයට පැමිණි පුද්ගලයෝ සතර දෙනෙක් ද වෙත්. එසේ අට වැදෑරුම් වූ ඒ ආර්ය සඞ්ඝයා ඔබගෙන් වෙත් ය යි අපි නො සිතමු

**විස්තර:-** සතර මග සතර ඵලයට පැමිණි පුද්ගලයන්ගේ වශයෙන් අට දෙනෙක් වූ ඒ ආර්ය සඞ්ඝරත්නය ඔබ වහන්සේගේ ම ය යි යු සේ යි, මෙහි සත්කාය දෘෂ්ටිය

පර්වතයක් ලෙස ද, මාර්ගඥානය වජ්‍රායුධයක් ලෙස ද රූපණය කළහ. සත්කාය දෘෂ්ටිය ඉතා ඝනබහල බවත්, වජ්‍රායුධයෙන් පර්වතයක් වුව ද සුණු විසුණු කර දැමිය හැකි බැවින් මාර්ගඥානයෙන් සත්කාය දෘෂ්ටිය නැසිය හැකි බවත් එයින් දක්වයි.

භිත්වා = 'භිදිර් විදරණෙ' ධාතු යි, පූර්වක්‍රියා යි.
උන්මූලයන්තඃ = 'උන්මූලයත්' ශබ්ද ප්‍රථමා බහුවචන යි.
විඝනාශාමඃ = 'විනි විනාශායාම්' ලට් ප. උ. බහුවචන යි.

104. **අපි ගගනමනන්තං සර්වසත්වා'ප්‍යනන්තාඃ**
**සකලමිදමනන්තං චක්‍රවාලං විශාලම්,**
**වදසි ජින විදිත්වානන්තකා ඥානගත්‍යා**
**තව ච ගුණමනන්තං වෙද්සි බුද්ධ ත්වමෙව.**

**පදාර්ථ:-** **ගගනමපි** = ආකාශය ද; **අනන්තං** = කෙළවරක් නැත්තේ ය; **සර්වසත්වා'පි** = සියලු සත්වයා ද; **අනන්තාඃ** = කෙළවරක් නැත්තේ ය; **සකලම් ඉදං විශාලං චක්‍රවාලං** = මේ විසල් සක්වල ද: **අනන්තම්** = කෙළවරක් නැත්තේ ය; **ජින** = පස් මරුන් දිනූ බුදුරජාණන් වහන්ස; **අනන්තයා** = අවසානයක් නැත්තා වූ; **ඥාන ගත්‍යා** = ප්‍රඥා ගතියෙන්; **විදිත්වා** = අනන්ත වස්තූන් දැන; **වෙද්සි** = විභාග කොට වදාරණ සේක. **බුද්ධ** = සර්වඥයන් වහන්ස; **එවඤ්ච** = මෙසේ ම; **තව** = නුඹ වහන්සේගේ; **අනන්තං** = අනන්ත වූ; **ගුණඤ්ච**; = ත්‍රිවිද්‍යා, චතුර්වෛශාරද්‍යාදි ගුණයන් ද; **ත්වමෙව** = නුඹ වහන්සේ ම **වෙද්සි** = දැන වදාරණ සේකි.

**භාවය:-** පින්වත් ජිනේන්ද්‍රයන් වහන්ස, අහසෙහි ද, සියලු සත්වයාගේ ද, විශාල වූ මේ සක්වලෙහි ද කෙළවරෙක් නැත. අනන්ත වූ ඒ සියල්ල අනන්ත වූ ඔබගේ ඥානයෙන් දැන ප්‍රකාශ කරණ සේක. එසේ ම ඔබ ගුණයන්ගේ ද කෙළවරෙක් නැත. ඒ බව ඔබ වහන්සේ ම දැන වදාරණ සේක.

**විස්තර:-** ලොකයෙහි අනන්ත වූ සියල්ල බුදුවරු ම දැන තත් වූ පරිද්දෙන් ප්‍රකාශ කෙරෙති. එහි ලා සෙස්සෝ අසමර්ථයහ. බුදුවරුන්ගේ අනන්ත ගුණ ද බුදුවරු ම සර්වථා භාවයෙන් දනිති. සෙස්සෝ ස්වල්ප මාත්‍රයක් ම දනිති. සියල්ල නො දනිති.

**වෘත්තය:-** මෙයත්, මීලඟ පද්‍ය දෙකත් මාලිනී යි.

105. භගවති භවභීතිධ්වංසකාරිණ්‍යමොඝෙ
භවතු භවතු භක්තිර් ජන්ම ජන්මාන්තරෙ'පි,
භවතු භවතු ධර්මඃ සර්වථා මෙ'නුශාසා
භවතු භවතු සඞ්ඝො'නුත්තරා පුණ්‍යභූමිඃ.

**පදාර්ථ:-** අමොඝෙ = නො සිස් වූ; භවභීති ධ්වංසකාරිණී = සංසාර භය විනාශ කරණ සුලු වූ; භගවති = තථාගතයන් වහන්සේ කෙරෙහි; භක්තිඃ = ශ්‍රද්ධා ප්‍රවෘත්ති තොමෝ; ජන්ම ජන්මාන්තරෙ'පි = උපනුපන් ජාතියෙහි; භවතු භවතු = වේවා, වේවා; ධර්මඃ = සපර්‍ය්‍යාප්තික නව ලොකොත්තර ධර්මය තෙමේ; මෙ = මට; සර්වථා = සර්ව ප්‍රකාරයෙන්; අනුශාසා භවතු භවතු = අනුශාසක වේවා, වේවා; සඞ්ඝඃ = අෂ්ටාර්‍ය්‍යපුද්ගල සඞ්ඝ තෙමේ; අනුත්තරා = නිරුත්තර වූ; පුණ්‍යභූමිඃ භවතු භවතු = පුණ්‍ය ක්ෂෙත්‍ර වේවා, වේවා

**භාවය:-** සසර බිය නසන සුලු බුදුරජාණන් වහන්සේ කෙරෙහි උපනුපන් ජාතියෙහි මාගේ භක්තිය වේවා. උන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය භවයක් පාසා මට අනුශාසක වේවා. අෂ්ටාර්‍ය්‍ය පුද්ගල සඞ්ඝ රත්නය ඒකාන්තයෙන් ම මට නිරුත්තර පුණ්‍ය ක්ෂෙත්‍රය වේවා.

**විස්තර:-** භවයක් පාසා ම රත්නත්‍රය මට පිහිට වේවා යි කියා යි.

**භවභීතිධ්වංසකාරිණී** = "භවෙ භීතිර්භවභීතිඃ, ධ්වංසං කරොති ශීලෙනෙති ධ්වංසකාරී, භවභීතෙර්ධ්වංසකාරී භවභීතිධ්වංසකාරී, තස්මින්."

**භවතු භවතු** = ප්‍රසාදාර්ථයෙහි ආම්‍රෙඩිත යි.

**ජන්මජන්මාන්තරෙ** = "අන්‍යද් ජන්ම ජන්මාන්තරම්, ජන්ම ච ජන්මාන්තරඤ්ච ජන්මජන්මාන්තරම්, තස්මින්."

106. ත්‍රිභුවනමහනීයං ත්වාමශෙෂවෘත්ත්‍ය බුද්ධං
විශදතරමදභ්‍රං පුණ්‍යමත්‍රාර්ජිතං යත්,
ජගති සකලසත්වාස් තෙන සම්බුද්ධබොධිං
විධුතවිවිධපාපං භාවනාභිර් ව්‍රජන්තු.

**පදාර්ථ:-** ත්‍රිභුවන මහනීයං = ස්වර්ග මර්ත්‍ය පාතාල යන භුවනත්‍රය වාසීන් විසින් පූජා කටයුතු වූ; බුද්ධම් = ත්‍රෛලොක්‍යවර්ති වූ සර්වධර්මයන් සර්වාකාරයෙන් දන්නා වූ; ත්වාං = තුඹ වහන්සේට;

**අභිෂ්ටුතාය** = ශ්‍රද්ධාතිශයයෙන් ස්තෝත්‍ර කොට; **විශදතරං** = අතිශයින් නිර්මල වූ; **අදභ්‍රම්** = අනල්ප වූ; **යත් පුණ්‍යම්** = යම් කුශලයෙක්; **අත්‍ර** = මේ ස්තෝත්‍ර විෂයෙහි; **අර්ජිතම්** = රැස් කරණ ලද ද; **තෙන** = ඒ පුණ්‍යානුභාවයෙන්; **ජගති** = ලොකයෙහි; **සකලසත්ත්වාඃ** = සියලු සත්වයෝ; **විධූතවිවිධ පාපාඃ** = නසන ලද අවිද්‍යාදි නොයෙක් පව් ඇත්තාහු; **භාවනාභිඃ** = භාවනාවන් කරණ කොට ගෙණ; **සම්බුද්ධ බෝධිම්** = සර්වඥතාඥානයට; **ව්‍රජන්තු** = පැමිණෙත්වා.

**භාවය:-** තුන් ලෝ වැස්සා විසින් පිදිය යුතු වූ සියල්ල දන වදළ ඔබ වහන්සේට සතුති කිරීමෙන් මා විසින් රැස් කරණ ලද මහත් පිණ හෙතු කොට ගෙණ සියලු සත්වයෝ නොයෙක් පව් නසා භාවනා කිරීමෙන් බුදුබවට පැමිණෙත්වා

**විස්තර:-** මේ බුද්ධ ස්තෝත්‍රයෙන් ජනිත පින් සියලු ලෝ වැස්සාට මෙසින් අනුමෝදන් කළහ. බුදුබව කෙරෙහි ඇති මහත් භක්තිය හෙතු කොට ගෙණ "සියල්ලෝ ම බුදු වෙත්වා" යි පැතුහ. හැනහොත් මොහු මහායානික මතය ගරු කරන්නෙකු විය යුතු ය. මහායානික බෞද්ධයන් බුදුබව ම පතන බැවිනි.

**ත්‍රිභුවනමහනීයම්** = "ත්‍රීණි භුවනානි සමාහෘතානි ත්‍රිභුවනම්, තෙන මහනීයඃ= තිභුවනමහනීයඃ, තම්."

**අභිෂ්ටුතාය** = 'අභි' පූර්ව 'ෂ්ටුඤ් සතුතෞ' පූර්වක්‍රියා යි.

**විධූතවිවිධපාපාඃ** = 'විධූතානි විවිධානි පාපානි යෛස්තෙ විධූතවිවිධපාපාඃ."

**සත්‍යෛ නාම සන්දශීනය.**

107\. **භාස්වද්භානුකුලාම්බුජන්මමිහිර රාජාධිරාජේශ්වරෙ ශ්‍රීලඞ්කාධිපතෞ පරාක්‍රමභුජෙ නිත්‍යා මහිං ශාසති, සද්ගුණෞඝඃ කවිභාරතීසඞ්තිසූරඃ ශ්‍රීරාමචන්ද්‍රඃ සුධීශ් ශ්‍රොත්‍රෘණාමකරොත් ස භක්තිශතකං**

**ධර්මාර්ථමොක්ෂප්‍රදම්.**

**පදාර්ථ:-** **භාස්වත්** = මනු මන්ධාතු භරත භගීරථාදි වූ මහරජ දරුවන්ගේ උත්පත්ති ප්‍රකාශ වූ · **භානුකුලාම්බුජන්ම** = සූර්‍ය්‍ය වංශ නමැති පද්මයට; **මිහිර** = සූර්‍ය්‍යමණ්ඩලයක් වැනි වූ;

**ශ්‍රී ලඞ්කාධිපතෞ** = ත්‍රිවර්ග සම්පත්තියෙන් යුක්ත වූ තෙවන් ශ්‍රී ලඞ්කා ද්වීපයට අධිපති වූ; **පරක්‍රමභුජෙ** = පරාක්‍රමබාහු නම් වූ; **රාජාධිරාජෙශ්වරෙ** = රාජාධිරාජයන්ට නායක වූ මහ රජහු; **නීත්‍යා** = නීති මාර්ගයෙන්; **මහීං ශාසති** = මුළු පොළොව අනුශාසනා කරණ කල්හි; **සද්ගෞඩඃ** = උත්තම ගෞඩදේශයෙහි උපන්; **කවිභාරතිඃ** = කවි ජනයාට සරස්වතී දේවිය වැනි වූ; **සුධීඃ** = ප්‍රශස්ත වූ බුද්ධි ඇති; **ශ්‍රීරාමචන්ද්‍රඃ** = ශ්‍රී රාමචන්ද්‍ර නම් වූ; **සඃ ක්ෂිතිසුරඃ** = ඒ බ්‍රාහ්මණොත්තම තෙමේ; **ශ්‍රොතෘණාං** = අසන්නවුන්ට; **ධර්ම** = දශවිධ කුශල ධර්මය; **අර්ථ** = උපභොග පරිභොග සම්පත්තිය යන අර්ථය; **මොක්ෂප්‍රදම්** = අමෘත මහා නිර්වාණය යන සියලු සම්පත් දෙන්නා වූ; **භක්තිශතකම්** = බුදුන් කෙරෙහි අචලශ්‍රද්ධාවෙන් උපාසක රත්න භාවයෙහි පිහිටා කියන ලද හෙයින් භක්ති ශතක නම් වූ මේ ප්‍රකරණය; **අකාරොත්** = රචනා කෙළේ යි.

**භාවය**:- ප්‍රසිද්ධ වූ සූර්‍ය්‍යවංශය හොබවන ශ්‍රී ලඞ්කාධීශ්වර රාජාධිරාජ ශ්‍රී පරාක්‍රමබාහු මහරජානන් ලක් රජය කරවන කල්හි කවි ජනයාට සරසවිය වැනි ගෞඩදේශීය ශ්‍රී රාමචන්ද්‍ර නම් බ්‍රාහ්මණ පණ්ඩිත තෙමේ අසන්නවුන්ට ධර්මාර්ථමොක්ෂ ප්‍රදායක වූ මේ භක්ති ශතකය රචනා කෙළේ ය.

**විස්තර**:- මෙහි දැක්වෙන පරාක්‍රමබාහු රජු නම් ශ්‍රී ජයවර්ධන පුරය (=කෝට්ටේ) රජධානිය කොට රජ පැමිණි අන්තිම වරට ලක්දිව එක් සේසත් කළ **සවැනි ශ්‍රී පරාක්‍රමබාහු** රජතුමානෝ ය. මෙතෙමේ සූර්‍ය්‍ය වංශිකයෙකි. ඉන්දියාවේ ද ප්‍රදේශ කිපයක් යටත් කළ බලසම්පන්න රජෙකි. ඔහුගේ රාජ්‍යකාලය ක්‍රි. ව. 1412 පටන් 1467 තෙක් වූ අවුරුදු පස් පණසෙකි. ඒ කාලය තුළ දඹදිව ගෞඩ දේශයෙන් ලක්දිවට පැමිණ එකල මෙහි වැඩ විසූ ශ්‍රේෂ්ඨතම පැවිදි පඬිවරයා වූ ශ්‍රී සඞ්ඝබොධි විජයබාහු පරිවෙණාධිපති ෂඩ්භාෂා පරමෙශ්වර **තොටගමුවේ ශ්‍රී රාහුල** සඞ්ඝරාජ මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙතින් ත්‍රිපිටක ධර්මය සහිත පාලිභාෂාව ඉගෙණ රත්නත්‍රය ශරණ පරායණ බෞද්ධයෙක් වූ ශ්‍රී **රාමචන්ද්‍ර** කවිභාරතී නම් බ්‍රාහ්මණ පණ්ඩිත තෙමේ "භක්ති ශතක" නම් මේ බුද්ධස්තොත්‍රය රචනා කෙළේ ය.

**භාස්වද්භානුකුලාම්බුජන්මමිහිරෙ** = "භානොඃ කුලං භානුකුලම්, භාස්වච්ච තද් භානුකුලඤ්චෙති භාස්වද්භානුකුලම්, අම්බෞ ජන්ම යස්‍ය තද් අම්බුජන්ම, භාස්වද්භානුකුලමෙවාම්බු

ජන්ම භාසවද්භානුකුලාම්බුජන්ම, තස්‍ය මිහිර ඉව භාසවද්භානුකුලාම්බුජන්මමිහිරඃ, තස්මින්." සූර්‍ය්‍යවංශ නමැති පියුමට හිරු වැනි. පියුම පුබුදු වන්නේ හිරුගෙනි. එමෙන් ම මේ රජුගෙන් සවකිය වංශය වූ සූර්‍ය්‍යවංශය ප්‍රබොධවත් වූ බව හෙවත් දීප්තිමත් වූ බව මෙයින් හඟවයි.

**රාජාධිරාජේශ්වරෙ** = "රාඥමධිරාජා රාජාධිරාජාඃ, තෙෂාමීශ්වරො රාජාධිරාජේශ්වරඃ, තස්මින්." රජුන්ගේ රජුන්වත් ශ්‍රෙෂ්ඨ වූ:

**ශාසති** = වර්තමාන කෘදන්ත 'ශාසත්' ශබ්ද යි. භාව සප්තමී යි.

**සගෞඩඃ** = 'ගෞඩ දේශය' නම් ඉන්දියාවේ විනධ්‍ය කඳු වැටියට උතුරෙන් පිහිටි ප්‍රදේශයෙකි. වඞ්ග දේශයෙහි පටන් භුවනෙශ දේශය තෙක් පැතිර පවත්නා ප්‍රදේශය යි කියති **සාරස්වත, කාන්‍යකුබ්ජ; ගෞඩ, මෛථිල්‍ය, උත්කල** ය යි ගෞඩයෝ පස් වර්ගයෙකි. ඒ සියල්ලෝ ම බ්‍රාහමණයෝ ය.

> **සාරස්වතඃ කාන්‍යකුබ්ජා**
> **ගෞඩමෛථිලකොත්කලාඃ,**
> **පඤ්ච ගෞඩා ඉති ඛ්‍යාතා**
> **විනධ්‍යස්‍යොත්තරවාසිනඃ.**

යනුවෙන් ඒ බැව් දක්වූහ.

**කවිභාරතීක්ෂිතිසුරඃ** = "කවීනාං භාරතීව කවිභාරතීඃ, ක්ෂිතෞ සුරඃ ක්ෂිතිසුරඃ, කවිභාරතීශ්ච ස ක්ෂිතිසුරශ්චෙති කවි භාරතීක්ෂිතිසුරඃ." කවීන්ට සරසවතී වැනි ය යි කීමෙන් සියලු කවීන් මොහුගෙන් ආදර්ශ ගත් බව, අනුග්‍රහ ලැබූ බව දක්වේ.

**ක්ෂිතිසුර** නම් පොළොවෙහි දෙවියෝ ය. බ්‍රාහමණයෝ උසස් ම කුලවත්තු ය යි ද, එහෙයින් ම ඔව්හු මිනිස්ලොව වෙසෙන දෙවියෝ ය යි ද වෛදිකයන්ගේ පිළිගැණීම යි.

**භක්තිශතකාඛ්‍යම්** = සියයක් ඇත්තේ ශතක ය යි. මෙහි මූළ පද්‍ය සඞ්ඛ්‍යාව 107 කි සියයට කීපයක් වැඩි වුවත් ප්‍රධාන සඞ්ඛ්‍යාව සියය බැවින් "ශතක" නම් වේ. රතනත්‍රය

විෂයෙහි පවත්නා සවභීය භක්තිය, ආදරය, ගෞරවය ප්‍රකාශ වන සේ මෙය රචිත බැවින් **භක්ති ශතක** නම් විය. මේ වනාහි ග්‍රන්‍ථ කර්තෘහු විසින් මේ පොතට තබන ලද නම යි. බෞද්ධයන්ගේ සවභාවය මෙයින් පැවසෙන හෙයින් මෙය **බෞද්ධ ශතක** ය යි ද ව්‍යවහෘත ය.

**ධර්මාර්ථමොක්‍ෂප්‍රදම්** = ධර්මශ්චාර්ථශ්ච මොක්‍ෂශ්ච ධර්මාර්ථමොක්‍ෂාඃ, තාන් ප්‍රදදාතීති ධර්මාර්ථමොක්‍ෂප්‍රදඃ, තම්." බුද්ධ ස්තොත්‍රයක් බැවින් මේ පොත කියවන කල්හි පහළ වන චේතනා කුසල් ය. එයින් පින් රැස් වේ. එහි විපාක වශයෙන් ධනය ලැබේ. කෙළවර නිවන් ලැබීමට ද මේ පොත කියවීම හෙතු වේ· රත්නත්‍රය කෙරෙහි භක්තිය වැඩෙන බැවිනි. මෙසේ මේ පොත කියන්නවුන්ට ධර්ම, අර්ථ, මොක්‍ෂ යන තුණ ම ලැබෙන බැවින් මෙය ධර්මාර්ථමොක්‍ෂ ප්‍රදායක ය.

**වෘත්තය** – ශාර්දූල වික්‍රීඩිත යි.

**ඉති ශ්‍රී ශාක්‍යමුනෙර්භගවතඃ සර්වඥස්‍ය පරමොපාසකෙන ගෞඩදෙශීය ශ්‍රී බෞද්ධාගම චක්‍රවර්තිනා භූසුරෙණාචාර්යෙණ මහා පණ්ඩිතෙන විරචිතං භක්තිශතකං සමාප්තම්.**

**පදාර්ථ:**- **ශ්‍රී ශාක්‍යමුනෙඃ** = හෙතුඵල සම්බොපකාරයෙන් යුක්ත වූ; ඉක්ෂ්වාකු වංශාවතීර්ණ මහාපුරුෂ වූ; **භගවතඃ** = භාග්‍යවත් වූ; **සර්වඥස්‍ය** = බුදුරජාතන් වහන්සේගේ; **පරමොපාසකෙන** = ("පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො උපාසකො උපාසක රතනඤ්ච උපාසකපදුමඤ්ච උපාසකපුණ්ඩරීකඤ්ච" යනාදි ශ්‍රී මූල පාඨයෙන් වදාරණ ලද) උපාසක ගුණයෙන් යුක්ත වූ; **ගෞඩදෙශීය** = ගෞඩයට ඇතුළත් රාඪ මණ්ඩලය බද වරේන්ද්‍ර ජනපදයෙහි **වීරවටක** නම් වූ අග්‍රහාරයෙහි ජාත වූ; **මහා පණ්ඩිතෙන** = ත්‍රිපිටක, තර්ක, ව්‍යාකරණ, නිඝණ්ඩු, ඡන්දෝලඞ්කාර, කාව්‍ය, නාටක, සමෘති, පුරාණ, ඉතිහාසාදි වූ සකල ශාස්ත්‍රඥ භාවයෙන් ප්‍රසිද්ධ පණ්ඩිත වූ; **ශ්‍රී බෞද්ධාගම චක්‍රවර්තිනා** = ශ්‍රී බෞද්ධාගම චක්‍රවර්ති නම් වූ; **භූසුරෙණ ආචාර්යෙණ** = බ්‍රාහමණ පණ්ඩිතයා විසින්; **විරචිතම්** = රචනා කරණ ලද; **භක්තිශතකම්**= "භක්ති ශතක" නම් වූ ප්‍රකරණය තෙමේ; **සමාප්තම් ඉති** = සමාප්ත ය යි කියයි

ශ්‍රී **බෞද්ධාගම** චක්‍රවර්ති යන ගෞරව නාමොපලක්‍ෂිත පරම බෞද්ධොපාසක මහා පණ්ඩිත ගෞඩ දෙශීය බ්‍රාහමණාචාර්යයන් විසින් කරණ ලද භක්ති ශතකය නිමියේ ය.

---

1. නෘපඃ පරාක්‍රාන්ති භුජෝ මහීභුජාං
ශිරෝමණිඃ පණ්ඩිතමණ්ඩලීසඛඃ,
ස රාමචන්ද්‍රං කවිභාරතීද්විජං
චකාර බෞද්ධාගම චක්‍රවර්තිනම්.

**පදාර්ථ:-** **මහීභුජාං** = ෂට්ත්‍රිංශත් කුලයෙහි උපන් රජ දරුවන්ට; **ශිරෝමණිඃ** = ශිඛා මාණික්‍යයක් හා සමාන වූ; **පණ්ඩිත මණ්ඩලීසඛඃ** = සංස්කෘත ප්‍රාකෘතාදි භාෂාවෙහි නිපුණ වූ කවි ජනයාට කල්‍යාණ මිත්‍ර වූ; **සඃ පරාක්‍රාන්ති භුජඃ** = ඒ ප්‍රසිද්ධ වූ පරාක්‍රමබාහු නම් මහා රාජෝත්තම තෙමේ; **රාමචන්ද්‍රං** = ශ්‍රී රාමචන්ද්‍රභාරතී නම් වූ; **කවිභාරතී ද්විජම්** = කවි ජනයාට සරස්වතී හා සදෘශ වූ බ්‍රාහ්මණ පණ්ඩිතයා; **බෞද්ධාගම චක්‍රවර්තිනම්** = "බෞද්ධාගම චක්‍රවර්ති" යන නම් ඇත්තහු; **චකාර** = (මේ භක්ති ශතක ශ්‍රවණයට ඉක්බිති ව පූජා සත්කාර සහිත වූ පට්ට බන්ධනයෙන් ප්‍රසිද්ධ) කෙළේ යි.

මෙම **භක්ති ශතකය** කිරීම ගැණ ප්‍රීතියට පත් සවැනි පරාක්‍රමබාහු මහරජතුමා විසින් ශ්‍රී රාමචන්ද්‍ර පඬිතුමාට **බෞද්ධාගම චක්‍රවර්ති** යන ගෞරවෝපාධිය ප්‍රදානය , කල බව මෙයින් දැක්වූහ

2. **බුද්ධෝ මෙ ජගතාං ජිනඃ ස භගවාංස් තද්දේශනා නිර්මලා**
**ශ්‍රේයාත් සත්වහිතාය භාතු භණිතා සඞ්ඝස් තදාධාරකඃ,**
**ලඞ්කාශප්‍රමුඛාශ්චිරං වසුමතීං රක්ෂන්තු නීත්‍යා නෘපා**
**වර්ෂන්තු ඝනානසිතනාවශව සමයෙ මෛත්‍රීං ලභන්තාං ප්‍රජාඃ.**

**පදාර්ථ:-** **ජිනඃ** = පස් මරුන් දිනූ; **සඃ භගවාන්** = ඒ භාග්‍යවත් වූ; **මෙ** = මාගේ; **බුද්ධඃ** = සර්වඥ තෙමේ; **ජගතාම්** = සකල සමයෝත්කර්ෂයෙන් පවතීවා; **නිර්මලා** = විරුද්ධ දෝෂ රහිත වූ; **තද්දේශනා** = ඒ බුදුන්ගේ පාලි ධර්මය තොමෝ; **සත්වහිතාය** = ලෝවැඩ පිණිස; **ශ්‍රේයාත්** = පවතීවා; **තදාධාරකඃ** = ඒ ධර්මයට ආධාර වූ; **භණිතා** = බණ කියන්නා වූ; **සංඝඃ** = අෂ්ටාර්‍ය පුද්ගල සඞ්ඝ තෙමේ; **භාතු** = ධර්ම තේජසින් බබලාවා; **ලඞ්කාශප්‍රමුඛාඃ** = ලඞ්කාශ්වර අපගේ මහරජානන් ආදි කොට ඇති; **නෘපාඃ** = රජහු; **නීත්‍යා** = ධර්මනීති ක්‍රමයෙන්; **චිරං** = බොහෝ කාලයක්; **වසුමතීම්** = පොළොව: **රක්ෂන්තු** = රක්‍ෂා කෙරෙත්වා; **ඝනානසිතනාවශව** = මේඝයෝ ද; **සමයෙ** =

සුදුසු කාලයෙහි; **වසිත්වා** = වසිත්වා; **ප්‍රජාඃ** = සත්ත්වයෝ; **මෛත්‍රීං ලභන්තාම්** = ඔවුනොවුන් කෙරෙහි සමගි වීමෙන් මෛත්‍රිය ලබත්වා

මේ පද්‍ය දෙක ද ශ්‍රීමද් **රාමචන්ද්‍රයන්** විසින් ම රචනා කරණ ලද බව පෙණේ. භාෂා විලාසයෙන් හා රචනා ශෛලියෙන් ද ඒ බව සලකා ගත හැකි ය. භක්ති ශතකය නිමවා ශ්‍රී පරාක්‍රමබාහු මහරජතුමාට පිළිගැන්වූ පසු එය කියවා ඉතා ප්‍රීතිමත් වූ එතුමන් විසින් **බෞද්ධාගම චක්‍රවර්ති** යන ගෞරවෝපාධිය තමහට ප්‍රදානය කළ බව දැක්වීම සඳහා මෙහි මුල් ශ්ලෝකය ද, උසස් පින්කමක් සිදු කොට කෙළවර වැදගත් ප්‍රාර්ථනයක් කිරීම චාරිත්‍රයක් බැවින් "භක්ති ශතක" නමැති මේ බුද්ධස්තෝත්‍රය රචනා කිරීම් සඞ්ඛ්‍යාත පුණ්‍ය කර්මයාගේ අවසානයෙහි කරණු ලබන ස්වකීය ප්‍රාර්ථනය වශයෙන් මේ දෙවැනි ශ්ලෝකය ද රචිත බව සැලකිය හැකි ය.

**විස්තර වර්ණනා සහිත භක්ති ශතකය නිමි.**

---

## ව්‍යාඛ්‍යාතෘ රචනා.

භක්ති ශතකයට පැරණි සන්නය සැපයූ **සුමඞ්ගල** නම් ස්ථවිරයන් වහන්සේ විසින් ස්වකීය නාමය දැක්වීම සඳහා ද, රත්නත්‍රයට නමස්කාර පිණිස ද, ස්වකීය ප්‍රාර්ථනය වශයෙන් ද විරචිත ශ්ලෝක තුණක් මතු සඳහන් වේ.

**ස්වනාම සන්දර්ශනය**

1. **තීර්ථග්‍රාමජනෛකතේජස් ත්‍රිපිටකාචාර්යස්‍ය භූපාර්චිතා**
**චාර්යශ්‍රේෂ්ඨමුනීශ්වරස්‍ය සුගිරඃ ශ්‍රී රාහුල ස්වාමිනඃ,**
**ශිෂ්‍යෝ යෝ විරජස්සුමඞ්ගල මුනිර්**
**ධීමාන් ස්වයා භාෂයා**
**කාරුණ්‍යෙන මුනීන්ද්‍රභක්තිශතක**
**ව්‍යාඛ්‍යානමාඛ්‍යාතවාන්.**

තොටගමුවට හිමි වූ, කෙලෙස් තාවන වීර්‍ය ඇති, ත්‍රිපිටකාචාර්‍ය වූ, රාජ පරම්පරාවට ඇදුරු වූ, ශ්‍රේෂ්ඨ භික්ෂු වරයෙකු වන, මනා වචන ඇති ශ්‍රී රාහුල ස්වාමීන්ද්‍රයන්

වහන්සේගේ යම් ශිෂ්‍යයෙක් වී ද; උසස් කුලයෙහි උපන් නුවණැති ඒ සුමඞ්ගල ස්ථවිර තෙමේ කරුණාවෙන් මුනීන්ද්‍රයන් වහන්සේ කෙරෙහි භක්තිය ප්‍රකාශ වන භක්ති ශතකයේ සන්නය සිංහල භාෂාවෙන් කෙළේ ය.

## රත්නත්‍රය නමස්කාරය

2. නමෝ බුද්ධාය ගුරවෙ නමො ධර්මාය ශාසිනෙ,
නමස්සඞ්ඝාය මහතෙ ත්‍රිභ්‍යො'පි සතතං නමඃ.

ආචාර්ය වූ බුද්ධ රත්නයට නමස්කාර වේවා. ශාස්තෘ වූ ධර්ම රත්නයට නමස්කාර වේවා. මහත් (= පිදිය යුතු) වූ සඞ්ඝ රත්නයට නමස්කාර වේවා. රත්නත්‍රයට ම නිතර (මාගේ) නමස්කාරය වේවා.

## ප්‍රාර්ථනය.

3. උත්පත්තිඃ ශුද්ධවංශෙ වරපුරුෂසද
ප්‍රාර්ථනා බොධි බෞද්ධං
දීර්ඝායුඃ ශුද්ධබුද්ධිඃ දශගජබලවාන්
වජ්‍රකායස්‍ය කීර්තිඃ,
ධර්මාශොකස්‍ය තෙජො ධනද ධනපතිඃ
කාමදෙවස්‍ය රූපං
දානං වෛශවන්තරත්වං මම භවතු සදා
බොධිපර්යන්ත ලාභාත්.

බුදු බව ලැබීම දක්වා මට සැම කල්හි ම උසස් කුලයෙහි ඉපැද්ම ද, බුදුබව ප්‍රාර්ථනා කිරිම ද, බෞද්ධ බොධිය ද, දීර්ඝායුෂ ද පිරිසිදු නුවණ ද, ඇතුන් දස දෙනෙකුන්ගේ බල ඇති බව ද, බුදුරජානන් වහන්සේගේ කීර්තියට බඳු කීර්තිය ද, ධර්මාශොක රජුගේ තෙජස වැනි තෙජස ද, කුවෙරයාගේ ධනපති කම වැනි ධනපති කම ද, අනඞ්ගයාගේ රූපය වැනි රූපය ද, දන් දීමෙහි ලා වෙසතුරු බව ද වේවා.

මේ 1, 3, පද්‍ය දෙක ව්‍යක්ත රචනා ලෙස නො දක්විය හැකි ය විවරණ දෙසින් ද සදෙස් ය. මෙහි අර්ථ අප විසින් ලියා එකතු කරණ ලදී.

ශම්.



